
kathapothak.blogspot.com



kathapothak.blogspot.com

# 01

ගවේෂ් යලිත් වරක් අසංකට ඇමතුමක් ගත්තේ ය. අංසක වෘත්තීය පත්‍ර කලාවේදියෙක් නිසා ඇමතුමට ලෙහෙසියෙන් සම්බන්ධ කර ගැනීමට නොහැකි වුණි. මෙම තත්ත්වයෙන් ගොඩ ඒම තනිව කළ නො හැකි ය. ගවේෂ්ට ඇති එක ම කරදරය වන්නේ ඉක්මනින් විවාහ වීම සඳහා නිවෙසින් බල කිරීම ය. උපාධිය අවසන් වන තෙක් කිසිසේත් විවාහ වීමට පුළුවන් කමක් නැත.

ගැහැනු ඇසුරු කිරීම පිළිබඳව ගවේෂ්ට පෞද්ගලික අත්දැකීමක් නැත. දන්නා හඳුනන මිතුරන්ට ගැහැනු නිසා සිදු වූ විපත් ගවේෂ් දනී.

අමාලි විවාහ වී සිටියේ ගවේෂ්ගේ හොඳම මිතුරා සමග ය. ඇය එකම දරුවා අතැර වෙනත් පිරිමියෙක් සමග ගියා ය. ගැහැනුන්ට දාරක ස්නේහය ඇතැයි කියන බයිලාව ඔහු දැන් විශ්වාස නො කරයි.

අද ලිංගික අවශ්‍යතා සඳහා ඕනෑ ම වයසක ගැහැනියෙක් සොයා ගැනීමට පුළුවන.

ලිංගික රෝග නැති බවට වෛද්‍ය සහතික සහිතව සොයා ගැනීමට පුළුවන.

වෙබ් අඩවියෙන් නැරැව්කාරයෙක් මගින් සංසර්ගයේ යෙදීමට ගැහැනියෙක් සොයා ගැනීම බරපතළ ප්‍රශ්නයක් නො වේ.

ගැහැනියෙක් විවාහ කර ගතහොත් මුළු ජීවිත කාලය පුරාම කන්ට බොන්ට දී ඇයව ආරක්ෂා කරදිය යුතුය. ලෙඩට දුකට බැලිය යුතුය.

මෙවැනි සුළු වැඩක් වෙනුවෙන් මුළු ජීවිත කාලය පුරාවට ම ඇය ආරක්ෂා කිරීම හොඳ වැඩකි.

ගැහැනු ස්වභාවයෙන් ම විශ්වාස කළ නොහැකි පිරිසකි. මේ අය අතර හොඳ ගැහැනු නැතිවාම නොවේ.

හඳහන් පොරොන්දම් බැලීමෙන් පමණක් අද හොඳ ගැහැනු සෙවිය නොහැකි ය. විවාහයට ප්‍රථම විවාහ අපේක්ෂිත යුවතියගේ රුධිරය පරීක්ෂා කිරීම කළ යුතුය.

යුග ජීවිතය පිළිබඳ කුමන අඩුපාඩු තිබුණත් පිරිමියෙකුට සහකාරියක් අවශ්‍ය වෙයි. එහෙත් තමා ජීවත්වන වර්තමාන තත්ත්වය අනුව දැන්ම විවාහ වීමට නුපුළුවන. විභාගය සම්පූර්ණ කරන තෙක් විවාහය පිළිබඳව සිතිය නොහැකි ය. ඊටත් වඩා කිසිම අවබෝධයක් නැති ගැහැනියක් සමග ජීවිතයක් ඇරඹිය නොහැකි ය.

"මචං අසංක, කොහෙද යකෝ යන්නෙ. කීයෙ ඉඳන් ද මම කතා කරන්නෙ."

"සොරි වස්තුව අපි විකල්ප පත්‍රකාරයො. පැපරාසියො වගේ නිවුස් හොයනවා. ඇයි කතා කළේ...?"

"මචං මට උදව්වක් ඕනෑ. මාව ලොකු අමාරුවක වැටෙන්නයි යන්නෙ. උඹ මාව බේරගන්ට ඕනෑ."



"පිස්සුද උඹව අමාරුවෙ වැටෙන්ට දෙන්ව බෑ. ඇයි චෙක් එකක් රිටන් වෙලා ද?"

"ඔෆිස් එකේ ප්‍රශ්නයක් නෙමේ, මේක මගෙ පෞද්ගලික ප්‍රශ්නයක්."

"මගෙ මාලමේ ගැන්සිය අරගෙන එන්නම්. බයිට් එකකුයි වැජ්මෙන සමාජයට ඔබින දෙක තුනක් ගෙනැත් තියපං. මම සෝඩා ගේන්නම්."

"උඹ දන්නවනෙ මම බොන්නෙ නැති බව. කෑම දෙන්නම්."

"ඇඟට කික් එකක් නැතිව අයිඩියාස් එන්නෙ නැති බව උඹ දන්නවනෙ."

"මොනවා හරි කරන්ට බලන්නම්."

"එහෙම නම් මම හරියට අටට එනවා. ලෑස්ති කරලා තියපං."

අම්මා එවා තිබුණු පෝස්ට් කාඩ් ප්‍රමාණයේ ඡායාරූපය අතට ගත් ගවේෂ් එදෙස බලා සිටියේ ය. ඡායාරූපයේ හැටියට තරුණිය අවලස්සන යැයි කීමට පුළුවන් කමක් නැත. සිහින් තුනී දෙතොල් පෙනී මුහුණට ලස්සනක් ගෙන දී තිබුණි. දීප්තිමත් නෙතු සඟලකින් යුතු ඇය මෙම ඡායාරූපයට පෙනී සිටින්ට ඇත්තේ මංගල උත්සවයකට සහභාගි වූ දිනයක විය යුතුය.

ඇය ලස්සන නැතැයි පැවසීමට නොපුළුවන.

හඳහන් නොගැළපෙන්නේ යැයි පවසා ප්‍රතික්ෂේප කිරීමට ද නොහැකි ය.

අම්මා මෙම ඡායාරූපය එවන්ට ඇත්තේ එය ගැළපෙන බව තීරණය කිරීමෙන් පසුව ය. නංගී හා මස්සිනා අනුමැතිය දෙන්නට ඇත.

විසිහතර වැනි ඉරිදා අනිවාර්යයෙන් ම මනමාලිය බැලීමට

යා යුතුය. ඊට කලින් මේ මඟුල නැවැත්විය යුතුය. සියලු කළමනා සූදානම කරගත් ගවේෂ් මෝටර් සයිකලයෙන් මිතුරා හමුවීමට ගියේ ය.

"මම මේ උඹ පරක්කු නිසා කෑම එකක් ගේන්ට යන්නයි ලෑස්ති වුණේ."

"මේ කැත පුරුද්ද නතර කරපං."

ඔහු එය මේසය මත තබමින් කීවේ ය.

"මචං අපි මේවා නතර කළොත් රටට ජාතික ආදායම ලැබෙන්නේ නෑ. ටෙලිවිෂන් එකේ කොටු දාන එක සම්පූර්ණයෙන් ම නතර කරන්න කියපං."

"උඹ නම් කවදාවත් හැදෙන මිනිහෙක් නෙමේ."

"හරි... හරි.. මොකද්ද වස්තුවේ ප්‍රශ්නෙ...?"

ගවේෂ් දිනපොත තුළ වූ ලියුම් කවරය මිතුරා අත තැබුවේ ය.

## 02

අසංක කවරය තුළ වූ ඡායාරූපය අතට ගෙන එදෙස භාවනාවකට සම වැදුණාක් මෙන් බලා සිටියේ ය. සෑහෙන කලකට පසු ඔහු ලස්සන ගැහැනියක් දුටුවේ ය.

ඓශ්වර්යා රායි මෙන් නොවූවත් ඊට සමාන අමුතු ලස්සනක් ඇති රුවැත්තිය දෙස ඔහු බලා සිටියේ ය. පැහැදිලිව නිරූපිකාවක් ලෙස බොහෝ දුර යා හැකි යෞවනියකි.

"නියම සුදු කෑල්ලක්. සොරි මචං, අපි කරන විකල්ප පත්තරවල මේ වගේ ලස්සන කෙල්ලො දමන්නෙ නෑ."

"ඒකට නෙමේ ගෙනාවෙ.."

"මම මේක අපේ 'ගාමා'ට දෙන්නම්. ඌට සුදු කෑලි පෙන්වන්ට බෑ. කවරයක් කරයි."

"මට මේක කුණු ගොඩක් වගේ පේන්නෙ."

අසංක උස් හඬින් කෑ ගැසුවේ ය.

"මචං අපි කාන්තා පත්තර කරන්නෙ නෑ, ගාමා මේ දවස්වල

රට ගිහින්. උඹ මේ ෆොටෝ එක පත්තරේ මම දන්න කෙල්ලෙක් ඉන්නවා. ඒකිට ගිහින් දීපං."

"පත්තර පිටකවරේකට දාගන්න තෙමේ ගොනෝ. මේ කෙල්ල ගැන මට ප්‍රොපෝසල් එකක් ඇවිදින්."

"සතේක දැවැද්දක් ඉල්ලන්න එපා. බැඳපං. ගොනෝ මේ වගේ කෙල්ලෙක් දිහා නිකං බලන් හිටියත් ඇති. බලපන් මොනවද අඩු. ඉස්සරහ ද පස්ස ද මේ ජේනහරිය...?"

ගවේෂ් පිළිතුරක් නොදී නිහඬව සිටියේ ය.

"මේ කෙල්ල උඹට එපා නම් මට දීපං."

ඔහු මිතුරාගේ පිටට ගසා සිනාසුණේ ය.

"මචං... මට බඳිනවාට වඩා වෙන වැඩ තියෙනවා. මට මේ ගැහැනු ඕන් නෑ. මනමාලිගෙ පැත්තට මාව එපා කරවන්න ඕනෑ. ඒකයි ආවෙ."

අසංක මොහොතක් කල්පනා කළේ ය.

"උඹ කලින් බැඳපු මිනිහෙක් කියලා ප්‍රචාරයක් අරිමු."

"ඒක හරියන්නෙ නෑ. මනමාලි බලන්න අම්මයි තාත්තයි දෙන්නම යනවා. නංගිත් එයි."

අසංක අසුනෙන් නැගිට කීපවරක් ඒ මේ අත ඇවිද්දේ ය.

"ඒ කෙල්ලට මාව එපා වෙන පිළිකුල් වෙන වැඩක් කරපං."

"අපි මෙහෙම කරමු. උඹ නරක චරිතයක් තියෙන, ගෑනු පස්සෙ යන පැණියෙක් කියන අදහස ඇති වෙන්න කැලෑ පත්තරයක් ගහමු."

"මචං, ඔය එන්නෙ අයිඩියාස්."



"උඹ අඩිගහන, සිගරට් බොන, සයිඩ් එකේ කෙල්ලො ඉන්න වනචරයෙක් කියලා කැලෑ පත්තරයක් හදලා කෙල්ලගෙ ගෙදරට යවමු. ඉඳා මේ වීදුරුව ගනින්."

"මචං, මම බොන්නෙ නැහැ සහා."

"උඹ බොන්න එපා. බොන්න වාගෙ වීදුරුව අතේ තියාගෙන හිටපං. මම පින්තූර ටිකක් ගන්නම්."

මිතුරාගේ අදහස තේරුම් ගත් ඔහු කැමරාවට මුහුණ දුන්නේ ය.

"මට කෙල්ලො හොයන්නෙ කොහොමද?"

"ඒවා සිම්පල්. ඒවා කම්පියුටර් එකෙන් බස්සන්නම්. සෙමිනියුඩ් කෙල්ලෙක් ඇගේ තුල්පටක්වත් නැති එවුන් ඉන්නවා. ඒක ගානට කරන්නම්."

"තැන්ක් යූ මචං. මට නියම මඩ කැලෑ පත්තරයක් ඕනෑ. ගම්වල අය මේවා විශ්වාස කරනවා."

"මචං තව ටිකක් කල්පනා කරපං. උඹට කවදාවත් මේ තරම් ලස්සන කෙල්ලෙක් ලැබෙන එකක් නෑ. මේක දමන්ට කලින් ටිකක් කල්පනා කරපං. ඇඳුම් එක්ක මෙච්චර ලස්සන නම් අහා...!"

"දිව්‍යාංගනාවක් වුණත් මට එපා. මට මේ මඟුල කඩල දීපන්. ඒ ඇති."

"හරි මම මඟුල කඩල දෙන්නම්. මම හැන්දෑවට එන්නම්."

අසංක මිතුරාගේ අත තරයේ අල්වා ගනිමින් කීවේ ය.

ඉකුත් දින රැයේ වලනි අම්මාට හා තාත්තාට සිහිනෙන් දුටුවා ය. කාර්යාලයේ සිටිය දී ඇයට පිළිගැනීමේ නිලධාරිනිය වෙතින් කැඳවීමක් ලැබුණි. වලනි කරමින් සිටි කාර්යය නවතා

අමුත්තන්ගේ මැදිරියට ගියා ය. අම්මා හා තාත්තා කාමරයේ අසුන් ගෙන සිටිනු දුටු වලනිගේ සිතේ ඇති වුණේ සතුටකි.

වලනි පෞද්ගලික බැංකුවක කළමනාකාරිත්ව පුහුණුව ලබන විසි හැවිරිදි තරුණියකි. අගනුවර කාන්තා නේවාසිකාගාරයක නැවතී බැංකු කළමනාකරණය පිළිබඳව පුහුණුව ලබයි.

අම්මා හා තාත්තා කොළඹ පැමිණ ඇත්තේ අවන්ති අක්කාගේ මංගල උත්සවයට සහභාගි වීම සඳහා ය. නිවාඩු නැති නිසා වලනිට මංගල උත්සවයට සහභාගි වීමට නොපුළුවන.

වලනිගේ පියා වන බාල මහත්තයා උත්සාහ ගත්තේ දූවම ඉක්මනින් විවාහ කර දීමට ය. උසස් පෙළ විශිෂ්ට ලෙස සමත් වීම නිසා ඇයට බැංකුවේ රැකියාවක් ලැබුණි. ඇගේ එකම බලාපොරොත්තුව වන්නේ ද බැංකු ක්ෂේත්‍රයේ ඉදිරියට යාම ය. ඒ සඳහා තවත් ඉගෙන ගත යුතුය. එහෙත් පියා උත්සාහ කරන්නේ ඉක්මනින් තමා විවාහ කරදීමට බැව් වලනි දනියි. හැම නිවාඩු දවසකම ඇයට මනාලයෙක් ඉදිරියට යාමට සිදු වෙයි. දැන් ඇයට මේ නාඩගම එපා වී ඇත.

"අද නම් අම්මා ලස්සනයි. කාට කියල ද අන්දවා ගත්තෙ..?"

වලනි අම්මාගේ සාරිය සකස් කරමින් කිවා ය.

"අනේ මට කවුරු අන්දවන්න ද? මම ඇඳ ගත්තා."

ඇය අව්‍යාජව සිනාසුණා ය.

"දන්නද බාල අම්මා ඇඳලා හිටිය හැටි. මළසොහොන් සන්තියට ඇඳලා වගේ. තලන්ට ඕනෑ උන් එක්ක යන පිරිමින්ටයි."

"මොකද දෙන්නා හදිස්සියෙන්ම මාව බලන්ට ආවෙ...? මඟුල් ගේ හැරුණාම වෙනත් හේතුවක් තියෙනවද?"

වලනි සිනාසෙමින් ඇසුවා ය.



"දූවට විසිහතර. විසිපහ පෝයත් එක්ක දවස් තුනක් නිවාඩු නේද?"

"ඔව් නිවාඩු තමයි. ඇයි මනමාලියෙක් එනවද?"

ඇගේ කතාවට සැවොම එකවර සිනාසුනහ.

"මේවා අපේ යුතුකම්නෙ දූව."

බාල මහත්තයා වගකීමෙන් කීවේ ය.

"තාත්තෙ මට දැන්ම කරදර කරන්ට එපා. මේ බැංකු විභාග ඉවර වෙනකල් මට බඳින්ට බෑ."

"පොඩි දූව... මම ලෙඩා දුකා. මම කොයි වෙලේ පැත්ත වැටෙයි ද දන්නෙ නෑ. අපිට දූවලා පැනලා වැඩ කරන්ට පුළුවන් කාලෙ මේවා ඉවර කරන්ට ඕනෑ."

තාත්තාගේ කතාව පිළිබඳව කිසිම වාදයක් නැත. නිසි වයසේ දී ගැහැනු දරුවන් විවාහ කරදීම මවුපියන්ගේ යුතුකමකි.

විවාහයෙන් පසු නිරායාසයෙන්ම ගැහැනු ජීවිත වෙනස් වේ. තමා හා එකට ඉගෙන ගත් විවාහක මිතුරියන්ගේ ජීවිත දෙස බලන විට සිතේ ඇතිවන්නේ වේදනාවකි. බොහෝ පිරිමි විවාහ වන්නේ දෑවැද්දෙන් තමාගේ පෞද්ගලික කටයුතු කර ගැනීමට ය. ණය තුරුස් පියවා ගැනීම, වාහනයක් මිල දී ගැනීම දෑවැද්දෙන් කර ගැනීමට ඔවුහු සිතති. ඇතැම් පිරිමින්ට වෙනත් ගැහැනු සබඳතා ඇත. ඇතැමුන් බෙලහීනතාවයෙන් පෙළෙන රෝගීන් ය.

## 03

අම්මා හා තාත්තා මෙම මංගල යෝජනාව පිළිබඳව අභිරුචියෙන් කතා කරනු ඇසේ.

"පිරිස් කපුවා අපිට කවදාවත් බොරු කියන්නෙ නෑ. මනමාලයාගෙ පැත්තෙ අය අපි වගේමයි. අම්මයි තාත්තයි දෙන්නම මුල් ගුරුවරු."

"තාත්තෙ මම කසාද බඳින්න අකැමැති නෑ. මට මේ විභාග ඉවර කරගන්න කල් අවුරුදු තුනක් ඉන්න ඕනෑ."

"මගෙ මාරයා අවුස්සන්න එපා. අවුරුදු තුනක් යනකොට මම මැරිලා තියෙයි. අපිත් දරු මුනුබුරන් දකලා මැරෙන්ට ආසයි."

ඔහු උස් හඬින් කතා කර අසුනෙන් නැගිට එළියට ගියේ ය.

වලනී පහත් කරගත් හිසින් යුතුව නිහඬව සිටියා ය.

"හොඳට දේපල තියෙන ඇනාළඩකන්දෙ මිනිස්සු. බම්බලපිටියෙ ගෙවල් තියෙනවා. දත් වේයන්ගොඩ ලොකු ගෙයක් හදනවා."



"ඒ ළමයා හාබර් එකේ ලොකු රස්සාවක් කරනවලු. තව ලොකු විභාගෙකට ඉගෙන ගන්නවලු."

මට පිරිමි අරහත්. බසයේ යද්දී ඇඟට හේත්තු වන්නේ කිසිම ලජ්ජාවක් නැතිව ය. බසයේ අසුන් ගෙන සිටිය දී පපුව හිල් වී යන සේ බලන බැල්ම පිළිකුල් සහගත ය. නිවෙසට ගොස් බිරියගේ හැට්ටය ගලවා බැලුවත්, අම්මාට, ආච්චි අම්මාට, දූවට ඇත්තේ ද එකම ළැමකි. එවැනි ජඩයන් අතරින් එකෙක් විවාහ කර ගන්නා මෙන් කරන යෝජනා පිළිකුල් සහගත ය.

"මෙන්න අර කිව්ව ඉලන්දාරියාගේ පින්තූරේ. හොඳ ද බලන්න."

"ඔන්න ඔහේ තියලා යන්න අම්මා. මම පස්සෙ බලන්නම්."

"වරායෙ වැඩ කරන කොල්ලුපිටියෙ ද බම්බලපිටියෙ ද කොහේද ගෙවල් තියෙනවා කිව්වා."

"හරි හරී... ඔය කිව්වා ඇති."

අපි දන්නවා පිරිමින්ගෙ හැටි. වැලේ ගවුමක්, බ්‍රා එකක්, අන්ඩර්වෙයාර් එකක් එල්ලන්ට බෑ. කලවා දෙක බලන්න ගවුම උඩ යන කල් බලන් ඉන්න ලෙඩ්ඩු. මේ වාර්තාව ඇය අම්මාට පැවසුවේ නැත. ගැහැනු ළමයෙක් බාල කාලයේ සිට මුහුණ දෙන ජීවිත ප්‍රශ්නවලින් වැඩි කොටසක් තමාට ම පෞද්ගලික වූ අත්දැකීම් ය. ඒවා තවත් කෙනෙකුට පවසන්නේ නැත. කොයි පිරිමියත් එකයි.

පිරිමි නිසා කරදරේ වැටුණු ගැහැනු පිළිබඳ දුක් සහගත කතා ඇය දනියි. විවාහ වී පවුල් ජීවිත ගත කරන පිරිමි තමා අවිවාහක බව පවසා තරුණියන් ගේ ජීවිත සමග සෙමින් වෙලී සිටි කථා සුලබ ය. ගැහැනියකට වරදින්නට වැඩි වේලාවක් ගත වන්නේ නැත. එම වරද නිවැරදි කිරීමට කිසිදාක නොහැකි ය.

අම්මා දුන් ඡායාරූපය සහිත ලියුම් කවරය ගත්තේ ඇය අමනාප වේ යැයි සිතූ හෙයිනි. අම්මා ගියේ 25 වෙනිදාට එන බවට පොරොන්දු කර ගනිමිනි. නවාතැනට ගිය සැනින් ඇය ඇඳේ වැතිරුණා ය. ඈ දෑස් පියා මඳ වේලාවක් සිටියා ය. විවාහ වුවහොත් කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් සිදුවන පෙළගැස්මට යටත් විය යුතුය. කිට්ටුවම සිද්ධිය වන්නේ ගැබිනියක් වීම ය. ඉන්පසු ඉගෙනීමේ කටයුතු නතර කිරීමට සිදුවනු ඇත.

මඳ වේලාවක් ඇඳේ වැතිර සිටි ඇය යළි නාන කාමරයට ගියා ය. විවාහ වුණත් නැතත් මනමාලයා බැලීමට යා යුතුය. වැඳ ආචාර කර රස කැවිලි පිරිනමා සමුගන්නා නාටකීය අවස්ථාව හොඳට මතක ය.

මෙම යෝජනාව පිළිබඳ දෙදෙනාම උනන්දුවෙන් කතා කරන නිසා සිතේ තරමක් බියක් ඇති වෙයි. මනාලයා අකැමැති කරවා ගතහොත්... මෙය තනිව කළ නොහැකි ය. ඇඳුම් මාරු කර ඇය ඇඳේ වැතිරුණා ය.

එකවරම විදුලි පහන දැල්විණි. ඉසුරි කාමරයට ආවේ ප්‍රමාද විය.

''ඇයි කෙල්ලේ සනීප නැද්ද?''

ඉසුරි බෑගය හා කුඩය මේසය මත තබමින් චලනිගෙන් ඇසුවා ය.

මුණින්තලාව සිටින විට ලතාවකට උස්ව නැගී ගත් ගැහැනු සිරුර පෙනෙයි.

''ඉන්න හැටි. කොල්ලෙක් දැක්කොත් පිස්සු හැදෙයි.''

''හරියට අනිත් අයට එහෙම නෑ වගේ.''

චලනි කොට්ටය තුරුල් කර ගනිමින් කීවා ය.



ඉසුරි මේසය මත වූ ලියුම් කවරයේ ඡායාරූපය ගෙන බැලුවා ය.

''හේයි... කෙල්ලෙ මේ කවුද පින්තූරෙ ඉන්නෙ...? සුපිරි අලිබාන් වගේ ෆිල්ම්ස්ටාර් කෙනෙක් ද?''

කවරයේ වූ ඡායාරූපය චලනි දැක තිබුණේ නැත.

''කෝ දියන් බලන්ට. මම තාම දැක්කෙ නෑ.''

ඉසුරිගේ කෑ ගැසීම නිසා යාබද කාමරවල යුවතියන් පැමිණියහ.

චලනි ද ඡායාරූපය බැලුවා ය. ඔවුන් පැවසූ පරිදි මනමාලයා කඩවසම් ය. මුහුණේ වූ දළ රැවුල පෞරුෂය හෙළි කළේ ය.

''මේකා නම් හැන්ඩ් පොරක්. කොහේද වැඩ...?''

''පෝර්ට් ඕතෝරිටියෙ.''

''ඒයි චේතනා, චලනිට එපයි කියනවද?''

''ඒක තමයි මම අහන්නෙ. එපයි කියනවා නම් මට දෙන්ට කියපං.''

''ඒක තමයි මාත් කිව්වෙ. මේකව බැන්දොත් රෑට උයන්න ඕනැ නෑ. හාබර් බත් දෙකක් ගෙන්නා ගෙන කාලා තුරුල් වෙලා නිදාගන්ට පුළුවන්.''

ඔවුහු එකවර සිනාසුණහ.

''මම තව අවුරුදු තුනකට බඳින්නෙ නෑ. මට මේක කොහොම හරි නතර කරගන්ට ක්‍රමයක් කියපල්ලා. මට අම්මගෙ හිත රිද්දන්ට බෑ.''

මිතුරියන් මේ සාධාරණ ප්‍රශ්නය ගැන කථා කළහ.

''ඒ බෝයි මගෙ බෝයි ෆ්‍රෙන්ඩ් කියලා මම ඇවිදින් කියන්නම්.'' ඉසුරි කීවා ය.

''ඒකත් හොඳයි. මම වෙන බෝයි කෙනෙක් එක්ක යාළුයි කියන අදහස මේ බෝයිට දුන්නොත්.''

''තමුන්ගෙ කෙල්ලට සුළඟක්වත් වැදිලා නැත යන කාරි සිතුවිල්ලට පිරිමි කැමතියි.''

චේතනා කීවා ය.

''අපි කැලෑ පත්තරයක් ගහලා කොල්ලගෙ ගෙදරට දාමු. ගම්වල තවමත් කැලෑ පත්තර වැඩ කරනවා.''

එය ඉසුරිගේ අදහස විය.

''උඹ කොල්ලෙක් එක්ක ඉන්න පින්තූරයක් එක්ක දැම්මොත් නියමෙට වැඩ කරයි.''

චේතනා කීවා ය.

''ඒවා ඉසුරි කම්පියුටර් එකෙන් කරයි.''

''ඇඳුම් නැතිව ඉන්න පින්තූරයක් වුණත් සෙට් කරන්න පුළුවන්. සිම්පල් වැඩක්. දැන් මොනවද ලියන්න ඕනෑ.''

චේතනා ඇසුවා ය.

''මට වෙන කොල්ලෙක් ඉන්න බව කියවෙන්න ඕනෑ. මගෙ චරිතෙ හොඳ නැති බව මහමාලයට තේරෙන්ට ඕනෑ.''

සියල්ලම එක්ව සාකච්ඡා කළේ මඟුල කඩා දමන උපක්‍රම ගැන ය.

''ඔබ පෙම් කරනා ඔබේ කුමාරි මට ද ආදරේ කියා තිබේ.'' කියලා හෙඩිම දමමු.'' ඉසුරි යෝජනා කළා ය.

සැවොම කාලෝචිත අදහසට එකඟ වූහ.

''ඒට කාලා කැලෑ පත්තරයක් ලියල බලමු.



# 04

අඥාත වගේ සංවිධානයක් මගින් ප්‍රකාශයට පත්කරන විකල්ප පත්‍රයක මාධ්‍ය වේදියෙක් වශයෙන් සේවය කළේ ය. මාක්ස්වාදියෙකු වූ හෙතෙම දේශපාලන හා ආරක්ෂක තොරතුරු ඉදිරිපත් කිරීමේ හපන්කම් පෑ තරුණ මාධ්‍යවේදියෙකි. ඇත්ත වශයෙන් ම ඔහු සේවය කළ යුතුව තිබුණේ ජාතික පුවත්පතකට ය.

ප්‍රජාතන්ත්‍රවාදයට හා මාධ්‍ය නිදහසට පහර වදින අවස්ථාවල දී ඔහු අපක්ෂපාතීව ලිව්වේ ය. රජය ගෙනයන ප්‍රගතිශීලී සටන්වල දී ඔහු රජයට සහාය දැක්වූයේ ය. ඇතැම් දේශපාලන පක්ෂවලට අද අවශ්‍යව ඇත්තේ පොදු සතුරාට විරුද්ධව සටන් කිරීම නොව රජය පෙරළා දැමීමට ය. පත්‍රයේ වැඩ නිසා ඔහුගේ නිදහස සීමා වී තිබුණි.

ඒසේ වුව ද ඔහු ගවේෂ් කළ ඉල්ලීම ද ඉටු කළේ ය.

''සතා කැලෑ පත්‍රය ඉවරයි. ඇවිත් පාසල් එකක් බලපං.''

''කොහේට ද එන්නේ මාලගේට ද? ජනමාධ්‍ය මෙට ද? කෙල්ලගේ ගෙදරට ද?''

''මාලඹෙට එන්න එපා වස්තුව. මේ එනකොට කිව්ව එක අරන් වරෙන්.''

''වෙරි සොරි. මතට තිත තියලයි තියෙන්නේ. බුරියානි එකක් ගේන්නම.''

''ඕන් අදහස් නාවොත් මට මුකුත් කියන්ට එපා.''

''හරි හරි දිදාලෙකින් එකක් දෙන්නම.''

ගවේෂ්ට විවාහයක අවශ්‍යතාවක් නැත. විභාගය අවසන්ව පිටරට සවාරියක් ගොස් මුදල් ටිකක් සොයා ගැනීමට ඔහු සිතා සිටියේ ය.

අසංක මනාලියගේ නිවසට යැවීම සඳහා ගැළපෙන කැලෑ පත්තරයක් සැදුවේ ය.

''මහත්මයාණෙනි' මෙම කාමුකයාගෙන් ඔබේ දුව බේරගන්න. ගැහැනු දරුවෙකු විවාහ කරදීමේ දී හඳහන් ගැළපීමට වඩා ඔහුගේ චරිතවත් බව සැළකිය යුතුය.

පූහ්... මෙන්න බැණාගේ තරම ගැනු දෙන්නේ මුන්ටද?

ගවේෂ් අඩ නිරුවත් ගැහැනියෙක් ළඟ සිටින ඡායාරූපයක් ගැළපෙන ලෙස යොදා තිබුණි.

''ලෝසුරා සුරයන්ගේ සුරා'' ඔබේ දුව විවාහකර දෙන්න යන්නේ මෙවන් බේබද්දෙකුට ද?

ගවේෂ් දුම්වැටියක් මුවේ රදවාගෙන අතින් අතින් මත්පැන් වීදුරුවක් අතේ තියාගෙන ඉන්නා රූප රාමුවක් විය.

කොටුවේ ප්‍රෙස් ක්ලබ්, ආමර්වීදිය, මැලිබන් වීදිය, බොරැල්ල වැනි ආපනශාලාවල යාවජීව සමාජිකයෙකු ලෙස ලිපියේ සඳහන් විය.



හැන්දෑවට ගෙදර එන්නේ හතර ගාතෙන් බවත් ලියා තිබුණි. සේවා ස්ථානයේ මුදල් හොරකමකට වැඩ තහනම් කළ අයෙක් ලෙස ද චරිත සහතිකයේ විය.

ගවේෂ් සැඳෑ සමයේ අසංක හමුවීමට නවාතැනට ගියේ ය.

''කොහොමද වැඩේ..?''

''සනා මේ වැඩේ කරන්ට කලින් පොඩි අවවාදයක් දෙන්ට ඕනෑ.''

''මට අවවාද දෙන්න උඹ කවු ද? හා හා කියන දෙයක් කියපං.''

''එවං තරහකට කියනවා නෙවේ. මම මේ කියන්නේ මේ කෙල්ල උඹට ගැළපෙනවා කියලයි. සමහරවිට මේ ඉන්නේ උඹේ ගිම්කාරී වෙන්න පුළුවන්. බලපං මූණේ ලස්සන. මොනවයින් ද අඩු. කැත නැතිව මගේ බඩු කැල්ල කියලා තැනකට එක්ක යන්ට පුළුවන්.''

''මගේ ගිම්කාරි මම වෙලාවට හොයා ගන්නම් උඹට තියෙන්නේ මම කිව්ව දේ කරන්නයි.''

''මම මේ හදලා තියෙන ලිප්ලට් එක යැව්වොත් පුවර් එකට මඟුල නතර වෙනවා.''

''මට ඕනෑ එච්චරයි. කෝ පෙන්නපං.''

තිහඬව මිතුරාව කොම්පියුටරය වෙත කැඳවාගෙන ගිය අසංක වර්ණ පිටපතක් ගත්තේ ය.

''උඹේ ඉල්ලීමටයි මේ වැඩේ කළේ.''

වර්ණ පිටපත අතට ගත් ඔහු එය ඕනෑකමින් කියවා බැලුවේ ය. පැහැදිලිවම එය හොඳ රචනයකි. එය දුටු විගස මනාලිය යෝජනාවට අකමැති වනු ඇත. මෙවන් කැලෑ පත්‍රයක් දකින

මනාලියගේ මවුපියන් තම දූව විවාහ කරදීම සම්බන්ධයෙන් බුද්ධිමත්ව සිතනු ඇත.

''දාපං අත. ඉට්ස් ඒ මාස්ටපීස්. ෂුවර් එකට මඟුල කැඩෙනවා.''

ගවේෂ් සතුටෙන් කෑගැසුවේ ය.

''මචං ගවේෂ් මම නම් කියන්නේ මෙකයි. උඹට තියෙන ප්‍රශ්නේ එග්සැම් එකනේ. විභාගෙන් පස්සේ බඳිමුයි කියලා කතා කර ගනින්. මම නම් කියන්නේ ඒක තමා හොඳම වැඩේ.''

''මචං මට මඟුල් එපා.''

ඔහු ඡායාරූපය ළඟට කර බැලුවේ ය.

''පිස්සු හැදෙන සද. මේ බලපං කෙල්ලගේ ලස්සන. දෙකක් නෑ ෂුවර් එකට ලස්සන පස්සක් ඇති. මචං ජේන හරිය මෙච්චර මෙහෙම නම් අනිත්වා කොහොම ඇද්ද?''

ඔහු ගවේෂ් ගේ උරහිසට ගසා සිනාසුනේ ය.

''අසංක මම උඹගෙන් උදව්වක් ඉල්ලුවා. උඹ ඒක කළා.''

''මචං අපි වෘත්තිය කලාකාරයො. ගෑනියෙක් දැක්ක ගමන් කොහොමද කියලා කියන්ට පුළුවන්. මෙකි හරි පින්පාටයි මචං. අතින් ගිලිහුනොත් ආයේ මේ වගේ රෝස මලක් අල්ලනු බොරු.''

''එච්චර හිත ගියා නම් උඹ සෙට්කර ගනිනි.''

''දූන් ඇඳගෙන යන මගේ ගල්රෝල නැත්තම් ෂුවර් එකට අල්ල ගන්නවා. මචං මෙච්චනේ තියම සුදු කෑලි.''

මවුනතර නිහඬ බවක් ඇති වුණි.

''කොහේද කෙල්ල වැඩ කරන්නේ.''



''ප්‍රයිවට් බැන්ක් එකක.''

''හා එහෙනම් ලියුම් ටික බැංකුවටයි ගෙදරටයි දානවා. කමක් නැද්ද?''

''කිසි ප්‍රශ්නයක් නෑ. උඹ කැමති විදිහක්.''

''හැබැයි පුතෝ..... කෙල්ල නැති වුණේ මා නිසයි කියන්ට එපා.''

ඔව්හු අත්ගසා සමුගත්හ.

# 05

වලනිට සහාය දීම සඳහා කාන්තා නේවාසිකාගාරයේ මිතුරියන් සාකච්ඡාවක් පැවැත්වූහ. කිසිම පිරිමියෙක් තම බිරියට, පෙම්වතියට අනියම් සබඳතාවක් ඇතැයි ඇසීමට කැමැති නැත.

පිරිමි යනු පැහැදිලිවම ආත්මාර්ථකාමී පිරිසකි. අනන්ත දුර්වලකම්වලින් පිරී හැකිනාක් අනියම් සබඳතා, පෙම් සබඳතා පවත්වා තිබුණත් සුළඟක්වත් නොවැදුන අහින්වන් නොඇල්ලු කනාවියක් පතති.

"දැන් අපි වලනිගේ වැඩේට මොකද කරන්නේ."

සැඳෑ තේ පානයට රැස් වූ තරුණියන් සාකච්ඡා කළහ.

"මම මේ ගැන තාදුන් එක්ක කතා කළා."

ඉසුරි කීවා ය.

"තාදුන් මොකද කියන්නේ..?"

වාසා ඇසුවා ය.

"ගැහැණු ජීවිතයක් එක්ක සෙල්ලම් කරන්න එපා කියලා මට බැන්නා."

ඉසුරි කීවා ය.

"කතාව අපිටත් තේරෙනවා. මෙකිට හාබර් බත් එකක් කාලා කොල්ලුපිටියට වෙලා ඉන්න පින නෑ."

"උඹලට ඕන නම් සෙට් කර ගනිල්ලා. මම කතා කරලා දෙන්නම්."

"හා... හා උඹලා පැටලෙන්නේ නැතුව හිටපල්ලා. අපි දැන් මේ මඟුල නතර කරන ක්‍රමයක් කතා කරමු."

ගැහැනු අනිවාර්යයෙන්ම විවාහ විය යුතු යැයි නීතියක් නැත. විවාහ නොවී සිටින කාන්තාවන් ඕනෑ තරම් ඇත. විවාහ වීම හොඳ යැයි හෝ නරක යැයි පැවසීමට කිසිවෙකුට පුළුවන්කමක් නැත. එය තැනැත්තියක් සතු සිවිල් අයිතියකි. ආරක්ෂාව සඳහා විවාහ වන්නේ යැයි පැවසීමේ කිසි පදනමක් නැත. අවසාන කාලයේ දුක සැප බැලීමට දරුවන් සිටිය යුතුය යන්නේ කිසිම තර්කානුකූල භාවයක් නැත.

අද බොහෝ දරුවන් විදේශගතව ජීවත් වෙති. තාත්තාගේ අම්මාගේ අවසාන අවස්ථාවට දරුවන්ට එන්ට පුළුවන් කමක් නැත. තාත්තාගේ හෝ අම්මාගේ ප්‍රාණකාරයාට පින් පිණිස ලන්ඩන් විහාරයට, ප්‍රංශයේ, ඕස්ට්‍රේලියාවේ පන්සලට දානයක් දී පින් පැමිණවීම වැනි චාරිත්‍රයක් පවත්වනවා හැර වෙන කළ හැකි දෙයක් දරුවන්ට නැත. කැත කුණු අත ගෑ පව යන්ට වත් සමත් කිරීමට ඔවුනට පුළුවන් කමක් නැත. මේ පිළිබඳව දූ දරුවන්ට දොස් පැවරිය නොහැකිය. ජීවත් වීම යනු එක්තරා අරගලයකි.

විවාහයකින් තදබල සමාජ ආරක්ෂණයක් සිදුවන්නේ නැත. හොඳට විභාග පාස්කර රැකියාවේ උසස් තත්ත්වයකට ගියහොත් ජීවිතයේ අවසාන කාලය හොඳින් ජීවත් වීමට පුළුවන. අද මුදල් හැකිව කිසිවක් කළ නොහැකිය. ඔවුන් මේ බැඳීදැයින් කතා කරමින් සිටින්නේ වලනීගේ විවාහය නතර කිරීම ගැන ය.

"උඹ නඳුන්ට වලනිගේ තත්ත්වය කිව්වෙ නැද්ද?"

චාපා ඉසුරිගෙන් ඇසුවා ය.

"මම කිව්වා. එතකොට නඳුන් කිව්වා සමහරවිට මේ එන්නේ වලනිගේ ඉරණම්කාරයා වෙන්න පුළුවන් කියලා."

"මේ නඳුන්ට පිස්සු නටන්ට එපා කියපං. ඉරණම්කාරයා...! ඒකි කැමැති නැත්නම් මොනවා කරන්නද?"

"මේ ඉසුරි අපි වලනී කියන දේ කරල දෙමු. අතට දෙන දේ කටට දමා ගන්ට වාසනාව තියෙන්ට ඕන."

නඳුන් ආවේ මංගල්‍ය නතර කිරීම සඳහා වූ නව යෝජනා රැසක් ඇතිවය. ඉසුරි දුන් විස්තර අනුව නඳුන් හොඳ වාර්තාවක් සාදාගෙන ඇවිත්ය. සීඩී තැටියට ගත් විස්තරවලින් මුද්‍රණ පිටපතක් ගත්තේ ය.

"මේක හොඳ ද බලන්න...?"

නඳුන් වර්ණ පිටපතක් ගෙන ඉසුරිට දුන්නේ ය.

"ඔබ පෙම් කරනා ඔබේ කුමාරී" හෙඩිම නව ශිල්පීය ක්‍රම අනුව සකස් කර තිබුණි.

නඳුන් හා වලනි හෝටලයක සිටින ප්‍රේමණීය දසුන සිත් ගන්නාසුලු ය. වේදිකා හා රූපවාහිනී නළුවෙකු වන නඳුන් සිය කොටස මනා ලෙස රඟපා තිබුණි.

"කෙල්ලෙ වලනියි නඳුනුයි ඉන්න මේ පින්තූරේ කොල්ලා දැක්කොත් වන බොයි."

මහත්මයාණෙනි,

ඔබ විවාහ කර ගැනීමට යන මෙම ගැහැනිය කලක් මට ද ආදරය කර තිබේ. අත්තෙන් අත්තට පනින මෙවන් ගැහැනියෙක් ඔබට ගැළපේදැයි බලන්න.



නාන ඇඳුමින් සැරසී සිටින වලනිගේ රූව දෙස ඉසුරි බලා සිටියා ය.

ගමේ සිටිය දී වත්ත පහළ ළිඳෙන් තනපට හැඳ දිය නැවා හැර නාන ඇඳුමකින් සැරසී නාන තටාකයක හෝ මුහුදු වෙරළේ දිය නා නැත. ඇඳුමක් නැතිව දිය නැවේ නාන කාමරයේ දී පමණි. මනස්කාන්ත ඡවි කල්‍යාණයෙන් යුත් වෙනත් ගැහැනියකගේ යටි කයට වලනිගේ මුහුණ සවිකර තිබුණි.

"හරි දැන් මෙන්න මෙහෙමයි වෙන්නෙ. අපි කොල්ලගෙ තාත්තගෙ නමට ලියුමක් දානවා. අනික කොල්ලා වැඩ කරන වරායෙ ඔෆිස් එකට යවනවා."

"අපිට මේවා තේරෙන්නෙ නැහැනෙ. නඳුන් ඔයා හොඳ විදිහක් කරන්න."

ඉසුරි කීවා ය.

"අපි මොනවා කළත් වලනිගේ ප්‍රශ්නයක් නෑ නේද?"

චාපා ඇසුවා ය.

"කිසි ප්‍රශ්නයක් නෑ. ඔයාලට කැමති දෙයක් කරන්ට. වලනිට ඕනෑ මේක නතර කර ගන්නයි."

"මේක සරල කටයුත්තක් කියලා හිතන්ට එපා කියලා කියන්න. කෝ වලනී...?"

"වලනී බැන්ක් එග්සෑම් එකට හැන්දෑවෙ පන්ති යනවා. එන්ට රෑ වෙනවා."

"මේවායින් හොඳ ප්‍රතිඵල වගේම නරක ප්‍රතිඵලත් ලැබෙන්ට ඉඩ තියෙනවා. හරියට ඔපරේෂන් එකක් කරනවා වගේ."

නඳුන් මිතුරියන්ට තත්ත්වය පැහැදිලි කර දුන්නේ ය.

''වලනි වීක් එන්ඩ් එකේ ගමට යනවා.''

''හරි කිසි දේකට බයවෙන්ට එපා. වලනි යනකොට මඟුල කැඩිලා තියෙයි. ඔකේ දෙන්. ගුඩ් නයිට්.''

නදුන් සමුගෙන යන්ට ගියේ ය.

වලනි බැංකු පන්තියට ගොස් එනවිට තරමක් රෑ බෝ වී තිබුණි. ඇය පොත් පසෙක තබා ඇඳුම පිටින්ම ඉසුරිගේ ඇඳේ ඉඳගත්තා ය.

''නදුන් ලියම යැව්වද?''

''කිසි දේකට බයවෙන්ට එපා. ඒවා හිතට හෙරෙයි.''

''නදුන් මොකද කියන්නේ...?''

''මේක හරියට බබෙක් හම්බ වෙන්න යනවා වගේ වැඩක් කිව්වා.''

වලනි දිඟු සුසුමක් හෙළුවා ය.

''මට බය තාත්තා ගැනයි. හාට් පේෂන්ට් කෙනෙක්.''

ඇය තමාට කියා ගත්තා ය.

''ඔයාට හෙට ගෙදර යනවද?''

''ඔව්. නොගිහින් බැහෙ. තාත්තට එනවා කියලා පොරොන්දු වුණානෙ. මට බයත් එක්ක.''

''නදුන් කිව්වෙත් ඒක තමා. ගැහැනියෙකුට කවදා හෝ මෙම ප්‍රශ්නයට මුහුණ දෙන්ට සිද්ධ වෙනවා.''

''මම නැහැ කියන්නෙ නැහැ.''

''එතකොට වලනි කවදාවත් බඳින්නෙ නැද්ද?''



''ඔව් මම බඳින්නෙ නෑ. කසාදයක් බැඳීමකින් වෙන්නේ ජීවිතයේ ප්‍රශ්න වැඩිවන එකයි. හොඳ මිනිහෙක් ලැබුණොත් හොඳා. නැතිනම් විවාහයක් කියන්නේ සිරගෙයක්.''

''ජීවිතය තර්කයෙන් හඳුනා ගන්ට බෑ. ඒක ජීවත් වෙලාම දැන ගන්ට ඕනෑ.''

''මම හෙට ගිහින් ඇවිදින් විස්තරේ කියන්නම්. උඹල කළ උදව්වලට තැන්ක් යූ වෙරි මච්.''

## 06

බාල මහත්තයා වලනිට විවාහ යෝජනාවක් ගෙන ඒමට වෙහෙසුණේ ඇගේ හදහන එතරම් හොඳ නැති බැවිනි. දෛවඥයන් පැවසුවේ මෙම හදහනට ගැළපෙන පිරිමි හඳහනක් සෙවීම පහසු නැති බව ය. හෘද රෝගියෙක් වූ බාල මහත්තයා මිය යාමට ප්‍රථම දුවට හොඳ විවාහයක් කර දීමට වෙහෙසුණේ ය.

පීරිස් කපුවා ගෙනෙන ලද හඳහන රැගෙන් බාල මහත්තයා හෙන්ඩියගල වෙද හාමුදුරුවන් හමුවීමට ගියේ ය. වෙද හාමුදුරුවෝ පැවසූ කිසිවක් මෙතෙක් බොරු වී නැත. උන්වහන්සේ හිස අතගාමින් හඳහන පරීක්ෂා කර බලා සිනාමුසු මුහුණින් එය පසෙක තැබුවේ ය.

"පුදුමාකාර හඳහන් දෙකක්."

"ඇයි අවසර ඒ හඳහනත් ගැළපෙන්නෙ නැද්ද?"

ඔහු දුක්බර හඬින් ඇසුවේ ය.

"බාල මහත්තයට මම කිව්ව නේද කලබල වුණොත් කොරස්සටෙත් අතදාන්ට බෑ කියලා. මෙන්න ඉරණම්කාරයා ඇවිදින්."



"මොනවා අවසර. හඳහන් දෙක ගැළපෙනවද?"

"ගැළපෙනවදත් අහනවා. මේ දෙන්නා ආත්ම ගාණක් එකට ජීවත් වෙන්න පෙරුම් පුරාගෙන ආව දෙන්නෙක්. කොහොමද මේ පිරිමි හඳහන හම්බ වුණේ...?"

බාල මහත්තයා තෑග්ගක් ලැබුණු කුඩා දරුවෙක් මෙන් හික්ෂුව දෙස මුව අයා බලා සිටියේ ය.

"සුළු සුළු ප්‍රශ්න එයි. මේ දෙන්නා කවදාවත් වෙන් කරන්නත් බෑ... දෙන්නා වෙන් වෙන්නෙත් නෑ."

දුවට හොඳ මංගල යෝජනාවක් පැමිණීම පිළිබඳව වලනිගේ මවුපියන් සතුටු වූහ. අල්ලපු වැටේ සිටින්නේ බාල මහත්තයාගේ ලොකු අයියා ය. එවැනි දුර්ජන මිනිහෙක් මුළු ගාල්ලට ම නැත. පවුලේ සියලු සැප වින්දේ ඔහු ය. තාත්තා වැඩියෙන් ම ආදරේ කළේ ඔහුට ය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබ පරිපාලන සේවයට ඇතුළ් වූ පසුව විවාහ වූයේ ධනවත් පවුලකිනි. විවාහය සඳහා බැංකු ණයක් ගැනීමේ මාර්ගයෙන් මෙහෙතම පවුලේ බාලයා වන රංජිත් මල්ලිට හිමිවිය යුතු ඉඩම ලියවා ගත්තේ ය. ඔහු විවාහ වූයේ ප්‍රේම සම්බන්ධයක ප්‍රතිඵලයක් වශයෙනි. පවුලේ නෑදෑකම් සහෝදරකම් නැත්තට නැතිව ගියේ ඒ 'පරට්ටි' පැමිණි පසුව ය.

මේ ඊර්ෂ්‍යාකාර නෑයින් බලා සිටියේ වලනිට විවාහයක් කරදීමට බැරිවන තෙක් ය. විවාහයේ ප්‍රශ්න ඇතිවන බැව් 'කොටහලු' නැකතේ ඇතිබව ඔවුනු දන සිටියහ.

අයියාගේ ගෙදර මඟුල් කීපයක් සිදු වුණත් ඉන් එකකටවත් බාලමහත්තයට හෝ පවුලේ බාලයා වන රංජිත් මල්ලිටත් කිව්වේ නැත. ගලදාරි, හිල්ටන්, ටාජ් වැනි කොළඹ මහ හෝටල්වල ගත් උත්සවවලට ආරාධනා කර තිබුණේ ගාල්ල, මාතර ධනපතීන්ට පමණි. කවදා හෝ හොඳ තැනකට දුව දීමේ බලාපොරොත්තුවක් බාලමහත්තයාගේ සිතේ තිබුණි.

ඇඟිලි පහම එක සමාන නැත. ලොකු මහත්තයා වන අයියා විශ්වවිද්‍යාලයට පිවිස පරිපාලන සේවයට බැඳුණත් බාල මහත්තයාට එතරම් දුර ඉගෙනීමට නොලැබුණේ තාත්තා මිය ගිය හෙයිනි. බාල මහත්තයා ජ්‍යෙෂ්ඨය සමත්ව ගුරු විද්‍යාලයකට ඇතුළත්ව විදුහල්පතිවරයෙක් දක්වා උසස් වීම ලැබුවේ ය.

හිච්චි මල්ලී වන රංජිත්ගේ ඉගෙනීම කඩාකප්පල් වුණේ තාත්තාගේ මරණය නිසා ය. පාසල් ගමන අතරමඟ නතර කළ ඔහු වැල්ලේ මිතුරන්ගේ කල්ලියට වැටුණේ ය. මැර කල්ලිවලට සම්බන්ධව සිටීම නිසා ඔහුට නගරයේ කළ නොහැකි දෙයක් නැත. ඔහුට මාළු බෝට්ටු කීපයක් හා කඩ බක්කි තුනක් හිමි ය.

රංජිත් මල්ලී කෙතරම් දරදඬු පුද්ගලයෙක් වුවත් බාල මහත්තයාට කීකරුය. ඔහු ලොකු අයියාව සතේකට ගණන් ගන්නේ නැත. හෙතෙම කුඩා කල සිට වලනිට ආදරය කළේ ය. කාට අමතක වුණත් දූවගේ උපන් දිනය රංජිත්ට මතකය. දූවගේ වැදගත් දවස මල්ලීට මතක් කළ යුතුමය. බාල මහත්තයා හිච්චි මල්ලී හමුවීමට මාළු ලැල්ලට ගියේ ය.

"රංජිත් මහත්තයා ඉන්නවද?"

"ම්... මේ අපේ ඉස්කෝලෙ සර්නෙ. ඩික්සන්... අපේ හිච්චි මහත්තයා ඉන්නවද බලපං."

"රංජිත් මුදලාලි කාමරේ අහ යනවා කියලා ගියා."

"දොරේ එහෙම නම් මේ වෙලාවෙ යන්ට එපා. සළු වෙලා ඇති. දන්නවනෙ"

"ඒ වුණාට කමක් නෑ. අයියා ඇවිදින් කියමු. බාල මහත්තයා ඇවිදින් කියමු."

මාළු බක්කියේ රංජිත්ගේ අතවැසියෙක් බාල මහත්තයාව ඔහු සිටිනා කාමරයට කැඳවාගෙන ගියේ ය.



ගෝලයා බය පක්ෂපාතීව දොරට ගැසුවේ ය. එක්වරම සිංහයෙක් නැගසන හඬ ඇසුණි.

"මුදලාලි... මේ මුදලාලිගෙ අයියා ඇවිදින්."

"රංජිත්... මම මේ අයියා."

"අඩියක් ගහලා ඉන්නකොට ප්‍රසිඩන්ට් ආවත් දොර අරින්නෙ නෑ."

ගෝලයා පහත් හඬින් කීවේ ය.

කිසිදාක බාල මහත්තයා මෙවැනි අපූර්ව මිනිසුන් ගැවසෙන තැනකට පැමිණ නැත. මඳ වේලාවකට පසු කාමරයේ දොර විවෘත වුණි. කොට කලිසමකින් හා ස්කිනියකින් සැරසී සිටි රංජිත් දොර විවෘත කළේ ය. ඔහුගේ උරහිසේ 'අම්මා' පච්චය දිස්වුණි. බාල මහත්තයා එකරවම මල්ලීට කතා කළේ නැත. අයියාව දුටු සැණින් වෙරි සිඳී ගිය බවක් රංජිත්ට දැනුණි.

"යමු අඩියෙ ඇතුළට."

ඔහු ගෞරව පෙරදැරිව කීවේ ය.

"මට ඉක්මනින් යන්ට ඕනෑ. මෙහෙම හොඳා."

"යමු ඇතුළට මොනවා හරි කාලා යමු. ඒයි ගැමුණු, සජිත්, නිහාල්, ඩික්සන් මෙහෙ වරෙල්ලා. මේ ඉන්නෙ මගෙ බුදු අයියා."

"දිසාපති ද?"

"ඒ මෝඩයා නෙමේ. මේ ඉන්නෙ මගෙ පොඩි අයියා. මගෙ දෙවියෝ."

සැමවාම ගෞරව පෙරදැරිව රංජිත්ගේ පොඩි අයියා දෙස බලා උන්හ.

"බොරු සිංහල උගන්වන සමහර ටියුෂන් හොරු වගේ නොවේ, මේ ඉන්නෙ ගුරු දෙවිවරු. යූ නෝ හි වෝස් රිටයඩ් ප්‍රින්සිපල්. ගිහින් මට කියලා විකන් කොත්තුවක් දාගෙන වරෙන්."

"නෑ මල්ලි එපා. කෑවා වගේ සන්තෝසයි. මල්ලි 25 දා ගෙවල් පැත්තෙ එන්ට ඕනෑ."

"මොනවත් හදිස්සි උත්සවයක් ද?"

"උත්සවයක් නෙවේ. පොඩි දූව බලන්න මනමාලයෙක් එනවා."

"ඉතින් ඒක උත්සවයක් නේන්නම්. මගෙ කෙල්ලට මඟුලක් හරියන්නෙ නෑ කියලා හතර වටේ ඉන්න නෑයෝ සන්තෝසෙන් හිටියා. මෙක අපිට මඟුලක් තමා."

"ඔව් ඒක ඇත්ත. මම හෙන්ඩිගල නායක හාමුදුරුවන්ට හඳහන් දෙක පෙන්නුව. පෙර ආත්මෙක ඉඳන් පතාගෙන ආපු දෙන්නෙක් කිව්වා."

"නායක හාමුදුරුවෝ කිව්ව නම් තවත් මොනවද අයියෙ මේ කටයුතු ස්ථිර වෙනකල් මේ ගැන කිසිම කෙනෙකුට කියන්ට එපා. අල්ලපු වත්තට ලීක් වෙන්ට ඉඩ තියන්ට එපා. උන් කැලෑ පත්තර ගහයි."

"අක්කා කිව්වෙත් ඒක තමා."

"මගෙ කෙල්ලට විරුද්ධව මොනවා හරි කිව්වොත් අල්ලපු වත්තෙ එවුන්ව මම ඩාවනවා. මේ වැල්ලෙ එවුන්ට එක සින්නල් එකක් දුන්නොත් 'බිලයා' කපනවා වගේ පෙකී ගහයි."

"ඒක කියන්ටත් එක්කයි ආවෙ. හොඳින් හැසිරෙන්ට ඕනෑ. නිරම සමරජීවට කිව්වා, වලස්මුල්ලෙ ගෙදරට කිව්වා, උඩුමලගල චමින්දට කිව්වා."



"අයියේ කෑම බීම මා ගානෙ. ඉස්සො, දැල්ලො. මාළු කිරට විරිසට මම මෙහෙන්ම හදාගෙන එන්නම්. වල් ඌරුමස් ලැබුණොත් ගේන්නම්."

"මල්ලිට කැමති විදිහක් කරන්ට."

"එන අය කොයි වගේ ද දන්නෙ නෑ. සයිඩ් බොන්ඩ දේකුත් ලෑස්ති කරමු. අයියා සද්ද නැතිව ඉන්ඩකො මම ඒක ලෑස්ති කරන්නම්."

## 07

පොඩි දුවට විවාහ යෝජනාවක් පැමිණීම පිළිබඳව රංජිත් සතුටට පත්ව සිටියේ ය. ලොකු අයියාගේ නිවසේ මඟුල් කීපයක් ගත්තත් හෙතෙම පවුලේ බාලයා වූ රංජිත්ට ආරාධනා කළේ නැත. එවැනි ජඩයෙක් ගාලු දිස්ත්‍රික්කයටම නැත.

හැමදෙනාටම පෙන්නන්න දුවගේ මංගල උත්සවය ඉහළින්ම ගැනීමට රංජිත් සිතුවේ ය.

''හිච්චි අයියේ කොල්ලා වැඩ කරන්නේ කොහේ ද?''

''එලිසෙබෙත් ජැටියේ''

''අහා එහෙනම් අහන්ට දෙයක් නැහැ. හොඳට හම්බ කරන කන බොන එකෙක් වෙන්ට ඕනෑ. ඩියුටි ෆ්‍රී බඩු හම්බ වෙනවා ඇති. කොහෙද ගෙවල්...?''

''ඉන්නේ බම්බලපිටියේ. දුන් වේයන්ගොඩ තට්ටු දෙකේ ගෙයක් ගහනවලු. තව දිවුලපිටියෙ ඉඩම්කඩම් තියෙනවලු.''

''දේපල තියෙන වැදගත් මිනිස්සු.''



''හාබර් එකේ වැඩ කරනවා නම් සල්ලි හම්බ් ගහලා ඇති. ඇයි අයියේ ගනමනාව හම්බ වෙනවනේ.''

ගවේෂ්ගේ මනාලිය බැලීමට යාම සඳහා බාල සොහොයුරිය වන බේමා ද ආවා ය. සංගීත ගුරුවරියක වන 'බේමා' විවාහ වී සිටින්නේ බැංකු සේවකයෙක් සමඟිනි. සෙනරත් මෙම ගමනට ආවේ විනෝද ගමනකුත් යොදා ගනිමිනි. උණවටුනට ගොස් පසුදින බූස්සේ සිටින අවන්තිගේ නිවසට යාමට ද සැලසුම් කර තිබුණි.

''අම්මා... මනමාලි ලස්සන ද?''

බේමා මවගෙන් ඇසුවා ය.

''පින්තූරේ හැටියට නම් මූණ කට හැඩයි. ලස්සනයි.''

''පුදුමයි ඔයාලගේ අයියා මනමාලියෙක් බලන්න යන්න කැමැති වුණා. මම නම් හිතුවේ පොර මහණ වෙයි කියලයි. හනිමූන් ගියත් ගැනිට නිදාගන්න කියලා පොතක් බලයි.''

''ඔයා මහා කුපාඩියෙක්. අපේ අයියා හරි හොඳයි.''

''ගැනු මහලොකුවට උඩ පැනගෙන එන්නේ ඕකටනේ.''

''අම්මට ඇහෙනවා. නැත්නම් මම කියනවා බෑණාගේ තරම. කිසිම අනුකම්පාවක් නැතිව මට වද තිස්දෙකම දුන්න හැටි.''

ඇය ව්‍යාජ අමනාපයක් අඟවා සෙමින් පහරක් ගැසුවා ය.

''බැන්දට පස්සේ කවදාවත් හරියට නිදාගන්න ලැබුණේ නෑ.''

''අපටත් මෙච්චර හොඳ පාඩම් මීට පස්සේ මම ඇඟටවත් අත තියන්නේ නෑ.''

''මම නැතිව ඔයාට නිදන්න බැරි වින්නිය මම දන්නවා. ඒත් මම අද අම්මා ගාව.''

"මම නරක මිනිහා කියන්ට එපා."

"අද විතරයිනේ සෙනේ. මම නැතිව දවසක් ඉන්ට බැරිද?"

"මේ සීතලේ මට තනියම නිදන්ට බෑ."

"බලන්න අයියා."

"අපි විවාහට අවශ්‍ය දේ ඉල්ලනවා. ඉල්ලන දේ ලබාගන්නවා. ඔයාලගේ අයියා ලෝක කට්ටයෙක්."

"මෙන්න අයියා එනවා."

"ඔන්න බලන්න කතා කරන දේවල්. විභාග ගැන කතාකරයි."

"කොහොමද මචං...?"

ගෙවීෂ් මස්සිනාගේ පිටට ගසමින් සිනාසුනේ ය.

"අපි මනමාලි බලලා මුදේ තාලා......"

"උඹ අර ඕශ්රියට රෙජිස්ටර් වෙන්නේ නැද්ද?"

සෙනෙවි බෑමා දෙස බලා සිනාසුනේ ය.

වලනි නිවසට යනවිට හොඳටම රෑ බෝවී තිබුණි. කැලෑ පතුය පැමිණ තිබුණා නම් තත්ත්වය මීට වඩා වෙනස් විය හැකිව තිබුණි. නිවසේ අයට මෙය පැහැදිලිවම උත්සවයකි. කිරම සමරවීර මාමා පවුලේ සිටින වැදගත්ම පුද්ගලයෙකි. හේ කෙළින්ම ආවේ ය. වලස්මුල්ලේ අබේවික්‍රම පවුලේ අයත් ඒමට නියමිත ය. රංජිත් බාප්පා ඉස්තරම් වර්ගයේ දූල්ලන්, ඉස්සන් ගෙනවිත් තිබුණි. කෑම ඔහු ගානේ ය.

නිවෙසට රැස්ව සිටි නෑදෑ පිරිස දකීමෙන් වලනිගේ සිතට පිවිසුනේ අසතුටකි. නාගරයේ බාප්පාගේ සුපවේදීන් රාත්‍රියේ සිටම කෑම පිසින සුවඳ නැහැයට දැණුනි.



සියල්ල අමතක කර ඇය නිදාගන්නට වෙර දැරුවා ය. වැඩි දිමකින්වත් මේ මනුස්සයා මාව බලන්න ආවොත් කිසි සැකයක් නැතිව විවාහ වීමට සිඳුවනු ඇත. ඉන්පසු සිඳුවන්නේ බඩකූත් උස්සාගෙන බස්වල දුම්රියවල එල්ලී ඇවිදීමට ය. විවාහ වූ පසු නෙහෙට්ටුවකට අමාරුවකට සැමියා නිසා නිදාගන්නට නොලැබෙනවා වගේම දරුවන් නිසාම මවුවරුන්ගේ ජීවිතය වෙනස් වෙයි. දරුවන් නැගිට කෑගසන්නේ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙනි. රෑට නෙමාගතහොත් පිබිදිය යුතුය. කුසගිනි වූ විට දරුවන් පපුවේ එල්ලෙති. පිරිමින් පපුවෙ එල්ලෙන්නේ වෙන අදහසකට මුල පිරීමට ය. සුළු වෙනස්කම් තිබුණත් මේවා ස්ත්‍රීන් මුහුණ දෙන පොදු අත්දැකීම් ය.

පාන්දර යාමයේ ලද නින්ද සුවදායක ය. උදේ පිබිදුනු අම්මා හා අප්පච්චි කෑගසන හඬ ඇසීමෙනි. සිඳුව ඇත්තේ කුමක්දැයි ඇයට තේරුණේ නැත. මුව සෝදාගත් ඇය නිදන ගවුම පිටින්ම ඉස්තෝප්පුවට ගියා ය.

රංජිත් පනහක් ආවත් කෑම දීමට සූදානම් ය. ඉස්සෝ, දැල්ලෝ, බලමාළු, තෝරමාළු කෑමට සූදානම් කළේ ය. ඊට අමතරව චිකන්, ඉස්සෝ. දැල්ලෝ බයිට් එකට සූදානම් කළේය. වරානයේ වැඩ කරන්නෙකුට ගල් පොල් දිය යුතු නැත. විස්කි, බ්‍රැන්ඩි, විකිලා, ජින් වැනි ඉස්තරම් වර්ගයේ රට බීම පිරිමින්ට ද, ප්‍රාංශ වයින් ගැහැනුන්ට ද සූදානම් කළේ ය. මේවා කරන්න ඇත්තේ හිච්චි මල්ලී විසින් විය යුතුය.

යාබද වන්නේ සිටින ලොකු අයියාට ගෙදර උත්සවයක් තිබෙන බව දැන්වූයේ නැත. ඔහු සහෝදරයෙක් නොව දුර්ජනයෙකි. අහිංසකයා සතු ලෙ හිමිකර ගත්තේ ය. දැන් හන්දියේ කඩ පේළියට හිමිකම් කීමට සූදානම්ව සිටියි. පත්තර ඒජන්සිය, තොග බඩු කඩය ඇත්තේ වලනිගේ මවගේ නමට ය. තාඩු කියන්නට මිනිහාව කුලප්පු කරන්නේ අයියාගේ ඇනි ය. එම ගැහැනිය පවුලට මඟුල්

දා සිට පවුලේ සහෝදරයන් විරසක වුණි. රංජිත් කලබලයෙන් හිච්චි අයියා හමුවීමට ආවේ ය.

"හිච්චි අයියේ දූන් මනමාලයගෙ පැත්තෙ අය ආවම ඉස්සෙල්ලා තේ දෙන්ට එපා. කූල් ඩ්‍රින්ක් එකක් දෙමු."

"ඔව්. එහෙම තමා හිතන් ඉන්නෙ."

"අයියෙ එහෙනම් මම මාළු ලෑල්ලට දුවල එන්නම්."

"ඔව්. ඔව්. ඒවා පාඩුකරගන්ට එපා. ගිහින් ඉක්මනට එමු."

ලියුම්කාරයා පැමිණ ගිය පසු ඔහු කඩිනමින් ලියුම් කඩා බැලුවේ ය. ආරාධනා පත්‍ර, මංගල ඇරියුම්, දායක සභාවේ ලිපි ඒ අතර විය.

ඔහු තුන්වැනි ලිපිය ගලවා බැලුවේ ය. ටික දුරක් කියවා ගෙන ගිය ඔහු ගැහැනු පිරිවරා සිටින මනමාලයා හැඳින ගත්තේ ය. දෙවියනේ... මේ ඉන්නෙ දූව බලන්න එන මනමාලයා ද, තොල් වියළී දෙනෙත් නිලංකාර වී යන බවක් බාලු මහත්තයාට දැනුණි. ඉන්පසු කිසිවක් ඔහුට මතක තිබුණේ නැත.



# 08

රංජිත් වැල්ලට ගොස් මාළු ඔරු එකහෙක් බලා සිටියේ ය. මාළු වෙන්දේසිය අවසන් වන තෙක් සිටි ඔහු ඉක්මනින් කඩවීදියට ගියේ ය.

කෑම බීම සියල්ල සූදානම් ය. අතුරුපස සඳහා පලතුරු සලාදයට අමතරව අයිස් ක්‍රීම් දීමට ඔහු අදහස් කළේ ය.

තොග බඩු කඩයට යාබදව ඇති ගොඩනැගිල්ලට තවම උසාවි තීන්දුව ලැබී නැත. රංජිත්ට හිමි කඩයට ලොකු අයියාගේ බිරිය නඩු ගොස් ඇති නිසා සෑහෙන කාලයක සිට එය වසා දමා ඇත. කඩ ලෑලිවලට චිත්‍රපටි, නාට්‍ය, ඉඩම් වෙන්දේසි හා විදුලි පෝස්ටර් ගසා ඇත.

"හිච්චි මහත්තයෝ මේ බලන්ටකෝ."

"ජෝති රාත්‍රිය ආපහු ඇවිදන්."

"නෑ නෑ මේක මේ කැලෑ පත්‍රයක්."

"බලන්ට වෙලා නෑ එකක් දීපං."

රංජිත් පෝස්ටරය දෙස උඩින් පල්ලෙන් බලා මෝටර් සයිකලයට නැග්ගේ ය.

ඔහුට අවශ්‍යව ඇත්තේ දුවගේ මඟුල මුළු ගාල්ලටම පෙනෙන සේ නිවෙසේ ගැනීමට ය.

ටවුමේ කොල්ලන්ගෙන් සැදුණු හොඳ සංගීත කණ්ඩායමක් ඇත. ඔහු දන්නා හඳුනන ගායක ගායිකාවන් ද රැසක් ඇත.

ලොකු අයියාගේ දරුවන්ගේ එක මඟුලක්වත් රංජිත්ට කිව්වේ නැත. ඔහුට අවශ්‍යව ඇත්තේ ලොකු අයියා රිදවීමට ය.

පැහැදිලිවම අයියා කිසි සමාජ ඇසුරක් නැති පඹයෙකි. බිරියගේ මවගේ අවමඟුල තිබුණේ යාබද වත්තේ ය. ගම්වාසීන් කිසිවෙක් එම අවමඟුලට සහභාගි වූයේ නැත. මරණය දවසේ සිටියේ කොළඹ සිට පැමිණි ටයිකාරයන් කිප දෙනෙක් පමණි.

වලනිගේ මංගල උත්සවයට මඟුල් මඩු ගසන තැන් පවා සිතා හමාරය. සයිකලයෙන් බසිද්දී නිවෙස තුළ මොනවා හෝ දෙයක් සිදුව ඇති බවක් හැඟුණු නිසා ඔහු කඩිනමින් නිවෙස දෙසට දුව ගියේ ය.

අයියා සිහිසුන්ව සැටියේ වැතිර සිටිනු දුටු රංජිත්ගේ දෙපා පණ නැතිව ගියේ ය.

''පොඩි දුව... මොකද මේ...?''

''බාප්පේ තාත්තට සිහි නෑ. හාට් ඇටැක් එකක් හැදුණා.''

''මේ මම යනකොට අගේට හිටියෙ, බලා ඉඳලා හරියන්නෙ නෑ. කරාපිටියට ගෙනි යමු.''

''මල්ලියෙ මහත්තයව බෙහෙත් ගන්නෙ ඒකනායක මහත්තයාගෙන්.''



''ඒකට දැන් කොළඹ යන්නයැ. කොහොමද අසනීප වුණේ. බර වැඩක් කළා ද?''

''මොන බර වැඩ ද, මහත්තයට මනමාලයා ගැන කෑලෑ පත්තරයක් එවලා.''

රංජිත් කෑලෑ පත්තරය උඩින් පල්ලෙන් බැලුවේ ය.

''මම හිතුවා හරි. දෙකක් නෑ මේක අල්ලපු වත්තෙ මහ දිසාපතිගෙ ගෑනිගෙ වැඩක්. මම ඇවිදින් බලා ගන්නම්.''

''මල්ලියෙ අපි ඉස්පිරිතාලෙට ගිහින් එමු.''

''දුව... පීරිස් කපුවා දැන් එයි. මම එනකල් ඉන්න කියන්න.''

තවමත් නිදන ගවුම පිටින් සිටින වලනි හිස සලා එය පිළිගත්තා ය.

''මේ වගේ වල් වනචරයෙකුට අපේ දුව දෙන්න පුළුවන් ද? ගෑනු වටකරගෙන අඩගහන හැටි. මම එනකල් නාකියාට යන්ට දෙන්ට එපා.''

රෝගියා රැගත් පිරිස රෝහල කරා ගියහ. උඩුමලගල වම්න්ද, කිරම සමරජීව මාමා ද ඒ අතර විය. නිවෙස තුළ ඇතිවූයේ දැවැන්ත පාළුවකි. සියල්ල අතරමඟ නතර වී ඇත. වලනි මේසය මත වූ කෑලෑ පත්තරය අතට ගත්තා ය. අඩනිරුවත් ගැහැනු පිරිවරා අරක්කු බොන නැනැත්තා දෙස ඇ පිළිකුලෙන් බලා සිටියා ය.

මේකට එක ගැහැනියෙක් නෙමේ අන්තඃපුරයක් ඇති. හෙළුවැලි ගැහැනු පිරිවරා සිටින මෙවැන්නෙක් හා විවාහ වූවහොත් තමාට සිදුවන්නේ උසාවි ගානේ රස්තියාදු වීමට ය. එසේත් නැතිනම් දිවි නසා ගැනීමට ය. මේ හැම උපක්‍රමයක් ම යොදන්ට ඇත්තේ තාත්තා තමා වෙනුවෙන් කර ඇති දායාද කොල්ල කෑමට ය.

තාත්තා දුෂ්කර වූ ගුරු සේවයේ යෙදී දුක් මහන්සියෙන් රැස් කළ මුදල මෙවන් කපටියෙකුට කිසිසේත් දිය යුතු නැත.

පැහැදිලිවම තාත්තා මෙම මංගල යෝජනාව පිළිබඳව තදබල විශ්වාසයකින් පසු වී ඇති බවක් පෙනේ. දුර බැහැර සිටින කිරම සමරජීව මාමාට පවා ආරාධනා කරන්ට ඇත්තේ ඒ නිසා විය යුතුය. තාත්තාට මොනව හරි වෙයිද? ප්‍රධාන ප්‍රශ්නය වන්නේ මෙතරම් ඉක්මනින් කැලෑ පත්‍රය ක්‍රියාත්මක වීම ය. කළේ පෝස්ටර් ගැහුවේ කවුද?

මෙම හන්දියේ කඩය අපේ එකක් බව කිසිවෙක් දන්නේ නැත. බාප්පා සැක කරන්නේ මෙය මහප්පලාගේ කුමන්ත්‍රණයක් බව ය. තාත්තලා, මහප්පලා අතර ප්‍රශ්න තිබුණත් ඒ අයියලා අක්කලා කොළඹ දී මුණගැසුණු විට තමා හා කතාබහ කරයි. එසේ වුවත් පවුල් දෙක අතර කිසියම් මොහොතක මහා ගින්දරක් ඇවිළීම වැළැක්විය නොහැකිය.

කෙසේ වුවත් මනමාල පිරිස නොපැමිණීම සතුටට හේතුවකි.

මේ විනාචරයා බැන්දා නම් දරුවෙක් හදාගෙන දික්කසාද වී ගෙදර නැවතීම වැළැක්විය නොහැකිය. හැටි විතරක්.. ඇය ඡායාරූපය දෙස බලා තමාට කියා ගත්තා ය.

සමරවීර ඉස්කෝලෙ මහත්තයා සතුටු වූයේ පුතාට ගැළපෙන හඳහනක් ලැබීම පිළිබඳව ය. පුතා හතර කේන්දරය පාළු තැනැත්තෙකි. ගැළපෙන හඳහනක් සෙවීම බරපතළ ප්‍රශ්නයක්ව තිබුණි. පුතා දහම් පාසල ඇසුරෙන් හැදුණු වැඩුණු, මසක් මාළුවක්වත් නොකන, පෝයට සිල් සමාදන් වන අමුතුම තරුණයෙකි.

ඔහුට සොයා දිය යුත්තේ ද එවැනිම හොඳ ගැහැනු දරුවෙකි.

මනාලියගේ පියාව ඔහුව ගුරු අභ්‍යාස විද්‍යාලයේ දී මුණ



ගැසී ඇත. ඔවුන් ගාලු පළාතේ හොඳ මිනිසුන් ය. සිය කුඩා රථයෙන් වවුමට ගිය ඔහු නැපැල් කරුගෙන්ම තමාට ඇති ලියුම් ගත්තේ ය.

තමා නමට ඇති ලිපිය විවෘත කර බලද්දී ඇඟට පණ නැතිව ගියාක් මෙන් සමරවීරට දැනුණි. නිවෙසට රථය ධාවනය කළේ අමාරුවෙනි.

''තාත්තෙ ගාල්ලට යනකොට පුරුද්ද විදිහට කිරි පැණි ගෙනියන්ට එපා. ඒක හරියට ඇස්කිමෝවරුන්ට අයිස් ගෙනියනවා වගේ වෙයි.''

සෙනරත් රථයෙන් බැස එන මාමණ්ඩියට කීවේ ය.

''ඔයා පලතුරු වට්ටියක් සූදානම් කරනවා කිව්වෙ නේද සෙනෙවි.''

බේමා සැමියාගේ අතින් අල්වා ගත්තේ ය.

''අපිට මනමාලි බලන්ට යන්න වෙන්නෙ නෑ.''

''අයියත් ඇවිදින් ඉන්නවනෙ අප්පච්චි.''

බේමා කීවා ය.

''මෙන්න මේක කියවලා බලන්න.''

බේමා පියා දුන් ලිපිය දිග හැර බැලුවා ය.

''මොකද්ද අප්පච්චි... මේ... මේ... ජරා පින්තූරයක්නෙ.''

''පිරිස් කපුවා... අයියාට ප්‍රොපෝසල් කරපු කෙල්ල නේද?''

''හානේ... මේ බඩ්ඩ අයියාට පාලනය කරන්ට බෑ. අපි හොයන එක හොඳා.''

''අප්පච්චි මේ කැලෑ පත්තරයට බොරු වෙන්ට විදිහක් නෑ.

හොඳට දන්න කෙනෙක් එවලා තියෙන්නෙ. වයස බලන්නෙ නෑ. මම නාකියාගෙ කන රත්වෙන්න එකක් දෙනවා.''

''නෑ නෑ පුතා රණ්ඩුවට යන්ට එපා. අපි බේරුණානෙ.''

''බලන්න මේකිගෙ හැටි. හෙන සෙක්සි ඇඟක්.''

''ඔයා බලන්ට එපා. මේ එන්නෙ කපුවා.''

කපුවා ශාලු යාම සඳහා කබායකින් සූදානම්ව ආවේ ය. අප්පච්චි කපුවා සමඟ කළ සාකච්ඡාවට සෙනෙවි මැදිහත් වූයේ නැත. ඔහු හිසවනා එම කතාව අනුමත කළේ ය.

''මට සමාවෙන්න ඉස්කෝලෙ මහත්තයො. මේ කෙලි ඇඳුම මුකුත් නැතිව උපන් හැටියෙ හිටියා නම් මීට හොඳා. මම මේක පෙන්නලා දෙකක් කියලා එන්නම්.''

පීරිස් කපුවා කෝපයෙන් යුතුව නිවෙසින් පිටව යන හැටි ගවේෂ් බලා සිටියේ ය.



# 09

චලනි කාමරයට වී සිටියේ දරිය නොහැකි සිත් වේදනාවෙන් යුතුව ය. තාත්තා හා අම්මා නිතරම වෙහෙසුණේ තම යහපත් අනාගතය වෙනුවෙනි. තමා පිළිබඳව තාත්තාගේ සිතේ කප්පරක් බලාපොරොත්තු ඇති බව චලනි දනියි.

මනාලයාගේ පැත්තෙන් එවන ලද කැලෑ පත්‍රය දුටු සැණින් රෝගාතුර වූ හැටි සිහිවෙයි. ඉස්පිරිතාලෙට ගිය අය තාම නැත. හැම තත්පරයකම සිතට විවිධ සිතුවිලි ගලා එයි. තාත්තාට කරදරයක් නොවේවායි ඇය පැතුවා ය.

ඇය සෙමින් සාලයට පියවර මැන්නා ය. මේසය මත ඇති පෝස්ටරය වෙත ඇගේ නෙත යොමුවුණි.

''මේකා වල් වනචරයෙක්. අරක්කු බොන සිගරට් උරන පිරිමි හානි සිද්ධ කරගන්නේ තමාට ය.''

වනචර ගැහැනු ආශ්‍රය කරන අයාලයේ යන පිරිමි ගැහැනුන්ගේ ජීවිත ද විනාශ කරති. ගොනෝරියා, උපදංශ, එඩ්ස් වැනි මාරාන්තික රෝග ගැහැනුන්ට බෝ කරන්නේ පිරිමින් විසිනි. මේකා ඒ ජාතියේ වනචරයෙක්. විස් හැටි චිතරක්.

නවරත්න අයියා ත්‍රිවිලරයෙන් බැස දුව එන දුටු ඇයට කැගැසුණි. තාත්තාට මොනවත් වෙලා ද?

"ඇයි නවරත්න අයියේ තාත්තාට මොකද වුණේ...?"

"මාමාට දැන් සනීපයි. ඒක නෙමේ රංජිත් ලොකු මාමාගේ කඩේ කුඩු කරලා."

"නෑ. ඒ මොකද?"

"මේ කැලෑ පත්තරේ එවලා තියෙන්නේ ලොකු මාමලා කියලයි රංජිත් මාමා කියන්නේ. මාළු මාකට් එකේ ගැන්සිය ඇවිදින්."

"හුභාක් අලාහද?"

"බෝතේස් කුඩේ කුඩු. පොලිසියෙන් ඇවිදින් මාමාව හොයනවා. මැන් මිසිං."

නවරත්න ආපසු යන්නට ගියේ ය. මඳ වේලාවකට පසු තාත්තා රඟත් චන්ද්‍රනගේ රථය ආවේ ය. තාත්තා සෙමින් නිවස දෙසට එනු දුටු චලනි ඉදිරිපසට දුවගොස් ඔහුගේ අතින් අල්වා ගත්තේ ය.

"තාත්තාට කොහොම ද?"

"මට සනීපයි. දූව කලබල වෙන්ට එපා."

එහෙනම නිහඬව සිය හාන්සි පුටුවේ දිග ඇදුණේ ය. ඉකුත් පැය කිහිපය තුළ මහා විපතක් සිදුව ඇත.

"සමරජීව... මෙහෙ එමු."

"මේ එනවා අයියේ."

ඔහු එකත්පසෙක හිට ගත්තේ ය.



"මට ඇත්ත කියමු. මොකක්ද වෙලා තියෙන්නේ...?"

"හිච්චි අයියා මේක අහලා කලබල වෙන්ට එපා. ලොකු අයියාගේ දංමගදර කඩේ කවුද කුඩු කරලා. ඒත් රංජිත් අයියා ඒකට සම්බන්ධ නෑ."

"රංජිත් සම්බන්ධ නැතිනම් පොලිසියෙන් හොයන්නේ මොකටද?"

"දෙවි කෙනෙක් වගේ හිටිය හිච්චි අයියාවත් ලොකු අයියා උසාවි ගෙනිච්චේ."

"ඒවා කාන්තිගේ ඉගැන්නුම් බහට සිද්ධ වෙච්ච දේවල්. රංජිත්ව පොලිසියට අහුවුණොත් ගහයි. මස්කරයි. කාන්තිගේ නෑයෙක් පොලිසියේ ඉන්නවා."

"මම රංජිත්ව මාමාව උඩුමලගල අපේ අහ එක්ක යන්නම්." චමින්ද කීවේය.

"නීතියෙන් හැංගෙන්ට බැහැ. ලෝයර් කෙනෙක් මඟින් උසාවියට ඉදිරිපත් කරමු."

චලනි කීවා ය.

"ඔව් එහෙමත් කරන්න පුළුවන්. දූවගේ කතාව ඇත්ත." සමරජීව කීවේ ය."

පරිසරයේ නිහඬ බවක් ඇතිවුණි. චලනි සෙමින් පියාගේ හිස පිරිමැද්දා ය. පීරිස් කපුවා කිසි ගරු සරුවක් නැතිව සාලයට පිවිසෙනු දැකීමෙන් බාලමහත්තයාගේ සිතේ ඇතිවුණේ කෝපයකි. පිරිමියෙකුගේ හඳහන පමණක් හොඳවීමේ කිසිම තේරුමක් නැත. වැදගත් ගැහැනු දරුවෙකු හට මංගල යෝජනාවක් ගෙනෙන විට ඊට අදාළ සමාජ ජීවිතය වැනි ඉතිහාසය ද සෙවිය යුතුය.

"පීරිස් උන්නැහේ... බොහෝම අපූරුයි ගෙනාපු යෝජනාව."

ඉස්කොලේ මහත්තයා කීවේ ය.

"ඉස්කොලේ මහත්තයෝ මම හිසේ කෙස් ගානට මංගල යෝජනා ගෙනැල්ලා තියෙනවා."

"ඒක වෙන්ඩ ඇති මෙච්චර කොණ්ඩෙ අඩු." සමරජීව කීවේ ය.

"හරි නොගියට තමුන්නැහැටත් මඟුල් ගෙනැල්ලා තියෙනවා."

"තමුසේ වයසක කෙනෙක් හින්දා ඉවසනවා." චමින්ද කීවේය.

"ඉස්කොලේ මහත්තයෝ... මනමාල මහත්තයාගේ පැත්තෙනුත් ආවේ නැත්තේ හේතු ඇතිව. ඒ මිනිස්සු බොහෝම වැදගත් මිනිස්සු."

"බොහෝම වැදගත් මිනිස්සු තවත් ලෝකයේ නැත්නම්. බලනවා මේ කව්ද කියලා."

සමරජීව කැලෑ පත්‍රය දෙමින් කිවා ය.

පීරිස් කපුවා සාක්කුවේ ඇති උපැස් පුවල ගෙන පැළඳ කැලෑ පත්‍රය බැලුවේ ය.

"සුරා සුදුවෙන් තොර, මනට සීත.' කොහොමද දහම් පාසල් ආචාර්යවරයාගේ වැඩ...?

චලනි ඔවුනතරින් නොගොස් බලා සිටියේ ඔහුගෙන් පිළිතුරක් ලැබෙන තෙක් ය.

"ගෑනියෙකුගේ හුළඟවත් වැදිලා නෑ කිව්වා නේද? කොහොමද අනාගයාගේ තරම." චමින්ද ඇසුවේ ය.

"පීරිස් උන්නැහැ තරක මිනිහෙක් නොවන බව මම දන්නවා. මීට පස්සේ කටයුතු කරද්දී ටිකක් හොයලා බලන්ට ඕනෑ."



"ඔයින් ගියා ඇති."

චලනි නිහඬව සමාගමයෙන් පිටව ගියා ය. පීරිස් කපුවා ලිපිය දැකීමෙන් කම්පාවට කෝපයට පත්ව සිටියේ ය.

"මම ඒ ගෙදරින් ගුටි නොකා බේරිලා ආවා. එහෙමනම් ඉස්කොලේ මහත්තයා මේකත් බලමු."

බාල මහත්තයා කපුවා දුන් ලිපිය අතට ගත්තේ ය. "ඔබ පෙම් කරනා ඔබේ කුමාරි මට ද ආදරේ කියා තිබේ." වර්ණ රූපයේ වූ කාන්තා රූපය හෙතෙම එකවරම හඳුනා ගත්තේ ය. නිරුවත වැනී හිටියේ යාන්තමිනි. මැදිවියේ කාමුක පිරිමියෙකුගේ අත අල්වාගෙන සිටින රුව දැකීමෙන් යළි හෘද ස්පන්දනය වැඩි විය.

"පී....රිස් උන්නැහේ.... මේක කොහොමද හම්බ වුණේ..?"

"දූත් මේ දූත් උදේ මනමාල මහත්තයාගේ ගෙදරට තැපැලෙන් හම්බ වෙලා."

"මොනවා තැපෑලෙන් හම්බ වෙලා."

"මේ ඉන්නේ මහත්තයාගේ දුව නේද?"

ඔහු හිසවනා අනුමත කළේ ය.

"තමුන්ගේ ඇමේ පොල්පරාල තියාගෙන අනුන්ගේ ඇස්වල තුත්තිරි ගස් ගැන හිතන්ට එපා. මේ මඟුල ඇරුණාවේ."

කොහේ හෝ නැති වේදනාවක් පපුව හිර කරනු දැනුණි. කපුවා ගේට්ටුව විවෘත කරගෙන නොපෙනී යනවා ඔහු බලා සිටියේ ය.

"අම්මේ.... මගේ පපුව"

බාල මහත්තයා යළි පපුව බදාගන්නවා දුටු ඉස්කෝලේ හාමිනේ ළතෝනි දුන්නා ය.

## 10

ක්ලාන්ත වූ නාත්තාව යළි රෝහලට ගෙන ගියේ ය. චලනි කොට්ටය බදා හැඩුවේ වෙන කළ යුතු දෙයක් නැති හෙයිනි. මේ පැමිණ ඇත්තේ මිතුරියන් විසින් යවන ලද ලිපියකි.

කවුරුන් හෝ මනමාලයාගේ තොරතුරු දන්නා කෙනෙක් ලිපිය එවා ඇත. මෙම කැලෑ පත්‍රය නිසා මෙවන් විනාශයක් සිදුවෙතැයි ඇය කිසිසේත් සිතුවේ නැත. නාත්තා දෙවැනි වරටත් රෝහලට ගෙන ගොස් ඇත. මොනවා වේදැයි කිව නොහැක. රංජිත් බාප්පා විසින් මහප්පාගේ කඩිය කඩා දමා ඇත.

දැනට ගාල්ලේ පොලිස් අධිකාරිවරයා ලෙස පත්ව සිටින්නේ කාන්ති මහම්මාගේ සොහොයුරෙකි. ඒ නිසා බාප්පාට කිසිම ගැලවිල්ලක් නැත. බාප්පා ඇතුලු පිරිස සෙවීමට පොලිසිය යොදා ඇත.

හඬමින් කාමරයට පිවිසි අම්මා අසළට චලනි ගියා ය.

''නාත්තාට මොකද අම්මේ...?''

''මොකද අම්මේ, මේක බලනං''



චලනි අම්මා දුන් වර්ණ ඡායාරූපය දෙස බලා සිටියේ ය.

''අපි කොහොමද මී හරකියේ පාරට බහින්නේ මේ ඇත්ත ද?''

මංගල උත්සවය නතර කිරීමට උපක්‍රමයක් ලෙස ලිපියක් යැවීමට තමා අනුමැතිය දුන් බව සැබෑය. ඒත් දෙයියනේ මේක කළේ කවුද? යාමතමින් නිරුවත වැසුණු ගැහැනියකගේ සිරුරට තම මුහුණ සවිකර තිබෙනු දැකීමෙන් ඈ කෝපටය පත් වූවා ය. තමුන් සමඟ සිටින දසුනට අනුමැතිය දුන්නා හැර අඩ නිරුවත් ගැහැනියකගේ කඳට මුහුණ යොදතැයි සිතුවේ නැත.

ලිපිය දෙස බලද්දී මනමාලයාගේ නිවසට යැවූ කැලෑපත්‍රය සිහියට නැගුණි. ''ඔබ පෙම් කරනා ඔබේ කුමාරි'' යන අදහස ගැන කතා කළා මතක ය. තමා කිසිදිනක මෙවන් නාන ඇඳුමකින් සැරසී සිට ඇත. තමා හැඳ වැඩූ මවට පවා අඩු වශයෙන් තමාටවත් ඡායාරූපය ප්‍රතික්ෂේප කළ නොහැකි ය. ඉසුරි හා වාපා කැලෑපත්‍රය සැදීමට දී ඇත.

''කොහොමද මී හරකියේ අපි ඇඳුමක් ඇගෙන පාරට බහින්නේ.''

අම්මා යළිත් කීවා ය.

''අම්මා මම කවදාවත් ස්වීමින් පූල් එකකට ගිහින් නෑ අම්මා.''

''එහෙනම් මේ ඉන්නේ කවු ද? මම ද?''

''අම්මගේ බෙල්ල අරගෙන මේ ගෑනියෙකුගේ බෙල්ලට දමන්ට පුළුවන්. කම්පියුටර් තාක්ෂණය ඒ තරමට දියුණුයි. මේක කුමන්ත්‍රණයක්.''

කිසිවක් තේරුම් ගියාක් මෙන් අම්මා නිහඬ වූවා ය.

''හා එහෙනම් මේ ඉලන්දාරියා කවුද? මේ වගේ සම්බන්ධයක්

හිතේ තියාගෙන ඉන්නෙ නැතිව කියපං.''

''එහෙම දෙයක් තියෙනවා නම් කියන්නම්. තවම නෑ.''

''මේ හොඳට දැකලා පුරුදු ඉලන්දාරියෙක්.''

''අම්මා.... මේ ඉන්නේ වෙලිනාටා නළුවෙක්. එයාගේ පින්තූරේ මා ළඟට කරලා කම්පියුටරයෙන් හදලා.''

''මේක කවුරු හරි ඊර්ෂියාවට කරපු දෙයක්. රංජිත් මහප්පලාගේ කඩේ කුඩු කරලා. හන්දියේ කඩේ කඩලා එකම නස්පැත්තියක්.''

''අම්මේ... මම ඉස්පිරිතාලෙට යන්න ද?''

''නෑ නෑ ගෙදරින් හෙල්ලෙන්ට එපා.''

ඇය පිළිතුරක් නොදී නිහඬ වූවා ය.

''මම තාත්තාව බලලා එන්නම්.''

''ඒවා අපි බලාගන්නම්. රට්ටු හිනාවෙනවා උඹ වහාම කොළඹ පලයං.''

අම්මා කීවේ කෝපයෙනි.

මංගල යෝජනාව නතරවීම වෙන කතාවකි. කිසිම අයුරකින් නොසිතූ දෙයක් සිදුව ඇත. දෙවරක් හෘද රෝගය බලවත් වීම බරපතළ තත්වයකි.

තාත්තා පොලිසියට බියෙන් සැඟව සිටියි. මඟුලට අකමැතියි කියලා ගෙදරට කීවා නම් කිසිදාක මෙවැනි තත්වයක් උදාවන්නේ නැත.

ගවේෂ් ගේ පියා පළාතේ වැදගත් පුද්ගලයෙක් විය.

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරී පත්ව සිටියේ



බොහෝ දෙනාගේ ඉල්ලීම මත ය. දැනට මෙහෙතම උපසභාපතිවරයෙක් වශයෙන් සේවය කරයි. ජනතාව පිළිගන්න නිසා ඊළඟ වර පළාත් සභාවට හෝ පාර්ලිමේන්තුවට යාමට පුළුවන.

දැනුම් බුද්ධිය අධ්‍යාපනය හා විශේෂ කොශල්‍යයෙන් අනුව ඒ තනතුර වඩාත් ගැළපෙන්නේ ගවේෂ්ට ය. සමරවීර සිතා සිටියේ පුතාට උචිත පරිසරයක් නිර්මාණය කර දීමට ය.

හඳහන බැලූ අවස්ථාවේ දී වුවත් පැවසුවේ පුතා රජවන බව ය.

හන්දියේ තාප්පවල පුතා ගැහැනු පිරිවරා සිටින පෝස්ටරය දුටු සැනින් සිතට පිවිසුණේ බලවත් සංවේගයකි.

පුතා වෙනුවෙන් තමා කොච්චර බලාපොරොත්තු තැබුවා ද?

කවදා හෝ ප්‍රාදේශීය සභා, පළාත් සභා මස්සේ පාර්ලිමේන්තුවට යා හැකි, වෙනත් කාටත් නැති වාසනාව ඔහුට තිබුණි.

මෙය තමාගේ දේශපාලන විරුද්ධවාදීන් විසින් කරන ලද්දකැයි සමරවීරට සිතුණි. පුතා සිය අනාගත ගමන විනාශ කරගෙන ඇතැයි ද සමරවීරට සිතුණි.

''කැලෑපත්තරේ ගැන බැණා මොකද කිව්වේ...?''

මේ ප්‍රශ්නය තවමත් සිහින් බැඳැරව නැත.

''සෙහරත් ළමයා ඒක ගණන් ගත්තේ නෑ.''

''පුතාගේ අම්මේ... මම හිතාගෙන හිටියේ මේකව පාර්ලිමේන්තු යවන්ටයි.''

"ඔවා ගැන එච්චර හිතන්ට එපා. සෙනරත් ළමයා ගණන් ගන්නේවත් නෑ. අපි පුතාට හොඳ තැනකින් කටයුත්තක් කරලා දෙමු."

"අම්මේ අපි හවසට යනවා."

බේබා මව අසළට එමින් කීවා ය.

"අනේ දුව අර පෝස්ටර් එක දැක්කට පස්සේ තාත්තට සිහිකල්පනාව නැති වුණා. මොනවා කරන්න ද කියලා මට තේරෙන්නේ නෑ."

"දේශපාලනය කරනකොට එහෙම බෑ. ඕනෑ වේදනාවක් දරන්ට පුළුවන් වෙන්ට ඕනෑ."

"අප්පච්චිට ඕනෑ දෙයක් දරන්ට පුළුවන්. නමුත් මේ වගේ දෙයක් ඉවසන්ට බෑ. මේ බලන්න කවදාවත් මෙහෙම වෙලා නෑ."

අප්පච්චි සාලයේ ගමන් කළේ හිස් බැල්මෙන් යුතුව ය. දවසට දෙකට ඔහු රෝගාතුරව ඇතැයි සෙනෙවි සිතුවේ ය.

"මොකක්ද මචං දැන් අප්පච්චිගේ වැඩේට කරන්නේ...?"

සෙනෙවි ඇඳේ ඇල වී සිටින මස්සිනා අසළ ඉඳගනිමින් ඇසුවේ ය.

ගවේෂ් පිළිතුරක් නොදී නිහඬව සිටියේ ය.

"සෙල්ලමක් නොවේ අප්පච්චිව ඩොක්ටර් කෙනෙකුට පෙන්වන්ට වෙයි."

"පෞද්ගලික ප්‍රශ්නයක් අහන්නම්. උත්තර දුන්නත් කමක් නෑ. නුදුන්නත් කමක් නෑ. මම නම් පෞද්ගලිකව මේ පින්තූරේ ඉන්න ගැනිට කැමතියි." සෙනෙවි මිතියට නැඹුරුව ගේ පහත් හඬින් කීවේ ය.



ඔහු පිළිතුරක් නොදී සිටියේ ය.

"ගැනු කවදා ගන්ට බැරිද? දැන් මේ අප්පච්චිගේ කේස් එකට මොකද කරන්නේ...?"

"ගවේෂ් මේකට මට උත්තර දෙන්ට බෑ. අප්පච්චි දේශපාලනය ඉදිරියේ ඕනෑම විරුද්ධවාදියෙකුට පිළිතුරු දෙන්න දන්නවා. එත් දරුවෙකුගේ ප්‍රශ්නයක දී අසරණ වෙලා."

"මම බඳින්නේ නෑ. මට දැන්ම මඟුල් එපා."

"ඔය රෙද්ද මේ මනුස්සයාට කලින් කීවා නම් ඉවරයිනේ. අපරාදේ කී දාහක් වියදම් කරගත්තා ද?"

" මම බඳින්නම් තවම මම කැමති කෙනා හම්බ වුණේ නෑ."

# 11

අප්පච්චිට තවමත් කිවයුතු සුවයක් නැත. සියලු වැඩ නවතා දැමූ ගවේෂ් සෙනෙවි සමග අප්පච්චිව මනෝ වෛද්‍යවරයෙක් ළඟට කැඳවාගෙන ගියේ ය.

බැලු බැල්මට රෝගයක් නැත. ඔහු සිය කටයුතු සාමාන්‍ය ලෙස පවත්වාගෙන යයි. දේශපාලන වැඩ ගැන ද කතා කරයි. පුතාගේ විවාහය පිළිබඳ වූ සිදුවීම ඔහුට තදබල වේදනාවක් ගෙන දී ඇත.

“අම්මා... මේ විෂය ගැන අප්පච්චි එක්ක කතා කරන්ට එපා.”

සෙනෙවි කීවේ ය.

“ඔව් ඒක තමා මාත් කිව්වේ. අපි අයියට වෙන මඟුලක් කතා කරමු.”

“අයන්ති ලස්සන කෙල්ල. එයාව බලන්නකෝ.”

“යන ගමන් බූස්ස පැත්තෙන් යමුයි කිව්වේ ඒකයි. අම්මලාට අයන්තිලාගේ ගෙවල් දොරවල් බලන්ටත් පුළුවන්නෙ.”



“ගෙවල් පස්සේ බලමු. අයන්ති දැන් ඉන්නේ කොළඹනේ. එහෙට ගෙන්වලා පෙන්වමු. ඩොක්ටර් කිව්වෙත් මේ වාගේ ලෙඩවල් ඕනෑ තරම් වෙනවා කියලා.”

“නංගී ඔයා පේපර්මාකින් යන්නේ නැද්ද?”

“අපි ලෙඩ නිවාඩු දාලා ඉන්නේ.”

ඇය නොසැලකිලිමත්ව කීවා ය.

“ඉගෙන ගන්න ළමයින්ගේ ජීවිතය එක්ක සෙල්ලම් කරන එක අසාධාරණයි කියලා අද පේපර් ආටිකල් එකකුත් තිබුණා.”

“ඒක ඇත්ත.”

“එහෙම නම් වෛද්‍යවරු ස්ට්‍රයික් කරන්නෙත් අපේ ප්‍රශ්නේට දැන් අවුරුදු දහයකටත් වැඩියි. හැම එකාම අපට වංචා කරනවා.”

“නංගී මේක 1997 ඉඳලා තියෙන ප්‍රශ්නයක් බව ඇත්ත. ඒත් දරුවන්ගේ ජීවිතත් එක්ක සෙල්ලම් කරන්ට එපා. දොස්තරවරු ලෙඩ්ඩු ප්‍රාණ ඇපකාරයෝ කරනවා වගේම ඔයාලා ශිෂ්‍යයෝ ඇපකාරයෝ කරගෙන.”

“ඔයා හැම දෙයක්ම බලන්නේ වෙනස් විදිහකටනේ. අපේ වර්ජනය සාධාරණයි.”

ඔහු තවදුරටත් මේ ප්‍රශ්නය ගැන කතා කිරීමට ගියේ නැත. තාත්තා සිය ජීවිත කාලය තුළදී කිසිම නිවාඩුවක් නොගෙන සේවය කළ ආචාර්යවරයෙකි. ඒ දිනවල ගුරුවරුන්ගේ මෙවැනි වැඩ වර්ජන තිබුණේ නැත. ඔවුන්ට අසාධාරණයක් සිදුව ඇති බව රජය පවා පිළිගනියි.

“අම්මා මාත් ඉන්න එකේ තේරුමක් නෑ. මාත් කොළඹ යන්නම්.”

"උඹලා ඔක්කොම එක්ක පලයල්ලා. එතකොට මම ලෙඩ මනුස්සයා එක්ක ඉන්නෙ කොහොමද?"

"නිලම්මහර හොඳ සිංහල වෙද මහත්තයෙක් ඉන්නවා නේද?"

"ඒකත් අපි කරලා බලමු. පුතා තාත්තව සන්තෝසෙන් තියාගත්තොත් ඇති."

"කියන දේ තේරුම් ගන්න. මම තව උපාධියක් කරනවා. එහෙනම් අම්මයි තාත්තයි මා එක්ක කොළඹ එන්න. මම ගෙයක් ගන්නම්. කොල්ලුපිටියේ ගේ හොඳ නැත්නම් වෙයන්ගොඩ හදන ගෙදරට එන්න."

"එහෙම කරලා කොහොමද..? අප්පච්චි ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී කෙනෙක්නේ."

"අම්මා මට කියන්නේ අර පින්තූරවල ඉන්න කෙල්ල බඳින්න කියල ද?"

"නෑ. නෑ ඒ නැට්ටුක්කාරි ගම්වලට ගේන්ට බෑ. අම්මපා මූනුත් ගැහැනු ද? මගේ එකියක් නම් මම පට්ට ගහනවා."

"ඒක අමතක කරමු. මම අප්පච්චිව ඩොක්ට කෙනෙකුට පෙන්වන්න යන්න එක්ක යන්න එන්නම්."

අසංක කීපවරක්ම උත්සාහ ගත්ත ද ගවේෂ්ගේ දුරකථනය විසන්ධි කර තිබීම නිසා ඇමතුමක් ගත නොහැකි විය.

කොළඹට පැමිණි වහාම අසංකගේ ඇමතුම ලැබුණි.

"හව් ඉස් යුවර් ප්‍රොග්‍රෙස්. මනමාලි බලන්ට ගියාද?"

"මට කරදර නොකර ඉන්නවද? මම වැඩක"

ගවේෂ් කීවේ ය.



"ආ... එහෙමද සයිස් එක. අපෙන් වැඩක් කරගන්ට වුණාම විතරක් මචෝ මස්තුවේ කියලා පානීය දානවා. උඹලත් හරියට ඇමතිවරු වගේ. හැම බලුවැඩක්ම කරව ගන්නවා. හම්බ වෙන්න ගියාම අඳුනන්නෙ නෑ."

"මම කතා කරන්න සුදුසු තත්වයක නෙමේ ඉන්නෙ."

"එහෙම වෙන්න විදිහක් නෑ. මට තව අයිඩියා එකක් ආවා. තව පෝස්ටරයක් හැමතැනම ගැහුවා."

"ඇයි ගොනෝ... එහෙම කළේ. ඉටස් ඕවර. අපිට එපා නම් මොනවටද තව පෝස්ටර් ගහන්නේ...?"

"කටින් කියන්ට බෑ. ඇවිදින් පෙන්වන්නම්. මම දැන් එනවා."

ගවේෂ් ඇඳුම පිටින්ම ඇඳේ හාන්සි වුණි. සිදුවූයේ නොසිතූ දෙයකි. අප්පච්චිලා ගමේ හොඳ නමක් තියාගෙන ජීවත් වූ මිනිසුන් ය. පුතාගේ නමට වරදක් වෙතැයි ඔහු නොසිතන්නට ඇත. පැහැදිලිවම මෙය ගොඩින් බේරාගත හැකිව තිබූ දෙයකි. අප්පච්චි වැඩියෙන්ම උනන්දු වූයේ මෙවැනි හඳහනක් ලැබීම ගැන ය. මනමාලි බලන්ට ගොස් අකමැතියි කීවා නම් මේ කිසිවක් වෙන්නෙ නැත.

"මේ අයි කම් ඉන්."

අසංක සිනාවක් පාමින් ඇතුළට ආවේ ය.

"ඇයි නිකං සුනාමියට අහුවෙලා වගේ."

"හැම දෙයක්ම සුනාමියට අහුවුණා වගේ."

ගවේෂ් කීවේය.

ගවේෂ් වලනිවල් ඡායාරූපය දෙස බැලුවේ ය.

"මෙන කැත වැඩක් ඇයි උඹ මගෙන් අහන්නෙ නැතිව මේ වගේ පෝස්ටරයක් ගැහුවේ."

• • • • • • • • • • • • •

චලනි කොළඹ නේවාසිකාගාරයට එනවිට සැවොම නවාතැනින් පිටව ගොස් ය. පැහැදිලිවම සිදුවූයේ අනපේක්ෂිත සිදුවීමකි. මෙය මෙතරම් දුර දිග නොගොස් බේරාගත හැකිව තිබුණි. මින් සිදුවූයේ මනමාලයාගේ තත්ත්වය තේරුම් ගැනීමට නොහැකි වීම ය.

තාත්තා නවම කරාපිටියේ ප්‍රතිකාර ලබයි. සිදුවූයේ හෘද රෝගියෙකුට දැරීමට බැරි දෙයකි. දෙමාපියන් විශේෂයෙන් ගැහැනු දරුවෙක් හදන්නේ වැදගත් ලෙස නිවසින් පිට කිරීමට ය. වරදක් නොවුණත් කැලෑ පත්‍රයේ තිබුණේ කෙනෙකුට විශ්වාසවන්තව පිළිගත හැකි චෝදනා ය.

බාප්පා සැක කරන්නේ මෙය මහප්පාගේ අනු දැනුම පිට සිදු වූ කුමන්ත්‍රණයක් ලෙසය. වසර ගණනාවක සිට මහප්පාගේ පවුලේ අය සමග ඉලව් මඟුල් නැත. කාන්ති මහම්මාගේ දරුවන් ඉඳහිට කොළඹ දී චලනිට මුණ ගැසෙයි. මහේෂ් ඉගෙන ගන්නේ විශ්වවිද්‍යාලයේ ය. මඟුල කැඩීමට ඔවුන් කැලෑපත්තර ගැසුවේය යන්න පිළිගත නොහැක.

හැන්දෑවේ නවාතැනට එකා දෙන්නා ළඟා වෙන්ට වූහ. කැලෑපත්‍රය යැවීමට මූලික වූ පිරිස චලනිගේ කාමරයට රැස් වූහ. චලනි පිළිතුරක් නොදී සිටියා ය.

“කෙල්ලෙ උඹ අපිට කේක් ගෙනාවේ නැද්ද?”

“කේක් නෙවේ වහ කන්ටයි වෙලා තියෙන්නේ.”

“අපි අපේ කොටස හරියට කළා. උඹ ගිය තැන ඉඳලා කියපං.”

මඳ වේලාවක් කල්පනා කරමින් සිටි ඇ රැස්ව සිටි මිතුරියන්ට සිදු වූ සිදුවීම විස්තර කළා ය. බෑගයේ තිබූ පෝස්ටර් ලිපි ඇ



මිතුරියන්ට පෙන්වූවා ය.

වරුණි නීති විද්‍යාලයෙන් සමත්ව ජ්‍යෙෂ්ඨ නීතිඥයෙක් යටතේ පුහුණුව ලබමින් සිටියි. පැහැදිලිවම මනමාලයා වන නවේන්ට විරුද්ධව නීති මඟට බැසීමට හැකියාවක් ඇති බව අදාළ සාක්ෂි අනුව වරුණි තේරුම් ගත්තා ය.

“ඒ...ඒ කැතයි. විශේෂයෙන් තරුණ ගැහැනු ළමයෙකුගේ චරිත ඝාතනය කිරීම දඬුවම් ලැබිය යුතු වරදක්.” වරුණි කීවා ය.

“අපිට නීති මඟින් දඬුවම් දෙන්ට බැරිද?”

“අපි නඩුවක් දාමු. මම කතා කරන්නම්.”

සැවොම නවේන්ට එරෙහිව අධිකරණය වෙත යැමට කැමති වූහ.

අපහාසාත්මක ක්‍රියාවක් තුන් ආකාරයකින් සිදුවිය හැකිය. ලිඛිත විය හැක, කතාවෙන් විය හැක, ක්‍රියාවෙන් හෝ අංගචලනයෙන් විය හැක.

අපහාස නඩුවක දී අවශ්‍යතා පහක් ඔප්පු කළ යුතුය. පැමිණිලි කරන ලද ප්‍රකාශය, පැමිණිලිකාරිය පිළිබඳව වීම, වග උත්තරකරු තුළ හිංසක චේතනාවක් පැවැති බව, පැමිණිලිකරුට අදාළව ප්‍රසිද්ධ කළ බව.

“මම කේස් එක ෆයිල් කරන්නම්. නිකම් නෙමේ අපි මේ අපහාසය සම්බන්ධයෙන් ලක්ෂ පනහක වන්දියක් ඉල්ලමු.” වරුණි යෝජනා කළා ය.

සැවොම අත් ගසා සපථ කළා ය.

## 12

බේමා නංගි සෙනෙවි සමඟ කාර්යාලයට ආවේ ගණේෂ් ප්‍රශ්නවල ගුලි වී සිටින මොහොතක ය. අප්පච්චිට සිංහල වෙදකම් කිරීමට සූදානම් වන බවක් අම්මා පවසා තිබුණි. අප්පච්චිට තවම සුවයක් නැත.

''කොහේ යන ගමන් ද?''

''අයියා බලන්නයි ආවෙ.''

බේමා කීවා ය.

''තවම පේපර් මාකින් ගියේ නැද්ද? පඩිය ගෙවන්න කැබිනට් ඇප්පෑවල් එක ලැබිලා නේද?''

''තමුසෙට බාල්දියක් ඇදලා වගේ.''

සෙනෙවි ගණේෂ්ට ලියාපදිංචි ලිපිය දෙමින් කීවේ ය. හෙතෙම ලිපිය විවෘත කර එදෙස බලා සිට යළි සෙනෙවිට දුන්නේ ය.

''මේක නීතිඥ සමාගමකින් එවලා තියෙන්නෙ.''

සෙනෙවි ලිපිය දෙස බලා සිටියේ ය.



''මළ කෙලියක්. චරිත ඝාතනය වන පරිදි ඡායාරූප පළ කිරීම, විවාහ පොරොන්දුව කඩකිරීම, ද්වේෂ සහගත ලෙස හැසිරීම වාගේ හේතු මත රුපියල් ලක්ෂ පනහක වන්දියක් ඉල්ලලා.''

''කවුද වන්දි ඉල්ලලා තියෙන්නෙ...?''

''මනමාලි. අර බඩඩ දවස් ගනක් ඇතුළත උත්තර බඳින්න කියලා. නැතිනම් නඩු දානවලු.''

''ඉස්සර වගේ ගැහැනුන් සූරාකන වධ බන්ධනවලට ලක් කරන්න බෑ.''

බේමා කීවා ය.

''මොන වද බන්ධනයක් ද? එහෙනම් මේ මනුස්සයට වෙලා තියෙන දේවල්. අපිත් ලෝයර් කෙනෙක් අල්ලමු. ගණේෂ් උඹ බය වෙන්ට එපා. නඩු කියනවා නම් නඩු කියන්ට කියමු.''

කිසි දෙයක් පැවසීමට නොහැකිව ඔහු නිහඬව සිටියේ ය.

''අයියා ඇත්ත කියන්න... ඔයා ඒ කෙල්ලට ලියුම් දුන්න ද?''

''පිස්සුද නංගි...''

''හරි.. එහෙනම් ඔයා බයවෙන්ට එපා. සෙනෙවි ලෝයර් කෙනෙක් අල්ලලා මේක බාර දෙන්ට.''

''අප්පච්චි මේක දැක්කා නම් ආයෙ හිස කුඩිච්චි දාන්ට වෙනවා.''

''බේමා නඩු යන්නෙ නැතිව අපි කෙල්ලව හමුවෙලා හොඳින් බේරා ගන්ට බලමු ද?''

''එපා පල්වෙන්න. මගෙ අයියව ඒ වගේ වල් කෙල්ලෙක් ඉස්සරහ බාල්දු කරන්ට බෑ. මම ඇඩ්වකේට්ට ගෙනෙන්නම්. අපි කොළඹින් ලෝයර් කෙනෙක් ගේමු.''

නංගී ගිය පසු ඔහු යළිත් නීතිඥවරයා මගින් එවන ලද ලිපිය දෙස බැලුවේ ය.

'ලක්ෂ පනහක්...'

නිවාඩුවක් ගත් ඔහු අසංක හමුවීමට පත්‍ර කාර්යාලයට ගියේ ය. ඔහු පැමිණීමට ප්‍රමාද වන විට යකා නැග්ගේ ය. ලක්ෂ පනහක වන්දියක්. දෙන්නම් ලක්ෂ පනහක් දෙන්නම්. ඔහු තමාට කියා ගත්තේ ය. ඇඳල හිටියේ යාන්තම් වැහිච්ච චූටි ජංගියක්. අම්මට කෝන්ති ගියේ සුදු පාට කලව දෙක දැක්කම තමයි. ඇත්තටම ඒ ගෑනු ඇඟ ලස්සනයි.

"හලෝ සහා... මම මේ උඹව මතක් කළා විතරයි. මට ආටිකල් එකක් කරන්ට තියෙනවා. වෙරෙන් මා එක්ක බැටිකලෝ යන්ට. කෑම බීම ඔක්කොම මා ගානෙ."

"බෑ... මට බෑ."

"පාසිකුඩා බීච් එකෙන් නාලා පොඩි ජොලියක් දාලා එමු. උඹ බඳින්නෙත් නෑ ඉගෙන ගන්නවා විතරයි. උඹට තල් රා දෙන්නම්."

"තල් රා නෙමේ මට වස බෝතලයක් ගෙනෙත්. මෙක බලපං."

අසංක ලිපිය කියවා අවසන් වෙද්දී මුහුණට තරමක ගැඹුරක් පිවිස තිබුණි.

"මේ වගේ දේකුත් වෙයි කියලා මං හිතුවා."

"ලක්ෂ පනහක්."

"මේවා මෙතන කතා කරන්ට හොඳ නෑ. අපි ලන්ච් ගන්ට යමු."



"බලපං බලාපොරොත්තු වෙච්ච නැති දෙයක්නෙ වුණේ."

"මම උඹට කිව්වා. තවත් දේවල් වෙන්ට පුළුවන්. කෙල්ල මොකාටද එන්නෙ බලමු."

නිර්මාංශ හෝටලයට පිවිසි අසංක කෑම ඇණවුම් කළේ ය.

"මට කෑම එපා."

"කෑම එපා කියලා හරි යන්නෙ නෑ. මෙකට හොඳ වැඩක් තියෙනවා."

"අමාරුවේ නොවැටෙන දෙයක් නම් කරමු."

"අපි කෙල්ලව උස්සමු."

"මොනවා... කෙල්ල උස්සන්න."

"ඔව් පැහැරගෙන යමු. කට වැහෙනකල් තියාගෙන ඉමු."

• • • • • • • • • • • • •

රාත්‍රී ආහාරයෙන් පසු මිතුරියන් රැස්වූහ. දැන් සූදානම් වන්නේ ගෙවිණ්ට විරුද්ධව නඩු දැමීමට ය. කොතරම් සමතැන ලැබීම පිළිබඳ කතා කළත් 78 ව්‍යවස්ථාවෙන් ගැහැනියගේ ආරක්ෂාව පිළිබඳව තහවුරු වුණත් ඇයට විඳීමට සිදුව ඇති කරදර ඉවරයක් නැත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් මිදීමට පුළුවන් වී නැත. ගැහැනිය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට මෙවන් සිවිල් සංවිධාන ඇතිවිය යුතුය.

"දැන් මෙලහට වින්තිකරුගේ ගෙදරට ලෙටර් ඔෆ් ඩිමාන්ඩ් ලිපිය ලැබෙන්ට ඇති. අපිට කටයුතු කරන්නෙ ඊට පස්සෙයි."

"අපි මේ සම්බන්ධයෙන් ජනමතයක් ඇති කරන්ට ඕනෑ."

"අපි උද්ඝෝෂණ ව්‍යාපාරයක් ගෙනියමු."

අමාලි කීවා ය.

"මේ ඉල්ලීම්වලට නිසි ප්‍රතිචාරයක් නොදක්වුවොත් අපි උපවාසයක් කරමු."

ඉසුරි යෝජනා කළා ය.

"කාන්තා සහයෝගය කියලා N. G. O. එකක් තියෙනවා. අපි ඒකට සම්බන්ධයි. ඒ නිසා මේකයි තවත් සාධාරණ හේතුත් එක් කරලා අපිට විරෝධතාවක් ඇති කරන්ට පුළුවන්."

"ඔව්. සමහර ගුරුවරු අතින් ගැහැනු ළමයින්ට ලිංගික අතවර වෙලා තියෙනවා. නොදැනුවත්කම නිසා එවගේ බලහත්කාර බවට ඒවා වෙනවා."

"දුප්පත්කම නැති බැරිකම වාගේ හේතුත් මේ අපචාරවලට මුල් වෙලා තියෙනවා. රස්සාවල් දෙන්න කියලා 17 - 18 තරම් ලාබාල ගැහැනු ළමයින්ව කොළඹට ගෙනැල්ලා සම්භාහන ආයතනවලට විකුණනවා."

වරුණි කීවා ය.

"ඔව්. අම්මල තාත්තලා හිතන්නේ ගැහැනු දරුවෝ කොළඹට වෙලා හොඳ රස්සාවල් කරනවා කියලා."

අවසානයේ තරුණියන්ගේ මතය වූයේ ගවේෂ්ට විරුද්ධව නීති මඟින් කටයුතු කර ස්ත්‍රී අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ය. රාත්‍රී තේ පැන් සංග්‍රහයක් සූදානම් කෙරිණ.

නිදන ගවුමට පිවිස කොට්ටය තුරුල් කරගත්ත ද ඇයට එකලස් සිතින් සුවව නිදා ගැනීමට ලැබුණේ නැත.

"මම පුද්ගලිකවම උඹට ආදරේ නිසා යමක් කියන්ටද?"

ඉසුරි කීවා ය.



"හා කියන්න."

"වරුණි නීතිය දන්න නිසා කිව්ව දේ ඇත්ත. උඹගෙ පින්තූරෙ හැම්තැනම ඇලවීම තුළ පුද්ගලිකව පළිගැනීමක් ඇති බව පේනවා."

"ඔව් ඉසුරි... ඒක නම් ඇත්ත."

N. G. O. වල වැඩ කරන එවුන්ට ඕනෑ ඒ රටවලට යවල ගාන කඩා ගන්ටයි. හැප්පෙන්න ගිහින් තමුන් අමාරුවේ වැටුණොත් කවුරුවත් නෑ."

එකවරම සිතට බියක් පිවිසුණේ ඇගේ කතාව ඇසීමෙනි.

"ගවේෂ් කියන එකා ලේසි පහසු මිනිහෙක් නෙමෙයි. කාට හරි කොන්ත්‍රාත් එකක් දීලා ඔයාට ඇසිඩ් පාරක් ගැස්සුවොත් මොකද කරන්නේ...?"

"දෙවියනේ... ඔව් නේද?"

"එහෙමත් නැත්නම් ඔය හැන්දෑවක යද්දී ඔයාගෙ මූණට මොනවා හරි අල්ලලා වාහනයක දාගෙන ගිහින් බලහත්කාරකමක් කළොත් මොන දෙවියන්ට කියන්නද?"

එම කතාව සත්‍ය වූවකි.

"මාව අනාථ කළොත්..?"

කන්‍යා දූෂණය ඔප්පු කිරීමේ කාර්යය පැමිණිල්ල සතුවේ. උසාවි ගියොත් කන්‍යා දූෂණය සිදු වූ දිනයේ තමා කන්‍යාවක්ව සිටි බව පැමිණිල්ල විසින් කියා සිටිය යුතුය. නව නීති වාර්තා 11/242 ලූසිනා නාමිට එරෙහි දියෙස් නාමි නඩුවේ දී ප්‍රකාශ වුණි. මගෙන් පළිගන්න දෙවියනේ මේකා මාව පැහැරගෙන ගිහින් දූෂණය කරයි ද?

මුළු ගතම දාඩියෙන් තෙත්ව ගියේ ය.

# 13

අසංක පැවසුවේ සත්‍යයකි. ගැහැනියෙක් ඕනෑවට වඩා අහංකාර වුවහොත් ආයතනයක් මෙන්ම නිවෙසත් ද පාලනය කළ නොහැකිය. එසේ වුවහොත් සැබෑ ලෝකයේ දී ජනතාවගේ පිළිකුලට භාජනය වනු ඇත.

''එවං අපි මෙකිගෙ ආඩම්බරකම නැති කරන්න ඕන.''

''ලක්ෂ පනහක වන්දියක් ඉල්ලන්න. මොනවද තියෙන වටිනාකම්.''

''අර පොඩ්ඩ ලක්ෂ පනහක් වටිනව කියලා හිතන් ඇති. එවං මූන්ට ගහන්ට ඕනැ මොනවයින් ද දන්නවද... බුවල්ලෙන්.''

අසංක සිංවේ කෝපයෙනි.

අසංකගේ කතාව සත්‍යයකි. පැහැදිලිව ගැහැනු කෙරෙහි සිතේ තිබුණේ ලොකු ගෞරවයකි. නංගී මට කොච්චර ආදරේ ද? ගෙදර ගියාම අම්මයි, මායි නංගියි තුන් දෙනා එක ඇඳේ නිදනවා.

''එවං ගවේෂ් අපි මේකිව පැහැරගෙන යමු.''

''එවං ගැහැනියක් පැහැරගෙන යාම අඩුවම ලැබිය යුතු බරපතළ වරදක්.''



''මනුස්මෘතියට අනුව පැහැරගෙන ගිහින් ජීවත් වීමත් එක විවාහ ක්‍රමයක්. කවදාවත් මෙකි හොඳ ගෑනියෙක් වෙන්නෙ නෑ.''

''හරි... එලනිව අපි පැහැරගෙන යන්නෙ කොහොමද?''

''මමත් දන්නෙ නෑ. ඒවට මිනිස්සු ඉන්නවා. සුදු වෑන්වලින් ඕනෑ තරම් පැහැරගෙන යන්නෙ.''

''පොලීසියට අහුවෙයිද?''

''එතකොට වෙන්න තියෙන දේවල් ඔක්කොම වෙලානෙ. කැමැත්තෙන් ආවෙ කියලා කියයි.''

ගවේෂ් මඳ වෙලාවක් කල්පනා කළේ ය.

''කැලෑ පත්තරයක් ගහන්ට යාමෙන් උඹට මගෙන් ප්‍රශ්න වුණා. මම කාමරේට ගෙනැත් දෙන්නම්.''

''කටගහගෙන ආවොත් මොකද කරන්නෙ...?''

''කට වැහෙන්න පාරක් දීපං. කොයි ගෑනිත් හඳන්නෙ කටින් බය කරල නාස් ලණුව දමාගන්නයි.''

''හා හරි දැන් කෙල්ලව හංගාගෙන ඉන්නෙ කොහේද?''

''කොහේවත් යන්ට ඕනෑ නෑ. මගෙ කාමරේට ගෙනෙත්.''

''මේවා ලෙහෙසියෙන් විසඳිය හැකි ප්‍රශ්න නොවේ.''

''උඹ දන්නෙ නැති වුණාට මම මීට කලින් කාමරේට කෙල්ලොත් ගෙනැත් තියෙනවා. සල්ලි දීලා වෙන අයත් ගෙනැල්ලා තියෙනවා. නියමෙට ආතල් එක ගනින්.''

ඔහුගේ සිතට තුහුරු සතුටක් ගලා ආවේ කිසිදාක විඳ නැති අත්දැකීමක් ගැන කතා කරද්දී ය. පැහැදිලිවම මැයට පාඩමක් ඉගැන්විය යුතුය.

''උඹ බයවෙන්න එපා. අපි කෙල්ලව ගේන්නේ සිහි නැති කරලයි.''

"ඒක හරි නැනෙ."

"එහෙමනම් පෝරුවෙ නග්ගලා බැඳලා ගේන්නද කියන්නෙ..? බූරුවෝ සිහි තියෙද්දි ගෑනියෙක් ගේන්ට පුළුවන් ද? සිහි නැතිවෙලා ඉන්න කොට උඹ කැමති දෙයක් කරගනින්. ඒතකොට ආඩම්බරකම යයි."

"කොයි වගේ දෙයක් ද?"

"අනේ මම දන්නෙ නෑ... හනිමූන් ගිය දවසටත් මට එන්ට වෙයි."

චලනී පැහැරගෙන පැමිණියායින් පසු කළ යුතු දේවල් පිළිබඳ ඔවුහු දීර්ඝ ලෙස සාකච්ඡා කළහ.

අඳුර සෙමින් ලොව වටකරගෙන ඇත. අසංකගේ මිතුරන් ඒවා නිසි පරිදි කරනු ඇත. කටයුතු සංවිධානය කිරීමට අසංක ගිය පසු සිතට තරමක බිය ඇති වුණි. කෙසේ වුවත් අනිවාර්යයෙන්ම ඇයට දඬුවම් දිය යුතුම ය.

"මචං උඹ නාලා පිරිසිදු වෙලා පලයං. කිසි දේකට බයවෙන්න එපා. ගෑනු කියන්නේ පුදුම ජාතියක්."

"අනේ මචං උඹත් වරෙන්."

"හල නම් තෙලටය කිව්වලු. මාව දක්ක ගමන් වෛර බඳියි. උඹට දෙන්නා කැමැත්තෙන් කරගන්ට පුළුවන්."

තමා බැලූ ඉංග්‍රීසි සිනමා කෘතියක මෙලෙස ගැහැනියක පැහැරගෙන ගිය කතාවක් තිබුණා ඔහුට ය. ගැහැනුන් පැහැරගෙන ගිය කතා ඇත්තේ නොදියුණු ශිෂ්ටාචාරවල ය. නමුත් මෙය ආදර කතාවක් නොවේ. මිතුරාගේ කාමරයට වී සිටියේ චලනී පැහැරගෙන එනතෙක් ය. ත්‍රිවීලරයක හඬ ඇසුණු නොබෝ වේලාවකින් දොරට තට්ටු කරන හඬ ඇසුණි.

"සර්... අයි. අයි... ගෙනාව."

ගවේෂ් දොර විවෘත කළේ ය. චලනී දෑතට ඔසවාගෙන



කාමරයට පැමිණි මැරයන් දෙදෙනා ඇය ඇඳ මත තබා යන්ට ගියහ.

ඔවුන් තරුණිය ඇඳ මත තබා ගියේ ඇඳිවත පවා විසිර යන පරිදි ය. ජීවිතයේ කවදාවත් තමා ගැහැනියක සමඟ මෙලෙස කාමරයේ තනිව සිට නැත.

දෑස් පියා තද නින්දක වැටී සිටියත් සුන්දර උවනේ ලස්සන නැතිවී තිබුණේ නැත. සිහි ගන්නා ගැහැනු දේහය දුටු සැණින් සිතේ අම්භාප පහව ගියාක් මෙන් දැනුණි.

සම්භාරවිට මෙය ඇගේ ජීවිතය ලියා තැබූ ආකාරය විය යුතුය.

ආවේග බහුල පිරිමියෙක් වශයෙන් සුන්දරත්වයේ දී මෝඩයෙක් වීමට පුළුවන්කමක් නැත. ගැහැනියක් හා තනිව සිටි රාත්‍රියක සැබෑ ලෝකයේ දී සිදුවන ඕනෑ දෙයක් සිදුවිය හැකිය.

ඔහු මේස ලාම්පුව නිවිටු කර ඇගේ උවන දෙස බැලුවේ ය. දෙවියනේ මෙච්චර ලස්සනක්. දෙනෙත් අඩවන්ව තිබුණි.

කැපී පෙනෙන තියුණු ආසක්ත බවක්, නාදල්ලයින් හෝ රතු පැහැති මලකින් උදුරාගත් රතු පැහැය දෙතොල්වල තැවරී තිබුණි.

පැහැදිලිවම ගැහැනියක් නැතිනම් ලෝකයක් නැත. ලෝකයේ රන්, මුතු, මැණික්, මුදල් වශයෙන් කුමන වටිනාකම තිබුණත් ගැහැනිය තරමට වටිනා සම්පතක් ලොව නැත.

මිනිසුන් මේ වටිනා ධනය වැය කරන්නේ ගැහැනු වෙනුවෙනි. ඕනෑ ආභරණයක මැණිකක වටිනාකම ඇත්තේ ගැහැනු දේහයක පැළඳි විට ය.

එසේම ස්වභාව ධර්මයේ සැබෑ සුන්දරත්වය ඇත්තේ ඇය මුකුත්ම නැතිව සිටින විට ය.

ගැහැනිය ප්‍රථමයෙන් නිර්මාණය වූ අතර ඇඳුම් සොයා ගත්තේ පසුව ය.

ස්වභාව ධර්මයේ ඒ සැබෑ නිර්මාණය මුකුත්ම නැතිව දැකීමට ඔහු ආශා කළේ ය. ඇය මුනින්තලාව, ඇඳේ වැතිර සිටින විට හදවතට ඇති වූයේ අසමාන සතුටකි.

හරියට මලින් කළ රූපයක් වගේ. මේ රූපය වර්ණනා කරන්නේ කොහොමද?

රතු නෙළුම් මල් දෙකක් පපුවට තියාගෙන ඉපදිලා වගේ. සිහිනිඟ, දෙවටොර, රිදී පාසළඹක් බැඳි තිරුවත් දෙපා දෙස තව දුරටත් බලා සිටීමට ඔහුට නොහැකි වුණි. නින්දෙන් පිබිදුණත් ඇයට තමාගෙන් මිදීමට පුළුවන්කමක් නැත.

ගවේෂ් ඇඳේ වැතිර මෘදු ලෙස ඇගේ බඳ වටා අතක් දමා තමා දෙසට හරවා ගත්තේ ය. තව දුරටත් ඒ කුසුමේ සුවඳ නොබලා සිටිය නොහැකි ය. ආසක්ත බවින් යුතුව ඔහු චලනිව තුරුල් කරගත්තේ ය

"මොනවද යකෝ... මේ කරන්නෙ. නිදාගන්ට දෙන්නෙ නැද්ද?"

අසංක උස් හඬින් කෑගසන හඬ ගවේෂ්ට ඇසුණි.

ඔහු යළිත් නිදිමතේම අසංක බදා ගත්තේ ය. අසංක බැණ වදිමින් නැගිට ඇඳේ ඉඳගත්තේ ය.

"උඹට මේ අලි ඇඳ මදිනෙ. මම බිම නිදාගන්නම්."

"වරෙන්... වරෙන්... මම හීනයක් දැක්කා. උඹ ඒක කැඩුවෙනෙ. ෂත්... මරු හීනයක්. උඹ තව ටිකක් ඉන්න දුන්නෙ නෑනෙ."

—



# 14

කාන්තා පිළිබඳව හරි ආරංචියක් චලනිට ලැබුණේ නැත. ඔහු තවම කරාපිටියෙන් බෙහෙත් ගන්නවා විය හැකිය. රංජිත් බාප්පා ද තවම පොලිසියට කට්ටි පනිමින් සිටියි. මහප්පාගේ නඩුය තවම සාදා නැත.

එකම සහයකට ඇත්තේ සතිපතා එන මංගල යෝජනා නතරවීම ය. දැන් තමා පිළිබඳව වෙහෙසෙන්නේ නේවාසිකාගාරයේ මිතුරියන් ය.

බෝඩිමේ සන්ධානයේ ඇතැමුන් අන්තවාදී වාමාංශික සංවිධානවල සම්බන්ධ වූවන් ය. තවත් පිරිසක් රාජ්‍ය නොවන සංවිධානවල ක්ෂේත්‍ර නිලධාරින් ලෙස සේවය කරති.

චලනි වැඩ අවසන් වූ පසු අතරමග නොනැවතී නවාතැනට එයි. සතිඅන්ත බැංකුවල සහභාගි වී එනවිට රෑ බෝවෙයි. බසයෙන් බැස ධර්මාරාම පාර දිගේ තනිව ආ යුතුය.

අද මිනිසුන්ට අනතුරු සිදුවන්නේ නිකම්ම නොවේ. රාජ්‍ය නායකයන් ඝාතනය කරන්නේ සැලසුම් සහගතව ය. දින කිහිපයක සිට නාඳුනන අයෙක් තමා පසුපස එන බව දුනුගේ [illegible]

දුරට පරීක්ෂාකාරීව ඉඳීමෙන් පසුව ය. ඇගේ මතකයේ හැටියට එදින ඉරිදා දිනයකි.

බෙංගාල බොක්කේ පැවති වායු අවපාතයක් නිසා මුළු දවසම නොනවත්වාම වැස්සේ ය. බැංකු පන්තිය වෙනදාට වඩා කලින් අවසන් වුණි. වැස්ස අඩුවක් නැති නිසා ඇය ධර්මාරාම මාවතට ත්‍රීවීලරයෙන් යාමට අදහස් කළා ය.

වැස්සේ නවාතැනට එනවිට සන්ධානයේ මිතුරියන් රැස්ව සිටිනු දුටුවා ය.

''ඉක්මනට ලෑස්තිවෙලා වරෙන් උඹ විතරයි අඩු.''

කාමරයට දුව ගිය ඇය මුහුණ සෝදා කොට කලිසමකින් හා සැහැල්ලු කමිසයකින් සැරසී ආවා ය. රාත්‍රී ආහාරය සූදානම් වන තෙක් තේ පානය කළා ය.

''ගැහැනුන්ට විඳින්නට සිදුවන අසාධාරණය එන්න එන්නම වැඩියි.''

වරුණි කීවා ය.

''ඔව් ඇත්ත ගැහැනු වෙනුවෙන් මීට වඩා ජනතාවගේ අවධානය යොමු වෙන්ට ඕනෑ.'' ඉසුරි කීවා ය.

''යුරෝපයේ ගැහැනියකට තියෙන අසීමිත නිදහස ආසියාවේ ගැහැනුන්ට නෑ.''

''හිමිවිය යුතු ගෞරවණීය බව ගැහැනියකට හිමිවන්නේ නෑ.''

''මේ පිළිබඳව ආකල්පමය වෙනසක් ඕනෑ. මම නම් හිතන්නේ මේවා නීත්‍යානුකූලව ඇති කරන්ට බෑ. ගැහැනියකගේ විවාහය සඳහා නිශ්චිත වයසකුත් තියෙන්ට ඕනෑ.''



වෛද්‍ය සිසුවියක් වන රශ්මි යෝජනා කළා ය.

''වැඩිවියට පත් වූ දවසේ ඉඳලා දරුවෙක් ලැබෙන්නට හැකියාව තිබුණත් වරුණි කිව්වා වගේ විවාහ වෙන්න නිශ්චිත වයස් සීමාවක් තියෙන්න ඕනෑ. එතකොට තමයි නිරෝගී දරුවන් බිහි කරන්ට පුළුවන් වෙන්නේ.''

මේවා සැබැවින්ම සාකච්ඡාවට බඳුන් විය යුතු සමාජ සංස්කෘතික ප්‍රශ්න වේ. අද ඉන්දියාවේ ගැහැනු දරුවන් ඉපදීම බරපතළ සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇත. බාල වයස්කාර දරුවන් මවුපියන්ගේ කැමැත්තෙන් අවුරුදු 70, 80 වයස්වල විවාහ කරදීම සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන හා කාන්තා සංවිධාන විරුද්ධව නැඟී සිටියත් ඒ පිළිබඳව ඔවුනට කිසිවක් කරකියා ගත නොහැකි ය. අද ලංකාවේ මධ්‍යස්ථාන රැසක් ක්‍රියාත්මක වෙයි. ඒවායේ සේවය කරන්නේ අවු. 17-18 පාසල් යන වියේ බාලලියන් ය. සේවාදායකයන් ලෙස මෙම ආයතනවලට එන්නේ මහලු මිනිසුන් ය. සම්භාහනය පිළිබඳව කතා කළත් අවසානයේ බැලලියන් වෙතින් සිදුවන්නේ වෙනත් ලිංගික කටයුත්තකි.

අංගභාග හා වෙනත් හන්දිපත් ව්‍යායාම සඳහා සම්භාහක වෛද්‍යවරුන් හා පෞද්ගලික අංශයේ, නමුදා රෝහල්වල ඇත. ගැහැනුන් වෙළෙඳාම් වන වෙනත් පෞද්ගලික ආයතන ඇත.

''අපි පුවත්පත් සාකච්ඡාවක් කැඳවලා තියෙනවා. ඉස්සෙල්ලා අපි කරන දේවල් පිළිබඳව මාධ්‍ය දැනුවත් කරලා තියෙන්ට ඕනෑ.''

අරුණි කීවා ය.

''ඔව් ඒක හොඳා. ඊට පස්සේ අපිට කාන්තාවන්ට එරෙහිව කරන හිංසනය පිළිබඳව ජනමතයක් ගොඩනගන්ට පුළුවන්.''

අප්සරා කීවා ය.

"අපිට චලනිගෙ වගේ ප්‍රශ්න ගොඩාක් ඉස්සරහට හමුවෙයි. අපි මේකට එරෙහිව පිටකොටුවේ ස්ටේෂන් එක ළඟ විරෝධතා ව්‍යාපාරයක් කරමු."

අසංකා කීවාය.

චලනි පිළිතුරක් නොදී සිටියා ය.

"පැහැදිලිවම අපට චලනිව වෙච්ච අසාධාරණය වෙනුවෙන් ලක්ෂ පනහක් ගන්ට පුළුවන්. පහළ උසාවියේ දී මට කතා කරන්න කියලා ඩග්ලස් සර් කිව්වා. නඩුව අනිවාර්යෙන්ම ඉහළ උසාවියට තියෙනවා. එතකොට මගේ සීනියර් ජනාධිපති නීතිඥවරයෙක් එයා කතා කරයි."

හැම දෙනාගේම උත්සාහය වූයේ චලනිගේ නඩුව දිනා දීමට ය.

"හැබැයි චලනි ඔයත් හොඳ කල්පනාවෙන් ඉන්ට ඕනෑ."

වරුණි කීවා ය.

සැවොම ඇගේ කතාව අනුමත කළා ය.

"දන් වුදිතයා ඇවිස්සිලා ඇති. ඔයාව බලපෑම් කරන්න. හිරිහර අතවර කරන්නට පෙළඹෙන්නට පුළුවන්."

"මාත් ඒක තමා මෙයාට කිව්වෙ."

ඉසුරි කීවා ය.

"ඔයා පන්ති ඇරිලා එනකොට රෑ වෙනවද?"

"බැංකුවේ වැඩ තිබුණොත් රෑ වෙනවා. එතකොට නම් ට්‍රාන්ස්පෝර්ට් ලැබෙනවා. බැංකු ක්ලාස් ගිහින් එනකොට තමයි රෑ වෙන්නෙ."



"පාරෙ තනියම යන්ට එපා. රෑ වුණොත් ත්‍රීවීලර් එකකින්ම හොස්ටල් එකට එන්න."

සති අන්ත බැංකු පන්ති ගිහින් එනවිට චලනිට මුහුණ දීමට සිදු වූයේ බරපතල ප්‍රශ්නයකට ය. උදේ සිට ඇද හැළුණු වැස්ස නිසා පරිසරයේ මහා පාළු බවක් පැතිර තිබුණි. බසයෙන් බසිද්දී වුවද වැස්ස තුරල්ව තිබුණේ නැත. මාවත අයිනේ නවතා තිබූ ත්‍රීවීලරය වෙත ඇගේ නෙත යොමු වුණි. නොසිතූ ලෙස ත්‍රීවීලරය ඇය ඉදිරිපිට නැවතුවේ ය.

"කොහේටද මිස්...?"

"ධර්මාරාම පාරේ, ගර්ල්ස් හොස්ටල්."

"සියක් ඕනෑ."

"වෙනදා යන්නෙ හැටට."

"හා කමක් නෑ යමු."

ඇගේ සිතේ ඇති වූයේ කෝපයකි. ත්‍රීවීලරය ඉදිරියට ඇදී යයි.

තමා මේ යන්නේ තම තීරණාත්මක ගමන යැයි ඇයට කිසි විටෙක සිතුණේ නැත. වැස්සෙන් බේරීමට ඉවිරෙද්දී දුම් පළු ත්‍රීවීලරය තුළ තදබල අඳුරක් ඇතිවුණි.

මඳ දුරක් යද්දී කිසිවෙක් අත දිගු කරනවා ඇය දුටුවා ය.

රියදුරා රිය නතර කළ පසු සිතට පිවිසුණේ කෝපයකි.

"බයවෙන්න එපා මිස්. අපේ කෙනෙක් ඉස්සරහින් බසිනවා."

රථය ධර්මාරාම මාවතේ නතර නොකර වේගයෙන් ඉදිරියට ගියේ ය.

"මේ කොහේද යන්නේ...? නතර කරනවා... නතර කරනවා නැතිනම් මම පනිනවා."

"කැගැහුවොත් බලාගෙනයි."

කිසියම් ආයුධයක් ගෙලට තබා උස් හඬින් කෑගසන හඬ වලනිට ඇසුණි. ඒ සමගම කිසියම් විසක් නාසයට අල්වනවා දැනුණු සැණින් ඇයට සිහි නැතිව ගියේ ය. මහා වේදනාවකින් ගත දුර්වල වන බවක් ද ඇයට දැනුණි.

වලනිට යළි සිහිය ලැබුණේ වේදනාව අතරිනි. කොහේදෝ නැති සීතලක් ළයට දැනුණි. මුළු ගතම සිස්ව ඇති බව දැනුණේ යාන්තමින් සිහි ලද පසුව ය. දෙවියනේ මුන් මට මොනවද කරන්න හදන්නෙ. ඇය ළය දෑතින් වසා ගැනීමට අසාර්ථක උත්සාහයක යෙදුණා ය.

ගවේෂ් කාමරයට පිවිසෙනු දුටු ඇගේ සිතට පිවිසුණේ කෝපයකි. තමා මෙම ජරා මිනිහා හඳුනාගෙන හමාර ය. ඔහු නිරුවත් ගැහැනු සමඟ ඡායාරූපවලට පෙනී සිටීමෙන් තමාගේ පහත් තත්ත්වය ප්‍රකට කර ඇත. පැහැදිලිවම තමා පැහැරගෙන එන්ට ඇත්තේ අපරාධයක් කිරීමෙන් තමාගෙන් පළිගැනීමට ය.

කිසිම කතාවක් නැතිව ඇඳට පැමිණි හෙතෙම සිය ශක්තිමත් දේහයට තමා යට කරගත්තේ ය. කොපමණ කෑගැසුවත් ඔහුගෙන් බේරීමට හැකි වූයේ නැත. තිරිසනෙක් මෙන් ඔහු ඇයව දූෂණය කළේ ය.

"තමුසෙට හොඳක් වෙන්නෙ නෑ... මොකද්ද මේ කළ අපරාධය."

"ලක්ෂ පනහකට වඩා මේක මට වටිනවා."

ඔහු යළි තමා දෙසට එනු දුටු වලනි උස් හඬින් කෑගැසුවා ය.



# 15

කාන්තා නේවාසිකාගාරයේ විවිධ වර්ගවල විවිධ වෘත්තීන් හි නියැලෙන තරුණියන් ජීවත් වෙති. වාමාංශික අදහස් ඇති කාන්තා අයිතීන් පිළිබඳව සටන් වදින්නන් වෙති.

පැසිපන්දු, දැල්පන්දු, බැඩ්මින්ටන්, ක්‍රිකට් වැනි ක්‍රීඩාවන්ගේ ජාතික මට්ටමේ සිටින තරුණියන් ද නේවාසිකව සිටිති. වලනිට සිදු වූ කරදරය පිළිබඳව මේ සැවොම දැන සිටියහ. මෙම සිදුවීම පිළිබඳව හරියටම දැන සිටියේ වලනි නිදා ගන්නා කාමරයේ සිටි ඉසුරි පමණි. මෙම මංගල යෝජනාව නිසා සැහැල්ලු ලෙස ජීවත් වූ තරුණියකගේ ජීවිතය උඩු යටිකුරු වී ඇත. කෑම මේසයට යන්නේ ඉල්ලීම නිසා ය. කෑම කටක් කන්නේ පෙරැත්ත කළ විට ය.

රාත්‍රී විදුලි පහන දල්වා තිබෙන නිසා නිදන ගවුමින් සැරසී ලතාවකට නිදා ගන්නා අයුරු පෙනේ.

වලනි උස් හඬින් ලතෝනි දෙනු අසා ඇය නැගී සිටියා ය.

"අනේ... අම්මේ... මගේ වරදක් නෑ අම්මේ.."

ඇය ඇඳේ ඉඳ හිස බදා කෑගසන්ට වූවා ය.

"ඇයි යකෝ... අපි නිදන්නෙ නැද්ද? මොකද මේ මරහඬ දෙන්නේ..?'

ඉසුරි උරහිසින් සොලවමින් කීවා ය.

"බලපං මට වෙච්ච දේ... අර තිරිසනා මාව විනාශ කළා."

"කොයි තිරිසනා ද?"

"මම දැන් අම්මට මූණ දෙන්නෙ කොහොමද?"

ඇය දෑස් පියාගෙන කීවා ය.

"හරි... හරි... අපි ඒකව පොලීසියට අල්ලලා දෙමු."

ඇය වලනිගේ හිස පිරිමදිමින් කීවා ය.

"පන්සිල් සමාදම් වෙලා නිදාගනින්."

පන්සිල් සමාදම් වී නිදා ගැනීමට වෙර දැරුවත් ඇය වෙත නින්ද ළඟා වූණේ නැත. තම ජීවිතයට කවදාවත් මෙවන් ප්‍රශ්නයක් ඇති වෙතැයි වලනි සිතා තිබුණේ නැත. ඉකුත් ජීවිතයේ දී තමාට විවිධාකාර වූ මිනිසුන් මුණ ගැසී ඇත. විවිධ තරාතිරමවලින් යෝජනා ලැබී තිබුණි. තවත් විපරම් කරති.

බලහත්කාරයෙන් තමා පැහැරගෙන ගොස් විපතක් කරතැයි ඇයට නිකමටවත් සිහි තිබුණේ නැත.

එවන් වනචර දූෂ්‍ය පළිගන්නා සුලු තැනැත්තෙකු ඉන්නා දෙසින් හමන සුළඟටවත් ඇය කැමති නැත.

දුටුවේ සිහිනයක් වුවද එය ඔහුගේ ස්වරූපය විදහා පාන්නකි. ඔහු තරම් තම ජීවිතයට බලපෑ තවත් කෙනෙක් නැත. පවුල් අවුල් කළේ ඔහු විසිනි. තාත්තාගේ රෝගී තත්ත්වය පිළිබඳ කිසිදු ආරංචියක් නැත. බාප්පා නීතිඥයෙක් මගින් උසාවියට බාර වී ඇත.



මේ හැමදේකට වරද පිට අය වෙත පැවරිය නොහැකි ය. ඉසුරි යෝජනා කළ පරිදි මනමාලයා හමුවට ගොස් ආවා නම් මේ කිසි දෙයක් වන්නේ නැත. දැන් ඔහු රෝගයක් බවට පත්ව ඇත. සිත නිදහස් වන හැම මොහොතකම ඔහු සිතට පිවිසෙයි.

ඔහු ලෙහෙසියෙන් යටත් කිරීමට හැකි පුද්ගලයෙක් නොවන බැව් තේරී හමාර ය. දැන් ඔහුට එරෙහිව උසාවි යාමට ද සිදුව ඇත.

මෙම නඩුව සඳහා තමාගෙන් කිසිම වියදමක් නැත. කරන ලද අපහාසය වෙනුවෙන් ලක්ෂ පනහක වන්දියක් ඉල්ලා නඩු පවරා ඇත.

වරුණි උදේ පාන්දර කාමරයට ආවේ තේ ජෝගුව ද රැගෙන ය.

"නැගිටල තේ එක බීපං."

නිදි ගැට කඩා නැගී සිට කට සෝදා පැමිණි වලනි තේ කෝප්පය අතට ගත්තා ය.

"වරුණි ඊයෙ රෑ මාර වැඩක් වුණානෙ."

"මොකක්ද?"

වරුණි ඇසුවා ය.

"මෙකි ඊයෙ රෑ හීනයක් දැකලා."

වරුණි පිළිතුරක් නොදී සිනාසුණා ය.

"ඊයෙ රෑ මෙයා අර බෝයිව හීනෙන් දැකලා."

"කොයි වගේ හීනයක් ද?"

"වලනිව දූෂණය කරන්ට ඇවිදින්."

වරුණි හිස වනා එය අනුමත කළා ය. වලනි පහන් කරගත්

හිසින් යුතුව තේ කෝප්පය බිව්වා ය.

''හිතෙන් බලහත්කාරකමක් කරන්ට ආවා කියලා ඔප්පු කරන්ට බෑ.''

''මේකා කෙල්ලගෙ හිතට පිවිසිලා.''

''බොළඳ ගැහැනියෙක් වෙන්න එපා. කොපමණ අකමැති බව ප්‍රකාශ කළත් මේ කටයුත්තට ගැහැනු කැමතියි.''

''නෑ නෑ මම කැමති නෑ.''

චලනි කීවා ය.

''කාන්තාවන්ට වෙන අසාධාරණකම්වලට එරෙහිව අපි අද විදි බහිනවා. පිටකොටුවෙ ස්ටේෂන් එකට.''

• • • • • • • • • • • • •

ගවේෂ් ගේ සිතේ වූ උනන්දු ගතිය හීන වී ගොස් ය. පාඩුවක් කිරීමට ආශාවක් නැත. බෝඩිමේ තනිව සිටීමට නොහැකිය. කවුරුන් හෝ තමාට බෝම්බ ගසාවී යන අවිනිශ්චිත බියක් සිතේ ඇත.

මේකි මගෙ ජීවිතය නැති කළා. කන්ට ගියත්, නිදන්ට ගියත්, නාන්ට ගියත් ඇය සිහිවෙයි. විභාගය අත ළඟ වුණත් කිසිවක් පාඩම් කිරීමට නොසිතේ.

''වස්තුව උඹට මොකද වෙලා තියෙන්නෙ...?''

අසංක ඇසුවේ ය.

ඔහු උදාසීනව බලා සිටියේ ය.

''උඹ ඔහොම හිටියොත් ලෙඩ වෙනවා. වරෙන් මා එක්ක ගමනක් යන්ට.''



''කොහේද?''

''උඹ මෙහෙම හිටියොත් පිස්සන් කොටුවට තමා ගෙනියන්ට වෙන්නෙ. අපි වැඩකට ගිහින් කොහෙන් හරි රෑට කාලා එමු.''

ගවේෂ් මිතුරා සමඟ එක් වූයේ තනිකමක් දැනුණු හෙයිනි. සිතේ ජවය ගිලිහී ගොස් ය. කැමරා මෙවලම් කරේ දමා ගත් අසංක නිවෙසින් පිටතට ආවේ ය. ගවේෂ් යතුරු පැදියේ අඳ හෙල්මට්ටය පැලඳ ගත්තේ ය.

''මචං හෙමින් යමං. මේක රේස් එකක් නෙමේ.''

''මාව ටිකක් අල්ලා ගනින්. අපි දැනටමත් පරක්කුයි.''

සයිකලය පිටකොටුව දුම්රියපොළ අසල නතර කරන විට වාහන තදබදයක් දිස්වුණි. දුම්රිය පොළ ඉදිරිපිට කාන්තාවන් උද්ඝෝෂණ ව්‍යාපාරයක යෙදෙනු ගවේෂ්ගේ නෙත ගැටුණි.

''මොකද මේ පිකටින් කරන්නෙ..?''

ගැහැනියට සමාජය ඉදිරියේ අපේක්ෂිත සාධාරණය ඉටුවී ඇතැයි පැවසිය නොහැකිය. බුදුරජාණන් වහන්සේ ගැහැනිය මෙවැනි සස්නට එක්වරම ඇතුල් කර ගත්තේ නැත. පිරිමියා සමඟ උරෙනුරෙන් ගැටී සංවර්ධන කාර්යයේ යෙදෙන ගැහැනිය පැහැදිලිව අගය කිරීමට ලක්ව තිබේ ද?

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වෙනි පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් යටතේ 12 වැනි වගන්තියේ දෙවැනි කොටසේ භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය යටතේ ගැහැනිය වෙනස් වීමකට යටත් නොවිය යුතු බව සඳහන් වේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡා කර ඇත. නීතිය ඉදිරියේ ගැහැනියගේ ආරක්ෂාව පිළිබඳ කවර ප්‍රතිපාදන තිබුණත් ඇයට

සිදුවන අසාධාරණකම මීට දශක කිහිපයකට තිබුණටත් වඩා වැඩිය. ශ්‍රම වෙළෙඳපොළ තුළ අද තරගකාරී බවක් ඇත. ලිපිකරු, ගුරු සේවය, නීතිය, වෛද්‍ය වැනි සම්ප්‍රදායික රැකියාවලට වඩා අද වෙනත් රැකියා ඇත. ඇඟලුම් කර්මාන්තය නිසා තරුණියන් ගම හැර දා නගරයට සංක්‍රමණය වී ඇත. කර්මාන්ත ශාලාවල අඩු මුදලකට කාන්තා ශ්‍රමය අලෙවි වෙයි. පාර තලන, කුණු ලොරිවල සේවය කරන, සිමෙන්ති වැඩපළවල තද අව්වේ සිමෙන්ති තාච්චි ඔසවන මෙහෙකාර සේවය සඳහා විදේශ රටවලට ශ්‍රමය විකුණන දහස් සංඛ්‍යාත වූ ගැහැනුන්ට ආරක්ෂාව තිබේ ද? ලෝකයේ යුද්ධය නිසා අවතැන්ව සරණාගත කඳවුරුවල සිටින ගැහැනුන්ට ආරක්ෂාව තිබේ ද?

"මචං මේ ඇත්තටම උද්ඝෝෂණ කරන ඒවා ද?"

"ඇත්තක් නැහැයි කියන්වත් බෑ. N. G. O කාරයො ඉන්නවා, බලයට පත්ව සිටින රජයට විරුද්ධ අය ඉන්නවා."

අසංක විවිධ සටන් පාඨ රැගත් තරුණියන් සිය විඩියෝ කැමරාවෙන් රූගත කර ගත්තේ ය.

ලිප්ස්ටික් තවරා අවකණ්ණාඩි පැළඳ තම යෞවනයේ අයිතිවාසිකම් සඳහා කරන සටන මොකද්ද? හරියට වැසිකිළියක් නැති, ඇඟ සෝදා ගැනීමට වතුර නැති, හරියට ඇඳුමක් මාරු කර ගැනීමට තැනක් නැති, ආශාව වෙනුවෙන් පිරිමියෙක් සමඟ සැතපීමට තැනක් නැති ගැහැනු මේ රටේ කොච්චර ඉන්නවාද?

හොඳට දුක පුරුදු ගැහැනු රුවක් දුටු ඔහු මොහොතකට නතර වුණි.

"බලපං අර කෙල්ල අඳුනනවද කියලා."



## 16

මේ ලෝකය රැදී පවතින්නේ මිනිස් අයිතිවාසිකම් වෙනුවෙන් කරන සටන් නිසා ය. අපි සටන් වැදිය යුත්තේ කුමක් අරභයා ද? වලනිව තමා අතින් වරදක් සිදු වී ඇද්ද?

ඇය මේ සටනට එළඹ ඇත්තේ අවබෝධයෙන් ද? ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, කාන්තා හිංසනය, බාල අපචාරය ගැහැනුන්ට විඳීමට සිදුව ඇති විවිධ වද හිංසා පිළිබඳව තනිව ගැහැනියකට නැඟී සිටීමට පුළුවන් කමක් නැත. ප්‍රේමාලාප දොඩනවාට වඩා ගැහැනු අයිතිවාසිකම් වෙනුවෙන් අද යමක් කළ යුතුව ඇත.

"උඹට ළඟ තියාගන්න මෙයාගෙ පින්තූර ටිකක් අරන් දෙන්නද?"

"මට වැඩක් නෑ."

ඔහු නොසැලකිල්ලෙන් යුතුව කීවේ ය. වෙනත් ගැහැනුන්ට මෙන් නොව ඇයට තිබුණේ උදාසීන පෙනුමකි.

"හොඳට ළංවෙලා බඩු කෑල්ල දිහා බලපං."

"මට ඕනෑ නෑ මචං."

"බලපං හැන්දෑවේ ඉරට රත් පැහැ වෙච්ච රෝස පාට මූණ.

මේ පේන තැන විතරයි. ගෑහැනුන්ගෙ තව කොච්චර ලස්සන තැන් තියෙනවද?''

ඔහුගේ කතාව සත්‍යයකි. වඩාත් සුන්දරව ඒ රුව සිහිනෙන් දුටුවා මතක ය.

එය ලං නොවූ සතුටකි. ඒ ගැන කිරීම් නිමව ඔවුහු නවාතැනට ගියහ.

ඉතා ප්‍රීතියෙන් හා අධ්‍යාපනය පිළිබඳව වූ තදබල උනන්දුවකින් සිටි ඔහු අද ගත කරන්නේ මහා උදාසීන ජීවිතයකි.

වෙනදා කෑමකට ගියහොත් හොඳට ඇඟට දනෙන්නට ආහාර ගැනීම ඔහුගේ සිරිත ය. අද කෑම කන්නේ පෙරැත්තයෙනි.

අසංක මිතුරාගේ වෙනස පැහැදිලිව තේරුම් ගත්තේ ය. තනිව සිටියහොත් රෝගියෙක් වෙතැයි සිතුණු හෙයින් ඔහු මිතුරාව සිය නවාතැනට කැඳවාගෙන ගියේ ය.

''මොකද්ද මිනිහො උඹට වෙලා තියෙන දේ...?''

ඔහු පිළිතුරක් නොදී සිටියේ ය.

වෙනදා කොතරම් උද්දාමයකින් පසුවන අයෙක් ද?

දින කිහිපයකින් ඔහු රැකියාවට ගියේ නැත.

''මචං උඹට මොකද වෙලා තියෙන්නෙ...?''

''මට මුකුත් වෙලා නෑ. මම මේ දවස්වල පත්තර ලිපියක් ලියනවා.''

''හේ... මරුනෙ. මම මේ උඹට කියන්නම හිටියෙ. අපේ පත්තරේට ලිපියක් ලියපං.''

''එච්චර සාර්ථකයි කියලා මම හිතන්නෙ නෑ. ඒක කපල කොටල හොඳ නම් දාපං.''

''උඹ වාගෙ බුද්ධිමතෙකුගෙ ලිපියක අපිට සඩ කරන්ට දෙයක් නෑ.''



''එහෙම කියන්ට එපා. මේ උඹලගෙ පත්‍රයට ගැළපෙන්ටත් ඕනැනෙ.''

''මම අපේ බොසාට මේක දීලා බලන්නම්.''

''අපේ යාළුකම වෙන දෙයක්. ලිපියක් කියන්නෙ වෙන දෙයක්.''

''හවසට මොකද කරන්නෙ..?''

''මේ දවස් ටිකේ කොහේවත් යන්නෙ නෑ.''

''උඹ චිත්‍ර ශිල්පියෙක්නෙ. පුළුවනි නම් කතාවට ස්කෙච් එකක් කරපං.''

''මේක මේ ගෑනු ගැන ලියපු ආටිකල් එකක්. ඇයි අරවින්දය ඉන්නෙ. ඌ ගෑනුන්ගෙ අරව මේවා අඳින්ට දස්සයිනෙ.''

''එත් නෑ. ලොක්කා මොනවා හරි කරගනියි. හැන්දෑවට යමනක් ගිහින් එමුද?''

''කොහේද?''

''අපේ ගජයෙක් බැන්දා. වෙඩින් එකට යන්ට බැරි වුණා. හෝම්කමින් එකට දුවලා එමුද?''

''පිස්සුද මට අනුන්ගෙ වෙඩින්වලට යන්ට පුළුවන් ද?''

''ආරාධනා නැතිව අපි කොච්චර වෙඩින්වලට ගිහින් තියෙනවද? යමංකො ඌ උඹ වගේම මගේ ගජයෙක්.''

''ඔය උඹ මාව එක්ක යන්නෙ වෙන වැඩකට.''

''නිකං බයිල කියන්නෙ නැතිව හිටපං. කොච්චර බීලා ආවත් පත්තර කාරයන්ව පොලීසියෙන් අල්ලන්නෙ නෑ. ඒක මම බලාගන්නම්. උඹ එරෙන්.''

''ලැජ්ජා නැද්ද බං අහගෙන එතුල් යන්ට.''

''අපි එහෙමයි. මටත් මඟුල් කියල නෑ. ගිහින් පිස්සුවක් කෙළලා එමු.''

• • • • • • • • • • • • •

සැමදෙනාම දුක් වූයේ චලනිට සිදු වූ දෙය ගැන ය. නේවාසිකාගාරයේ සිටි ක්‍රියාශීලී දඟකාරිය වූ චලනි අද දුර්වල උදාසීන කාන්තාවකි. නේවාසිකාගාරයේ නිරතුරු උත්සව පැවැත්වෙයි.

වෙනදා ඒවා සංවිධානය කරන්නේ චලනි විසිනි. දැන් ඇය කාමරය තුළින් පිටතට එන්නේ නැත.

ප්‍රියංගි නේවාසිකාගාරයේ සිටි ලස්සන යුවතියකි. දොඩම්ගස්ලන්ද පළාතෙන් පැමිණි ඇය නීති ශිෂ්‍යාවකි.

ඇය විවාහ වූයේ පිළියන්දල ව්‍යාපාරිකයෙකුගේ පුතෙක් සමඟිනි. එම විවාහ මංගල උත්සවය තිබුණේ අඹගමුව උත්සව ශාලාවක ය.

නේවාසිකාගාරයේ වැඩි දෙනෙක් මනාලයාගේ නිවෙසේ පැවැත්වෙන ප්‍රිය සම්භාෂණයට සහභාගි වීමට කැමැත්ත ගත්හ.

දුර ගමන් සඳහා සූදානම් කරගත් බසයක් ඇත. මේ ගමනට යාමට සැවොම සූදානමින් සිටියහ.

මේ සඳහා කිසිම සූදානමක් නැතිව සිටියේ චලනි පමණි.

''කෙල්ලෙ උඹ ප්‍රියංගිගෙ හෝම්කමින් එකට අඳින්නෙ මොකද්ද?''

චලනි කිසිදු පිළිතුරක් නොදී ඇඳ බදා ගත්තා ය.

''උඹට නම් අලුතුවෙන් ලැස්ති වෙන්න දෙයක් නෑ. කොයි දේ ඇන්දත් ලස්සනයි.''

''ඇත්තටම උඹලට මොනවද මේ වෙලා තියෙන්නෙ. හැම වෙලාවෙම මාව පීඩ්දන්න හදන්නෙ...?''



ඇය හැඬුම්මුසුව ඇසුවා ය.

''මෙන් බලාපල්ලකො මෙයාගෙ කතාව. අනිත් අයව පීඩ්දන්නෙ ඔයයි. හා... හා.. ලැස්ති වෙයං.''

''මට බෑ කිව්වොත් බෑ.''

''බලපං උඹත් බැන්දා නම් මෙලහට හනිමූන් ගිහින් බබෙකුත් හදාගෙනනෙ.''

හිතට පිවිසි කෝපය දරා ගැනීමට අසීරු වුණි. ඇතට අසු වුණේ අඩිරූල පමණි.

''මරණ එක මරනවා.''

චලනි අඩි කෝදුව ගෙන ඉසුරි පසුපස එලෙව්වා ය.

''හෙල්ප්.. හෙල්ප්...''

ඇය කෑගසමින් කොරිඩෝරය දිගේ වරුණිගේ කාමරය දක්වා දිව්වා ය.

''ඇයි මේ... ඇයි මේ පොඩි ළමයි වගේ රණ්ඩු කරන්නෙ.''

වරුණී චලනිගේ අතින් අල්වා ගනිමින් ඇසුවා ය.

''අපිට ඉන්න දෙන්නෙ නෑ.''

''ඉට්ස් ඒ ඔෆෙන්ස්. මේක දඬුවම් ලැබිය යුතු වරදක්. ඒක ගණන් ගන්ට එපා.''

වරුණී ඇගේ අතින් අල්වා ගනිමින් කීවා ය.

''මඟුල් ගෙදර යන්ට බැහැයිලු.''

''ඔයත් ලිස්ට් එකට සල්ලි දම්මානෙ. ඒ නිසා අනිවාර්යයෙන්ම එන්ට ඕනෑ.''

''යමු මෙයා. අනික ඔක්කොම ගියාම ඔයා තනියම ඉන්නෙ කොහොමද? කවුරුහරි ඇවිදින් ඔයාට බලහත්කාරකමක් කරයි.''

''තනියම ඉන්න ගැහැනියෙකුට විපත් සිදුවීමට ඇති

සම්භාවිතාව වැඩියි. ඒ නිසා නිතරම තමුන්ගෙ ආරක්ෂාව තමුන් සලසා ගන්ට ඕනෑ."

"හිතෙනුත් තමාට විපත් සිදුවෙනවා නම් සැබෑ ජීවිතයේදීත් වෙන්ට පුළුවන්. ලෑස්ති වෙන්න."

kathapothak.blogspot.com

"මට බෑ."

"හරි. අපි මෙයාව ලෑස්ති කරමු."

මනාලියට පිරිනැමීම සඳහා වූ තෑගි පෙට්ටියට විශේෂ තෑගි ද විය. උපත් පාලනය සඳහා වූ ගිලින පෙති, කොන්ඩම් කොපු සනීපාරක්ෂක තුවා වර්ග ආදිය ඉසුරිගේ පෙම්වතා දමා තිබුණු බව කිසිවෙක් දැන සිටියේ නැත.

නේවාසිකාගාරයේ වෙස නිරූපණ ශිල්පිනියකගේ අධීක්ෂණය යටතේ චලනි හැඩ වූවා ය. ඔවුන් කරන කිසිවකට ඇය විරුද්ධ වූයේ නැත. සැමවොම සූදානමව සිටියහ.

"හේයි.. සිම්රන්ටත් වඩා ලස්සනයි."

ඉසුරි චලනිගේ නිකටින් ඔසවා බලා කීවා ය.

ඇය තරයේ ඇස් පියා සිටියා විනා වචනයකුදු කතා කළේ නැත.

"අර මිහරකා එපා කිව්වෙ මේ වගේ ලස්සන ගෑනියෙක් නේද?"

වරුණි කම්පාවෙමින් ඇසුවා ය.

"මේ වගේ රෝස මලක් ළඟට ගන්නත් පින් කරල තියෙන්ට ඕනෑ."

"මේක තෙලා ගන්න පින් කරපු එකා අද එයි."

ඉසුරි දම්ළ රූමතියගේ හිස පිරිමදිමින් කීවා ය.

"අද කොල්ලෙක් මඟුල් ගෙදරදී ඉල්ලුවොත් දෙමු."



# 17

චලනි මේ මංගල උත්සවයට යාමට සූදානම් වූයේ නොයෙක් බැරි හෙයිනි. මංගල දිනය වෙනුවෙන් සහභාගී වීමට නොලැබුණේ ගමට යාමට සිදු වූ හෙයිනි.

දෙවැනි ගමන දිනයට ආරාධනා කරන්න ඇත්තේ තමා විශේෂ මිතුරියක් ලෙස සළකාය. චලනි ජීවිතයේ කවදාවත් විවාහ නොවන බවට සිතා හමාරය.

ප්‍රිනි වීම සඳහා නොව පෞද්ගලික මට්ටමෙන් නොයෙක් බැරි ය.

"අපි හතර දෙනා හතර විදියට අඳිමු. උඹ දෙමළ විදිහට අඳපං."

ඉසුරි යෝජනා කළා ය.

"අනේ මට කරදර කරන්ට එපා. මට මගේ පාඩුවේ ඉන්න ඉඩදීපං. මට බෑ."

චලනි කීවා ය.

''මම මේකප් ආටිස් කෙනෙක් වෙලත් උඹව තැනකට එක්ක යන්ට පුළුවන් ද?''

''මේ කෝලන්වලට එන්ට එපා දන්නවද?''

ඇය ව්‍යාජ අමනාපයෙන් පහරක් ගැසුවා ය. ඉසුරිට තම මිතුරිය දක්ෂිණ භාරතීය ගැහැනියෙක් කිරීමට වැඩි වේලාවක් ගත වූයේ නැත. සිමරන්, රේවතී, ජෝති වැනි නිළියන්ට වඩා වලනි සිත් ඇදගන්නා සුළු පෙනුමෙන් යුතුය. ඇය කිසි දේකින් අඩු නැති තරුණියකි.

''දැන් මාධවන් හෙම දැක්කොත් අරගෙන යයි.''

''මොළේ හොඳ නැද්ද ගොනියේ.''

වලනි අමනාපයෙන් කීවා ය.

''අද මෙකිව දැකලා කොල්ලො පිස්සු වැටෙයි.''

මිතුරියන් සැමෝම කතා කළේ වලනිගේ රූපශ්‍රීයාව පිළිබඳව ය. කෙස් කළඹේ මල් ගසා තිලකය තැබූ විට අඳුනන්නට බෑ.

''අද මඟුල් ගෙදරට එන පිරිමි, ගැහැනුන්ගෙන් බැණුම් අහනවා.''

''මේ.. ඔව කොච්චෝත් මම වෑන් එකෙන් බහිනවා.''

වලනි මැසිවිලි නැඟුවා ය.

හෝටලය සාමාන්‍ය පන්තියේ අය සඳහා සාදන ලද්දකි. තුරුරින් පිහිටි සමුදුර සිපමින් හමන මඳ සුළඟ සිසිල් ය. උයන්පල්ලෙකුගේ පරීක්ෂා යටතේ හැදුණු ගෙවුයනේ වවා තිබුණු ගස්වල විදුලි පහන් දැල්වෙමින් තිබුණි.

''ලස්සනයි. ඒත් මෙච්චර ලස්සනයි කියල මම හිතුවෙ නෑ.''

මනාලිය වලනිගෙ දෙකම්මුල් සිප ගනිමින් කීවා ය.



''මන්න උමත් පටන් ගත්තා.''

වලනි සිනාසුණා ය.

''පද්මිණී, රාධිකා, ශ්‍රීදේවි, රේවතී, සිමරන්, ජෝති ඒ කාටත් වඩා ලස්සනයි.''

''වහන්නයි කිව්වෙ කට එනවා මෙතන.''

ඇය මනමාලියට සෙමින් පහරක් ගැසුවා ය.

''ඇත්තමයි මාත් හිතුවෙ ටැමිල් ෆිල්ම්ස්ටාර් කෙනෙක් කියලයි. සිමරන් එනවා කියලයි.''

සුදේශ් කීවේ ය.

''කෙල්ලෙ සිද්ධ වෙච්ච දේ ගැන ආරංචියි. මේ දවස් ටික පහුවෙලා මම බැන්ක් එකට එන්නම්.''

මනාලිය කීවා ය.

''මට දැක තාත්තා අසනීප වෙච්ච එකටයි. තාත්තා තවම කරාපිටියෙ. බාප්පා රිමාන්ඩ්.''

''මම ඒකාට පාඩමක් උගන්වන්නම්. උඹ හිනාවෙලා සන්තෝෂෙන් හිටපං. මම මගේ බොස් එක්කත් කතා කළා.''

ශාලාවේ සිටින හැමදෙනාගේම නෙත් යොමු වූයේ හිසේ මල් පැලඳ සිටින රුවැත්තිය වෙත ය. පසු වූයේ සතුටින් යුතුවය. තවාතැනේ මිතුරියන් එක්ව සංවාදයේ යෙදෙනු පෙනේ. එත්වර සිත තනි වුණි. තේරුම් ගත නොහෙන මහා දොම්නසක් සිතට පිවිසෙයි.

පෙරදිග තූර්ය වාදක කණ්ඩායම පැමිණ ඔවුන් පිරිස පිනවීමට ගී ගයනු ඇසේ. එය ප්‍රේමය අහිමි වීම පිළිබඳ ශෝකාකුල විරහ ගීතයකි.

එපා තවත් ඔබ මා රවටන්නට

ඇගේ සුවය මුදු මල් යහනාවක් නම් ඒ සුව යහනේ ඔබ සැතපෙනු මැනවි''

මසන්තා තිලංකාගනිගේ ගීතයේ අනුවාදනය පැතිරෙමින් තිබුණි. සිදුවීම එසේ නොවුණත් හදවතට තේරුම් ගත නොහෙන දුකක් පාළුවක් දනෙයි. තම හදහන හොඳ නැති බැව් මවුපියන් පවසනු ඇය අසා ඇත. කිසිදාක තමාට විවාහයක් ලියවී නැත. නොසිතූ පරිදි ඒ මංගල අවස්ථාව නැතිව ගියේ ජීවිතය පෙළගැස්ස වී ඇති ආකාරය නිසා විය හැකිය. ඉසුරි පැවසුවාක් මෙන් විහාගය අවසන් වූ පසු විවාහය කිරීමට මූලික සාකච්ඡා කළා නම් මෙවැනි බැඳීරුම් අවස්ථාවක් ඇතිවන්නේ නැත. හැම දෙනාම සතුටින් සිනාසෙද්දී දුකින් සිටීමට සිදුව ඇත්තේ චලනිට පමණි.

සුදේෂ් විවාහ වුණේ මීට අවුරුදු හයකට පමණ ඉහතදී ය. විශ්වවිද්‍යාලයට පිවිසීමට ප්‍රථම මවුපියන්ටත් රහසින් සිදු වූ විවාහයේ සාක්ෂියට අත්සන් කළේ අසංක ය. අද මේ රුස්ව සිටින්නේ දඟකාර ජීවිතයේ ගජයන් ය.

''සුදේෂ් මූ තමා ගජේෂ්. මම උඹට කියල තියෙන්නෙ.''

''මගේ දුක් සහගත දවසේ ආවට තැන්ක් යූ මචං.''

''මචං සුදේෂ්.. මූටත් සුදු කෙල්ලක් හොයා දෙන්නත් එක්කලයි ආවෙ. අභිෂේක් වගේ ඉන්න නිසා මූට 'A 4" සයිස් එපා. ජේනාවගේ හැටි.''

''මගෙන් අහන්න දෙයක් නෑ. ඕය තියෙන්නෙ සූ ගාලා. මගේ එක හැර ඕන එකක් අල්ල ගනින්.''

''උඹේ එසේ දැන් ගන්ඩ දෙයක් නැතිව ඇති. ඒක නම් එපා.''



''පින්නවල ඇත් පැටියා එනවා.''

අසංක දුටු ගජයන් කෑගැසූහ. සනූජා එවකට පන්තියේ සිටි දඟකාරියෙකි. ඇය දැන් ගැබිනියකි.

අසංක අසුන් ගනිමින් කීවේ ය.

''අපේ මිනිහගෙ එකම විනෝදාංශය මෙකයි.''

ඇගේ කතාවට සැවොම එකවර සිනාසුණහ.

''වෙන මිනිස්සු නාටා, චිත්‍රපටි බලන්ට යනවා. විනෝද ගමන් යනවා. සමහරු පන්සල් යනවා. මේ මනුස්සයා කිසි දෙයක් කරන්නෙ නෑ. එකම විනෝදය මේක තමයි.''

''මචං බඳින්න කලින් නැන්දම්මා මට අතින් වත් අල්ලන්ට දුන්නෙ නෑ. දැන් මේ ගන්නෙ ඒකෙ පලිය.''

''ඔෆිස් ඇවිලා ආපු වෙලේ ඉඳන් රී ලෝඩ් දානවා.''

ඇගේ කතාවට යළි සැවොම සිනාසුණහ. අසංකගේ මිතුරු මිතුරියන් බෙහෙවින් විවෘත විනෝදයට බර පිරිසකි.

තමාටත් ඔවුන්ට මෙන් සතුටින් සිටින්ට බැරි වුණේ ඇයි..?

''මාලකත් මේ දවස් ටිකේ ඉන්නෙ සතුටෙන්. මෙයා අම්මයි අප්පච්චියි මට වන්දනාවෙ අරියා.''

ශානි කීවා ය.

''මචං උඹෙත් බඩදාගෙන එනවා. ජීම් එකකටවත් පලයං. නැතිනම් පින්නවලට තමා යන්ට වෙන්නෙ.''

''ඔව් අසංක වගේ පිරිමි ඒ වගේ තැනකට ගිහින් ඇඟ හදාගන්නවා. ඉස්සර වෙට්ස් කළා. දැන් කිසිම දෙයක් කරන්නෙ නෑ.''

"හැමදාම රෑට මේ ලොරි බාගෙ උස්සනවා. ඒ ව්‍යායාමෙ මදි ද?"

යළි සිනාසෙන්නට වූහ.

"දැනුයි මම ලොරි බාගෙ වුණේ. ඉස්සර පුළුන් රොදක් තමා."

"මචං 'සුදු බෝලෙ' වගේ හිටියට කිලෝ පනහක්. ඇයි 'ඇතා උඩකන්දෙ කොස්, දෙල් කාලා හැදුණ ඇඟවල්නෙ."

ඉසුරි හා පූර්ණි මෙම සුන්දර කතාබහට සවන් දුන්හ.

"මේ නදුනි, අපේ යාළුවෙකුට ළමයි හදන මැෂිමක් ඕනෑ වෙලා තියෙනවා."

අසංක කීවේ ය.

"ඊමපල් නෝ... කොයි වගේ එකක් ද ඕනෑ. කිරි සුදු බැන්ඩ නිව්, පුල්ඔප්ෂන් ඒවා තියෙනවා."

ෂානි කීවා ය.

"පාවිච්චි කරපු හොඳ රනින් කන්ඩිෂන් ඒවත් තියෙනවා."

"මේ දවස්වල ගැහැනු විවාහ කර දීමේ ප්‍රශ්න තියෙනවා. උන්ට දෑවැද්ද හොයන්ට ඕනෑ. බන්දල දෙනකල් ආරක්ෂා කරන්ට ඕනෑ. පිරිමි ළමයි හදන මැෂිමක් තමා හොඳ."

අසංක කීවේ ය.

"තියඹ සුදු කැල්ලක් දෙන්නම්. අර කොණ්ඩෙට මල් ගහල නළලට තිලකයක් තියල ඉන්න දෙමළ කෙල්ල කොහොමද?"

ගණේෂ් කිසිත් නොදොඩා දමිළ යුවතිය දෙස බලා සිටියේ ය.

"ෂා... පුදුම ලස්සනක්."



# 18

තමා හැර මේ රටේ සිටින හැම දෙනාම සතුටින් සිටිතැයි වලානිට සිතෙයි. උත්සවයට සහභාගිව සිටි තරුණ පිරිස කතා කළේ ඉතා සැහැල්ලුවෙනි. ප්‍රශ්න ලෙස මහා ලොකුවට සිතූ සාමාන්‍ය දේ ගැන කතා කළේ සැහැල්ලුවෙනි.

ඇතැමුන් විවාහ වී ඇත්තේ නිවෙසට රහසිනි. ඇතැමුන් විවාහ වී ඇත්තේ දරුවන් ලැබ බොහෝ කලකට පසුවය. ජීවිතයේ බොහෝ ප්‍රශ්න තර්කයට අහුවන්නේ නැත. මේ මනාලිය විවාහ වී ඇත්තේ වසර හයකට ඉහතිනි. හැමදේම දෙවියන්ගේ කැමැත්ත අනුව ඉටුවෙතැයි නිහඬව සිටිය නොහැකිය.

ඒ මිත්‍ර සමාගමේ සිටින්නේ පුදුම පිරිසකි. කිසිවක් වසාගෙන කතා කරන්නේ නැත. ඔවුනට ජීවිතය අතිශයින් සැහැල්ලු කරල සිදුවීම් ය. පවුල් ජීවිත ගෙවමින් සිටියත් ඇතැමුන් තවම විවාහ වී නැත.

යුග දිවියක දී වඩා වැදගත් වන්නේ දෙදෙනෙක් අතර පවතින අන්‍යොන්‍ය විශ්වාසය වේ. දෙදෙනෙකුට හොඳ ජීවිතයක් ගෙවීමට විවාහය ප්‍රධාන ගැටලුවක් නොවේ. නීත්‍යානුකූල

විවාහයක වටිනාකම පවතින්නේ දේපල ඉඩකඩම් පිළිබඳව අයිතිය ප්‍රකාශ කිරීමට ඇති සාක්ෂියක් ලෙස පමණි. නීතියෙන් නොබැඳුණත් දෙදෙනෙකුට හදවතින් ජීවත් විය හැකිය.

මංගල උත්සවය පිළිබඳව කතා කළේ පසු දින දිවා ආහාරය ගනිද්දී ය.

"සුදේශ්ගෙ යාළුවො ටික නම් නියමයි. ගෑනු පිරිමි ඔක්කොම එකයි. හැමදේම කියාගන්නවා."

"අන්න එහෙම තමයි ඉන්න ඕනෑ. බලපං උන් සන්තෝසෙන් ඉන්න හැටි."

"පින්නවල අලි පැටියා වැරදිලා කිරි එක ගහලා ඇවිදින් කියලා අර අසංක කියන බෝයි හිනා වුණා."

චලනිගේ සිනාව පුපුරා ගියේ ඔවුන්ගේ දෙබස් සිහිවීමෙනි.

"ඇති යාන්තම් හිනා වුණා."

ඉසුරි චලනි දෙස බලමින් කීවා ය. ප්‍රතිචාර ලෙස ඇය මදහස පෑවා ය.

"මම කිව්වා වගේම හැම පිරිමියාම බැලුවේ මේක දිහා."

"මේකිට පිරිමි අමාරුවෙ දාන දේවල් නියමෙට පිහිටලා තියෙනවා."

"අනිත් දෙන්නට ඒවා නැතිව වගේ. ඉසුරි මේ ඔය ලැස්ති වෙන්නෙ මා එක්ක තරහ වෙන්ටයි."

"සත්තයි බුදුම්පල්ල. කොල්ලන් ගෙන් බේරිල්ලක් නෑ. අර පින්නවලින් ආවයි කිව්ව බෝයි උඹට කතා කළා ද?"

"මගෙන් දෙමළෙන් මොකක්ද ඇහුවා."

ඔවුහු යළිත් එක්ව සිනාසුනහ.



නිවාඩු දින පෙරවරුවේ චලනි දිය නා කොණ්ඩය මුදාහැර දෙවන මහලේ සඳලුතලයට වී පාර දෙස බලා සිටියා ය.

උදේ සිට හැමුවේ තෙතබරි සුළඟකි. අහස පාරම්බාන්නේ පොළොව තෙත් කිරීමට ප්‍රමාණවත් වැස්සක් ගෙන ඒමට ය. තම නම අමතන හඬ ඇසී ඇය පහළ මාලයට දුව ගියා ය.

"ගෙදරින් කෝල් එකක්. ගාල්ලෙන්."

චලනි දුව ගොස් රිසිවරය අතට ගත්තා ය.

"චලනි දුව ද?"

"ඔව් අම්මා. චලනි තමා. ඇයි අම්මා කතා කළේ...?"

අම්මා කතා කළේ හැඬුම් මුසුව ය.

"තාත්තාව කරාපිටියෙන් කොළඹ එව්වා."

මහා ගින්දරක් හද පුරා හමා ගියේ නොසිතූ පරිද්දෙනි. සාමාන්‍ය අසනීප ගතියකින් පැවතුණත් මෙතරම් තදබල රෝගයක් නොතිබුණි.

"ඇත්ත කියන්න අම්මා තාත්තට මොකද?"

"විස්තර අපට කියන්නෙ නෑනෙ දුව. ඔපරේෂන් එකක් තියෙනවා කියලා කොළඹට යවනවා කිව්වා. මම මෙහෙ ඉඳලා එනකොට පරක්කු වෙයි."

"හා හොඳා මම යන්නම්."

ආපසු කාමරයට දුව ආවේ හඬමිනි.

"ඔක්කොම හොඳයි. කොච්චරවත් බෑයි කියා යන්න යන්න බලපං ඒයෙ හම්බ වෙච්ච කොල්ලා කෙල්ලා."

"හුඟාක් විවාහ වුණාම ප්‍රශ්න අඩුයි."

"අප්පච්චි කරාපිටියෙ ඉඳලා කොළඹට මාරු කරලා."

ඇය කතා කරමින්ම කලිසම හැඳ ගත්තා ය. ඉසුරි මිතුරිය දෙස ඔනෑකමින් බලා සිටියා ය.

"තනියම යන්ට පුළුවන් ද?"

ඉසුරි ඇසුවා ය. ඇය පිළිතුරක් නොදී නිහඬව සිටියා ය.

"හිටපං මම ගවුමක් දාගෙන එන්නම්. උඹ තනියම යන්ට පාර දන්නෙත් නෑනෙ."

ගාල්ලේ සිට එච්චා නම් මෙය සාමාන්‍ය සිදුවීමක් ලෙස සැලකිය නොහැකිය.

"පොඩි ඔපරේෂන් එකක් වෙන්නැති. නාඩා හිටපං."

ඇය ත්‍රීවිලරයට අත දිගු කරමින් කීවා ය.

• • • • • • • • • • • • • •

නංගී හා මස්සිනා නවාතැනට ආවේ ගවේෂ් කල්පනාවේ ගැලී සිටිය දී ය.

"ඇයි අයියා බෝඩිම මාරු කළා ද? අපි කලින් හිටපු ආරාම පාරේ ගෙදරට ගියා."

"එතන තනියම හිටියොත් මූට පිස්සු හැදෙන නිසා එක්කාගෙන ආවා."

අසංක කීවේ ය.

"මොකද අනේ ඔයාට වෙලා තියෙන්නෙ...?"

ඩේමා අයියාගේ අතින් අල්ලා ගනිමින් ඇසුවා ය.

"පාඩම් කරන්නෙ නෑ. කන්නෙ නෑ. ඔහේ බලාගත්ත අතේ බලාගෙන ඉන්නවා."



"මම අපේ එකෙක් දාලා හොයල බැලුවා. එළකිරි වගේ සුදුපාට කෙල්ලෙක්ලු."

"ජරා කටක් තියෙන්නෙ."

ඇය සැමියාට සෙමින් පහරක් ගැසුවා ය.

"දැන් ඒ එළකිරි කතාව ගියා. කොහොමටත් ඒ කෙල්ල අයියට ගැළපෙන්නෙ නෑ. මම අයියට ළඟදි පාස් අවුට් වෙච්ච කෙල්ලෙක් කතා කරලයි තියෙන්නෙ."

"මොනවා කරන කෙනෙක් ද?"

අසංක ඇසුවේ ය.

"ඩාන්සින් ටීචර් කෙනෙක්."

"එපා. ඩාන්සින් ටීචර් කෙනෙක් බැන්දොත් කවදාවත් දරුවෙක් හදාගන්ට බෑ."

"බණ වෝසිං. හිටු කියල පැටව් ගහන්නෙ ඩාන්සින් ටීචර්ලා තමයි. කවදාවත් සිලබස් කවර් කරල නෑ. ගජබා වන්නම් බලන්ට කියලා හැමදාම බේබි ඇඳුම් මහනවා. උඹට මතකනෙ කළුතන්ත්‍රී ටීචර්."

"ඔව් ඒක ඇත්ත. ලස්සන නැතිනම් මූ කැමති නෑ. හරි මම කෑම ටිකක් ගේන්නම්."

"නෑ සනා අපි යන ගමන් කාලා යන්නම්."

"පිස්සුද පොඩි දෙයක් කරලා කෑම ටිකක් කමු. වැඩියෙ නෑ කාලක් ක්‍රියා කරමු. එරෙන් යමු."

සැමියා ගිය පසු ඩේමා සොයුරා දෙස බැලුවා ය.

"අර කෙල්ල අයියට නවු දාන්න යනවා කිව්වෙ ඇත්තද?"

"ඔව් ලෙටර් ඔෆ් ඩිමාන්ඩ් එකක් එවලා තියෙනවා."

"මහ ජරා ගෑනියෙක්. ලක්ෂ පනහක්ලු නේද?"

ඔහු හිසවනා අනුමත කළේ ය.

"මේ කතා කරල තියෙන කෙල්ලත් හරි සෝෂල්. හඳහන් නැකැත් අරව මේවා කිසිදෙයක් විශ්වාස කරන්නෙ නෑ."

මේ විවාහ යෝජනාවක් නිසා තාත්තා බලවත් සේ රෝගාතුර වූ හැටි සිහිවෙයි. ගම්වාසීන් අතර හොඳ නමක් දිනා ගෙන සිටින ඔහු ප්‍රාදේශීය සභාවේ උපසභාපති වශයෙන් ද සේවය කර ඇත. මේ සිදුවීම නිසා අප්පච්චි මානසික ලෙස ඇද වැටී ඇත. දන් ඔහු යෝජනා කරන වැන්දඹුවක් හෝ විවාහ කර ගැනීමට ගවේෂ් කැමතිය.

"අප්පච්චිට දැන් කොහොමද?"

"ඉසකුඩිච්චිය දූම්මට පස්සෙ සනීප වුණා. ඊට පස්සෙ තමා මේ ප්‍රොපෝසල් එක ගෙනාවෙ."

"අප්පච්චි කැමති ද?"

"කෙල්ල ලස්සනයි. තනි කෙල්ල. අම්මලගෙ තාත්තලගෙ දේපල ඔක්කොම කෙල්ලට තමයි. නව කාර් එකකුත් දෙනවා."

"අම්මයි අප්පච්චියි කැමති නම් ළමයි ඉන්න ගෑනියෙක් වුණත් මම කැමතියි. මම බලන්ට එන්ට ඕනෑ නෑ. අප්පච්චි කියන දවසක බඳිමු."

"නෑ නෑ ඒක හරි නෑ. කෙල්ලව බලලා අදහස් හුවමාරු කරගෙන හොඳ දවසක් බලලා වෙඩින් එක ගම්මු."

"හොඳ දවසක් ඕනෑ නෑ. බැඳලා මෙහාට ගේන්නම්."

ඔහු කතා කළේ හැඟීම්බරව ය. එකම බලාපොරොත්තුව වන්නේ අප්පච්චි සුවපත් කරවා ගැනීම ය.





# 19

අසංක හා සෙනෙවි කතා කරමින් සිටියේ මිතුරා ගැනයි.

"මචං සෙනෙවි, දැන් ගවේෂ්ට මොකද කරන්නෙ...?"

"අනේ මම දන්නෙ නෑ. මේ නිසා අංකල්කාරයාගෙත් ඔළුව හොඳ නෑ."

"අංකල්ගෙ විතරක් නෙමේ මූගෙත් ඔළුව අප්සෙට් වෙයි කියලා මම බයෙන් ඉන්නෙ. මම බෝඩිමට ගිහින් එක්කාගෙන ආවා."

අසංක කීවේ ය.

"මචං මූ පාඩම් කළා මිසක් කෙල්ලෙක් එක්ක යාළු වෙලත් නැහැනෙ. ඒකයි වරද."

"ප්‍රොපෝසල් එක ආපු කෙල්ලත් හොඳයිලු මචං. මොකක් හරි ජල්බරියක් වෙලා තියෙනවා. දැන් මේමා ප්‍රොපෝසල් එකක් අරන් ඇවිදින් තියෙන්නෙ."

සෙනෙවි කීවේ ය.

"මචං අනිත් එවුන් වගේ නෙමෙ හරි සෙන්සිටිව්. මූට ගෑනියෙක් ගේන කොට හොඳට හොයන්න ඕනෑ. අද ඉන්නෙ හතර පස්දෙනෙක් පාස් කරගෙන ආපු කන්‍යාවියො."

අසංක වගකීමෙන් කිවේ ය.

"ඒක තමා මම බේමාට කිව්වෙ. මචං මනමාලි බලන්න යන ගමනට උඹත් එන්ට ඕනෑ."

"එක ස්ටාෆ් එකේ වැඩ කරනවා නම් කෙල්ල ගැන බේමා දන්නවා ඇතිනෙ."

"ඒ වුණාට සතා මැරෙන කල් පවුල් කෑවත් සමහර ගෑනුන්ව තේරුම් ගන්ට බෑ. උඹත් වරෙන්."

සෙනෙවි යෝජනා කළේ ය.

"අපි කොහොම හරි මූව බේරගන්ට ඕනෑ. මචං මූගෙ තාවුවට මොකද කරන්නෙ."

"අපි ලෝයර් කෙනෙක් අල්ලන්නත් එක්කයි ආවෙ. බේමාගෙ යාළුවො ඉන්නවා."

"ගොඩින් බේරගන්න ක්‍රමයක් නැද්ද?"

"කෙල්ලගෙ තාත්තා ඉස්පිරිතාලෙ ගමේ පෝස්ටර් ගහල. කොහොමද සමාදානෙට යන්නෙ. උන් තායි වෛරයිනෙ."

දිවා ආහාරය රැගත් ඔවුහු බෝඩිමට ගියහ. අයියා හා නංගි දිගු සාකච්ඡාවක යෙදෙමින් සිටිනු අසංක දුටුවේ ය.

"හැමදාම හාබර් බත් එක කන්න බලන් ඉන්ට එපා. ගෑනු අතකින් බත් ටිකක් කන්ට ක්‍රමයක් හදා ගනින්."

ගෙවල් කසාය පානය කළ ගොළුවෙක් මෙන් කිසිත් පැවැසිය නොහැකිව සිටියේ ය. බේමා කෑම මේසය සූදානම් කරන්නට වූවා ය.



"ගෑනියෙක් ගත්තම වැඩ කීපයක් නොමිලයේ කරවා ගන්ට පුළුවන්. අරක ඕනෑ වෙලාවක."

"මිනිස්සු ගැහැනු ගැන හිතන්නෙ ඔය වගේ සම්ප්‍රදායික විදිහටයි, ගැහැනිය කියන්නෙ නොමිලයේ ගන්න මෙහෙකාරියක් විදිහට සිතීම වැරදියි."

බේමා සිය අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරිපත් වූවා ය.

"ගැහැනියෙක් වෙලා ඉපදීම නිසාම වෙච්ච නොවැළැක්විය හැකි දෙවැනි පුරවැසියා වීමේ අඩුපාඩු තියෙනවා. ආදරය කරද්දී කාටවත් ලිපියක් නොලිව්ව කෙනෙක් වෙන්ට ඕනෑ. අහින්වත් අල්ලන්ට බෑ."

"සම්ප්‍රදායික චරිතවත් ගැහැනියෙක් වෙන්ට ඕනෑ. පිරිමියාගේ සතුට වෙනුවෙන් ඉන්න ඕනෑ, ගෙදර පරිපාලනය, කන්ට බොන්ට දරුවන්ගේ කටයුතු කරන්ට ඕනෑ. මේක කොච්චර දුෂ්කර ජීවිතයක් ද?"

බේමා කීවා ය.

"අපේ පවුල හත් දෙනෙකුගේ කටයුතු අම්මා කළා. තවමත් පුළුවන් විදිහට කරගෙන යනවා. කවදාවත් අයිතිවාසිකම් පිළිබඳව අම්මා කතා කරල නෑ. එදා මෙදාතුර අම්මා මෙහෙකාරියක් විදිහට වැඩ කළා කියන එක හිතලා නෑ. දැන් අලුතෙන් හැදුණු ගැහැනු කට්ටියක් ඉන්නවා ඒ අය තමයි ගැහැනුන්ට හිමි තැන නෑ කියන්නෙ."

සැබැවින්ම එය සත්‍ය කතාවකි. පෙරදිග සමාජය තුළ ගැහැනිය වෙත පැවැරී ඇති යුතුකම් සම්භාරයට [illegible] කොට නැත. සැමියා දරුවා වෙනුවෙන් තමා විසින් ඉටුකරන යුතුකම ගැහැනිය අනාදිමත් කාලයක සිට ඉටුකර ඇත. ලිංගික ජීවිතය තුළ තමා කැපකිරීමෙන් ඒ සැමියා සතුටු කිරීමේ පොදු කටයුතුවලට ඇය දායක වෙයි. දරුවන් බිහි කිරීම තමී පු

ගැහැනියකට පමණක් කළ හැකි උතුම් කාර්යය ඇය ඉටු කරයි. සැමොම නිදන මහ මැදියම් රාත්‍රියේ දරුවාට කිරි දී පිරිසිදු කරයි. එසේම සැමියා ද සතුටු කරයි. කෑම පිසීම, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, ගැහැනු දරුවෙක් නම් ඇගේ ආරක්ෂාව, අධ්‍යාපනය, දූවෙක් පතිකුලයට වගකීමෙන් බාර දීම හා පින්දහම් කර සංසාර සාගරයෙන් එතෙර වීම නම් වූ පුණ්‍ය ක්‍රියාව ද ඇය ඉටු කර ඇත. බුදු දහම ඇසුරෙන් නිර්මාණය වූ සමාජය තුළ සිය වගකීම් හා යුතුකම් ඉටු කළා හැර සෙසු ලෝකය හා තම තත්ත්වය කිරා බැලුවේ නැත. චෝට්සි මුලාකාත් නම් වූ බාල අවධියේදීම දරුවන් විවාහ කරන හින්දු සමාජයත්, පුරුෂයා මිය ගිය පසු එම ගින්නටම පැන මිය යන චාරිත්‍ර තවමත් ඉන්දීය සමාජ ගෝත්‍රවල පවතී. එක පුරුෂයෙකුට ගැහැනු හත්දෙනා විවාහ කරගත හැකි, එසේම ප්‍රසිද්ධියේ නගරයේ ශෝභනියන් සිටින, ජනාධිපතිනිය ලෙස රාජ්‍ය නායිකාව සිටින ඉන්දියාවේ සෙසු රටවල්වල සමග ස්ත්‍රියට ඇති තැන සලකද්දී ඔවුනට ලැබී ඇත්තේ 113 වන ස්ථානය බව ජනමාධ්‍ය ප්‍රකාශ කරයි.

"නිතිශ කාටත් ඉපාදූයි. තඩු කියලා බලමු."

බේබි පිඟන්වලට කෑම බෙදමින් කීවා ය.

"නඩු යනවා කියන්නේ බේබි සෙල්ලම් වැඩක් නෙමේ. අපිට මේක ගොඩින් බේරාගන්ට ක්‍රමයක් නැද්ද?"

"අසංක අයියා අපේ අයියා මෙකිව දූෂණය කළා වගේනෙ කතාව. කතා කරලත් නෑ, පින්තූරේ මිසක් හරියට දැකලවත් නෑ. එවිතෙ ඝාතනය වුණාය කියලා ඔප්පු කරන්නෙ කොහොමද? අපේ අයියා වගේ කෙනෙක් ගන්ට මෙසිට පින නෑ."

"බේබිගෙ කතාව ඇත්ත. පින්තූරවල වගේම සැබෑ ජීවිතයේදීත් ලස්සනයිලු. ඒකයි මේ තියෙන අහංකාරකම."

"මේක පස්ස ඉරෙන වැඩක්. නඩු කීවොත් වෙන්නේ



ලෝයර්ස්ලා පෝසත් වෙන එක විතරයි. අපි නඩුවට පෙඩි වෙමු. ඒ අතර අපි සාම සාකච්ඡාවටත් යමු."

"ඒවා පස්සෙ වෙන වැඩනෙ. ඉස්සෙල්ලා මනමාලි බලමු. වලනි දක්කොත් ඊර්ෂ්‍යා හිතෙයි."

"මට මනාමලියො බලන්ට එන්ට බෑ. ළමයි ඉන්න ගෑනියෙක් වුණත් කමක් නෑ... මම බඳින්නම්."

"වස්තුව එහෙම කියන්ට එපා. අපි පින්නවල අලි පැටව් වගේ. මමත් උඹට හොයන්නෙ දිව්‍යාංගනාවියක් වගේ කෙල්ලෙක්. අපි වලනිට පේන්න ලස්සන ගෑනියෙක් ගමු."

වලනි රෝහලට ගියේ මිතුරියගේ අතින් අල්වාගෙනය. සිත තුළ මහා වේදනාවක් ඇත. මේ හැම දෙයක්ම සිදු වූයේ තම නිතුවක්කාරකම නිසා ය. කොයි රටකට ගෙන ගියත් හිරමනයෙන් කළ හැක්කේ පොල් ගෑම පමණි. ලොව ඒ ඒ කටයුතු සඳහා විශේෂිත භාණ්ඩ ඇත. ගුවන් යානාව ඇත්තේ අහසේ පියාසර කිරීමට ය. එසේම ගැහැනිය ස්වභාව ධර්මයා විසින් නිර්මාණය කර ඇත්තේ ලෝකයක් නිර්මාණය කිරීමට ය. බුද්ධිමත්ව කටයුතු කළා නම් විහාගයත් කර ගනිමින්, විවාහ වී මේ වන විට ගැබිනියක්ව ඉන්න තිබුණා.

තාත්තාගේ මිනිය සුදු රෙද්දකින් වසා තිබෙනු ඇත. මිනිය හඳුනාගත් පසු දේහය ගාල්ලට ගෙන යා යුතුය. ගෙමැද තබා ඇති දේහයට ආචාර කිරීමට ගම් සභා නියෝජිතයන් එනු ඇත. තාත්තා සේවය කළ අධ්‍යාපන දිස්ත්‍රික්කයේ පාසල්වල ගුරුවරු, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, තාත්තාගෙන් ඉගෙන ගත් ආදි ශිෂ්‍යයන් හා නායක භික්ෂූන් වහන්සේලා ද එනු ඇත. පරිවේණාධිපති හිමියන් අනුශාසනය කරද්දී අනිවාර්යයෙන් මරණයට හේතුව පවසනු ඇත. වලනි කොරිඩෝරයේ තබා තිබූ බංකුවක ඉඳගත්තේ හඬමිනි. මහදියක් හමුවීමට ගිය ඉසුරි එනවිට තරමක් ප්‍රමාද වුණි.

"මොකද මේ අඬන්නෙ..? නාඩා හිටපං."

"මෙයාද යාළුවා..?" හෙදිය ඇසුවා ය.

"තව පුංචි ළමයි හොඳයි. ඕනෑ දේකට අඬාගන්න ගමන්."

"තාත්තට මොකද?"

"යමුකො වාට්ටුවට."

වේලාවට ප්‍රථම වාට්ටුවට යාමට හැකි වූයේ මිතුරිය නිසා ය. ප්‍රථමයෙන්ම වාට්ටුවේ හෙදිය හමු වී විස්තර දැනගත් ඔවුහු රෝගියා බැලීමට ගියහ. එලනි දුටු සැණින් බාල මහත්තයාගේ දෙනෙතේ කඳුලක් මතු වුණි.

පියෙක් දුවෙකුට දක්වන ආදරය අසීමිතය. අතේ කරේ හොවාගෙන දිය හැකි උපරිම සැප දෙමින් රකිද්දී පුතෙකු රකිනවාට වඩා ලොකු සතුටක් දැනෙයි. අවුරුද්දෙන් අවුරුද්ද රෝස මලක් මෙන් වැඩෙද්දී පියෙකුගේ හදවතේ මහා ආත්ම තෘප්තියක් ඇති වෙයි. පිරිසිදු දුවෙක් සාදා දෙවෙනි ගමනේ දී ලැබෙන්නේ ගෞරව පූර්වක සතුටකි. ඒ දේ මට තාත්තාට දෙන්න බැරිව ගියා.

බාල මහත්තයා දුවගේ අතින් අල්වා ගත්තේ ය. තාත්තා හා දුව දුක බෙදා ගන්නා තෙක් ඉසුරි වෛද්‍යවරයා හමු වී රෝගයේ තත්ත්වය කතා කර ගන්නා ය.

"තාත්තාට ලෙඩ කීපයක් මතුවෙලා."

ඈ පිළිතුරක් දී ගත නොහැකිව සිටියාය.

"තාත්තාට හදිසි ශල්‍යකර්මයක් කරන්නට වෙලා. ලේ දෙන්ට ඕනෑ."

"තාත්තාට අවශ්‍ය ලේ හොයන්නට ඕනෑ. මෙතන ඉඳල බෑ. යමු බෝඩිමට. කොහොත් හරි හොයමු. වරෙන් යන්න. ඕ... ඕන් අඬන්ට පටන් ගත්තා."



## 20

අම්මා සහ සෙනෙවි දිවා ආහාරයෙන් පසු පිටත්ව යාමට සූදානම් වූහ.

"එහෙනං මම යනවා."

සෙනෙවි ගණේෂ්ගේ උරට තට්ටු කරමින් කීවේ ය.

"අයියේ ඕන් කිව්වා නොවරදවාම එන්න ඕනෑ."

"ආවත් නාවත් වැඩේ කන්ෆර්ම්. වංගෙඩියක් වුණත් කමක් නෑ... මම බඳිනව කියල අම්මටයි, අප්පච්චිටයි කියන්න."

"උඹ මේ කාගෙන්ද පළිගන්ට හදන්නේ. හිහින් කතාකරල බලපං. ගොලුවෙක් ද දන්නෙ නෑ. ඇස් පේනවද බලපං."

"එහෙම නම් අතින් ඒවත් ෂුවර් එකට තියෙනවද බලන්ට වෙයි."

සොයුරිය රථයට ඇරලූ ගණේෂ් නිවෙසට ගියේ ය. ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

"පෝය දවසෙ උඹ ගෙදර යනවද?"

"පෝය දවසේ මම සිල්ගන්ටයි හිතන් ඉන්නෙ."

ගවේෂ් කීවේ ය.

ඔහු ඒ පිළිබඳව කිසිවක් කීවේ නැත.

සිල් ගැනීමට වයස් භේදයක් නැත. බොහෝ පිරිස් සිතන්නේ වයස්ගත වූ පසු සිල් ගැනීමටයි. වෘත්තීය පුවත්පත් කලාවේදියෙක් නිසා පන්සල් යාමට වේලාවක් නැත. බොහෝ කටයුතු අතින් ගවේෂ් වෙනස් නැතැත්තෙකි.

පසුදින හිමිදිරියේ අසංකට ඇමතුමක් ලැබුණි. එය ළඟින් ඇසුරු කළ අවංකාගේ කටහඬ බව හඳුනා ගැනීමට ඔහුට වැඩි වේලාවක් ගත වූයේ නැත.

"අවංකා නේද?"

"අඳුන ගත්තා නේද?"

ඈ සිනාසුනාය.

"කොහේද යන එකෙක් කර ගැහුවට ඇත්තටම ඔවා අපිට අයිති වෙන්න තිබ්බ සුදු කැලි."

"දැන් ඉතින් කරන්ට දෙයක් නෑ. උඹ කලින් ආවෙ නෑනෙ."

"වරින් එක්ක දවසක වරෙන්."

"ඉස්සර වගේ නෙමේ... දරුවින් එක්ක එන්ට බෑ. ආයෙත් අමාරුවේ වැටෙන්යි යන්නෙ. වරින් ආයෙත් මට වැඩ පෙන්නුවා."

"විනාඩි තියෙන්නෙ වාදනය කරන්ටනෙ. ඇයි මේ කතා කළේ...?"

"අනේ ළඟම හිතවත් කෙනෙකුට ලේ ඕනෑ වෙලා."



"මම ගිය මාසෙත් දුන්නා. ඒත් ඔයාම කියලා නේද?"

"තැන්ක්ස්. ඒකට පින්සිද්ධ වෙනවා. ගාල්ලෙ ඉඳලා ආපු ලෙඩෙක්. මෙහෙ කවුරුවත් නෑ. පිට අය වුණත් කමක් නෑ. සල්ලි ගෙවන්න වුණත් කැමතියි."

"හදිසියෙන් කරන්ට බැනෙ."

"අනේ ප්ලීස්. මම හිටපු බෝඩිමේ කෙල්ලෙකුට. පව් ඒ කෙල්ලට මාර ප්‍රශ්න. කිව්වට සිය කෙනෙක් විශ්වාස කරන්නෙ නෑ. පත්තරේට හොඳ කතාවක්."

"මා ළඟත් පත්තරේට හොඳ කතාවක් තියෙනවා. හම්බ වෙච්ච වෙලාවක කියන්නම්. මගේ කාමරේ යාළුවා ඉන්නවා. එයා එක්ක මනමාලියෙක් බලන්ට යන්ට."

"මේ මේ... යාළුවට මනමාලියො බලන්න යන්ට ඕනෑ නෑ කියන්න. නියම ලස්සන දිව්‍යාංගනාවක් වගේ කෙල්ලෙක් දෙන්නම්. උඹලගෙ භාෂාවෙන් කියනවා නම් සුදු කෑල්ලක්."

"මනමාලියො බලන්ට යන එක නවත්වන්ට මට බෑ. පුළුවන් වුණොත් මම එක්ක ගෙන එන්නම්."

මුහුණ සෝදා තේ පානය කිරීමට එමින් ඔහු මිතුරාගේ කතාවට සවන් දුන්නේ ය.

"පරණ කෑල්ලක් ද?"

"මම ඒකිව අල්ල ගන්න ඉන්න කොට වෙන ගෝලයෙක් පැන්නා."

"දැන් අනු වෙලා ඉන්න කෙල්ල නරක යෑ. මචං.. අර නංගි කිව්ව වැඩේට යන්නෙ නැද්ද?"

"යන්ට ඕනෑ. තව පොඩි වැඩක් තියෙනවා."

"ඇයි අසංක දවල්ට කන වෙලාවටවත් යන්ට ඕනෑ නේද?"

"මචං මිනිහෙක් මැරෙන්ට යනවා. එයාට ලේ ඕනෑ වෙලා. උඹට බැරිද ලේ ටිකක් දෙන්න."

"කොහොමද මචං ගමන් යන්ට තියෙද්දි ලේ දෙන්නෙ. මට සමහරවිට කලන්තෙ හැදෙන්ට ඉඩ තියෙනවා."

"උඹත් නිකං තාංගි කෙනෙක් වගේනෙ. මම දහ සැරයක් ලේ දීලා තියෙනවා."

"ඉස්සර වගේ නෙමෙ මගේ හිත හැම අතින්ම දුර්වලයි. ළඟදි මම මැරෙයි කියලත් හිතෙනවා."

"ගෑනියෙක් ජාතිය දූෂමා කියලා හැමදේම අතහරින්ට එපා. උඹට තියෙන්නෙ ඊට වඩා ලස්සන ගෑනියෙක් බැඳලා ඒකිට පේන්ට යන්ටයි."

ඔහු නිහඬව මිතුරාගේ කතාවට සවන් දුන්නේ ය. මෙම සිදුවීම නිසා සිත දුර්වල වී ඇති බවක් පිළිගත යුතුය. දශක කිහිපයකින් ඉදිරි ගමන ආපසු හැරුණි.

මේ මනමාලියක් බලන්ට යන්නේ සිතේ සතුටකින් නොවේ. මිනිසුන් ගැහැනුන්ට පෙම් බඳින්නේ, ආදරය කරන්නේ ඇයි? පැහැදිලිව ඒ තුළ ආත්මාර්ථකාමී බවක් ඇත. ගැහැනියගේ මෙන්ම පිරිමියාගේ ද එම දූෂ්‍ය සිතුවිල්ල ඇත. මින් පසුව ලිංගික කටයුතු කරන්ට ඇත්තේ ඒ දෙදෙනා සමගින් පමණි. මේ සිරගෙය තුළ සිරව සිටින කෝටි සංඛ්‍යාත ගැහැනු පිරිමි ඇත.

වෙනත් මිනිහෙක් සමග සැතපෙන්නට ඔහු වෙනුවෙන් දරුවෙක් බිහි කිරීමට පුළුවන්කමක් නැත. අපි මේ සම්ප්‍රදාය තුළ සිරවන්නේ ඇයි?



"ඇයි මචං උඹ කල්පනා කරන්නෙ...?"

"උඹ කිව්වා හරි. අපි ගැහැනියෙක් කසාද බඳිනවා කියන්නෙ අප විසින්ම අපිට සීමා පනවා ගැනීමයි."

"උඹට විතරක් නෙමෙ, පාරෙ යන සමහර ලස්සන ගෑනු දක්කම මට කිස් කරන්ට හිතෙනවා. ආදරේ කරන්ට හිතෙවා."

"මේක අප විසින් පනවා ගන්නා ලද සීමාවක්."

"මනමාලි බලන්ට යාම ටිකක් පමා කරමු. මනුෂ්‍යයෙකුගේ ජීවිතය බේරා ගැනීම අර බොරු වැඩේට වඩා ලොකුයි."

"කසාද බඳිනවා කියන්නෙ අපි දන්නා හෝ නොදන්නා ගැහැනියෙක් එක්ක හෝටලයකට ගිහින් ලිංගිකව හැසිරීමයි. මචං අපි එහෙම දෙයක් කළ බව එන හැම මිනිහම දන්නවා. ඒක නැතයි."

"ඔව් ඒක ඇත්ත. එන එවුන් පහන් රසයක් විඳිනවා."

"අපි ලිංගිකව හැසිරුණා ද නැද්ද කියල දැන ගන්න එකත් චාරිත්‍රයක් බවට පත්වෙලා."

ගවේෂ් මිතුරා සමග ලේ බැංකුව වෙත ගියේ රෝගියාට අවශ්‍ය ලේ දීම සඳහා ය. දෙන ලද ලේ සාම්පල්වලින් එලක් වී නැත. ඒ කිසිවක් රෝගියාට ගැළපෙන ඒවා නොවේ.

වලනි සිටියේ දුකින් යුතුවය.

"තාත්තාට ගැළපෙන ලේ කාගාවවත් නෑ. සමහරු ආවේ සල්ලි ගන්ට."

"මම පුදුම වෙන්නෙ මෙච්චර මිනිස්සු ඇවිදිනුත් ගැළපෙන ලේ සාම්පලයක් නොලැබිච්ච එක ගැන."

"එකම දුව වෙලත් මගේ ලේවත් ගැළපුණේ නැතෙ. දැන් ඔපරේෂන් එක කරන්නෙ කොහොමද?"

"අපේ හොස්ටල් එකේ කොල්ලන්ටත් දැන්නුවා. උන් කවුරු හරි එක්කාගෙන එයි. බලමු."

ලේ දීමට එන පිරිස දෙස ඕනෑකමින් බලා සිටියේ ඔවුනට ස්තුති කිරීම සඳහා ය.

කොරිඩෝරය දිගේ එන තැනැත්තා දුටු සැණින් ඇය තිගැස්සී සිටියා ය.

"දෙවියනේ... මේ එන්නෙ කවුද?"



# 21

වලහිට තමා සිටින්නේ කොහේදැයි දැනුණේ නැත. මේ එන්නේ කවරෙක් දැයි කිසිවෙකුගෙන් අසා දැන ගැනීමට අවශ්‍ය වූයේ නැත. අපේ මුළු පවුල නැති කළ දුෂ්ඨ මිනිහා. තමා අද මේ දුක්ඛිත තත්ත්වයක සිටින්නේ ඔහු නිසා ය. කිරිල්ලියක මෙන් සතුටින් සිටි තමා අද කටුවට වැදුණු ගොළුබෙල්ලෙක් මෙන් ජීවත්වන හැටි.

අප්පච්චි මිට ඉහත නිවසේ, වත්තේ පිටියේ වැඩ කරමින් ජීවත් වුණු හැටි මතකය. ඒ දිනවල ඔහුට කිසිම රෝගයක් තිබුණේ නැත. එවන් නිරෝගී තැනැත්තෙක් මේ තත්ත්වයට පත් වූයේ මේ බෙබද්දා නිසා ය. කොහේදෝ නැති කෝපයක් සිතට නැඟුණු ඇය මිතුරිය සොයා දුව ගියා ය.

"කෙල්ලේ උඹ කොහේද දුවන්නෙ...?"

පිළිතුරක් නොදී වලනී තහර වූවා ය.

"මොකද මේ හති අරින්නෙ...?"

"වරෙන් බැඩක් පෙන්වන්න. වරෙන් වරෙන්..."

"ලේ ලැබෙන කල් තාත්තගෙ ඔපරේෂන් එක කරන්ට බෑ. උඹ මොනවද කියන්ට ලෑස්ති වුණේ..?"

ඉසුරි ඇසුවා ය.

"අර ලේ ටෙස් කරන්නෙ කවුද බලපං. මේ කතාව උඹත් දන්නවා."

ඉසුරි එම රුව දෙස බලා සිටියා ය. දෙවියගෙන් අභිෂේක් හච්චන් වගේ උස මහත කෙනෙක්.

"ඒ මූණ මතකද බලපං. හොඳට කල්පනා කරපං."

ඇය ඉසුරිගේ උරහිසින් අල්ලා ඇසුවා ය.

"දෙවියනේ.. අර උඹට ප්‍රොපෝසල් එක ගෙනාපු බෝයි නේද?"

වලනි හිසවනා එය අනුමත කළා ය.

"එයාට ලේ දෙන්ට එන්න කිව්වෙ කවුද? උඹ කිව්වද?"

"උඹට පිස්සුද? මගෙ මරණෙට ආවොත් එළවපං."

"උඹලගෙ තාත්තාට අවශ්‍ය ලේ සාම්පලය තවම ලැබිලා නෑ. ඒ හින්ද මෙතන කලබල ඇති කරන්ට එපා."

"අපිව මේ තත්ත්වයට පත් කරල හිනා වෙන්ටයි ඔය ඇවිදින් ඉන්නෙ. මම එයාට පාඩමක් උගන්වන්නම්."

රංජිත් බාප්පලා ගාල්ලේ සිට පැමිණ සිටියේ ලේ දෙන්ට පිරිසක් රැගෙන ය. අයියාට සිදු වූ විපත පිළිබඳව ඉහේ බලවත් ලෙස කම්පාවට පත්ව සිටියේ ය. එත්තේ පිටියේ වැඩ කරගෙන හොඳ ශරීර සෞඛ්‍යයෙන් පසු වූ බාල මහත්තයාට මෙවන් බරපතළ රෝගයක් ඇති බව සිතාගත නොහැකිය.



මේ හැම දෙයක්ම සිද්ධ වූයේ දුව බැලීමට ඒමට නියමිතව සිටි වනවරයා නිසා ය. මොනවා හෝ කලබලයක් සිදුව ඇති බව පෙනේ.

"ඇයි දුව..?"

රංජිත් වලනි දුවගෙන් ඇසුවේ ය.

"අන්න අර කොල්ලා දිගා බලන්න."

වලනි තොරතුරු පැහැදිලි කර දුන්නා ය. රංජිත් සිටියේ ගවේෂ් හඹුවන තෙක් ය. මොහු නිසා පවුලම විනාශ වී ගියේ ය. පසුගිය දවස්වල පොලිසියට කට්ටි පනිමින් සිටියේ කඩ පේළිය කඩා බිඳ දැමීම නිසා ය. දැන් ගාල්ල දිසා අධිකරණයේ ගොනු කළ නඩුවක් ඇත. ව්‍යාපාර කටයුතු නැවතී ඇත. ගවේෂ් දුටු සැනින් යකා නැග්ගේ ය.

ලේ බැංකුවෙන් එළියට එනතෙක් වූ කාලය තුළ කිසිත් සැලසුම් කිරීමට ඔහුට ලැබුණේ නැත. ආයුධයක් ගෙනවා නම් ඔබාක්ක හිල්වෙන්ට සංග්‍රහයක් කිරීමට හැකිව තිබුණි. ගාල්ලේ සිට එද්දී කිහිප තැනක මාර්ග පරීක්ෂා කරන නිසා අඩු වශයෙන් කිනිස්සවත් ගෙනාවේ නැත.

"වරෙන් දෙන්නම්."

රංජිත් ගවේෂ් ලේ දී අවසන්ව එනතෙක් බලා සිටියේ ය.

ලේ බැංකුවට රැස්ව සිටියේ නැගැනුන් ය. අසංක දුටු මිතුරිය ඔහු සොයා ආවේ ය.

"නමින් 'අවංකා' වුණත් උඹ අවංක නෑ. ආයෙත් බඩු ලෙඩ කරගෙන තියෙන්නෙ."

"මගේ අවංකකමින් ඒ මිනිහා අහුඹ ප්‍රයෝජන ගන්නවා. මට කිසි නිදහසක් නෑ."

ඔවුහු එකවර සිනාසුණහ.

"අර ඉන්නෙ ගවේෂ්. ඒකා දූන් මේ මනමාලියෙක් බලන් යන ගමන්. උඹ කිව්ව හින්දා එක්කාගෙන ආවෙ."

"මරු හැන්ඩි පොරක්. පච් අසංක මෙච්චර වැදගත් ගමනක් තියෙද්දි ඇයි මේ ගමන එක්කාගෙන ආවෙ...?"

"මනුෂ්‍යයෙකුගේ ජීවිතය මනමාලියෙක් බලන්ට යනාවට වඩා වැදගත් කියලා ආවා."

"ඇත්තමයි මේ වගේ හොඳ අදහස් අද ඉන්න එවුන්ට නෑ. ඔය යන මඟුල හරි නොගියොත් මම කෙල්ලෙක් පෙන්වන්නම්. ඇත්තටම යාළුවට ලස්සන කෙල්ලෙක් ඕනෑ. මෑන්ට ගැළපෙන ලස්සන කෙල්ලෙක් ඉන්නවා.

"ඔය යන්නෙ කෙල්ලෙක් ඕනෑවට නොවේ. නංගි කියන නිසයි."

මොහු පැහැදිලිවම අගේ කළ යුතු තැනැත්තෙකි. ඔහු අතේ බ්‍රේස්ලට්, ගෙලේ මාල, කරාබු පළඳින පිරිමි අපික්කාලක් හෝ ගෑනු අර්ධයක් නොවේ. හතර රියන් පිරිමියෙක්.

"කොහේද යාළුවා වැඩ කරන්නෙ...?"

'පෝර්ට් ඔතෝරිටියෙ වැඩ කරන්නෙ. කොල්ලුපිටියෙ, ඇතා උඩකන්දෙ, වෙයන්ගොඩ ගෙවල් තියෙනවා."

"මේ යන ගමන හරි ගියත් නැතත් මම එකක් කතා කරන්නම්. අපේ චම්පාට වඩා සුදුයි. කොට නෑ ඒකිට වඩා හිනියි, උසයි."

"බිල්ඩ් සාම්පල් එක දුන්න ගමන් අපි යනවා."

"හරි. තැන්ක් යූ වෙරිමච් ආවට."

අසංක මිතුරා ළඟ දී එනතෙක් පසෙකට වී සිටියේ ය.



පත්‍රයක් ගෙන ඒමට පාරට ගියේ යුද පුවත දැන ගැනීම සඳහා ය. මේ පවතින්නේ කුරිරු ත්‍රස්තවාදයට එරෙහිව කරන සටනකි. සිංහල, දෙමළ, මුස්ලිම් සහ වෙනත් ජාතීන්ට ද මේ රට හිමි ය. ත්‍රස්තවාදීන්ට කෑල්ලක් ලියා දී රට කරවීමේ අදහස ඇතැම් පාලකයන්ට තිබුණි. පොදුවේ හැම ජාතියක්ම සිහිය යුත්තේ එකම ධජයක් යට ජීවත් වීමට ය. රට මුදා ගැනීම වෙනුවෙන් විරෝදාර යුද හටයන් කරන කැප කිරීම් පැහැදිලිව අප අගය කළ යුතුය. ඇතැමුන් ඒ කැප කිරීම් කුවුකේඩු සිතින් යුතුව හෑල්ලුවට පත් කරති.

පත්‍රය බලමින් එද්දි ගේට්ටුව අසල කිසිවෙකුට පහර දෙනු දුටු ඔහු ඉක්මනින් කැමරාව ගෙන එය රූගත කළේ ය. ඉන්පසු පහර කෑවුණේ සවනාට මැදිව සිටින ගවේෂ් ය. බෑගය පසෙක තැබූ ඔහු දුව ගොස් ගවේෂ්ව බේරා ගත්තේ ය.

"ඇයි... ඇයි...?"

අවංකා දුව එමින් ඇසුවේ ය.

"මේ තල්පතා මගේ යාළුවට ගැහුවා."

"ඒයි අපි ගාලු වැල්ලෙ තලපත්තු. තල්මස්සු තමයි. මට යන්ට ඉඩදියව් මූව බාවන්ඩ."

"ඒයි තල්පතා මම උඹට උගන්වන්නම්."

"මගෙ පස්ස පැත්තත් ගහින්."

රංජිත් සිය පස්ස පැත්ත දික් කළේ ය.

"අවංකා මම මේ තල්පතාව මේ විදිහට නොමේ ගාල්ලට යවන්නෙ. මම උඹ නිසා මුකුත් කරන්නෙ නෑ. නැතිනම් මිනීපෙට්ටියක යවන්නෙ."

අසංක මිතුරාගේ අත අල්වාගෙන රෝහලෙන් පිටතට

බැස්සේ ය. අවංකා තමා දෙසට දුව එනු ඉසුරි දුටුවා ය.

"මොකද්ද වුණේ..? ඇයි රංජිත් කෑගහන්නෙ...?"

"චලනිගෙ තාත්තාට ලේ දෙන්න මම කියල ගෙන්න ගත්ත බෝයිට චලනිගෙ බාප්පා ගැහුවා."

"කාටද?"

චලනි ඇසුවා ය.

"ලේ සාම්පල් එක දුන්න සුදු උස බෝයිට ඔයාගෙ බාප්පා ගැහුවා."

"හොඳ වැඩේ ගහපු එක."

චලනිට නිකමම කියවුණි.

"චලනි ඔයා මෙහෙම කතා කරයි කියලා මම හිතුවෙ නෑ. අසංකගෙ යාළුවා ඇවිදින් තියෙන්නෙ වැදගත් ගමනක් යාම නවත්වලයි. චීක් ඔයා කතා කළ විදිහ බොහොම කැතයි."

කවදාවත් මෙවන් වචනයක් කීමට සිතා නැත. පවුල මේ තත්ත්වයට පත් වුණේ මොහු නිසා ය.

"මේ බෝයි අද මේ ගමන ආවෙ මනමාලියෙක් බලන්න යාමත් නවත්වලයි. බාප්පා ඒ කොල්ලට පෙරළාගෙන ගැහුවා. ඒ මිනිහ නම් එක ජාති එකෙක්. ඔයා බුද්ධිමත් කෙනෙක් විදිහට කතා කරපු විදිය කැතයි."

ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

"මට සමාවෙන්න. මට ඔයාට කිවයුතු දෙයක් තියෙනවා."

චලනි මිතුරියගේ අත තරයේ අල්වා ගනිමින් කීවා ය.



22

වාතාවරණය සන්සුන් වීමට සෑහෙන වෙලාවක් ගත විණි. කිය මිතුරා සමග පැමිණි තැනැත්තාට පහරදීම පිළිබඳ අවංකා පසු වූයේ අමනාපයෙනි. අසංක ලෙහෙසියෙන් මෙල්ල කළ හැකි තැනැත්තෙක් නොවේ. රංජිත්ට නිරෝගීව ගාල්ලට යාමට ලැබෙන්නේ නැත.

"ඔයාගෙ බාප්පා මෝඩයෙක්. තමුන්ගෙ අයියට ලේ දෙන්න ආපු මිනිහෙක්ට එහෙම ගහනවද?"

"බාප්පා මේ විදිහටවත් ඉවසුවා ඇති."

"බාප්පාගේ ලොකුකම් ගාල්ලට. අසංකලාට මෙහෙ ඕනෑ දෙයක් කරන්ට පුළුවන්. ජනමාධ්‍යකාරයෙකුට රාජකාරිය කරන්ට දුන්නෙ නෑ කියලා හිරේ අරින්ට තිබුණා."

අවංකා කීවා ය.

"ඒ කොල්ලා එහා විත්තිය දන්නව නම් මම එන්ට දෙන්නෙ නෑ."

"ඔයා එහෙම කියන්ට එපා. අසංකලාගෙ කොල්ලෙලා ගැට

එකක් ඉන්නවා. උන් ජීවිතේ ගියත් මිනිසුන්ට උදව් කරන ජාතියෙ අමුතු එවුන්. අර බෝයි මනමාලියෙක් බලන්ට යාම තවත්වලා තමයි ලේ දෙන්ට ආවෙ.''

''අනේ එයාගෙ හොඳකම. එයා නිසා තමයි අද තාත්තා මේ තත්ත්වයෙම ඉන්නෙ. මට එයාගෙ ලේ එපා.''

අවංකා තව දුරටත් ඒ පිළිබඳ කතා කිරීමට කැමැති වූයේ නැත. සෑහෙන කලකින් නේවාසිකාගාරයට යාමට නොහැකි වූ නිසා මේ ගමනේ දී එහි යාමට ඈ සිතා ගත්තා ය. විවාහ පත් අය විසිර යන නිසා දන්නා හඳුනන පිරිස් හමුවීමට අවංකා සිතුවා ය.

ඇය ඉසුරි හා චලනි නේවාසිකව සිටින මැදිරියට ගියා ය.

ඉසුරි සිසිල් බීම හා රසකැවිලි රැගෙන ආවා ය.

''කවද්ද තාත්තගෙ ඔපරේෂන් එක කරන්නෙ...?''

''මේ බිලඩ් ගෲප් එක තවම නෑ.''

අවංකා නැවත වරක් රෝහලේ සිද්ධිය මතක් කළේ නැත.

''කෙල්ලෙ හොස්පිටල් එකේ වෙච්ච සිද්ධිය ගැන උඹට කිව යුතු දෙයක් තියෙනවා.''

''මට විශේෂයෙන් කිවයුතු දෙයක් නෑ. ඒ මගෙ යාළුවෙකුගෙ යාළුවෙක්. මාටඩි එකවුන්ටත් කෙනෙක්.''

ඇය කීවා ය.

''උඹට වඩා අපි ඒකාව දන්නවා.''

''දන්නව නම් ඇයි කිරිසහකුට වගේ ගැහුවෙ. තව පොඩ්ඩෙන් මැරෙනවා.''

ඇඳෙන් නැඟී සිටි ඉසුරි මිතුරියගේ අතින් අල්වා පසෙකට කැඳවාගෙන යන හැටි චලනි දුටුවා ය. ඇය පැහැදිලි කර දුන්නේ



තමාගේ තත්ත්වය විය යුතුය. කතා කරමින් සිටිය දී ම ආපසු පැමිණ පොත් කබඩයේ ලිපි ගොනුවක තිබූ පෝස්ටරය ගෙන මිතුරියට පෙන්වනු චලනි බලා සිටියා ය.

''දැන් ඔය ගහපු බාප්පලා පනහකට විතර කෑම මේසයක් දාලා බලන් හිටියා. ඊට පස්සෙ ගෙදරට ආපු කැලෑ පත්තරේ තමයි මේක.''

අවංකා හිස සලා අනුමත කළා ය.

පෝස්ටරය නිර්මාණය කළේ චලනිගේ අනුදැනුම පිට ඉසුරිගේ සොම්වතා ය. නමුත් පවතින තත්ත්වය මත ගෙවිෂ් වරදකරු යන චෝදනාව මෙහිදී ඔප්පු කළ යුතුය.

''අරක්කු බොන, දුම් උරන, කෙල්ලො වටකරගෙන ඉන්න පෝස්ටරය එදාම ගෙදර ඇවිදින්. මේක දැක්ක ගමන් තාත්තට සනීප නැති වුණා.''

''එතකොට මනමාලිව බලන්ට ආවෙ නැද්ද?''

''ඔයා දන්නෙ නෑ.. කෙල්ලගෙ තාත්තා රිටයර්ඩ් ප්‍රින්සිපල් කෙනෙක්. පොඩි ළමයෙක් වගේ.''

මෙය හිතුවාට වඩා බැරෑරුම් ප්‍රශ්නයකි. මෙවැනි අවස්ථාවක දී ගැහැනියගේ පාර්ශවය අසරණ තත්ත්වයට පත්වීම වැළැක්විය නොහැකි ය.

මේ පෝස්ටරය ගහන්ට ඇත්තේ අල්ලපු වත්තෙ මහප්පලයි සියලා හිතපු බාප්පලා හන්දියෙ කඩ කුඩු කළා. පොලිසියට කට්ටි පැන පැන ඉඳලා දැන් ඔය ඇප පිට ඉන්නෙ.''

චලනි කඳුළු සලමින් ඉවතට හැරී සිටියා මිස කතාවට එක් වූයේ නැත.

පැහැදිලිවම මේවා ගැහැනුන්ට මුහුණ දීමට සිදුව ඇති

ප්‍රශ්නය. අද ඉන්නේ බේබදු සල්ලාල පිරිමින් ය. දුම්රියේ, බස්රියේ හා කාර්යාලයේ පෙම්වතියන් ඇත.

"මේ බලපං උඹ හොඳයි කියන මනමාලයාගෙ හැටි."

අරක්කු බොන, ගැහැනු පිරිවරා සිටින ගවේෂ්ගේ ඡායාරූපය දෙස අවංකා බලා සිටියා ය.

"අපේ මිනිස්සුත් ඉඳලා හිටලා සෙට් වුණාම පොඩ්ඩක් බොනවා. එහෙම අරක්කු බීම තදබල ප්‍රශ්නයක් නෙමේ. මේකා ගැනු පිරිවරා සිටින ජඩයෙක්නෙ. මූන් නිසා ගැහැනුන්ට ලෙඩ බෝ වෙනවා. ඇයි ඇපොලජයිස් ඉට්. මට සමාවෙන්න. මං දන්නෙ නැතිවයි කිව්වෙ."

අවංකා ඇගේ දෙකම්මුල් සිප කියද්දී චලනිට හැඬුණේ ය.

"දැන් ඔය ගියේ මනමාලියෙක් බලන්නයි. චාන්සින් විවර් කෙනෙක්."

අවංකා කීවා ය.

"මේ වගේ උන්ට ගැලපෙන්නෙ ඔය වගේ නැට්ටුක්කාරියො තමයි. උඹ නාඩා හිටපං."

ඉසුරි මිතුරිය අස්වැස්සුවා ය.

"මම අද යන්ට කලින් දෙන්නටම දෙගි කපල යන්නම්. උන් හිතන් ඉන්නෙ ගැහැනු සෙල්ලම් බඩු කියලයි."

පොලීසියට පැමිණිලි කළ නොබෝ වේලාවකින් කලපතා අත්අඩංගුවට ගැනිණ. ගවේෂ් රෝහල්ගත කරන ලද්දේ අමානුෂික පහරදීම නිසා සිදු වූ තුවාල පරීක්ෂා කිරීම වෙනුවෙනි.

"මට අමාරුවක් නෑ. ටිකට් කපාගෙන යමු."

"උඹ දොස්තර නෙවේනේ. දවසක් දෙකක් හිටපං."



"ඇයි අර මනුස්සය මට මෙහෙම අමානුෂික විදිහට පහර දුන්නෙ...?"

ගවේෂ් ඇසුවේ ය.

"ඒ උඹ බලන්න ගිය කෙල්ලගෙ බාප්පා. මම ඒකට අමතක නොවෙ පාඩමක් උගන්වන්නම්."

තවාතැනට පැමිණ සැණින් අසංකගේ ෆෝනයට සෙනෙවිගෙන් ඇමතුමක් ලැබුණි.

"අසංක, උඹල මාර පොලුකාරයොනෙ. ඇයි ආවෙ නැත්තෙ...?"

"මචං, මාර වැඩක් සිද්ධ වුණානෙ."

"මනමාලිගෙ පැත්තෙ අය කැමත් ලෑස්ති කරගෙන ඉඳලා. ඇයි බං මෙහෙම පොලු තියන්නෙ...? හරියට පින්ගුත්තරයගෙ කතාව වගේ."

"තෝ බේමා. බේමාට කතා කරපං."

"කෙල්ලගෙ අම්මා කතා කලා බේමට බැණලා. ඔන් අඩ අඩා ඉන්නවා. දැන් කතා කලොත් උඹටත් බණියි. ගවේෂ්ට නම් කිට්ටු කරන්ට ලැබෙන එකක් නෑ."

"අපි උදේ එන්න ලෑස්ති වෙනකොට මචං අවංකා කතා කලා. කවුද ඔපරේෂන් කරන්ට ඉන්න ලෙඩෙකුට ලේ ඕනෑ කියලා."

"ඉතින් උඹලා ගියා ද?"

"ඔම ඒක ගවේෂ්ට කිව්වම මේකා ලේ ටිකක් දෙන්න කැමති වුණා."

"ලේ දෙන්න ගියාම මූට කලන්තෙ හැදෙන්න ඇති."

"ලේ අවශ්‍ය වෙලා තියෙන්නෙ ගවේෂ් බලන්ට යන්ට හිටිය මනමාලිගෙ තාත්තට. ලේ දෙන්න ගියාම බාප්පා ගවේෂ්ව

අඳුනගෙන බලඩ් බැන්ක් එකෙන් එනකොට ගවේෂ්ට නැති වෙන්ට නෙලලා."

"උඹ හිටියෙ නැද්ද?"

"මම එවෙලෙ පත්තරයක් බලන්න එළියට ගිහින් හිටියා. පස්සෙ මම පැනලා බේර ගත්තා."

"මචං... ඉට්ස් ඒ පැබ්රි කේටඩ් ස්ටෝරි. ගොතන ලද කතාවක් වගේ. හින්දි ෆිල්ම් එකක් වගේ. බාප්පට මොකද කළේ...? කෝ දූන් ගවේෂ්. මට පොඩ්ඩක් දීපං."

"මචං පොලිසියෙන් ගවේෂ්ව ඉස්පිරිතාලෙට යැව්වා."

"අමාරු ද?"

"අමාරුත් ඇති. බාප්පාව රිමාන්ඩ් කෙරෙව්වා. මේවා ගෙදරට කියන්ට එපා. අම්මා තාත්තා බය වෙයි."

"මූගෙ නම් හරකම වෙලාව. මම දැන්ම එන්නම්."

ත්‍රිවිලරයෙන් බැස නවාතැන දෙසට එන අවංකා අසංක හඳුනා ගත්තේ ය.

"උඹල ගැන මගේ හිතේ තිබුණෙ ලොකු පිළිගැනීමක්. අන්තිමට බලපුවහම උඹල මහ ජරා මිනිස්සු."

ඔහු පිළිතුරක් නොදී මිතුරිය දෙස බලා සිටියේ ය.

"උඹල මහ ජරා මිනිස්සු. කෝ උඹෙ යාළුවා ගවේෂ්. ඌට කතා කරපං."

"ගවේෂ් ද...? අර ගාල්ලෙ නලපතා ගවේෂ්ට ගහලා ඉස්පිරිතාලෙ ඉන්නවා. ඔයාට උදව් කරන්ට ගිහින් තමයි මේ වුණේ."

"මොනවා... ගවේෂ් ඉස්පිරිතාලෙ...?"

අවංකා කම්පා වෙමින් ඇසුවා ය.



## 23

"තේ එකක් හදලා දෙන්නද?"

අසංකා අවංකාගෙන් ඇහුවේ ය.

"එපා.. මම හොස්ටල් එකෙන් බීලයි ආවෙ."

"හොස්ටල් එකට ගියා නම් උඹට කෙල්ලො ටික විස පොවන්ට ඇති. ඒකයි මේ ආවේග වෙලා ආවෙ. එහෙම නේද?"

ඇය පිළිතුරක් නොදී සිටියා ය.

"ගවේෂ්ට ප්‍රොපෝසල් එකක් ආවා. මනමාලි බලන්න යන දවසේ ගෙදරට තැපෑලෙන් පෝස්ටරයක් ආවා."

නිවෙස තුළට ගිය අසංක පෝස්ටරය අවංකාට දුන්නේ ය. තාන ඇඳුමෙන් සැරසී සිටින තරුණිය දකිමෙන් ඈ තිගැස්සී සිටියා ය. දෙවියනේ මේ වලනී නේද?

"මෙයා තමයි ගාල්ලෙ බලන්ට යන්ට හිටපු මනමාලි."

"දැන් මම මෙයා එක්ක කතා කරලයි ආවෙ."

"හා හොඳා. අම්මල තාත්තලා මේ වගේ ගැනු ළමයෙක්

ගේනවට කැමති වෙයි ද? ටවුන්වල කොළඹ අය නම් කමක් නෑ. මූන් හද්දා පිටිසර ගැමියෝ.''

අවංකා හිසවනා අනුමත කළා ය.

''මේ ළමයාගෙ පෝස්ටර් එක ගමේ හැමතැනම කවුද ගහලා. ඒ නිසා තාත්තා, මස්සිනා, නංගිලා මනමාලි බලන්ට ගිහින් නෑ.''

''ඒකත් එහෙමද?''

''හා හොඳා උඹලගෙ සහෝදරයෙකුට මේ වගේ ප්‍රොපෝසල් එකක් ආවොත් යනවද?''

''ඔව් ඒකනම් ඇත්ත.''

ඇය සුසුමක් හෙළුවා ය.

''උඹ දන්නවද වැඩක්. ගවේෂ්ගෙ අප්පච්චි ප්‍රාදේශීය සභාවේ උපසභාපති කෙනෙක්. මේ ප්‍රශ්නෙ නිසා අප්පච්චිට සනීප නෑ. පිස්සු වගේ.''

''හානේ... ඇත්තද?''

''අද මනමාලියක් බලන්න යන්න දාගත්තෙ හිත සනසන්නයි. උඹ හින්දා ඒකත් නැති වුණා.''

''මම ඇත්තටම ආවේ ගවේෂ් ගැන වැරදි විදිහට හිතාගෙනයි. මොකද ඇත්තටම මම ගවේෂ්ව දැනගෙන හිටියෙ නෑ.''

''මේක මොකක්ද බලන්න.''

අවංකා නීතිඥයෙක් මගින් එවන ලද ලිපිය දෙස බැලුවා ය.

''විශ්වාසය කඩ කිරීම, චරිත ඝාතනය වැනි හේතු මත රුපියල් ලක්ෂ පනහක වන්දියක් ඉල්ලා නඩු දාන්ට යනවා.''

''නඩුද?''



''වෙන කවුරුවත් නෙමේ අර ගාල්ලෙ කෙල්ල. ලේ දෙන්ට ගිය මැන්ගෙ දුව.''

''දෙවියනේ... හිතන්ටවත් බෑ. රුපියල් ලක්ෂ පනහක වන්දියක්. එයා එච්චර වටිනවද?''

''දැන් උඹට තේරෙනව නේද ගැහැනුන්ගේ තරම. මේ ප්‍රශ්න නිසා ගවේෂ් වැඩට යන්නෙ නෑ. විභාගෙකට පාඩම් කර කර හිටියා. ඒකට උනන්දුවක් නෑ. පිස්සෙක් වෙයි කියන බයට මම මෙහෙ එක්කාගෙන ආවා.''

අවංකා සැබෑ තත්වය තේරුම් ගත්තා ය.

''මම ඔය බාප්පා කියන එකාට පාඩමක් උගන්වලා තමයි නවතින්නෙ.''

''මෙන්න බලන්න.''

ඔහු සිය කැමරාවෙන් රූගත කළ දර්ශන මිතුරියට පෙන්වූයේ ය.

''බලන්න මේ මනුස්සයෙකුට ගහන පාරවල් ද කියලා. මේ අහිංසකයා ගුටි කෑවෙ ඔය කෙල්ල නිසයි.''

''හානේ... අසංක මට මේ ෆිල්ම් එක ටිකකට දෙනවද? මේ ගොල්ල බාප්පගෙයි දුවගෙයි හොඳ කියනවා. මම මේක පෙන්නල ගෙනැත් දෙන්නම්.''

''හිතන්ට එපා අපිත් නිකම් ඉඳීවි කියලා. ලඟදීම ගේමක් දෙන්නම්.''

මිනිසුන් වෙත කරදර එන්නේ තනිව නොවේ වග බැඳගෙන ය. ගවේෂ් කියන්නේ මම ජීවිතයේ දී පිළිකුල් කරන කැනැත්තා ය. ලේ දෙන්ට පැමිණි බව තාත්තා දන්නවා නම් ඔහු එය ප්‍රතික්ෂේප කරනු ඇත. මේ මනුෂ්‍යයා මට දෙන කරදර ඇවර නෑ.

රෝහලේ වූ සිදුවීම සුළු කොට තැකිය නොහැකිය. ඉක්මනින් ලේ බැංකුවෙන් ආවේ අම්මා හොස්ටල් එකට එන බැව් දන්වා සිටි හෙයිනි.

පිටකොටුවට ගොස් එද්දී ඉසුරිගේ මිතුරිය යළි එහි පැමිණ සිටිනු නෙත ගැටුණි.

"ඉසුරි.."

අවංකා කතා කළා ය. ඔවුන් කොරිඩෝරයේ බංකුවට ගොස් අසුන් ගත්හ.

"උඹ තව ගෙදර ගියේ නැද්ද?"

"අර කොල්ලා ගැන උඹලා කිව්ව කතා පල් පට්ට බොරු. හෙණ ගහන කතා කියන්ට එපා."

ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

"ගමේජ්ගෙ අප්පච්චි ප්‍රාදේශිය සභා උපසභාපති කෙනෙක්. පුතාගෙ මඟුල කැඩිලා ගිය එක දරන්ට බැරිව ඒ මනුස්සයාගෙ ඔළුව හොඳ නැහැල්ලු."

"හානේ..."

ඉසුරි කීවා ය.

"මේ බෝයි අද මනමාලියෙක් බලන්ට ගිහින් තියෙන්නෙ තාත්තාව සතුටු කරන්ටලු. මේ බලපන් චලනිගෙ පින්තූරෙ හැටි."

ඉසුරි මොහොතකට ගොළුව සිටියේ මෙහි වරද ඔහු පිට පැටවිය නොහැකි බැවිනි. එක් අතකට මෙවන් පිරිමියෙක් ලබන්ට ගැහැනියෙක් පින්කර තිබිය යුතුය.

"යකෝ... මේ වගේ ගැහැනියෙක් දැක්කම අම්මලා තාත්තලා කොහොම හිතයි ද? අපි නාන කාමරේ ඇතුළෙ නැවත් මොනවා



හරි ඇඳන් නාන්නෙ. බලපං මෙකි ඇඳන් ඉන්න හැටි. මෙකත් නැතිව හිටියා නම් ඉවරයිනෙ."

මේ සිදුවීමේ මුල අග පැවැසිය නොහැකිය. එය එම වරදේ කොටස්කරුවන් වීම වැළැක්විය නොහැකි ය. මෙම පෝස්ටරය සුදේශ්ගේ අධීක්ෂණය යටතේ සිදු වූවක් බව පැවැසිය නොහැකිය.

අවංකා බලා සිටියේ තමා වෙතට එන රුවැත්තිය වෙත ය. ඔවුනියන් යටතේ හැඳෙන යුවතියක් මෙවැනි විකාර කාමුක ඇඳුමක් අඳිතැයි විශ්වාස කළ නොහැකි තරම් ය.

අම්මාගේ අතින් අල්ලා සිටින කිකරු දුව හා නොගැළපෙන ඇඳුමකින් සැරසී සිටින ගැහැනිය අතර තදබල වෙනසක් ඇත.

"අම්මා ඉස්සරහ හුරතල් වුණාට සම්පූර්ණ වරද මෙයා අතේ. මෙයා නිසා අර කොල්ලත් ඉස්පිරිතාලෙ."

"හා... හා... කලබල වෙන්ට එපා. කෙල්ලට බණින්ට එපා. මේ වැරැද්දට අපිත් එක් වුණා."

ඇය වරද පමුණුවා ගනිමින් කීවා ය.

"මේ පින්තූරෙ බොරු එකක්. මේක හදල දුන්නෙ මගෙ බෝයි ෆ්‍රෙන්ඩ්."

"මොනවා.."

"මේක දිග කතාවක්. අපි කළේ චලනි කිව්ව දේයි. මේකට අපි මෙහෙම වැඩක් කරමු."

# 24

රංජිත් බාප්පා අත්අඩංගුවට ගන්නා ලද්දේ ගෙවේෂ්ට පහරදීම නිසා ය. මේ හැම දෙයක්ම සිදු වූයේ තමා නිසා බව චලනි දනියි. තාත්තා වෙනුවෙන් ලේ දීමට පැමිණි ගෙවේෂ්ට පහරදීම පිළිබඳව ඈ මුල දී සතුටට පත්වූවා ය. ඉසුරි අවංකා සමඟ දීර්ඝ සාකච්ඡාවකින් පසුව චලනිට කතා කළා ය.

"මේ ඉන්නෙ අවංකා. කලින් ගර්ල්ස් හොස්ටල් එකේ හිටියෙ."

චලනි සිනාවක් පා පිළිගත්තා ය.

"ඔයාගෙ තාත්තට ලේ දෙන්න ගෙවේෂ් ගෙන්නලා තියෙන්නෙ මෙයයි."

"ඒ බවක් දන්නවා නම් මම ගෙවේෂ්ව ගෙන්වන්ට දෙන්නෙ නෑ. එයාගෙ ලේවත් මගෙ තාත්තාට ඕනෑ නෑ."

"තව ලේ දුන්නෙ නෑ. ලේ පරීක්ෂා කළා විතරයි. යම් විදිහකින් ගැළපුණත් මේ ලේ දෙන්ට මම ගෙවේෂ්ට ඉඩදෙන්නෙ නෑ. අන්න ඒක යාළුවට කියන්න."

අවංකා ඉසුරිට කිවේ චලනිට ඇසෙන සේ ය.

"චලනි මේ බලන්න ඔයාගෙ බාප්පා මෙයාගෙ යාළුවට ගහලා තියෙන හැටි."

ඇයට කැමරාවේ රූප රාමු දක්වමින් කීවා ය. බාප්පා තැගෙමින් කිසිවෙක් පසුපස එළවා යන අයුරු රූප රාමුවේ සටහන් වුණි.

ඉන්පසුව බාප්පා ගෙවේෂ්ට පහර දෙන හැටි ඈ බලා සිටියා ය. දෙවියනේ මෙහෙමත් මිනිසුන්ට ගහනවද? තරහක් තිබුණත් කෙනෙකුට මෙහෙම ගහනවද? බිම වැටෙන හැටි, නැගිට පහර දෙන හැටි රූගත කර තිබුණි. දෙවියනේ මනුෂ්‍යයෙකුට මෙහෙම ගහනවද?

චලනි පිළිතුරක් නොදී මදවේලාවක් සිටියා ය.

"දැන් ගෙවේෂ් බලන්න ඉස්පිරිතාලෙට යන්ට ඕනෑ. මම කිව්ව හින්දානෙ මනමාලි බැලිල්ල කියලා ආවෙ. ඒ තරම් හිත හොඳ එකෙක්."

"පව්නෙ... මමනෙ උඹට එන්න කිව්වෙ. මාත් එන්නම්."

ඉසුරි කීවා ය.

ඈ ඔවුන්ගෙන් සමුනොගෙනම සිය කුටියට ගියා ය. ගෙවේෂ්ට පහර දීම දැකීම නිසා ඇති වූ කම්පනය සිතින් බැහැරව නැත. සත්‍ය ලෙසම මෙය ඉතා පහත් කටයුත්තකි. විවේක දිනයන්හි කෙටි නින්දකට වැටීම සිරිතකි. සිතේ ව්‍යාකූල භාවය නිසා ඇස් පියා සිටියා විනා නින්දක් ලැබුණේ නැත. යාබද ඇඳේ නිදා සිටි අම්මා ලෙඩුන් බැලීම සඳහා සූදානම් වී ආවා ය.

"අම්මා එකක් කියන්නම්. දැන් ඉස්පිරිතාලෙට ගිහින් [illegible] පොලිසියෙ ඉන්න කතාව කියන්න [illegible]."

"මම කට හොල්ලන්නෙ නෑ."

"අම්මා බාප්පාට මේ සැරේ ලේසියෙන් බේරෙන්ට හම්බ වෙන එකක් නෑ. බාප්පා ගහන එක ඔක්කොම විඩියෝ කරලා."

"මොන නස්පැත්තියක් වෙන්න එනවද දන්නෙ නෑ. තාත්තට ගැළපෙන ලේ ලැබෙන කල් ඔපරේෂන් කරන්නෙ නැහැල්ලු."

"ගිහින් බලමුකො."

බාල මහත්තයා සිටින්නේ මරණයේ අත ළඟ ය. හෘද වස්තුවේ අසනීපයට ප්‍රතිකාර ගැනීමට පැමිණි ඔහුට දැන් ප්‍රතිකාර කිරීමට සිදුව ඇත්තේ වෙනත් අමාරුවකට ය. අවසාන කාලය ලබන විට නොදන්නා රෝග ඇති වෙයි. දැන් මේ ඇතිව තිබෙන්නේ එවැන්නකි. බිරිය හා දුව වාට්ටුවට එන විට ඔහු අස්වැසිල්ලක් ලැබුණි.

"දැන් හවස ගාලු යනවද?"

බාල මහත්තයා බිරියගෙන් ඇසුවේ ය.

"දුවලගෙ හොස්ටල් එකේ ටික දොහක් නතර වෙනවා. ඔයාට දැන් කොහොමද?"

"කිවයුතු ගුණයක් නෑ. දරුවගෙ කටයුත්ත එකලස් වුණා නම් මම මැරුණත් කමක් නෑ."

"දුව පතාගෙන ආ හැටි එහෙම නොවේ. ඔය ගැන හිතන්ට එපා."

"මේ ළමයි කවුද?"

"මේ දුවගෙ කාමරේ ඉන්න යාළුවො. මේ ඔක්කොම ඔයාට ලේ දෙන්න ඇවිදින්."

මවට හා පියාට කතා කරන්ට ඉඩ දී ඔවුහු වාට්ටුවෙන්



පිටතට ආහ. අවංකාට අවශ්‍යව තිබුණේ ගවේෂ්ව හමුවීමට යාමට ය. කිසිම දෙයක් පිළිබඳව නිශ්චිත අවබෝධයක් තිබුණේ නැත. ඔවුන් යන්නෙ කොහේ දැයි ඇය දැන සිටියේ නැත. ඔවුන් ගමන් කළේ තවත් පිරිමි වාට්ටුවකට ය. එය හදිසි අනතුරු වාට්ටුවකි. ඉසුරි හා අවංකා එක් රෝගියෙක් ළඟ නතර වනවා වලානි දුටුවා ය. මංගල උත්සවයේ දී දුටු තරුණයා දුටු සැණින් ඇ තිගැස්සී ගිවියා ය.

රුධිර සාම්පලය දී එළියට බසිද්දී වැදුණු අනපේක්ෂිත පහරින් ගවේෂ් අන්දමන්ද වුණි. ජීවිතයේ කිසිදාක මා අතින් කිසිවෙකුට වරදක් සිදුව නැත. මෙලෙස පහර දෙන්නේ ඇයි දැයි සිතා ගැනීමට නොහැකි වුණි. එවැනි දාමරිකයෙකුගෙන් පහර කෑමට නොහැකි ය.

රෝහල් පොලිසිය මඟින් ගවේෂ් රෝහල්ගත කෙරුණි. මෙම පහරදීම පිළිබඳ වැඩි විස්තර දැනගත්තේ අසංක වෙතිනි. මුහුණට වැදුණු පහර නිසා ඇස්වලට ආවරණ දමා තිබුණි.

"දැන් උඹට කොහොමද?"

"හෙට ආපහු ඇස් ඉස්පිරිතාලෙට යන්ට වෙනවා."

"උඹ බයවෙන්ට එපා. පොලිසියෙන් එළියට ආපු ගමන් තලපතාට තෙලන්ට ලෑස්ති කරලයි තියෙන්නෙ."

"මේක මගෙ වෙලාව. උඹ අනවශ්‍ය කරදර දාගන්ට එපා."

"නෑ මචං ගේම නුදුන්නොත් මූ අපි නැඟිලා කියලා හිතයි. උඹට රෑට මොනවද ඕනෑ. ප්‍රයිඩ් රයිස් එකක් ගේන්නද?"

ඉඳිආප්ප දොළහකුයි වඩේ එකකුයි ගෙනෙන්."

අසංක ගිය නොබෝ වේලාවකින් ගැහැනු රුවක් තමා ළඟ ගැවසෙනු ගවේෂ්ට දැනුණි.

"කෝ අසංක..?"

අචිංකා ගවේෂ්ගෙන් ඇසුවා ය.

"පොඩ්ඩක් එළියට ගිහින් එන්ට ගියා."

ඔහු මඳ සිනාවෙන් යුතුව කීවේ ය.

"මම අචිංකා. මට සමාවෙන්න. ඔයාට මේ කරදරේ වුණේ මා නිසයි."

ඔහු පිළිතුරක් දුන්නේ නැත.

"අසංක මගේ යාළුවෙක්. එයා තමා ඔයාව ලේ දෙන්න එක්කාගෙන ආවෙ. වැදගත් ගමනක් යන්ටත් තිබුණලු නේද?"

ඉසුරි ගවේෂ් දෙස ඔහැකමින් බැලුවා ය. අපේ මීහරකිට පින නෑ. නැතිනම් මෙච්චර ලස්සන පිරිමියෙක් අතහරිනවද? නිකං කතා බස් කරලා තියා ගත්තා නම් ඉවරයි නේද? විභාගෙත් ඉවරයි... මඟුලත් ඉවරයි."

"ඇයි කතා නොකරන්නෙ... අපිත් එක්ක තරහින්ද?"

"මම මොටද තරහා වෙන්නෙ. මිනිසාට තමයි මේ හැම දෙයක්ම වෙන්නෙ. මම හිය ආත්මෙ ලොකු පවක් කරලා ඇති. ගොනා පිටුපස ගැල එනවා වගේ දුක් කරදර අපි පස්සෙ එනවා."

"දැන් ගවේෂ්ට ගහපු අයට විරුද්ධව මොකද කරන්නෙ...?"

"මට ගැහීමෙන් සන්තෝසයක් ලැබුණා නම් මම කැමතියි."

ඉසුරි පුදුම වූයේ මෙම තැනැත්තාගේ කතාව පිළිබඳව ය.

"අපි ඔයා හොඳ කෙනෙක් බව පිළිඅරන් ඉවරයි. මේ වගේ දාමරික මිනිසුන්ට පාඩමක් උගන්වන්ට ඕනෑ. මම පොලිසියට කට උත්තරයක් දෙන්නම්."



"මට ගැහුවෙ රංජිත් කියන තැනැත්තා නෙමෙයි කියලා පොලිසියට කටඋත්තරයක් දුන්නා."

"ඔයාගෙ ඇස් ඉක්මනින්ම සනීප වේවා කියලා පතන්නම්."

රාත්‍රී ආහාරය ගෙන පැමිණි අසංක සංවාදයට සවන් දුන්නේ ය.

"ඔයාගෙ යාළුවා පුදුම කෙනෙක්. තමුන්ට ගහපු කෙනාටත් දඬුවමක් දෙන්න කැමති නෑ."

"කියල වැඩක් නෑ. මේ වගේ පසේ බුදුවරු තවත් ඉන්නවා. මං නම් ඒකාගෙ අතපය කඩලයි අරින්නෙ."

පිරිස කතා කරමින් රෝගියා අසලින් නික්ම යන හැටි බලහි බලා සිටියා ය.

ඔහුට මේ හැම කරදරයක්ම සිදුව ඇත්තේ තමා නිසා ය. කාටත් රහසින් ඔහු හමුවීමට ඇය සිතා ගත්තා ය.

ලෙඩුන් බැලීමට පැමිණි පිරිසට කාලය අවසන්ව ඇති බව දන්වන විදුලි සීනුව නාදවිනු ඇසෙයි. දෙවියනේ... ළඟට යන්නේ කොහොමද? ඇය සෙමින් ගවේෂ් ළඟට ගියා ය. දැස් වසා සිටි නිසා ඔහුගේ රූප කාය නිරවුල්ව දැකීමට අවස්ථාව ලැබුණි. කතා කළ යුතු ද නැද්ද ඇය මොහොතක් කල්පනා කළා ය.

## 25

චලනි මව සමඟින් නේවාසිකාගාරයට එනවිට හොඳටම ඒ බෝවී තිබුණි. ඉඳිආප්ප කිහිපයක් කෑවේ කුසගින්න නිසාම නොවේ. නිදන ගවුමෙන් සැරසුණු ඈ මිදුලේ වූ සිමෙන්ති බංකුවට ගොස් අසුන් ගත්තා ය. ගෙවී ගිය සැඳෑසමයේ සිත නොසන්සුන් වී ඇතැයි සිතේ. මිනිසුන් වන අප අතින් නිබඳවම වැරදි සිදුවෙයි. බොහෝ වැරැදි යළි සාදාගත හැකි ඒවා ය. සමාව නොදෙන වැරැදි ද සිදුවේ.

දෙවියනේ මට මොනවද වුණේ...? මම එපා කිව්වේ මට ලැබෙන්න තියෙන සම්පතක්. වෙනත් මනාලියක් බලන්නට ගිය වග ඇවසූ මොහොතේ සිට සිත නොසන්සුන් වෙලා. මා නිසා ගවේෂ්ට ලොකු පාඩු සිදුවෙලා. මට කරදර ඇතිකරගත්තේ මම. ලේ දෙන්ට ආවේ තාත්තටයි. අන්තිමට ගුටිකන්ට සිද්ධ වුණා. ඉස්පිරිතාලේ ඉන්නවා බලන්න මනමාලිගේ කට්ටිය එයි. ආවාවෙතො ලෙඩා බලන්න.

ඇය තමාටම කියා ගත්තා ය.

සුදු ඇඳුමින් සැරසුණු ඉසුරි චලනි සොයා ආවා ය.



"හැම තැනම හෙව්වා ඇයි තනිවෙලා."

"නෑ මුකුත් නෑ."

"මහප්පලා බාප්පලා උඹලා කවුරුත් එකයි. අච්චර උදව් කළ කෙනාව බලන්න ගියේ නෑ."

මේක සදාකාලික රහසක් වුණාවේ. මම යනකොට තද නින්දක වැටිලා හිටි බව කියන්නේ කොහොම ද?

"රංජිත් බාප්පා ගැහුවා කියලා ගවේෂ් කියලා නෑ. එතරම් හොඳ කොලිටිස් තියෙන කොල්ලෙක්."

"මම වැරදියි. කරුණාකරලා ඔය කතාව නතර කරන්න. මට දැන් ඔවා අහලා ඇතිවෙලා."

"මේවා කියන්නේ තරහට නොවේ. උඹලගේ තියෙන ඔල මොට්ටලකම නතර කර ගන්නයි."

කතාව සත්‍යයකි.

"ගෙදර දී පිරිමි වෙනුවෙන් ගැහු ඉවසන්න ඕනෑ. තමුන්ගේ නිසි වයසේ දී ගැහැනු විවාහ වෙන්න, දරුවෝ බිහි කරන්න ඕනෑ. ගෑනුන්ගේ ඇඟවල් හැදිලත් යෙන්නේ ඒවටයි."

"ඔය කතා ඔක්කොම ඇත්ත. මට වැරදුනා."

"ගිය දේවල් ගියා. දැන් මොකද කරන්නේ?"

"තවත් ප්‍රමාද නෑ. ඉස්පිරිතාලේ ඉන්දෙද්දිම කතා කරලා විසඳගනිත්."

"මට තනියම බෑ."

"වෙරි සොරි. කිසිම විචාරයක් නැතිව අපි උඹට උදව් කළා. ඒකෙන් ඇතිවුණ නරක ප්‍රතිඵල නිසා අපිත් පසුතැවිලි වෙනවා."

"හා දූන් මොකද කියන්නේ...?"

"වෙච්ච දේට සමාව ඉල්ලපං. උඹලගේ හැමදේටම මුල ඔය පුහු අහංකාරකමම තමයි."

"මට බණී ද?"

"එයා උඹලා හිතන තරම පහත් මිනිහෙක් නෙමෙ. ජීවිතය හොයලා පතුල් දෙක ගාවට ගේන්ට බෑ. ගිහින් හොයා ගනින්."

පරීක්ෂණ ප්‍රතිඵල පැමිණි පසු මින් පිටව යාමට හැකිවනු ඇත. ඊට කලින් ගවේෂ් බැලීමට යාමට ඈ සිතුවා ය. දෑස් වැසෙන සේ වෙළුම් පටියකින් බැඳ තිබෙනු දුටු ඇගේ සිතේ දරාගත නොහෙනා වේදනාවක් ඇතිවුණි.

"කවුද? අසංක ද..? ගවේෂ් ඇසුවේ ය."

"මම ද මේ... මම මේ අසංකගේ සාළුවෙක්. ඇස් දෙක රිදෙනව ද?"

"ඇස් දෙකට බෙහෙත් දාපු නිසා දූන් පේන්නේ නෑ."

ඇගේ හදවත දරාගත නොහැකි වේදනාවකින් ඔත්පලව ගියා ය.

දූවිලි නොවැදීමට දමන ලද හෙට් රෙද්ද අතරින් වැඩි වෙලාවකින් යාමට ප්‍රථම තමා අසල සිටි තැනැත්තිය හඳුනා ගත්තේ ය. මේ වැරැද්දිවල නිර්මාණකාරිය වන්නේ වලනි ය. අද තමා මේ අපහසු තත්ත්වයට පත්ව සිටින්නේ ඇය නිසා ය. උගන්වන්නම් හොඳ පාඩමක්.

"අනේ ඉතින් උදේ කෑම කැවෙත් නැද්ද?"

"කන්ට විදිහක් නෑ මට පේන්නේ නෑ."

"මම උදව් කරන්ට ද?"



"ඕනෑ නෑ. ඔය ඇටෙන්ඩන් කෙනෙක් ආවාම කවා ගන්නම්."

"මම දන්නවනේ ඉස්පිරිතාලේ වැඩ කරන අයගේ හැටි. උවුන්ට සල්ලිත් දෙන්ට වෙවි. ඉන්ට මම කියන්නම්."

අත සෝදා පැමිණ කෑම කවද්දී කොහේදෝ නැති අමුතුම සතුටක් දැනුණි. එකම එක වාසනාවකට තිබුණේ තමා දන්නා හඳුනන කිසිවෙක් මෙහි නොසිටීම ය.

"මා නිසා කරදර වුණා නේද?"

"මේක මොන කරදරයක්...?"

"මේ කළ උපකාරයට මට දෙන්න දෙයක් නම් නෑ. මේ කළ පිනෙන් චාතුර්මහා දිව්‍යලෝකයේ දිව්‍යාංගනාවක්ම වෙලා ඉපදේවා. සිතූ පැතූ සම්පත් ලබන දිව්‍යාංගනාවන්ගේ රැජිණ වේවා."

"ඇති... ඇති... මේ පුංචි වැඩකට එච්චර ප්‍රාර්ථනාවන් ඕනෑ නෑ."

"ඒ වුණාට ස්තූති නොකර බැහැනේ."

"මම හැන්දෑවට කෑම එකක් අරන් එන්නම්."

"නිකන් කරදර වෙන්ට එපා. මම ඉස්පිරිතාලෙන් දෙන කෑම ටිකක් කන්නම්."

"කරදර වීමක් නොවේ. මම කොහොමටවත් කාන්නට කෑම ගේනවා. එතකොට එකක් ගේන්නම්."

ඩෙබ්මා අයියාගේ නොපැමිණීම නිසා කෝපයට පත්වූවා ය. සෙනෙවිට පණිවුඩය ලැබුණේ පසුව ය. කොළඹට එනකෙක් සෙනෙවී බිරියට කිසිවක් පැවසුවේ නැත.

"අයියාට බණිනවා හෙම නෙමේ."

සෙනෙවි බිරියට කීවේ ය.

"මොන දේ කළත් ඉවසන්ට ද කියන්නේ."

"අම්මට ආරංචි වෙයි කියලා කිව්වේ නෑ. කෙල්ලගේ බාප්පා ගවේෂ්ව ගහලා ඉස්පිරිතාලෙ. ඇස් පේන්නේ නැහැල්ලු."

"මොනවා ඔය කෙල්ල ඉන්නේ කොහෙද කියන්න...?"

"නැති ප්‍රශ්න ඇති කරගන්ට ඕනෑ නෑ. මේ මනුස්සයා ආපහු කරදරේ වැටෙයි."

"ගාල්ලේ ඉඳලා ඇවිදින් ගහලා යනකන් බලා ඉන්නවද?"

"ගාල්ලට ගෙනියන්නේ නැතිව කොළඹ කනත්තේ අවසන් කටයුතු කරන්ට පුළුවන්. නැතිනම් මුළු ජීවිත කාලෙම රෝද පුටුවේ යවන්ට පුළුවන්. කෝ මේකා කිසි දෙයක් කරන්ට දෙන්නෙ නැනේ."

අසංක කීවේ ය.

"අසංක අයියා නරක තැනකට හෙම වැදිල ද?"

"නරක තැනකට වැදිලා තියෙන්නේ ඇස්වලට ලේ බැහැලා."

"තවත් මොන සමාව ද? තෙලමු."

කෝපයට පත් සෙනෙවි කීවේ ය.

"මට ඕනෑ අර කෙල්ලගේ කෙස් වැල්ලෙන් අල්ලා ගන්ටයි. කොහෙද ඉන්නෙ කියන්න."

"හොයා ගන්න නම් අමාරුම නෑ. ගර්ල්ස් හොස්ටල් එකේ ඉන්නෙ. මම දන්න ගර්ල්ස්ලා කිහිප දෙනෙක්ම ඉන්නවා. හොස්ටල් එකට ගියත් හම්බවෙන්න බෑ. ඔෆිස් එකට යමු."

"තුන්වෙනි පන්තියේ මිනිස්සු වගෙ අපිට ඔෆිස් එකට ගිහින් මණිත්තා බැහැනේ."



"නෑ සෙනෙවි සෙනඟට ඇහෙන්න තමා බණින්ට ඕනෑ. එතකොට ඉස්සරහටත් මඟුලක් කරගන්ට බැරිවෙයි. දෙයියනේ ඇස් දෙකට ගහනවා කියන්නේ කොච්චර නපුරු වැඩක්ද?"

අසංක බැංකුවට යාමට පෙර බැංකු කාර්යාලයට ඇමතුමක් ගත්තේ ය.

"චලනි ජයවීර කියලා ගාල්ලේ ඉඳලා එන ගර්ල් කෙනෙක්. එයි ඔව් තිවාබු ද...? හා.. .හා"

අසංක ඇමතුම විසන්ධි කළේ ය.

"මේ වැඩේට අවංකා හිටියා නම් තමා හොඳ. අපි බෝඩිමට ගිහින් අල්ලා ගනිමු."

රථය පණ ගැන්වුණි.

"මට ඕනෑ මෙයාගේ ශුද්ධවන්තකම කියාදෙන්නයි. පේපර් කටින් හිත්කොම ගෙනාවා."

ශේමා කීවා ය.

"නෑ මචං. මෙයා නෙළුම් මලෙන් උපන්නා වගෙයි කතාව. රෙද්ද ගැලවෙන්ට කියන්න ඕනෑ."

සෙනෙවි රථයෙන් නොබැස කීවේ ය. කාන්තා නේවාසිකාගාරයට ගිය අසංක ඉසුරිට පණිවිඩයක් යවා ආය එනතෙක් බලා සිටියේ ය.

මේස පන්දු ක්‍රීඩා කරමින් සිටි ඉසුරි පහළ මාලයට ආවා ය.

"ගවේෂ්ගේ නංගියි මස්සිනයි චලනි හම්බ වෙන්න ඇවිදින්."

"යුද්ධ ප්‍රකාශ කරන්ට වාගෙයි." ඉසුරි කීවා ය.

## 26

වලනි සැඳෑවරුවේ නිවෙසට යන විට හොඳටම ඊ බෝවී තිබුණි. අවශ්‍ය ලේ ලැබී ඇත. අධික රුධිර පීඩනය, මධුමේහය නිසා ශල්‍යකර්මය කල් දැමීමට සිදුව ඇත. ඉසුරිගේ මඟ පෙන්වීම අනුව ගවේෂ් බැලීමට යාමෙන් ඇති වූ සතුට දරා ගැනීමට අසීරු තරම් ය.

ගවේෂ් කැම කැවීමට සිතට ධෛර්යයක් ඇති වුණේ කොහොම ද? එය නිතැතින්ම සිදු වූවකි. එසේ කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ සදාචාරාත්මක අයිතියක් ඇයට ඇත. ඔහුට මේ හැම දෙයක්ම සිදුව ඇත්තේ තමා නිසා ය. එහෙත් හෙතෙම කිසිම දෙයක් කීවේ නැත.... තමාට මේ වගකීම පැවරී ඇත්තේ කිසිම පෙළඹවීමක් නැතිව ය.

''මොකද කල්පනා කරන්නෙ?''

ඉසුරි හිස අතගාද්දී සිතට මහත් අස්වැසිල්ලක් දැනුණි.

''මොකද වුණේ...?''

''මම කරල තියෙන්නෙ මහා පව්කාර වැඩක්. කිසි කෙනෙක් මට සමාව දෙන එකක් නෑ.''



''ගිය නුවණ ඇතුන් ලවාවත් අදින්නට බැහැ කියල කතාවක් තියෙනවනෙ. දැන් ඒවා ගැන හිතන්ට එපා.''

''මොකද වුණේ..?''

''බාප්පා ගහල තියෙන්නෙ ගවේෂ්ගේ ඇස් දෙකටයි. පව්. මම යනකොට කෑම කන්නත් බැරිවයි හිටියෙ.''

''උඹට ඉතින් කරන්ට තිබුණේ උදව් කරන්ටනෙ.''

''ඔව් මම කන්ට උදව් කළා.''

''ඔය තියෙන්නේ... අන්න එහෙමනේ කටයුතු කරන්ට ඕනෑ... ඉතින්.. ඉතින්...''

''උදේටයි දවල්ටයි කෑම එකක් ගන්ට බැරිද?''

''මොකද බැරි. ලෙඩෙකුට කිව්වම හොඳට හදල දෙයි. කුස්සියට කියපං.''

''හැන්දෑවට ඉසුරිට එන්ට බැරි ද ලෙඩා බලන්න යන්න.''

''මම එන එකේ තේරුමක් නැහැනෙ. වෙනින් දවසක එන්නම්. ඔයා යන්න.''

එම ගැහැනුකම තුළ අපූර්ව සුන්දරකමක් ඇත. එම සතුට විඳිය හැක්කේ ගැහැනියට පමණි. හදවතට පිවිස ඇත්තේ තේරුම් ගත නොහැකි සතුටකි. රාත්‍රී ආහාර වශයෙන් ගත්තේ පාන් පෙත්තක් හා සුපයක් පමණි.

මුහුණ සෝදා නින්දට ගියත් සිතු පරිදි ඉක්මනින් නින්ද ළඟා වුණේ නැත. ප්‍රශ්න ඇති වූ යුගයේ දී පවා සිත තුළ ජීවත් වූ හැටි. පන්නා දැමීමට නොහැකිව ඇතැම් රාත්‍රීවල නිදිවරව සිටි හැටි සිහිවෙයි. වෙනදා නොදැනුණ සතුටක් සිතේ සිරව තිබෙන හැටි.

චලනි උදේ පාන්දරින්ම සූදානම් වුණේ රෝහලට යාම සඳහා ය. වෙනදා උත්සවයකට යාමටවත් මෙතරම් උනන්දු වන්නේ නැත.

"ම්... අද නම් කහ කිරිල්ලියක් වගේ ලස්සනයි."

"මේ අපිව පල් කරන්න එපා."

"ඔහෑ තැනක දිව්වත්නම් මෙච්චර ලස්සන කෙල්ලෙක් දැකලා නෑ."

මේ සතුට අදහාගත නොහැකිය. පෙර මෙන් වාද විවාදවලට පැටලෙන්නේ නැත.

"මමත් එන්නද?"

ඇගේ සිත පරීක්ෂා කිරීමට ඇසුවා ය.

"එපා කරදර වෙන්ට. මම තාත්තා බලලයි යන්නෙ."

"ඔකගෙ මුලදීම කිව්වෙ. හා... ජයවේවා"

ඇය චලනිගේ දෙකම්මුල් සිප ආචාර කළා ය.

චලනි වෙන්ව ගිය මොහොතේ සිට සිත බෙහෙවින් දුර්වල වී ඇතැයි ගවේෂ්ට සිතෙයි.

වරදක් සිදු වුවා නම් එය චලනි පිට පමණක් පැටවිය නොහැකිය. අසංක යෝජනා කළ පරිදි මනමාලිය බලන්ට ගියා නම් මෙතරම් විනාශයක් සිදුවන්නේ නැත.

ඇය පෙරවරුවේ තම උපකාරයට ආවේ ඇයි? ඇතැම් විට රංජිත් පිළිබඳව වූ කට උත්තරයට බලපෑම් කිරීමට ආවා විය හැකිය. අසංක අවේලාවේ වාට්ටුවට ආවේ මාධ්‍ය හිතවත්කම නිසා ය.



"බේබි ආවද?"

ඔහු කැමරා ආම්පන්න මේසය මත තබමින් ඇසුවේ ය.

"මනමාලි බලන්ට නොගිය එකට හාංසිට කද වෙලා ඇති. මට මෙහෙම ගැලුවා කියලා කියන්ට එපා."

"එහෙම නොකියා කොහොමද? උඹ බලන්න ලස්සන කෙල්ලෙක් ඇවිදින් හිටියා කියලා නර්ස්ලා කිව්වා."

"මේ නර්ස්ලා අනුන්ගෙ ඕපා දූප හොයනවා. ඒකත් කගෙ කියලා."

"නර්ස්ලට කිව්වා උඹට පෝට්‍රේට් එකක් දෙන්න කියලා. උඹට ලස්සන කෙල්ලෙක් කෑම කැව්වලු. හාංසිත් හෙමේ නම් ඒ කවුද?"

"මචං... මාව බලන්න චලනි ආවා."

"උඹ බැණලා එලව ගත්තේ නැද්ද?"

"කොහොමද බං එහෙම කරන්නේ...? කෙල්ල හිතුවේ මට ඇස් පේන්නෙ නැතිව ඇති කියලයි. මාත් ඒ විදිහටම හිටියා."

"උඹ මම හිතුවට වඩා අණ්ඩයෙක්. ඉතින්... ඉතින්..."

"ඇස් දෙක බැඳිලා තිබුණ නිසා කෙල්ල හිතුවේ මට පේන්නෙ නෑ කියලා. පස්සෙ කෙල්ල මට කෑම කැව්වා. මාත් කෑවා."

"එහෙම නම් ඒ විදිහටම රඟපාපු. උඹ ඇස් පේන්නෙ නැති විදිහට ඇට් කරපං."

"ඒක හරි නෑනෙ මචං. හෙට උදේට නැම අපත් එනවා කිව්වා."

පාන්දරින් පිබිදුනු ඔහු මුහුණ සෝදා සූදානම් වී ඇඳට වී සිටියේ ය. නෑදෑ හිතවතුන් උදේ ආහාර ගෙන වාට්ටුවට එනු පෙනේ. එක්වරම තමා අසල විහිදෙන සුවඳක් දැනුණි. එච්චර මිහිරි සුවඳක්. ගෙල දෙතොල් පෙති, ළැම හා තවත් බොහෝ සුවඳවත් මර්මස්ථාන ගැහැනියට තියෙන්ට පුළුවන්. ගැහැනු පිරිමින්ව ජීවිතය තුළ බැඳ තබන්නේ මේ මායාවෙනි.

"ගවේෂ්... ගවේෂ්.."

ඇය සිහින් හඬින් කෙඳිරුවා ය.

"ආ... ආ... මේ චලනි ද?"

"ඉන්න... ඉන්න නැගිටින්ට මම උදව් කරන්නම්."

ඔහු නිහඬව ඇඳේ ඉඳගත්තේ ය. දෙනෙතේ ආවරණ මුදවා තිබූ බැවින් තේජවන්ත පිරිමි රුව දැකීමට අවසර ලැබුණි. මේ වැරැදි ඔක්කොම කළේ මමයි නේද? මුළු ජීවිතය පුරාවට මෙහෙම ඇස් දෙක පෙනෙන්නේ නැතිව තිබුණොත්...?

දෙනෙත් කඳුළෙන් තෙත්ව ගියා ය. ඇයට ඉකි ගැසී හැඬුණේ දුක වාවනු බැරිව ය.

"චලනි... චලනි... ඇයි මේ ඔයා අඬන්නෙ...?"

"මම කරල තියෙන වැරැදිවලට මෙහෙම අඬලා මදි. මට සමාවෙන්න ගවේෂ්."

"එහෙම නම් මටත් සමාවෙන්න."

"මොනවද ඕනෑ.. මොනවද මගේ අතින් අල්ලා ගන්න."

ඒ පිරිමි ස්පර්ශය සැනින් හදවත පුරා විහිද ගියේය.

"කෝ එන්න කෑම කවන්න."



"කරදර වෙන්න එපා. මම මේක ඇටෙන්ඩන්ට් කෙනෙකුට කියලා කවා ගන්නම්."

"මුළු ජීවිත කාලය පුරාවට මට ඉන්ට බැරි බව ඇත්ත. ඒ වුණාට දැන් මම කවන්ට ඕනෑ."

නිවාසයේ කෑම එතරම් රසක් නැත. කෙල්ලන් කෑම රස නැති දිනවල කෑම වර්ජන කරති.

"අපිත් කන්නෙ කඩ කෑම තමයි. ගෙදර ගියොත් තමයි රසට කන්නෙ. එහෙම නැතිනම් හාබර් බත් එකක් තමයි කන්නෙ."

"මඟුල කර ගත්තා නම් හොඳට ගෑනු අතකින් උයපු කෑම ටිකක් කන්ට තිබුණා."

ඇය සිනාව තද කරමින් කීවා ය. ඔහු ඇයට පිළිතුරු දුන්නේ නැත.

"බලන්ට ගිය මනමාලි ලස්සන ද?"

ඇය දුක්බර හඬින් ඇසුවා ය.

"කොයි මනමාලි ද?"

"ඇයි එදා ලේ දෙන්ට ආව දවසෙ බලන්න යන්ට හිටියෙ."

"මේවා කොහෙන් ආරංචි වෙනවද දන්නෙ නෑ."

"කොහෙන් ආරංචි වුණත් ඇත්තනෙ. ධාන්සින් ටිචර් ලස්සන ද?"

ඔහු සිනාවකින් මුව සරසා ගත්තේ ය. නියම ගැහැනුකම මතුවන්නේ මෙවන් තැන්වල දී ය.

"ඇස් දෙක පේන්නෙ නැති මට දැන් මොන ගෑනු ද? ජීවිතය පුරාවට අන්ධයෙකුගෙ කණ්වැල අල්ලන්ට ගෑනු එයි ද?"

"ඔවගෙ දුක හිතෙන කතා කියන්ට එපා. මම දොස්තරව හම්බ වෙන්නයි ඉන්නෙ. මගෙ ඇස් දෙක මම ඔයාට දෙනවා."

ඇය හඬමින් කීවා ය.

"ඔහොම ඉන්න."

ඔහු ඇගේ අත කරයේ අල්වා ගනිමින් කීවේ ය.

"මම මගේ ඇස් දෙක ඔයාට දෙනවා."

ඇය යළි වගකීමෙන් කීවා ය.



## 27

බිමා සැමියා සමඟ අයියා බැලීමට රෝහලට ගියා ය. ඔවුන් ගියේ හෝටලයකින් කෑම ද රැගෙන ය. වලනි පිළිබඳව වූ කරුණ සිතින් පහව නැත.

"කොහොමද අයියේ දැන් ඔයාට... ඇස් දෙක පේන්නෙම නැද්ද?"

බිමා ඇසුවා ය.

"පේනවා. පේනවා."

"එහෙමනම් ඔය දලක් වගේ ආලා තියෙන්නෙ. ඇත්ත කියන්න අර මැරයට ඇප දෙන්න හදනවා."

"නෑ. නෑ කදබල අමාරුවක් නෑ."

"මේ බලන්න මේ ඇස් දෙකේ රතු" ඈ හැඬුම් මුසුව කීවා ය.

"ඔය අඬන්ට දෙයක් නෑ. සනීප වෙයි."

ඔහු සොයුරියගේ අතින් අල්වා ගත්තේ ය.

අයියා ඔයා මිනිස්සුන්ට අනුකම්පාව දක්වනවා වැඩියි. මෙච්චර වැදගත් ගමනක් යන්න තියෙද්දී මල් දෙන්ට ගියේ මොට ද?

"හරි... හරි දූන් ඔය ගිය දේවල් අතෑරලා දාන්න ෆොටෝ ටික දෙන්න."

"අයියෙ මනමාලි බලන්නෙ නැතිව ජීවිතයක් බේරා ගන්න ගිය එක ගැන මනමාලිගේ පැත්තේ අය ඔයාව අගේ කරනවා. කෙල්ලත් ඒකට කැමති වුණා. මෙන්න ඇල්බම ඒක බලන්න. කෙල්ල ලස්සනයි."

"තියලා යන්න මම පස්සෙ බලන්නම්"

"අයියා ටිකට් කපලා ගෙදර යමු."

"මේ දවස්වල ෆයිනල් එකවුන්ට්වෙහ මම ඉන්නම ඕනෑ."

"තමුසේ නැතිවුණා කියලා හාබර් එක වහන්නේ නෑ. තනියම ඉන්නෙ කොහොමද?"

"අසංක ඉන්නවානෙ. වැඩ ටික ඉවර වුණාම මම එන්නම්."

"අයියෙ අර ගර්ල්ට පණිවිඩයක් යවන්ට ඕනෑ එහෙනම් අපි යනවා."

ඇය සොයුරාගේ දෙකම්මුල් සිප සමුගනිමින් කීවා ය.

චලනි වාට්ටු භාර වෛද්‍යවරයා හමුවීමට ගියා ය. වෛද්‍ය වෘත්තිකයෙකුට ශරීරය මෙන්ම කෙනෙකුගේ හදවත ද ව්‍යවච්ඡේද කර දකීමට පුළුවන. සතර සතිපට්ඨානයේ සම්පූර්ණ සිරුරම කිසිම වැදගම්මක් නැති ඇට මස් නහරවලින් සෑදී ඇති බව පසක් වෙයි.

එහෙත් මෙහි සුන්දර බවක් ද ඇත. තම මේසයට තුදුරින් ඇති ඇඳේ සිටින කඩවසම් තරුණයා හා තරුණිය පෙම්වතුන්



බවට කිසිම සැකයක් නැත. කෑම කවන්නෙ වැසිකිළියට කැඳවාගෙන යන්නෙ, ඇඳුම් අන්දවන්නේ තරුණිය විසිනි. ලස්සන යුවළක නිසා මේ දෙන්නා කාගේත් විමසිල්ලට ලක් වුණි. හෙදියක් සමග තමා දෙසට එන තරුණිය දෙස වෛද්‍යවරයා බලා සිටියේ ය.

"ඩොක්ට ඇස් දන් දෙන්න කැමති කෙනෙක් ඇවිදින්."

"බොහොම හොඳයි. අක්ෂිදාන සංගමයෙන් පෝරමයක් අරන් ඒක භාර දුන්නම හරි."

වෛද්‍යවරයා කීවේ ය.

"නෑ එහෙම නෙමේ මෙයාගේ ඇස් දෙක අර ඇඳේ ඉන්න ජේනට දෙන්න ඕනෑලු."

හෙදිය සිනාසෙමින් කීවා ය.

"ඉතින් තමුන්ට ඇස් දෙකක් ඕනෑනේ."

"මට ඇස් දෙක එපා. ඒක ගවේෂ්ට දෙන්න."

වෛද්‍යවරයා හැඟුම්බරව කතා කරන යුවතිය දෙස බැලුවේ ය.

"දැන්ම කලබල වෙන්ට එපා. අපි ඉස්සෙල්ලා ගවේෂ්ගේ ඇස් සනීප කරගන්ට බලමු."

"අනේ ඩොක්ටර් පුළුවන් වෙයි නේද? බැරි නම් ඕනෑ වෙලාවක මගේ ඇස් දෙක දෙන්නම්."

ඈ හැඬුම් මුසුව කීවා ය.

කාර්යාලයට ගොස් වැඩක නිරත වීමට පුළුවන් කමක් නැත. තාත්තාට කෑම ගෙනියන්නෙ අම්මා ය. තමාටත් දුන් [illegible] නොවන වගකීමක් පැවරී ඇත.

බසයේ ගියත්, පාරේ ගියත් සිහිවන්නෙ ඔහු ය. ඇස් ගවේෂ්ට පිරිනැමීමට සූදානම් වීම ගැන හෙදියන් සිනාසුණා ය.

ඊටත් වඩා වෛද්‍යවරයාත් එයට සම්බන්ධ කර ගත්තේ ය. මා කරන්ට සූදානම් වන පරිත්‍යාගය හැල්ලුවට පත් කරන්ට සූදානම් වන්නෙ ඇයි? අපි දෙදෙනා ආදරයෙන් බැඳුණු පෙම්වතුන් යැයි ඔවුන් නිගමනය කර ඇත.

නේවාසිකාගාරයට ගොස් නැවත සැදෑ සමයට ආ යුතුය.

"චලනි මිස් හම්බවෙන්න කට්ටියක් ඇවිදින් ඉන්නවා."

පාලිකාව කීවා ය.

අම්මා කාමරයට යවා ඇය පිසින්න කාමරයට ගියා ය. තරුණ යුවළක් අසුන්ගෙන කතා කරමින් සිටින හැටි ඇය දුටුවා ය. ඇය සිතා සිටින්නෙ ගාල්ලෙන්, කිරමින් හෝ නෑදෑයෙක් පැමිණ ඇත කියා ය.

"ඔයාද චලනි කියන්නෙ...?"

මනා හැඩරුවින් යුතු තරුණ ගැහැනිය දිලිසෙන දෑසින් යුතුව ඇසුවා ය.

"ඔව් අක්කා ඇයි..?"

"අක්කා කියලා ලැජ්ජ නැතිව කිව්වනෙ. අහිංසක කමට හිච්චට කරලා තියෙන්නෙ මිනී මරණ වැඩ. අයියාගේ ඇස් දෙකට මොනවා හරි වුණොත් ඔයාට වන්දි ගෙවන්න වෙයි."

මේ පැමිණ සිටින්නේ කවුදැයි ඈ තේරුම් ගත්තා ය. පැහැදිලිවම එසේ බැණ වැදීමට සාධාරණ අයිතියක් ඔවුන්ට ඇත.

"ඔයා නිසා අයියා පිස්සු හැදිලා ඉන්නෙ. ෆයිනල්ස් ලියන්න හිටියෙ. විභාග ඔක්කොම අතෑරියා. බලාගන්න අයෙක් බලාගෙන ඉන්නවා."



"ලේ දෙන්න කියලා එක්කාගෙන ගිහින් ගැහුවා කියලයි ඔප්පු වෙලා තියෙන්නෙ. ඇස් දෙකට මොනවා හරි වුණොත් වන්දි ගෙවන්න වෙයි."

සෙනෙවි කීවේ ය.

"ඔයා දැන් ලක්ෂ පනහක් ඉල්ලලා නඩුදාලානෙ ඉන්නෙ. අයියගෙ ඇස් දෙකට මොනවා හරි වුණොත් මොකද කරන්නෙ...?"

"අයියා මම මේ කිසිදෙයක් දන්නෙ නෑ. ඔගොල්ලො කැමති තරමක් බණින්න. මම ඒක දෙයක් කරන්න පොරොන්දු වෙලයි තියෙන්නෙ."

"මොනවද ඔයා කරන්ට හදන්නෙ."

"ගවේෂ්ගෙ ඇස් දෙකට මොනවා හරි වුණොත් මගෙ ඇස් දෙක දෙන්ට."

ඇය දෑතින් මුහුණ වසා හඬමින් කීවා ය. ඔවුහු චලනි දෙස බලා උන්හ.

"බේබා අපි යමු."

චලනි හඬමින් නේවාසිකාගාරය තුළට දුව යනු බේබා බලා සිටියා ය. කොපමණ අමනාපකම් හිතේ තිබුණත් ඒ අමනාපය ගියාක් මෙන් දැණුනි.

ලෙඩුන් බලන වේලාවෙදී වෛද්‍යවරයා ගවේෂ් අසළට ආවේ ය.

"දැන් කොහොමද ගවේෂ් ඇගේ ප්‍රශ්නයක් නැහැනෙ."

"ඔව් ඩොක්ට දැන්නම් හොඳයි. තව රතුපාට තියෙනවා කිව්වා."

''ඔයා බයවෙන්ට එපා. ඔයාගෙ මෙ ඇස් දෙක වෙනුවට ඇස් දෙකක් දෙන්න කෙනෙක් ඉන්නවා.''

''ලස්සන ඇස් දෙකක්. නිල නුවන් දෙකක්.''

හෙදියක් සිනාසෙමින් කීවා ය.

''අපි බොහෝ වෙලාවට ලොකේ ආදරය කියලා දෙයක් නැහැ කියලා කියන්නෙ. ඔය දෙන්නා වාට්ටුවේ ඉන්නවා දක්කම සන්තොසයක් දකිනවා.''

''මූණ හොඳලා, කවලා යනවා. අපිත් බලා ඉන්නෙ මේ දෙන්නා දිහා තමයි.''

''එහෙම නම් අපි යමු. දැන් ලෙඩ්ඩු බලන්න එයි.''

වාට්ටුවට පිවිසෙන චලනී දෙස බැලුවේ වෙනදා මෙන් නොවේ.

වෛද්‍යවරයා පැවසුවාක් මෙන් අමුතු ලස්සනක් ඇය වෙතින් වැස්සෙමින් තිබුණි. කෑම පාර්සලය මේසය මත තැබූ ඇය පහත් කරගත් හිසින් යුතුව සිටියා ය.

''ඔයාට මාව පේනව ද ගෙවින්...?''

''ඔව් පේනවා.''

''ඇත්තම කියන්ට මාව පේනවද..? කොයි විදිහට ද පේන්නෙ...?''

ඇයට අවශ්‍ය වූයේ ඔහුගේ පෙනුම පසක් කර දැන ගැනීමට ය.

''ඇත්තම කියන්ට ද?''

ඔහු සිනාසෙමින් කීවේ ය.



''මට පේන්නෙ ''කහ කිරිල්ලියෙක්'' වගෙ.''

ඔහුගෙ අනපේක්ෂිත කතාවෙන් හදවතට පිවිසුණේ දරාගත නොහෙන සතුටකි. එහෙත් එම සතුට හිමිකර ගැනීමට තමා හිමිකර නොමැති බව පිළිබඳව සිතට පිවිසුණේ දුකකි.

ඇය ඉවතට හැරී අතේ වූ ලේන්සුවෙන් දෙනෙත් පිස දමා ගත්තේ ය.

''විහිළුවක් නෙමෙ මා කිව්වෙ ඇත්ත.''

ඇය පිළිතුරක් නොදී මේසය මත වූ ෆොටෝ ඇල්බමය පෙරළා බැලුවා ය. ඒ ඇල්බමය කාගේදැයි ඔහුගෙන් විමසීමට අවශ්‍ය වූයේ නැත.

ඔහු මනාලියගෙ ඡායාරූප බලමින් සතුටුවනවා විය හැකිය.

# 28

ඇල්බමයේ වූ ඡායාරූප දෙස බලා සිටිය දී වලනිගෙ හදවත මහා ගින්නකින් දැවී ගියාක් මෙන් දැණුනි. දක්ෂිණ භාරතීය ඇඳුමකින් සැරසී ගන්නා ලද ඡායාරූප රැසක් එහි විය. කතක්, මනිපුරි රංග ශෛලීන් විදහා දක්වන ඡායාරූප විය. සල්වාර්, ජීන්ස් දෙවැනි මනමාලිය ලෙස රූප සුන්දරිය ලෙස කිරුළ පලන් මොහොත වශයෙන් විශාල ඡායාරූප එකතුවක් එහි විය.

"මම කවදාවත් බඳින්නෙ නෑ"

සැබැවින්ම ඇ ලස්සන යුවතියකි. තමාට ලැබෙන්නට තිබූ වාසනාවක් පිට කෙනෙකුට අයිති වෙන්ට යන විට ඇති වෙන සංවේගයක් සිතේ ඇති වුණි. පින්තූර දෙස නොබැලුවොත් තමා ඊර්ෂ්‍යාකාරියකැයි සිතුණ හෙයින් ඇය පෙරළා බැලුවා ය.

"ලස්සනයි." ඇ කට කොනින් සිනා සී ඇල්බමය වසා තැබුවා ය.

"ඇයි අද වෙනස්..?"

"නෑ මුකුත් නෑ."



ඇය ආයාසයකින් සිනාසුනා ය. දෙනෙත් කඳුළෙන් තෙත්ව ගිය බැවින් ඇය ඉවතට හැරී කඳුළු පිසදමා ගත්තා ය.

"විහාගෙ දන් ලකයි නේද?"

ඔහු පිළිතුරක් නොදී සිටියේ ය.

"එක ඉල්ලීමක් කරන්ට ද?"

"හා කියන්න."

"දන් අපේ බැන්ක් එකේ එග්සැම් කරන මැනේජර්ස්ල ස්ටඩි ලීව් අරන් පාඩම් කරනවා. ඔයා පාඩම් කරන්නෙ නෑ කියලා මට ආරංචියි."

"කවුද ඒ බොරු කිව්වෙ..?"

"කොහොම හරි ආරංචි වුණානෙ. ප්ලීස් විහාගෙ නොකර ඉන්න නම් එපා. එහෙම කළොත් මටයි බැණුම් අහන්ට වෙන්නෙ."

"මේ හැම දෙයක්ම වුණේ මා නිසයි නේද?"

"කවුරුත් සම්බන්ධ නෑ. මේ මගෙ වෙලාව නැතිනම් මෙහෙම දෙයක් වෙන්නෙ නෑ."

"දන් ඉතින් හැම දෙයක්ම හොඳට වුණානෙ. සනීප වුණා. ලස්සන මනමාලියකුත් හම්බ වුණා."

ඔහු වලනි දෙස බලා සිටියේ ය.

"මම ජීවිතේට බඳින්නෙ නෑ."

"මෙච්චර ලස්සන මනමාලියෙකුත් ලැබිලා. ඇයි හිතේ වෙන කෙනෙක් ඉන්නවද?"

ඇය උදක්ම බලාපොරොත්තුව සිටියේ ගමේෂ්ගෙන් පිළිතුර ලැබෙන තෙක් ය. ඇඳ අසළට තැනැත්තෙක් එනු යළි ඇ පසෙකට වූවා ය.

''කෑම එකක් නම් ගෙනාවේ නෑ. ආ''

අසංක කෑම පෙට්ටිය මේසය මත තබමින් කීවේ ය.

''කෑම එකක් හම්බ වුණා.''

''ඒ වගෙ වාසනාවක් අපට කොයින් ද?''

අසංකගේ ඇනුම් පදයට ඈ මදහස පෑවා ය.

''එහෙනම් මම යන්නම්.''

චලනි යාමට සූදානම් වෙමින් කීවා ය.

''හා... හා... යන්ට එපා. මම මේ පෙපර් කවරේජ් එකකට යන ගමන්. දෙන්නා කතා කර ගන්ට අපි යනවා.''

අසංක ගවේෂ්ගේ පිටට තට්ටුකර කැමරා බෑගය කරලාගෙන යන්ට ගියේ ය.

''අපරාදෙ මා නිසා යාළුවත් ගියා.''

චලනී කීවා ය.

''ඔක මොකද්ද ඕවගෙ පාඩු ද මට වෙලා තියෙන්නෙ?''

''කෝ මට ඇස් දෙක පෙන්වන්න බලන්න. මෙහෙම පේන්නෙ නෑ. එළියට යමු ද කෝ ඉන්න මම බහින්න උදව් කරන්නම්.''

චලනී ගවේෂ්ට ඇඳෙන් බැසීමට සහාය වූවා ය.

''කෝ මගෙ අතින් අල්වා ගන්න.''

ඇය ඔළු ලෙස ඔහුගෙ අතින් අල්වා ගත්තා ය. ඇය සෙමින් සෙමින් ඔහු සමඟ එළියට ගියා ය. දෙදෙනාම එකවර අසුන් ගත්හ.



''කෝ පෙන්වන්න ඇස් දෙක.''

''මේ ඒක නෙමෙ ඔයාගේ ඇස් දෙක මට දෙනවා කියලා ඩොක්ටර්ට කිව්වද?''

''ඔව් කිව්වා ඇයි...?''

''එතකොට ඔයාට ඇස් දෙකක් කෝ...?''

''මට එපා.''

''එහෙනම් ඔයාට කණවැල අල්ලන්ට මට එන්ට වෙයි.''

ඈගේ මුහුණේ සිනාවක් සටහන් වුණි.

''මුළු ජීවිත කාලය පුරාවට එන්න පුළුවන්. ඒත් මම පින් කරලා නෑ.'' යැයි පැවසීමට සිතුණ මුත් ඇය නිහඬව සිටියා ය. අතින් අල්වා බොහෝ වෙලාවක් සිටිය මුත් කතාවක් සිදුවූයේ නැත.

''පළවෙනි බෙල් එක ගැහුවා මම යන්නද?''

''තව ටිකක් ඉන්න.''

''ඉතින් මම හිටියා කියලා ඇති වැඩේ මොකක්ද? කොහොමටත් යන්ට වෙනවනෙ.''

''ආ... ඔව් ඒක ඇත්ත තමා. රෑ වෙනවනෙ එහෙනම් යන්ට.''

''තනියක් නම් නෑ. අම්මා ඉන්නවා. මම තව ටිකක් ඉඳලම යන්නද?''

ඔහු හිසවනා අනුමත කළේ ය.

''වෙඩින් එකට මටත් ඉන්වයිට් කරනවද?''

''මම කිව්වෙ. මම කවදාවක් බඳින්නෙ නෑ.''

ඔහු දිග සුසුමක් හෙළමින් කීවා ය.

බාලමහත්තයා ඇඳේ වැතිර සිටියේ බිරිඳ එනතෙක් ය. ගෙවමින් පවතින්නේ අපල කාලයකි. සිදු වූ දේවල් පිළිගැනීමටවත් බැරි ය. දූවගේ ප්‍රශ්නය හරහා සියල්ල නැති වී ගියේ ය.

''මා නිසා ඔයාටත් කරදර වුණා.''

''ඒකට කමක් නෑ. එක අතකට අපි කෙළින්ම මෙහෙට ආවානම් ඉවරයි.''

''ඔපරේෂන් කරන්න ඕනැමයි කියලා එච්චර බෙහෙතින් කරන්නට පුළුවන් කියලා මහත්තුරු කියනවා.''

''තුනුරුවන් සරණින් එහෙම නම් කොච්චර දෙයක් ද?''

''කෝ... දූව ඇයි තාම නැත්තෙ. හැමදාම බලන්න යන යාළු ලෙඩා තවම ඉන්නව ද?''

''අද ටිකට් කපනවලු.''

''රංජිත් එහෙම ආවෙ නැද්ද?''

රංජිත් මෙහි පැමිණ කලබලයක් ඇති කළ බව කිසිවෙක් සැමියා සමඟ පවසා නැත. හෙතෙම පොලිස් රිමාන්ඩ් භාරයේ සිට නිදහස් වූයේ පහර කෑ තැනැත්තාගේ කට උත්තරය නිසා ය. ඔහු පහර දී ඇත්තේ ෆෙල් දෙන්ට පැමිණි තැනැත්තෙකුට ය.

''තේන එක තමා හොඳ. මෝඩ වඳුරෙක් වගේ ඉවක් බවක් නැතිව වැඩ කරනවා.''

''මම වෙනුවෙන් ජීවිතේ පුදයි.''

වලනිගේ මව වැඩිපුර ඒ ගැන කතා කිරීමට සතුටු වූයේ නැත.



''කෙල්ලට හුළං පොදක් වදිනවට කැමති නෑ.''

සිදු වූ දෑ ඇය පැවසුවේ නැත. ඔවුන් කතා කරමින් සිටියදීම කිසිවෙක් පහත් කරගත් හිසින් පුතුට වාට්ටුව දෙසට එනු ඔවුහු දුටහ.

''රංජිත් මල්ලි.''

''ආවට මොකුත් කියනවා හෙම නෙවෙ.''

රංජිත් පැමිණ බාලමහත්තයා අසළ සිට ගත්තේ ය.

''කොහොමද අයියේ... දැන් සනීප ද?''

''අයියගෙ වෙලාවට තමා මෙහෙ ඇවිදින් තියෙන්නෙ. ඔපරේෂන් කරන්නෙ නැතිව සනීප කරන්ට පුළුවන් කිව්වා.''

''අනේ කොච්චර හොඳ ද?''

''මල්ලි පහුගිය දවස්වල කොහේද ගියේ...?''

ඔහු පිළිතුරක් දුන්නේ නැත. පසුගිය දිනවල පොලිස් කූඩුවේ සිරව සිටියේය යන්න අයියාට පැවසීමට නොහැකිය. රංජිත් සොයුරිය සමඟ එළියට ආවේ ය.

''අක්කේ කෝ දූව...?''

''එයාගෙ යාළු ලෙඩෙක් ඉන්නවා.''

රංජිත් බිත්තියට හේත්තු වී සිටියේ ය.

''මොකද වුණේ...? උසාවි යන්ට වුණා ද?''

''අක්කේ මම ගහපු කොල්ලා මාව අමාරුවේ දාලා නෑ. මම ගැහුවයි කියලා නෑ.''

''මොනවා මල්ලී... ඒ ඇයි...?''

"මම මහ ජරා මිනිහෙක් අක්කේ. මම මෙච්චර ගහලත් ඒ කොල්ලා මගේ නම පොලිසියට කියලා නෑ."

බාප්පා දුටු සැණින් වලනිගේ සිතේ ඇති වූයේ කෝපයකි. ඇය බාප්පා දෙස නොබලා ඉදිරියට ගියා ය.

"පොඩි දුව... පොඩ්ඩක් ඉන්න."

"ඔයා මා එක්ක කතා කරන්න එපා. ඔයා මිනිහෙක් නෙමෙ... අමනුස්සයෙක්."

ඇය පිළිකුලෙන් බාප්පා දෙස බැලුවා ය.



## 29

මිනිසුන් හැඟුම්බර තීරණ ගන්නේ අවස්ථානුකූලව ය. අයියාගේ දුව යනු තමාගේ දුවෙකුට සමාන ය. පරපුරේ කිසිවෙකුට අවැඩක් සිදු වුවහොත් එයට විරුද්ධව නැගී සිටිය කළ යුතුය.

පවුලට, නෑ පරපුරට, ගමට, රටට, ජාතියට අවැඩක් සිදුවන්නේ නම් එයට එරෙහි විය යුතුය. දුවගේ මංගල කටයුත්තට රංචා කළ නැකැත්තා හමුවන තෙක් මෙතෙම මඟ බලා සිටියේ ය.

එම නැකිත්තා නිසා පවුලේ සතුට, සාමය බිඳී ගියේ ය. ලොකු අයියා සැක කිරීම නිසා මහා විනාශයක් සිදු වුණි. පත්තර ඒජන්සිය ඇතුළු කඩපේළිය විනාශ වුණි. ලොකු අයියා මැදිහත් වීම නිසා එය ගොඩින් බේරා ගැනීමට හැකි වුණි. ගැහැනු දරුවාට මුහුණ දීමට සිදු වුණු මදිපුංචිකම නිසා පොඩි අයියා රෝගාතුර වුණි.

වලනි දුව ද මේ නිසා දුර්වල වී ඇත. දුව ඉගෙනීම අතෑර දමා බෝඩිමට වී සිටින බව දැනගත් දිනයේ සිට ඒ වනචරයාගෙන් පලිගැනීමට සිතා ගත්තේ ය. මේ හැම දේකම වැරැදිකරුවා වන්නේ දුව බලන්ට පැමිණීමට නියමිතව සිටි මනමාලයා ය.

කොහේදි හමුවුණත් පාඩමක් උගන්වන බවට ඔහු තීරණයක් ගෙන තිබුණි. රෝහලෙන් පිටතට එන තැනැත්තා ඔහු හඳුනා ගත්තේ ය. කතා දෙකක් නැත. පැන්න ගමන් පතබැමේ අම්මාගේ කිරි සිහිවන්නට ය.

රෝහලේ රැස්ව සිටි පිරිස නොවී නම් මොන දෙයක් වේදැයි ඔහුට නොදැන සිටියේ ය. රෝහල් පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් ගත කෙරුණි. පහර කෑ තැනැත්තා රෝහල් ගත කළ බව දැන ගත්තේ අක්කාගෙනි.

"මොකද මල්ලි මේ කරගත්තෙ...?"

අක්කා ඇහුවා ය.

"මට ඒකව දක්කම ඉවසුම් නැතිව ගියා අක්කා. හිරේ ගියත් මට ගහන්න ඕනෑ වුණා."

"වැඩේ ලේසි වෙන එකක් නෑ. දැන් ඒ කොල්ලගෙ ඇස් පේන්නෙ නැතැල්ලු."

"මම ගැහුවෙ මූණ වජ්ජ වෙන්ටයි. අක්කා මට ඇප ඉල්ලුවද?"

"ඕගොල්ල දුර දිග බලල වැඩ කරන්නෙ නෑ. ගුටි කාපු ළමයට අමාරුලු. ඇස් පේන්නෙ නැතිලු."

ඔහු මද වෙලාවක් නිහඬව සිටියේ ය.

"ඒ ළමයගෙන් තවම පොලිසිය කටඋත්තරයක් අරන් නෑ. කට උත්තරයක් දීලා නෑ."

"මේකාට මේක හද කරන්ට පුළුවන්. ඒ විතරක් නෙමේ මට හිරගෙදර යන්ට වෙයි."

"ඒ කොල්ලා කොළඹ ඉන්න කෙනෙක්. ලේසියෙන් ගැලවෙන්ට බැරිව එනේ."



ගාල්ල දිසා අධිකරණයේ නඩු කීපයක් ඇත. මේ නඩුවන් එක් වූ විට තත්ත්වය බරපතළ වනු ඇත. නමුත් හදිසියෙන්ම නිදහස ලැබීම නිසා ඔහු සතුටට පත්වුණි. පොලිස් පරීක්ෂකවරයා රංජිත්ගේ ඉතිහාසය දැන සිටියේ ය.

"තමුසෙ ගැන මම ගාල්ලෙන් හොයා ගත්තා. මෙහෙටත් ඇවිදින් දාමරික වැඩ කළා නේද?"

රංජිත් පහත් කරගත් හිසින් යුතුව සිටියේ ය.

"තමුසෙ ගහපු මහත්තයා තමුසෙ වගේ IRC කාරයෙක් නෙමේ. ඕනිත් ඒ මහත්තයට වැඳලා සමාව ගන්නවා."

"මගෙත් වෙලාව හොඳ නෑ සර්. මම ඒ මහත්තයා හම්බ වෙන්ට යනවා."

"තමුසෙට බේරෙන විදිහට කටඋත්තරයක් දුන්නෙ. තමුසෙ ගැහුවත් තමුසෙට මහත්තයා සමාව දුන්නා. හා... හා... යනවා."

රංජිත්ගේ සිතේ තමා කෙරෙහිම බලවත් කලකිරීමක් ඇති වුණි. අපි මිනිසුන් මැනීමට සිතා සිටින මිම් අතිශයින් වැරදිය. ඔහු ප්‍රථමයෙන්ම ගවේෂ් සිටින වාට්ටුව සොයා ගියේ ය. ඔහුගේ ඇඳ හිස් ය.

"අර ඇස් තුවාල වෙලා ඉන්න ලෙඩා නේද?"

"ඔව් මිස් එයා තමා."

"අන්න දෙන්නා කොරිඩෝවෙ දිහා ගියා."

රංජිත් තරමක සැකයෙන් යුතුව කොරිඩෝරය දෙසට බැලුවේ ය. රෝහල් ආලින්දයේ සිටි දුව හඳුනා ගැනීමට ගතවූයේ මොහොතකි. ඇය සමඟ සිටි තරුණයා කවුද? දෙවියනේ මේ ඉන්නෙ සියලුම ප්‍රශ්නවලට හේතු වූ තැනැත්තා නේද? ඔවුන් දෙදෙනා දැත් අල්වා සිටින සුන්දර විලාසය රංජිත්ගේ සිත් ගත්තේ

ය. ඔවුන් දෙදෙනා ආදරයෙන් බැඳී සිටින බවට කිසිම සැකයක් නැත. මෙවන් මොහොතක් ඔවුන් සිටින තැනට යාම සුදුසු නැත. ලෙඩුන් බැලීම අවසන් බව දන්වා සීනුව නාද වූ නිසා ඔහු වාට්ටුවට ගියේ ය. තවමත් වෙන්ව නැත. අත් අල්ලා සිටින සුන්දර විලාශය දෙස ඔහු යළිත් බැලුවේ ය.

සියල්ල වෙන්ව ගිය පසු ඇඳේ වැතිර සිටින ගවේෂ් අසලට ගියේ ය.

''මහත්තයෝ... මාව අඳුනන්ට පුළුවන් ද?''

ගවේෂ් හිස ඔසවා බැලූ මුත් කිසිවක් කීවේ නැත.

''මහත්තයෝ... මට සමාවෙන්න. මහත්තයා මෙච්චර හොඳ කෙනෙක් කියලා මම දන්නෙ නෑ.''

''හරි... හරි දූන් ඒ ගැන කතා කරල වැඩක් නෑ. හැම දෙයක්ම සිද්ධ වෙලා ඉවරයිනෙ.''

''කෝ බලන්ට ඇස් දෙක පෙන්නමු.''

ඔහු ගවේෂ්ගේ දෙනෙත් දෙස බලා සිටියේ ය. තවම ඇස්වල රත පහව නැත.

''මම වාහනයක් කතා කරගෙන එන්නම්. ගාල්ලෙ හොඳ ඇස් වෙද මහත්තයෙක් ඉන්නවා. අපි සිංහල වෙද මහත්තෙකුට ඇස් දෙක පෙන්වමු.''

''නෑ අවශ්‍ය නෑ.''

ඔහු නොසැලකිල්ලෙන් කීවේ ය.

''මහත්තයෝ... ඔම්වට යන වියදම් ඔක්කොම මම් ගාෙන. සිංහල බේතක් කරමු.''



''නෑ අවශ්‍ය නෑ. මා ගැන කවුරුවත් කරදර වෙන්ට කාරි නෑ.''

ගවේෂ් පසුවන්නේ අමනාපයෙන් බව හැඟී ගියේ ය.

අසංක කෙළින්ම ගියේ බේමා හමුවීමට ය.

''ආ... කොයි වෙලේ ද ආවෙ. ඔෆිස් එකේ ඉඳලා එන ගමන් ද?''

''මම මේ ගවේෂ් බලන්ට ගිහින් එන ගමන්.''

''ඒක නෙවෙ අසංක අයියා, අපේ අයියා අර ඇල්බම් එකේ හිටපු කෙල්ලට කැමතියි නේද?''

''කෙල්ල ලස්සනයි. ඒ වුණාට මම හිතන්නෙ නෑ කැමති වෙයි කියලා.''

''මොකටද අකැමැති වෙන්නෙ...? උපේකා තනි කෙල්ල. ලක්ෂ ගාණකට දීපල තියෙනවා. ඊටත් වඩා කවදා හරි ජනප්‍රිය නැටුම් උපදේශිකාවක් වෙයි.''

''ගැහැනු මිනිස්සු යාළු වෙන්නෙ කිසියම් හේතුවක් ඇතිව. සමහර ගෑනු මිනිස්සු එක්වෙලා ඉහත ආත්මවල ගෙවපු පව් ගෙවනවා. සමහරු සැප විඳිනවා.''

''මෙහෙම හිටියට ජාතික නැටුම් කණ්ඩායමක් එක්කල රටවල් දහයකට විතර ගිහින් තියෙනවා.''

''ටීවී එකේ ඉන්නවා මම දැකලා තියෙනවා. ඇයි ඉතින් ඒ පැත්තෙන් කෙනෙක් හොයා දෙන්නෙ නැත්තෙ...?''

''මේක අපේ යාළු මට්ටමින් කරන එකක්. අයියාගෙ හිත හදන්න ඔයත් උදව් වෙන්ට ඕනෑ.''

"මේ වැඩේ හරියන එකක් නෑ වගේ.මුගේ හිත වෙන පැත්තකට ගිහින් වගේ."

"මොනවා... අයියට කෙල්ලෙක් ඉන්නවා...?"

කොහේදෝ නැති සතුටක් සිතට ඉදිරියෙන් ඇති බවක් ඇයට හැඟේ.

චලනි නවාතැනට ගියේ වෙනදාට වඩා සතුටින් යුතුව ය. කාන්තාට ශල්‍යකර්මයක් කිරීමට අවශ්‍ය නොවන බැව් පැවසූ මොහොතේ සිට ඇති වූයේ සතුටකි. ගවේෂ්ට තමා අතින් සිදුවූයේ බලවත් වරදකි. ඊටත් වඩා තමාට හිමිවීමට තිබූ සම්පතක් අහිමි කරගත්තේ අවාසනාව නිසා ය. කාන්තා නේවාසිකාගාරයට පැමිණි ගවේෂ්ගේ නංගි තමාට දොස් පැවරූ හැටි චලනිට සිහිවෙයි. ඇය කතා කළේ තමා කෙරෙහි උපන් තදබල අමනාපයෙන් යුතුව ය. කොපමණ බැන්නත් ඉවසා සිටියේ සිතේ උපන් දුක නිසා ය. එසේ බැණ වැදීමට අයිතියක් ඔවුනට ඇත.

හැන්ඩ් ෆෝනයේ අංකය සිතේ තබා ගත්තේ ඔහු කිසිවෙකුට පවසද්දී ය.

"නිදි ද?"

ඇය සඳළුතලයේ යකඩ වැටට හේත්තු වී ඇසුවා ය.

"රෑට නිද්හගෙ නැතිව මොනවා කරන්නද? චලනි තවම ඇහැරලද?"

තම නම හඳුනා ගත් සැණින් ඇගේ සිතට දරාගත නොහෙන සතුටක් පිවිසුණි.

"මගේ කටහඬ මතක තිබුණද?"

"කටහඬ නෙමේ හැම දෙයක්ම මතකයි."



එම වචනයේ ඔසවා සිටීමට බැරි තරම් බරක් තිබුණි.

"මට සමාවෙන්න. මම ඔයාට බොහෝ කරදර කළා."

"නැහැ. මම ඊට වැඩියෙ වැරැදි කළා. හැමවිටම ගැහැනියකගේ ආත්ම ගෞරවය රකින්න ඕනෑ. මම ඒ දේ කළේ නෑ."

"එපා තමුන්ට දොස් කියා ගන්ට. මමයි වැරැදිකාරි. ඔයා මට සමාව නුදුන්නොත් මට ජීවත් වෙන්ට බැරි වෙයි."

"මම හෙට යනවා."

"ඉතින් අපි නැවත කවදාවත් හමුවන්නෙම නැද්ද?"

ඔහු පිළිතුරක් නොදී සිටියේ ය. ඇත්තටම අපි නැවත හමුවන්නේ කුමට ද?

ඈ දෑතින් මුහුණ වසා ගත්තා ය.

## 30

මනමාලයා තමා බැලීමට නොපැමිණීම ගැන නිවසේ අය ඔහුට දොස් පැවරූ හැටි උපේකාට මතක ය. එකම ගුරු මණ්ඩලයේ සේවය කරන මිතුරියක මගින් පැමිණි යෝජනාවේ හාදයාංගම බවක් තිබුණි. බේමා ඔහුගේ සොයුරාට තමා ගැළපේයැයි සිතීම තුළ තමාගේ හැඟීමක් තිබුණි.

අද විවාහයක් සඳහා පිරිමියෙක් සොයා ගැනීම බරපතල ප්‍රශ්නයකි. අවුරුදු ගණන් ඇසුරු කර ප්‍රේමයෙන් වෙළී සිටියත් දායාද වෙනුවෙන් සියල්ල අත්හරින පිරිමි සිටිති. එසේම විවාහක බිරිය අතහැර හොර අඹුවන් කරා යන පිරිමි විරල නැත. ඕනෑම තැනක වරදෙහි බැඳෙන්නට ගැහැනු පිරිමි කාටත් පුළුවන.

බේමා මේ විවාහය ගෙනෙන්නට ඇත්තේ හොඳ විශ්වාසයෙන් යුතුවය.

මනමාලිය බැලීමට නාවේ ඇයි දැයි හෙළි වූයේ පසුවය. මනමාලියක් බැලීමට යාම පසෙක තබා මනුෂ්‍යයෙකුගේ ජීවිතය බේරා ගැනීමට ගත් උත්සාහය උපේකා අගය කළා ය. මෙවැනි කැප කිරීමක් කළ උතුම් පුද්ගලයෙක් බැලීමට යාම යුතුකමකි.



ඇය කිසිවෙකුට නොදන්වා රෝහලේ සිටින ගවේෂ් බැලීමට ගියා ය. මෙවැනි තැනැත්තෙක් කිසිවෙකුගේ මඟපෙන්වීම නැතිව දැක ගැනීමට ඇයට අවශ්‍යව තිබුණි. රෝගීන් බැලීම සඳහා වේලාව නිවේදනය කළ සැණින් ඈ වාට්ටුව සොයා ගියා ය.

හෙදියක මගින් ඇය රෝගියා සිටින ඇඳ සොයා ගත්තා ය.

ඇඳට හේත්තු වී කිසිවක් බලා සිටින තැනැත්තා දෙස බැලුවා ය. ගැහැනියෙකුගේ සිත පැහැර ගන්නා පෞරුෂයක් ඔහුට තිබුණි. විදේශ සංචාර කීපයකට සහභාගි වී ඇත. ඒ කිසි ගමනක දී පිරිමියෙක් දැක නැත. කරාබු දමන, කොණ්ඩය වවන, ගැහැනු මෙන් අඳින්නට පලඳින්නට කැමති පිරිමි අරික්කාලවල් ඕනෑ තරම් ඇත. පිරිමියා සැබැවින්ම හොඳ ජවයක් ඇති රණකාමියෙක් විය යුතුය. ප්‍රාන්, ජෝලිකප්ජ්, අමිතා බච්චන්, රවීන්ද්‍ර රන්දෙණිය, විජය කුමාරතුංග වැනි පිරිමින්ට ගැහැනු වසඟ වීම පුදුමයට කරුණක් නොවේ.

උපේකා සෙමින් සෙමින් ගවේෂ් අසළට ගොස් බලා සිටියේ ය.

හෙතෙම බලා සිටින ඇල්බමය හඳුනා ගැනීමට ඇයට නොවූයේ මොහොතකි. තම ඡායාරූප ඇල්බමය බේමා අත එව්වේ ඔහුට බැලීම සඳහා ය. සමාධියට සම වැදුනාක් මෙන් තම ඡායාරූප දෙස බලන විට කොහේදෝ නැති සතුටක් හදවත පුරා පැතිර ගියේ ය. මෙවැනි දෙයක් කිසිදාක සිදුව නැත. තම රූප දෙස බලා ඔහු සතුටක් ලැබුවා නම් එය කොච්චර හොඳ ද?

මඳ වේලාවක් බලා සිටි ඈ ලෙඩුන් බැලීම සඳහා ගෙන ගිය පලතුරු බෑගය මේසය මත තැබුවා ය.

ගවේෂ් නරඹමින් සිටි ඇල්බමය ළය මතතබා හිස එසවීවේ ය. තමා ඉදිරිපිට සිටින රුව දකීමෙන් ඇස් අදහාගත නොහැකිව සිටියේ ය. ඔහුට මේ ලස්සන රුව හොඳට හුරු ය.

''අඳුනන්නට පුළුවන් ද?''

ඇ සිනාසෙමින් ඇසුවා ය. සිනාසෙන විට කම්මුල් වළ ගැසෙන ඡායාරූප රැසක් ඇල්බමයේ තිබුණි.

''නංගිගෙ යාළුවා නේද?''

''මොකටද ඔය කැත පින්තූර දිහා බලන් ඉන්නේ...?''

ඔහු පිළිතුරක් නොදී සිනාසුණේ ය.

''වෙච්ච දේට මට සමාවෙන්න.''

ඔහු පහත් හඬින් කීවේ ය.

''ඊට්ස් ඕකේ. ඒකෙන් ඔයා කොච්චර හොඳ කෙනෙක් ද කියලා මම තේරුම් ගත්තා.''

ඇය පහත් කරගත් හිසින් යුතුව කීවා ය.

''මම ඉස්පිරිතාලෙ ඉන්නවා කියලා නංගි ද කිව්වෙ...?''

''ඔව්... බේමා තමයි.''

''හොස්පිට්ල් එකේ කවුරුවත් ඉන්නවද?''

''වෙන කවුරුවත් නෑ. මම ආවෙ ගවේෂ්ව බලන්නයි.''

''අපරාදෙ ඇයි කරදර වුණේ...? ඇයි තනියම මෙහෙට ආවෙ...?''

ඔහු දුකින් ඇසුවේ ය.

''අපි දකින වෙනත් කෙනෙකුට නැති උසස් ගතිගුණ ඔයාට තියෙනවා. තමුන්ට හිරිහැර කරපු කෙනාටත් ගවේෂ් සමාව දුන්නා කියලා මට ආරංචි වුණා.''

''කෙකෙකුගෙන් පළිගන්නා සිතක් මට නෑ.''



''බේමාත් නිතරම ගවේෂ් ගැන කියනවා. බොන්න දෙයක් හදලා දෙන්නද?''

''එපා එපා කරදර වෙන්න.''

''මම හෙට කෑම එකක් හදාගෙන එන්නම්.''

''එපා කරදර වෙන්න. දැන් හිටියා ඇති. ඉක්මනින් යන්න. දැන් ගෙදර යනකොට රෑ වෙයි.''

''ජනමාධ්‍යගම අපේ අංකල් කෙනෙක් ඉන්නවා. අද මම එහෙ නවතිනවා.''

හදවතට ආදරය පිවිසෙන්නට නියමිත වයසක් නැත. හදිසියෙන්ම හිතට පිවිසුණේ දරාගන්ට බැරි ආදරයක්. ඇය එක එල්ලේ ගවේෂ් දෙස බලා සිටියා ය. පැහැදිලිවම තමා බේමාට ඉයගැති යැයි උපේකාට සිතුණි.

කාර්යාලයට ගියත් වලනිව වැඩක නිරත වීමට පුළුවන් කමක් නැත. ගවේෂ් සිහි නොවන මොහොතක් නැත. මිනිසුන්ට ජීවිතයේ වූ සතුට, ත්‍යාගයක් ලෙස පිරිනමන්නේ නැත. කාර්යාලය නිම වූ සැණින් යන්නේ ගවේෂ් බැලීමට ය.

වරදට සමාව දෙන මෙන් ඇය බැගෑපත්ව ඉල්ලා සිටියා ය. ප්‍රශ්න තිබූ බව ඇත්ත. අපි එකිනෙකා දොඩමළුවීමෙන් කොතරම් සතුටක් ලැබුවා ද?

''කෙල්ලේ දැන් උඹේ ප්‍රශ්න ඉවරයි නේද?''

''නාඩා හිටපං. උඹ එච්චර අවාසනාවන්ත නෑ.''

''එයාට ගෙදරින් ප්‍රොපෝසල් එකක් ඇවිදින්. ඒකට හැමදෙනාම කැමතියි.''

''උඹ තරම් ලස්සන නැතිව ඇති.''

"නෑ... නෑ... පුදුම ලස්සනක්. හොඳ ඩාන්සර් කෙනෙක්. නැටුම් කණ්ඩායමෙත් ඉන්නවා."

ඇය කම්පාවට පත්වෙමින් කීවා ය.

"දැන් ලෙඩ්ඩු බලන වෙලාව කිට්ටුයිනෙ. උඹ පලයං, අපි බලාගන්නම්."

"අනේ කෙල්ලේ මම යන්නම්. මෙලහට මම එනකල් බලන් ඇති."

"හොඳ හැන්ඩ්සම් කොල්ලෙක් කියලා ආරංචියි. ඇත්තද?"

ඇය හිසවනා එය අනුමත කළේ සිනාමුසු මුහුණින් යුතුව ය.

මේ වගේ සතුටක් කිසිදාක සිතට පිවිස නැත. ගැහැනියෙක් ලෙස සතුටට පත් වූ වැදගත් අවස්ථා රැසක් ඇත. ආදරය බොළඳ ලෙස සලකා ඉවත දැමූ හැටි සිහිවෙයි. ඒත් ඒ වාසනාවන්ත ආදරය තමා සොයා ගත් හැටි.

සාප්පු සංකීර්ණයට ගොස් ඔහු ප්‍රිය කරන රසකැවිලි මිලට ගත්තා ය. වාට්ටුවේ සේවය කරන හෙදියන් ද දැන් ඇයගේ මිතුරියන් ය. යන විට ඔවුනට ද රසකැවිලි ගෙනියන්නෙ ඕනෑම වේලාවක ඇයට වාට්ටුවට පිවිසීමට අවසර ඇති හෙයිනි. දැන් අපේ ප්‍රශ්න නැත. ගෙදරට දන්වා යළි ඔහුට නිවසට එන මෙන් ආරාධනා කළ යුතුය. කතා කළ යුතු දෑ සිහි කරමින් වාට්ටුවට පිවිසෙත් ම දුටු දසුනින් ඇය තිගැස්සී සිටියා ය.

"දෙවියනේ... මේ කවුද මේ ඉන්නේ... දැකලා පුරුදුයි."

"මේ අර මනමාලි නේද?"

දෙපා පණ නැතිව ගියාක් මෙන් දැනී ඇය යකඩ වැඩ අල්වා ගත්තා ය.



# 31

ඉසුරි බෝඩිමට එනවිට ප්‍රමාද වී තිබුණි. වලනී තවම පැමිණ නැත. සමහරවිට ඇය ගමේ බලන්ට රෝහලට ගියා වෙන්ට පුළුවන. තවම කාමරේ විදුලි පහන දල්වා නැත. මෙකි කොහේ ගියා ද? කොල්ලා එක්ක කොහේවත් ගියාවත් ද?

ඇය දොර තල්ලු කර විදුලි පහන දල්වූවා ය. මුණින්තලාව කොට්ටයේ මුහුණ හොවා සිටින තැනැත්තිය දුටු සැණින් ඇය යමක් සිතා ගත්තා ය. තවම පොඩි කෙල්ලෙක් වගේ. ඕනෑ දේටයි එපා දේටයි අඬනවා.

"මොකද මේ...?"

ඉසුරි ඇඳුම් නොගලවාම වලනීගේ ඇඳේ පසෙක ඉඳගනිමින් ඇසුවා ය.

"අඬනවා නේද? මොකද උඹට වෙලා තියෙන්නෙ...?"

"ප්ලීස් ලිව් මී එලෝන්. මට මගේ පාඩුවේ ඉන්න ඉඩ දීපං. මට අඬන්ට ඕනෑ."

"තමුන්ගේ අතට ලැබුණ දේ කවම දමා ගන්නෙ නෑ. දැන් ඉතින් අඬපං. මොකද වුණේ...?"

ඉසුරි උරහිස් සොලවමින් ඇසුවා ය.

ඇය කඳුළු පිසමින් ඇඳේ ඉඳගත්තා ය.

''අඬන්ට එපා. මොකද වුණේ කියපං. උඹ ගමේෂ් එක්ක රණ්ඩු වුණා ද?''

''ම්හු..''

ඇය හිස වැනුවා ය.

''ටිකට් කපාගෙන ගිහින් නම් පස්සෙ හම්බ වෙන්න පුළුවනිනෙ කෙල්ලෙ. අපි ගිහින් හම්බ වෙමු. යන්න මාත් එන්නම්. ගිය දේ ගැන දුන් කතා කරන්න එපා. මේකට අපි මොනවා හරි කරන්ට බලමු.''

''ඒ කිසි දෙයක් හරියන්නෙ නෑ. ගමේෂ්ව බලන්න මනමාලි ඇවිදින්.''

''මොනවා අර කිව්ව ඩාන්සින් ටීචර් ද?''

''එයා තමයි.''

ඈ බිඳුණු හඬින් කීවා ය.

''කරන්ට දෙයක් නෑ කෙල්ලෙ. මේක මගේ ලැබීම. වෙච්ච දෙයක් වුණාවෙ. මම තාත්තා එක්ක ගමට යනවා.''

''මම කියන්නද පැහැදිලිව මා තේරුම් ගත්ත දෙයක් තියෙනවා. ගමේෂ් උඹට කැමතියි.''

''කැමතියි.''

''කැමති නම් මොටද වෙනත් කෙල්ලො එක්ක කතා කරන්නෙ. හා මොටද එල්ලි එල්ලී කතා කරන්නෙ...?''

ඈ හැඬුම්මුසුව කීවා ය.



ඉසුරි ඉවතට හැරී සිනාව පාලනය කර ගත්තා ය.

''ඒක තමා සැබෑ ආදරය. ඒ තුළ ආත්මාර්ථකාමී බවකුත් තියෙනවා. උඹෙත් අහංකාරකම වැඩියි. ඒක සැරේකුත් අනා ගත්තා. ඉවසීමෙන් වැඩ කරපන්. අපි කොහොම හරි දිනනවා.''

''ඒකත් ප්‍රොපෝසල් එකක්. මට වඩා ප්‍රසිද්ධයි. ජනප්‍රියයි. ලොකු ඩවරියකුත් දෙයි. ඔක්කොටම වඩා ලස්සනයි. අපිට වාගෙ නෙමේ ලස්සන ස්ලිම් බොඩියක් තියෙනවා.''

''ඉතින් නාඩා හිටපන්. අපි මොනවා හරි කරමු. උඹ තාත්තා එක්ක ගාලු යනවද?''

ඇය හිසවනා එය අනුමත කළා ය.

''මට උණ ද බලපන්.''

ඉසුරි සිනාසෙමින් මිතුරියගේ නළලට, ළයට අත තබා බැලුවා ය.

''ඔක්කොටම මූල හිත. කිසි අමාරුවක් නෑ. ගාලු ගිහින් වරෙන්. මම අසංකට කතා කරන්නම්.''

චලනි තාත්තා සමඟ ගාලු ගියේ අසනීප ගතියෙන් පසු වූ බැවිනි. සිතට මොනවා හෝ දෙයක් සිදුව ඇතැයි සිතේ. ඇඳට ගියත් නින්ද යන්නේ නැත. කොළඹ ගොස් ආවට පසු තාත්තා සිටින්නේ සතුටින් යුතුවය. ඔහුගේ ලෙඩ ගතිය පහව ගොස් ඇත.

රංජිත් බාප්පා පැමිණ සිටියත් ඔහු හා කතා කිරීමට ඈ කැමති වූයේ නැත.

''කොහොමද අයියේ... අලුත් බේතට ගුණ ද?''

රංජිත් ඇසුවේ ය.

''කොළඹ නොගියා නම් මම අකාලෙ මැරෙනවා.''

"අපි කාටවත් වරදක් කරන්නෙ නැති හින්දා හොඳට ගියා. මල්ලියෙ මේ දරුවට මොකද කරන්නෙ...?"

"අනේ මට තේරෙන්නෙ නෑ. අපිත් ඉක්මන් වුණා වැඩියි."

"මටත් හිතෙනවා."

"අක්කෙ මාත් මේ මී හරකෙක් වගේ ඉවක් බවක් නැතිව වැඩ කරන මිනිහෙක්."

ඔහු වරද පමුණුවා ගනිමින් කීවේ ය.

බාල මහත්තයා ඔනෑකමින් යුතුව රංජිත් දෙස බැලුවේ ය. ඔහු දැන් සතියක දෙකක සිට වෙනස් ය. මේ වෙනසට හේතුව කුමක් ද? කොළඹ දී පොලිසියෙන් නැලුවාවත් ද? එය විමසිය යුතු නැත.

"මල්ලියේ දුව කාමරෙන් එළියට එන්නෙත් නෑ. රස්සාවටත් යන්ට බැහැයි කියනවා."

"අපි දුවට ආයෙත් මඟුලක් කතා කරමු."

"අක්කාට මම මේක කියන්ටයි හිටියෙ. මම ආයෙ පිරිස් කපුවට එන්ට කියන්නද?"

"අනේ මල්ලියේ මඟුලක් කතා කරන්ට ඕනෑ තමා. ඒත් ආයෙ පිරිස් කපුවා නම් මේ පැත්ත පළාතෙ එන එකක් නෑ. මල්ලිනෙ එලවා ගත්තෙ."

"මම ඒක බලාගන්නම්කො."

"කෙල්ල කැමති වෙයි ද දන්නෙ නෑ."

"හැමදාම ගෙදර තියා ගන්ටද? හොඳ වයසෙදි මේවා ඉවරයක් කරල දෙන්ට ඕනෑ."



බාල මහත්තයා මේ කතාවට හොඳින් සවන් දුන්නේ ය.

"මල්ලියෙ මට දූන් කපුවා හම්බ වෙන්න යන්ට බෑ."

"හරි... හරි... අයියා මේ ගැන කරදර වෙන්ට එපා. මම ඒක බලා ගන්නම්."

බාප්පා කෙරෙහි හටගත් අමනාපය සිතින් පහව නැත. තාත්තාගේ සහෝදරයා නිසා ඕනෑම වරදක් කළත් සමාව දීමේ සිරිත තිබුණි. මෙවන් පහත් පෙළේ මනුෂ්‍යයෙක් කිසිදා දැක නැත. නැඹිරාවේ සඳහන් රූප රාමුව මේ දැන් පෙනෙන්නාක් වැනි ය. තුට්ටු දෙකේ මිනිහෙක් නොවේ, උසස් අධ්‍යාපනය ලද ආයතන කළමනාකරුවෙකි. පෙරළාගෙන පහර දෙද්දී ඇස් තුවාල වූ හැටි. බාප්පා නිසා තාත්තා වුණත් නරක නම් ඕනෑම නෑ.

බාප්පා ගිය පසු චලනි කාමරයෙන් පිටතට ආවා ය. ඔහු කතා කළේ කුමක් දැයි ඇයට තේරුම් ගැනීමට පුළුවන.

"අම්මා, මොකටද බාප්පා ආවෙ...?"

"මොන දේ කළත් පවුලට ලැදියි. තමුන්ගෙ බාප්පනෙ දුව."

"ඔවගෙ බාප්පල නම් පොල්පිත්තෙන් වුණත් හදාගන්න පුළුවන්. චික්... මට ලැජ්ජයි බාප්පා කියන්න."

"සිද්ධ වෙච්ච දේ වරද එක්කෙනෙක් පිටම දමන්ට බෑ."

"හා... මොනවද ඔය බාප්පා රහසින් කිව්වෙ..?"

"දුවට ආයෙ මංගල්‍යයක් කතා කරන්ට ඕනෑලු. ඔක්කොම එයා කතා කරනවලු."

"හඩු, පොලු, බෝම්බ, පිස්තෝල, අත්බෝම්බ තියෙන පවුලක IRC කාරයෙක් කතා කරයි. එයාට ඉන්නෙ දාකෙළ අයනෙ."

"එහෙම කියන්ට එපා. මල්ලිත් ගියේ මහින්දෙට. එයාටත් හොඳ මිනිස්සු ඉන්නවා."

"එයා කතර කරන මඟුල් කරනවාට වඩා හොඳා ගෙදර නාකිවෙවී ඉන්න එක. මටත් හැමදාම හිරගෙදර යන්ට වෙයි."

කර්යාලයෙන් ආවෙ ගතේ තෙහෙට්ටුවෙන් යුතුව ය. ලාංකිකාටත් මේ වසංගත උණය වැලඳී තිබුණි. අත් පා තලා පෙලා දමා ඇතිවාක් මෙනි. විජේවර්ධන මාවත දෙසින් ආරම්භ වන පඩිපෙළ උඩමලුව දක්වාම විහිද යයි.

හැන්ඩ්ෆෝනය නාද වෙයි. ඒක මළවදයක්. අසනීපයකටවත් ගෙදර සිටින්නට පුළුවන්කමක් නැත. කාලිංග පවසන්නේ වැළඳී ඇත්තේ චිකන් ගුන්යා බවයි. පරිසරය නිහඬ ය. සයුර සිප හැමූ සිසිල් සුළඟ නිවෙස තුළට පිවිසෙයි. ඩීසල් බලවේග කට්ටලයක් ගාල්ල දෙසට ඇදී යන හඬ ඇසෙයි. සිත තනිවන හැම මොහොතකම එක් අයෙක් සිත තුළට පිවිසීමට වෙර දරනු දැනේ.

"කවුද?"

කටහඬ හඳුනා ගත් මුත් නොදන්නාක් මෙන් ඇසුවා ය.

"මට ඇස් දෙක දෙනවයි කිව්වෙ ඇත්තටම ද?"

ඒ සතුට ඇයට දරාගැනීමට නොහැකි වුණි. පිළිතුරක් දීගත නොහැකිව මඳ වේලාවක් සිටියා ය.

kathapothak.blogspot.com



# 32

හදවතට පිවිසි සතුට වළකිට දරාගත නොහැකි වුණි. ඔහු මෙලෙස තමා සමඟ කතා කරාවි යැයි ඇය කිසි විටෙක සිතුවේ නැත. ඇය හැන්ඩ්ෆෝනය රැගෙන බැල්කනියට ගියා ය.

හමන සුළඟ සිසිල් ය. උද්‍යානයේ නැඟී ගත් මල් ගස්වල සඳඑළිය නැවතී තිබුණි. අද පරිසරයම ලස්සනට සූදානම්ව ඇතැයි ඇයට සිතේ. මම කිව්ව ඒ වචනෙ හිතේ තියාගෙන ඉඳලා.

"මට ඔයාගෙ ඇස් දෙක දෙනවයි කිව්වෙ ඇත්තටම ද?"

"ඔව් සහතික ඇත්ත. මා ඕනෑ තැනක දිව්රන්නම්. මේ ඇස් දෙක මම ඔයාට දෙනවා."

"ඒ වෙනුවෙන් මොකුත් කොන්දේසි එහෙම තියෙනවද?"

"යර්ස් ඔෆ් කෝස්. ඕන්ලි වන් කන්ඩිෂන්. මුළු ජීවිතය පුරාවටම මා ළඟින් ඉන්ට ඕනෑ. මොකද මට පේන්නෙ නැහැනෙ."

"මම ඔයාට ගැළපෙන්නෙ නෑ."

"අනේ ඇයි ඒ..?"

ඇය දුකින් ඇසුවා ය.

''මම එච්චර හොඳ මිනිහෙක් නෙවේ. මම අරක්කු බොන, ගැහැනු ඇසුරු කරන සල්ලාලයෙක්.''

''ඔය කවුරුවත් කියන දේ මා පිළිගන්නෙ නෑ. ඔයා හොඳ කෙනෙක්.''

''මුළු ජීවිත කාලයටම ළඟ ඉන්න නම් හොඳ කෙනෙක් හොයා ගන්න ඕනෑ.''

''කරල තියෙන දඟකාරකම් අපිටත් ආරංචි වෙනවා දන්නවද?''

ඈ සිනාසුණා ය.

''කෙනෙකුට අපහාස කිරීමේ හා පොරොන්දු කඩ කිරීමේ චෝදනාව මත මට ලක්ෂ පනහක වන්දියක් ගෙවන්ට වෙයි. ඒක නොගෙව්වොත් මට හිරගෙදර යන්ට වෙයි.''

''වන්දි ගෙවන්නෙ නෑ. මම හිරේ යනවා.''

යළිත් සිනා හඬ ඇසුණි.

''මට සමාවෙන්න. මේ කිසිදේකට මම වැරදි නෑ.''

''එන ඕනෑ දේකට මම මුහුණ දෙනවා. මේ ඒක නෙමේ බෙහෙත් ගත්තද?''

''බෙහෙත් නම් ගත්තා... ඇඟ රිදෙනවා.''

''එහෙම නම් මම හතර වෙන්නද?''

''අනේ... තව ටිකක් ඉන්න.''

''කොහොමද ඉන්නේ... මේකටත් නඩුවක් දමයි.''



''සමාව ඉල්ලුවනෙ. මේවට මා සම්බන්ධ නෑ කිව්වනෙ. පාඩම් කරනවද කියන්න.''

''පාඩම් කරන්නෙ නෑ, එදා කිව්වනෙ.''

''මම කියන්නද... අපි දෙන්නා ලයිබ්‍රරියට ගිහින් පාඩම් කරමු.''

''මම ඉගෙන ගන්නවද කියලා තව තීරණය කරලා නෑ.''

''ඔයා අපේ බොස්ලටත් වඩා ඉගෙන ගෙන තියෙනවා. අනේ ඔයා කොහොම හරි ඉගෙන ගන්ට ඕනෑ. අපි පබ්ලික් ලයිබ්‍රරියට ගිහින් පාඩම් කරමු.''

''මට ජීවිතේ එපා වෙලා.''

''ජීවිතේ ගැන එහෙම කළකිරෙන්ට එපා. තව වැදගත් දේවල් ඉස්සරහට තියෙනවා.''

''මට ජීවිතේ වැදගත් දේවල් නෑ.''

''වෙඩින් එක අපටත් කියනවද?''

''කාගෙ වෙඩින් එක ද?''

ගෙවේෂ් ඇසුවේ ය.

''අපි දැක්ක මනමාලි, හරි ලස්සනයි. සිමරන් වගේ සුදුයි, හැඩයි.''

''කාගෙ මනමාලි ද?''

''මේ අපිට බොරු කියන්න එන්න එපා දන්නවද? කාටහරි හොඳක් වෙනවා නම් අපිත් කැමතියි. ඩාන්සින් ටීචර් කෙනෙක් නේද?''

ඇය පවසන්නේ කුමක්දැයි දැනගත්තත් ඔහු ඒ පිළිබඳව කිසිවක් නැවසුවේ නැත. උපේකාගේ පැමිණීම ඇය දැන ගන්ට ඇත. උපේකා

පසු දිනත් තමා බැලීමට පැමිණි හැටි සිහිවෙයි. ඇයට තමා බැලීම ඒමට අයිතියක් ඇතැයි සිතන්ට ඇත. නංගිගේ මිතුරියක් නිසා එය හිමිකමක් ලෙස සිතන්නට ඇත.

හිතේ මහා හින්දරක් තිබුණ ද එය පැවසීමට පුළුවන්කමක් නොතිබුණි. තමාට අයිති වන්නට තිබූ සම්පතක් අහිමි වෙන්ට යන බවක් දැනේ.

"මම ඔය දෙන්නාට සුබ පතන්නම්."

ඇය හැන්ඩ්ෆෝනය විසන්ධි කළා ය.

ගවේෂ් ෆෝනය සාක්කුවේ දමාගෙන අසංක අසළට ගියේ ය.

අසංක කෑම පාර්සලය අතට ගෙන ඉඳගත්තේ ය.

"කතාව ඉවර කළා ද? කවුද උපේකා ද?"

"උපේකා නෙමෙ... චලනි."

"ඒ වැඬේ දිගට යනවද?"

"මම දන්නෙ නෑ බං."

"මොනවද ඔය කියනවා ඇහුණෙ."

"මට විභාගෙට පාඩම් කරන්ට කියනවා. එයත් පාඩම් කරන්ට එනවා කිව්වා."

"වැඬේ නම් හොඳා. ඒ ගර්ල්ගෙ කතාව ඇත්ත. විභාගෙ ඉවර කරපං. අන්න නංගි කතා කළා."

"මංගල යෝජනාව ගැන වෙන්නැති."

"උඹට දුන් ඒ යෝජනාව අවශ්‍ය නැතෙ."



බත් කටවල් කීපයකට වඩා කෑමට නැත. යළි නිවෙසින් පිටතට බැස්සේ හැන්ඩ්ෆෝනය නාද වුණු බැවිනි.

"නිදි ද?"

"නෑ... තවම නෑ."

උපේකා කීවා ය.

"හෙට මම එනකොට ඔයාටත් එක්ක බත් එකක් බැදගෙන එන්නම්."

"මම ටිකට් කපාගෙන බෝඩිමට ආවා."

"මම නෑ කෙනෙකුගේ ගෙදර ඉන්නෙ. එනකොට දවල්ට කෑම අරන් එන්නම්."

"අපරාදෙ කරදර වෙන්ට එපා."

"නෑ... නෑ.. මට ඔයාව හම්බ වෙන්ට ඕනෑකමක් තියෙනවා."

"මොකද්ද ඕනෑකම කියන්න."

"අපේ කලා මංගල්‍ය ගැන පත්තරේට ආටිකල් එකක් කරගන්න ඕනෑ. ඔයා පත්තරවල මීඩියා ආටිස්ලා දන්නවා කියලා ටෙම්පා කිව්වා."

"ඉන්නවා නම් තමයි. උන් අපි කිව්වට කරන්නෙ නෑ. අපිට වඩා ලිට එවුන් ලොකුයි."

"ඒ වුණාට ඔයා පත්තරකාරයො දන්නවා. ගිය සැරෙත් කරල දුන්නෙ. මම ඔයාටත් එක්ක හෙට කෑමත් අරන් එනවා. ගුඩ් නයිට්."

"ගුඩ් නයිට්."

ගවේෂ් සිනාමුසු මුහුණින් යුතුව අසංක අසළට ගියේ ය.

"දැන් නම් එන පොට හොඳ නෑ. ගැනු කේස් නිසා අංගොඩ දාන්න වෙයි. කවුද කතා කළේ චලනි ද?"

"චලනි නෙමේ උපේකා. මේ නංගි දාන ලෙඩ නේද මචං. කලා මංගල්ලෙ ගැන පත්තරේට දාලා දෙන්නලු."

"අර වරුසප්පෙරුම කියල කෙල්ලක් ඉන්නෙ ඊකිට කියපං. ගාමාට වැඩ වැඩියි. ඌට වෙලා නෑ. මම කියනනද හොඳ වැඩක්. අපි වීවර්ගෙ කවර් පේජ් එකක් කරමු."

"හෙට කෙල්ල උඹටයි මටයි කෑම අරන් එයි. එතකොට පින්තූරයක් ගමමු. පව්නෙ වැඩේ කරල දෙමු. නැත්නම් නංගි අප්සෙට් ගහයි."

අත සෝදාගත් ගමේජ් යළි කෑම පාර්සලය දිග හැරියේ ය.

"දැන් චලනිත් ලව් නේද?"

"මට තේරෙන්නෙ නෑ මොනවා කරන්නද කියලා. හොස්පිට්ල් එකේ නර්ස්ලා කෙල්ලව වට කරගෙන කතා කළා. චලනි උපේකාව දැකලා. අප්සෙට් ගිහින්."

"මේ ප්‍රශ්නෙ දිහා බුද්ධිමත්ව බලන්ට ඕනෑ. මම නම් කියන්නෙ උපේකත් හොඳා. චලනිත් හොඳා."

"එහෙම කිව්වට දෙන්නෙක් බඳින්නෙ කොහොමද?"

"දෙන්නෙක් බඳින්න බෑ... දෙන්නගෙන් එක්කෙනෙක් තෝරා ගනින්."

හිතේ කුතුහලයක් තියෙද්දී එක් කෙනෙක් තෝර ගන්නේ කොහොමද? මගේ හිත නොසන්සුන් වෙලා.



## 33

මඟුල් කපුවෙකුට ජීවිතයේ හොඳක් අසන්නට ලැබෙන්නේ කලාතුරකිනි. ජීවිතයට මුහුණ දීමේ දී පවුල්වල සිදුවන සියලු ප්‍රශ්නවල වැරදිකරුවා වන්නේ මඟුල් කපුවා ය. එසේම පෙම් සබඳතාවයකට උදව් කළ මිතුරන් ද වැරදිකරුවෝ වෙති.

පීරිස් කපුවා හැම කටයුත්තක්ම කළේ නීත්‍යානුකූලව ය. මනමාලයා ලබන දායාදයෙන් සියයට ගණනක් ඔහුට හිමි ය. මෙසේ නොවන අවස්ථාවල ඔහු නීතියේ පිහිට පැතූ අවස්ථා ද එමට ය.

මෑතක කළ මංගල යෝජනාවලින් එක සතක ආදායමක් නොලැබූ යෝජනාව වන්නේ බාල මහත්තයාගේ දුවට කතා කළ මංගල්ලයයි. බාල මහත්තයා හොඳ මිනිහෙකි. වැල්ලේ මාළු ලැල්ලේ වැඩ කරන රංජිත් මැරයෙකි. දුවගේ මඟුල අසාර්ථක වීම නිසා හෙතෙම කමාට පහර දීමට සෙවූ බව ආරංචි වුණි.

හදිසියෙන් දිනෙක බාල මහත්තයාගේ සොඳුරා වන මදාවියා නිවෙස දෙසට එනු දකීමෙන් උගුර කට වියළී ගියේ ය.

"හෝමෙන්... ඔය එන්නේ බූස්සේ මිනීමරුවෙක්."

කපුවා නිවෙස තුළට දුව යමින් කීවේ ය.

පීරිස් කපුවාගේ බිරිය නිවෙස දෙසට එන තැනැත්තා දෙස බලා සිටියා ය. කේක් පෙට්ටියක්, හොඳ ඇඹුල් කෙසෙල් ඇවරියක් සහිත තෑගි පාර්සලයක් ගෙන එන තැනැත්තා නරක කෙනෙක් විය නොහැකියි. මේ මනුස්සයා නිකං බය වෙලා.

"කෝ අපේ පීරිස් මහත්තයා නැද්ද?"

ඔහු තෑගි පාර්සලය බිරිය අතට දෙමින් කීවේ ය.

"එමු ඉඳගන්ට. මම ගිහින් කතා කරන්නම්."

කපු නැනගේ බිරිය නිවෙස තුළට යද්දී ඔහු දොරමුල්ලේ සැඟව සිටියේ ය.

"මේ ගිහින් කතා කරනවා. නරක මිනිහෙක් නම් මෙච්චර තෑගි අරන් එනවද?"

"හොඳට බලනවා බෝම්බ ද කියලා. ඒ තරම් එස මිනිහෙක්. ඕකා එදා මගෙ යටි බඩ මිරිකුවා."

බිරියගේ කතාව සත්‍යයකි. මෙවැනි තෑගි ලැබෙන්නේ හොඳ විවාහ යෝජනාවකින් පසුව ය. බෝතල් තෑගි ලැබෙන අවස්ථා ද ඇත. ඔහු සෙමින් සාලය දෙසට ගියේ ය.

"රංජිත් මහත්තයා කොහේවත් යන ගමන් ද?"

"කොහේවත් නෙමේ... කෙළින්ම ආවා. මම නෝනට පෙන්නුවෙ නෑ.. ගෑනු කොහොමටත් මේවාට කැමති නැහැනෙ. රට බෝතලයක්. කෑමට කලින් ගමමු."

"අනේ මොකටද ගෙනාවද?"

ඔහු කැදරකමින් බෝතලය දෙස බලමින් කීවේ ය.



ඔවුනතර තරමක හිතඩ බවක් ඇතිවුණි.

"පීරිස් උන්නැහේ අයියා ටිකට් කපා ගෙන එක්කාගෙන ආවා."

"මේකෙ වරද මගේ අතේ."

"මමත් ඉස්සෙල්ලා හිතුවෙ එහෙම තමයි. නමුත් මහමාලිගෙ ඇත්තෙත් වැරදි තියෙනවා. මහමාලයාගෙ තාත්තා ප්‍රාදේශීය සභා උපසභාපතිවරයෙක්. හොඳ වැදගත් මිනිස්සු."

"ඒ ගැන අලුතෙන් කතා කියන්ට ඕනැ නෑ. මම ඔක්කොම දන්නවා. කපු මහත්තයා මම ආවෙ වැදගත් වැඩකට."

"රංජිත් මහත්තයාට හොඳ මඟුලක් කතා කරමු."

කපුවා විස්කි බෝතලය පසෙකින් තබා කීවේ ය.

"මට නෙමේ අපි අර මඟුල ආයෙ කතා කරමු."

"අර මඟුල කිව්වෙ...?"

"පොඩි දුවට කතා කරපු මඟුල ආයෙ කතා කරමු."

"අනේ මහත්තයෝ... ඒක නෙමේ අපි පොඩි නෝනාට වෙන හොඳ කටයුත්තක් කතා කරමු. ඒක අත්හරිමු."

• • • • • • • • • • • • •

මේ ගමනේ යෙදීම සම්බන්ධව අයිතියක් උපේකාට ඇත. මෙය මංගල යෝජනාවක් ලෙස ඉදිරිපත් වූවකි. මහාලයාගේ සොයුරිය ගෙනා මේ යෝජනාවට පවුලේ සැමෝම සතුටුය. ඊටත් වඩා බේබිමා එකම ගුරු මණ්ඩලයක සේවය කරන මිතුරියකි.

ඉකුත් යුගයේ නිවෙසින් යෝජනා රැසක් ඉදිරිපත් වුණි. ඒවා දායාදය වැනි වෙනත් හේතු මත ඉදිරිපත් වූ ඒවා ය.

පිරිමියා යනු ගැහැනු ජීවිතයකට අවශ්‍යම පෞරුෂයකි. කුමන තනතුර දැරුවත්, ධනයෙන් බලයෙන් අගනැන්පත්ව සිටියත්, කුමන ජනප්‍රියතාවයක පසු වුණත් ගැහැනියකගේ ජීවිතය උපදින්නේ පිරිමියෙක් ඉදිරියේ දී පමණි.

ගැහැනු උපදින්නේ පෙර භාවයන්හි පතාගත් පරිදි දුක සැප විඳීමට ය. තමා වෙනුවෙන් වෙහෙස වූ ආදරය දිනා ගැනීමට වෙර දූරු විවිධ තානාන්තරවල පිරිමින් උපේක්ෂාට හමුව ඇත. විදේශ ගමන්වල යෙදුණු අවස්ථාවල ඒ රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගෙන් ද ඇරයුම් ලැබී ඇත. තමා අයිති සැබෑවින් උගත් බුද්ධිමත් පිරිමියෙකුට ය.

සැබවින්ම ඔහු වීරෝදාර හමුදා භටයෙක් මෙනි. අද අපි දකුණට වී සියලු සැප සම්පත් විඳින්නේ, බියෙන් තොරව ඇවිදින්නේ අපේ වීරෝදාර හමුදාවන් නිසා ය.

ඒ සඳහා කැප කිරීමක් අවශ්‍ය වේ. මනමාලියෙක් බැලීමට යාම වැනි ජීවිතයේ වැදගත් ගමනක් නතර කර ලෙඩෙකුට ලේ දීමට යාම වැනි කටයුත්තක් කිරීමට හැමටම බැරි ය. පැහැදිලිව මෙය උතුම් කටයුත්තකි.

අද නිබඳව හමුවන්නේ කිසිම ගැඹුරක් නැති බොරු ආටෝපයෙන් පුතු පිරිමින් ය. අනාදිමත් කාලයක සිට සෞන්දර්ය කලාවේ නිපුණ බව ගුරු පරම්පරා ඔස්සේ පැවැත එයි. එහි නිපුණ බව විනිශ්චය කළ යුත්තේ ශ්‍රාවකයන් නොවේ. අද කලාකරුවන් SMS මගින් තේරීමට තරම් කලාව බාල්දු වී ඇත. ගවේෂ් එවත් තුට්ටු දෙකේ පිරිමියෙක් නොවන බව ඇයට තේරී හමාරය.

මේ යන්නේ විද්‍යාලයේ උත්සවය සම්බන්ධ ප්‍රචාරයක් ලබා ගැනීමට පමණක් නොවේ.



අසංක සයිකලය පණ ගන්වන හඬින් බියට පත් ගවේෂ් ඉදිරියට ගියේ ය.

"කොහේද යන්නේ...? දූන් අර කට්ටිය එයි."

"මම ඉන්න එකේ තේරුමක් නැහැ සහා. කොල්ල එන්නේ උඹව බලන්නයි."

"කැත වැඩ කරන්න එපා. උඹ ඊයේ කිව්වා නේද කෙල්ලගෙ නවරයක් කරමු කියලා."

"කපල් ෂොට් එකක් දාමු."

"මේක ගමේලාගේ වගේ කාන්තා පත්‍රයක් නෙමේ. විද්‍යාලයේ කලා උළෙලක්."

"මම ෆිල්ම් රෝල් එකකුයි, කන්ට දේකුයි අරන් එන්නම්. එතකල් උඹ ලාවට කැමති දෙයක් කර ගනින්."

ඔහු උරසලා සිනාසුණේ ය.

"කිස් එකක් දුන්නොත් නංගිට කියයි කියලා හිතුවද? ඕව ගැහැනුන් එක්ක නොමැරෙන සදාකාලික රහස්. කොහේ ඇල්ලුවත් ගෙදර ගිහින් කියන්නෙ නෑ. ඉල්ලන දෙයක් දීපං."

"යන තැනක ගිහින් ඉක්මනට වරෙන්."

"සෙනෙවියා එයි. වෙලාවට පොඩ්ඩක් ගත්තත් එපා යැ හැබැයි මගේ ඇඳ හයිය නෑ."

"උඹ මහ වල් බල්ලෙක්."

මිතුරා යතුරු පැදියේ නැගී යන අයුරු ඔහු බලා සිටියේ ය. මඳ වේලාවකට පසු ත්‍රීවිලරයක් බෝඩිම දෙසට එනු ගවේෂ් දුටුවේ ය. පැහැදිලිව මෙය නව අත්දැකීමකි.

අසංකට නම් පෙම්වතියන් ඇසුරු කිරීමේ අත්දැකීම ඇත. ඔහුගේ කාවය තුළට පිවිසෙන සම්භාව්‍ය මට්ටමේ කලා නිර්මාණඔහු දැක ඇත. ලෝකයේ ඇති විශිෂ්ටතම කලා නිර්මාණය වන ගැහැනියගේ රුව දැකීමට කවුරුත් කැමතිය.

නූල්පටක්වත් නැතිව කැමරාව ඉදිරියේ ගැහැනු විවිධ ඉරියව්වල පෙනී සිටිති. ඔවුනුත් අපේම කාන්තා සහෝදරියන් ය. ඇතැමුන් අලෙවි භාණ්ඩ බවට පත්වී ඇත. ගැහැනියකට වැරදීමට ගතවන්නේ සුළු වේලාවකි.

හැමවිටම ජීවිතය පුරාවට අවදානමක් ඇත. අසංක මිතුරෙකු ලෙස සිය භූමිකාව කර ඇත. ඔහු උදෙන්ම පැන ගත්තේ අපට පිසි ලෙස හැසිරීමට ඉඩ තබා විය හැකි ය.

ත්‍රීවිලරය නිවෙස දෙසට එන විට දෙපා පණ නැතිව ගියාක් මෙන් දැනුණි. නංගිගේ මිතුරියක් නිසා අනින් ඇල්ලීමටවත් නොසිතෙයි. නරක වෙලාවේ හැටියට බලහත්කාරකමක් කළ බවට චෝදනා එල්ල වන්ට බැරි නැත.

ෆොටෝ ගැනීමට ඇඳුම මාරු කිරීමට සිදුවනු ඇත. ඔහු කාමරයට ගොස් ඇඳ අසළ වූ කණ්ණාඩියෙන් කොණ්ඩය අතින් සාදා ගත්තේ ය. හැඳ සිටි ස්කිනියකට සුවඳ පැන් පොදක් ගසා ගත්තේ ය.

කෙසේ වුවත් උපේක්ෂාව උදව් නොකර බැරි ය. කාමරය පිරී තිබුණේ ගැහැනුන්ගේ ඉස්සරහ පස්ස මනාව පෙනෙන කලාත්මක නිර්මාණවලිනි. විදුලි සීනුව නාද වූ පසු හදවත ඔත්පල වෙනවාක් මෙන් දැනුණි. මේ ගමනේ දී අනිවාර්යයෙන්ම ඇය සිපගත යුතුය.

සැලෙන හදවතින් යුතුව ඔහු දොර විවෘත කළේ ය.



# 34

ගේට් දොර විවෘත කරගෙන එළියට ආවේ දහසක් පැතුම් දරාගෙන ය. ඔහුගේ නෙත යොමු වුණේ ත්‍රීවිලරයෙන් බැස එන මජං ඇඳුමකින් සැරසුණු අය වෙත ය.

"සර්... වොක්ස් වැගන් එකක් විකුණන්න තියෙනවා කිව්වෙ මොකද?"

"අයියෙ මෙහෙ ඇති වාහනයක් නෑ."

"46/9 තියෙන්නෙ මෙතන නේද?"

"මේක 46/6, 46/9 තව එහා ගිහින් බලන්න."

ත්‍රීවිලරය ගිය පසු සිතේ වූ බලාපොරොත්තු බිඳ වැටී ගියේය.

කාමරයට ගොස් මොහොතකට ඇඳේ වැතිර දෑස් පියා ගත්තේ ය. මෙම අංක දෙක නිසා සෑහෙන කරදරයකට මුහුණ දීමට සිදුව ඇත. 46/9 වොක්ස් වැගන් වාහන සඳහා ප්‍රසිද්ධ ගරාජයකි. නිතරම මිනිසුන් යෙනෙන නිසා මෙය කරදරයකි. යළි කිසිවෙක් දොරට තට්ටු කරනවා ඇසුණි. මෝටර් සයිකලයේ ශබ්දය ඇසීමෙන් පසු ආවේ කවරෙක්දැයි ඔහු දනී.

''දොර වහලා නෑ.''

කෑම ගෙනැල්ල ද දන්නෙ නෑ.

ඔහු ඇඳෙන් බැස දොර විවෘත කළේ අමනාපයෙනි.

දෙවියනේ... මේ කවුද? අවුරුදු දහහතරක පමණ යුවතියක් සමඟ සිනාමුසු මුහුණින් මිදුලේ රැඳී සිටි උපේකා හඳුනා ගැනීමට ගත වූයේ මොහොතකි.

''අනේ... මම ආපු එක කරදරයක් වුණා ද? නිදාගෙන ද හිටියේ..?''

''නිදාගෙන හිටියෙ නෑ. එන්න ඇතුළට.''

ඔහු ඇඟමැලි කඩමින් කීවේ ය.

''මේ අපේ නැන්දාගෙ දුවෙක්. දහම් පාසල් නොගිහින් අද කට් එකක් ගැහුවා.''

ඈ යුවතියගේ හිස පිරිමදිමින් කීවා ය.

ඔවුනු සතුටු සාමීචියේ යෙදුණහ.

''මොනවද බොන්නෙ...? රස්නෙයිනෙ. කූල් එකක් බොමු.''

''මේ...අනේ... ලෙඩ තියාගෙන කරදර වෙන්න එපා. අපි බිලයි ආවෙ.''

''මොන කරදරයක් ද... මම හදන්නම්.''

''කියන දේ අහන්ට.''

ඇය අසුනෙන් නැඟිට ගෙනෙන ලද බාස්කටය මේසය මත තබමින් කීවා ය.

''ඇයි මේ කරදර වුණේ...?''



''මොන කරදරයක්ද?''

ඇය කුඩා කුස්සියට යමින් කීවා ය.

''අපි කුස්සියට ආවට කමක් නැද්ද?''

''වෙල්කම්. දන්නවනෙ තනිකඩ කුස්සිවල හැටි.''

''අපිත් එහෙම තමා. හානේ.. මේ ලස්සනට කුස්සිය තියාගෙන ඉන්නෙ.''

''ඔයා ආවොත් දෙන්න කියල අසංක රසකැවිලි ගෙනැත් තිබ්බා.''

ඔහු මේසය මත වූ බන්දේසිය පාමින් කීවේ ය.

''තැන්ක්යූ වෙරි මච්. ඇයි කරදර වුණේ. ගන්න නංගි.''

උපේකා සොයුරියට බඳුන පාමින් කීවා ය. සිසිල් බීම පානයෙන් පසු ඔවුනු කුඩා සාලයේ අසුන් ගත්හ. සාලයේ වූ පොත් රාක්කය පිරී තිබුණේ ගවේෂ්ගේ පොත්වලිනි. බිත්තියේ හා රූඩවනයන් හි අසංකගේ ඡායාරූප එකතුවක් විය.

''ඔයාගෙ යාළුවා නම් හරිම දක්ෂයෙක්. හොඳ කලාත්මක ඇහැක් තියෙනවා.''

ඇය අඩ තිරුවත් ගැහැනු රූප දෙස බලමින් කීවා ය.

''ඔයාගෙ පින්තූර ටිකක් ගන්ට ඕනෑ කිව්වා. දැන් එයි.''

''අපේ පින්තූර ගන්ට ඕනෑ නෑ. මට මේ කලා උළෙළ ගැන ප්‍රසිද්ධියක් දුන්නොත් ඇති.''

''මම නම් කලාව ගැන මෙලෝ හසරක් දන්නෙ නෑ. අසංක ආවම බලමු.''

අසංක එනවිට තරමක් ප්‍රමාද වී තිබුණි. ඡායාරූප ඇල්බම

පිළිබඳව ඔවුහු කතිකා කර ගත්හ.

"රීල් එකක් දාගෙන ආවා. දෙන්නාගෙ පින්තූරයක් අරන් බලමු ද?"

"අනේ... මචං මාව නෙමේ... මේ ටිචර්ව ගනින්."

"ගන්ට නෙමෙ නිකං මේ වෙස් කරගන්ට හිටපං. උපේක්‍ෂා ෆ්‍රේම් එකට තව කිට්ටු වෙන්ට. හරි හරි ඔය හිනාව හොඳටම ඇති."

උපේක්‍ෂා හා ගවේෂ් පෙනී සිටි රූප රාමුව සිත් ගන්නා සුලු ය. පිට කවරයක් සඳහා පින්තූරයක් ගැනීම සරල කටයුත්තක් නොවේ. නමුත් නොරුක්සාහයෙන්ම හොඳ කෝණයක සිට රූගත කිරීමට හැකි වුණි.

"එහෙම නම් අපි කමු."

අසංක යෝජනා කළේ ය.

"මම බෙදන්නම්."

ඈ වගකීම බාර ගත්තා ය.

"ඔහොම බාස්කට්වල උයාගෙන ඇවිදින් බෙදල හරියන්නෙ නෑ. ගෙදරට ඇවිදින් උයන්ට ඕනෑ."

ඔහුගේ කතාවට ඇගේ මුහුණ ලේ පැහැ ගැන්වුණි. සිතේ ඇත්තේ එවන් අපේක්ෂාවකි. සම්ප්‍රදායික නොවන කියමනක් ආවේ ඒ නිසා ය.

"එහෙනම් ලබන සෙනසුරාදා අපි එනවා. ළමයින්ට ඇඳුම් අන්දලා ගියත් එදාට අපි ටීචර්ගෙ පින්තූර ටිකක් ගමමු. පොඩි මේකප් එකක් දෙන්ට ඕනෑ."

"අනේ මගෙ ඕනෑ නෑ. අනින් අයගේ ගන්ට."



"ලස්සන අය එහෙම තමා. ටිකක් ආඩම්බරයි."

"මේ එන්න එපා දන්නවද? අපි ලස්සන නෑ."

"මගෙ ඇස්වල පෙනුමෙ වරදක් ද දන්නෙ නෑ මට නම් පේන්නෙ ලස්සනවයි."

අසංක මිතුරා දෙස බැලුවේ ය.

"මේවා නංගිට කියන්ට එපා. මටත් පේන්නෙ ලස්සනටයි."

ගවේෂ් කීවේ ය.

"දැන් අප්පච්චිට බෙහෙත් ගන්නෙ තිලම්මහර වෙද මැදුරෙනි. ඉසකුඩිච්චියක් දමා තෙල් සාත්තුව දී ඔවුන් වෙදකම නතර කළහ.

"අනවශ්‍ය විදිහට බෙහෙත් කරන්ට ඕනෑ නෑ. දැන් බෙහෙත් බිව්වා ඇති."

"අනේ රාළහාමි බලාගත්ත අතේ බලාගෙන ඉන්නවා මිසක් අපි එක්කවත් වැඩිපුර කතාවක් නෑ."

"දේශපාලනය කරන කෙනෙකුට මේවා සාමාන්‍ය දේවල්. පුතාගෙ විවාහය නතරවීම ප්‍රබල හේතුවක් වෙලා ද?"

"අයියා ලොකු විභාගෙකට ඉගෙන ගනිමින් හිටියා. මඟුලෙන් පස්සෙ ඔක්කොම ස්ටඩීස් නතර වුණා."

"දැන් අයියා කෝ...?"

"ඒ මනමාලිගෙ පැත්තෙ අය අයියාට ගහලා ඒ බවක් අප්පච්චි එහෙම දන්නෙ නෑ."

"අප්පච්චිගෙ හිතේ මේ මඟුල කරල දෙන්න කැමැත්තක් තිබුණද?"

"ඔව් දෙන්නම ගුරු වෘත්තියෙ සෙදිලා හිටපු නිසා කැමැත්තෙන් හිටියා. දෙන්නම විදුහල්පතිවරු."

"සමහරවිට ඒ මංගල්ලය කළොත් අප්පච්චිට සනීප වෙන්ට පුළුවන්."

"අපි දූන් අයියට වෙන මංගල යෝජනාවක් ගේන්ටයි යන්නෙ."

"මංගල කටයුතුවල දි අපි නොහිතන ප්‍රශ්න ඇතිවෙනවා. අප්පච්චි සන්තෝෂ වෙන්ට නම් ඒ පරණ යෝජනාව ගෙනාවොත් නරක ද?"

වෛද්‍යවරයා අමුතු යෝජනාවක් ගෙනාවේ ය. රෝගියා ඉදිරියේ සෙනෙවි මේ කිසිවක් කතා කළේ නැත.

කිසිම ආකාරයකින් පරණ යෝජනාව අලුත් කළ නොහැකිය. අප්පච්චිගේ සිත සන්තෝසයෙන් තැබීම යුතුකම වුණත් පරණ යෝජනාව ගැන කතා කිරීමට පුළුවන්කමක් නැත.

එන ගමන් බෙල්ලන්විල රජමහා විහාරයට ගිය ඔවුහු අප්පච්චිට කැමති තරම් වේලාවක් විවේක ගන්ට ඉඩ සැලසූහ.

"තෙමා, වෙද මහත්තයා මාර කතාවක්නෙ කිව්වෙ...?"

"ඒක තමා මාත් මේ කල්පනා කළුල්. අපිට පුළුවන් ද ආයෙ ප්‍රොපෝසල් එක ගේන්න."

"ඔව් ඒක තමා. උපේකා දූන් අයියට පිස්සු වැටිලා වගේ ඉන්නෙ."

"ඔව්. අපිට ආයෙ ගාලු ගිහින් ඕවා කරන්ට පුළුවන් ද? මේ කෙල්ලට පිස්සු හැදෙයි."

අප්පච්චිව නිවසට ඇරලූ සෙනරත් දිවා ආහාරය ගෙන ටික වේලාවක් ඇඳට වී සිටියේ ය. තෙමා කතා කළේ නින්දයාමෙන එද්දී ය.



"සෙනෙත්... හරි වැඩක්නෙ. බඩුවක් පෙන්වන්න නැගිටින්න."

"මට එන්ට බෑ. මොකද්ද කියන්න. මට නිදිමතයි."

"පීරිස් කපුවා ඇවිදින්. ඔයාට අප්පච්චිට කතා කරනවා."

ඔහු දෑස් අයා බිරිය දෙස බැලුවේ ය. නැවත නොඑන බව දන්වා පිටව ගිය කපුවා මෙහි ආවේ කිම ද?

මාමණ්ඩියා කතා කරන නිසා ඔහු සාලයට ගියේ ය.

"මේ අපේ පීරිස් කපු මහත්තයා ඇවිදින්."

"අපේ ගාල්ලෙ බාලමහත්තයාව මැරෙන්ට වැටුණා. මේ කොළඹ ඉඳලා ඇවිදින් මහත්තයාට කොහොමද බලන්න එව්වා."

"අපි දෙන්නා ගුරු විද්‍යාලෙ හිටියෙ එකට. අපි හොඳ මිත්‍රයො."

"ඔබතුමා අසනීපයි කියලා ආරංචි වෙලා ලෙඩ බලන්ට එන්ට හදනවා."

පීරිස් කපු මහතා කිසිවක් පැවසීමට පෙරදැරනු සෙනෙවි වුවේ ය.

"මහත්තයො මම ආවෙ වැදගත් කාරණයක් කියන්ටයි."

කපු මහතා ඕනෑකමින් කීවේ ය.

## 35

සෙනෙවි පිරිස් කපුවා කැඳවාගෙන එළියට ගියේ ය. වත්ත ලස්සනට තිබුණේ අප්පච්චී සුවෙන් පසු වූ දිනවල ය. ගෙදරට අවශ්‍ය එළවළු ඔහු වත්තේ වගා කළේ ය. හිමිදිරි උදෙන්ම නැගිට වත්තේ වැඩ කිරීම සිරිත ය. ප්‍රාදේශීය සභාවේ වැඩට ගොස් නැවත දවල් කෑමට එයි.

වෙනත් රාජකාරි කටයුත්තක් නොතිබුණොත් හැන්දෑවට වත්තේ වැඩ කරයි. හෙතෙම හොඳ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කළේ ය.

මේ මංගල යෝජනාව නිසා ඇති වූ සිත් බිඳුම ඔහුට දරිය නොහැකි විණි. මේ හැමදෙයක්ම කපු මහත්තයා දනියි.

"මහත්තයෝ.. මම මේ පුරුදු වෙන්ට මඟුල් කපුකම් කරනවා නෙවේ. මා දනුවත්වම මේ යෝජනාවේ ඔය කියන කිසි වරදක් තිබුණේ නෑ."

"දැන් ඒ ගිය දේවල් ගියා. පිරිස් මහත්තයා ආවේ ඇයි..?"

"මනමාලිගෙ පැත්තෙන් මේ යෝජනාව ආයෙ ගේනට සූදානම් වෙනවා."



"මොනවා... ආයෙත් මඟුල කතා කරන්න. කපු මහත්තයා දන්නවද ඔය හිච්චි මහත්තයා කරලා තියෙන වැඩේ. තාම අප්පච්චි දන්නෙ නෑ. අප්පච්චි අයියට ආදරෙයි."

"මම දන්නවා මහත්තයො දන්නවා."

"දන්නවා නම් ඒ යෝජනාව ගෙනාවෙ අහවල් සද්දට ද? ලේ දෙන්ට ගිය වෙලේ ගහපු හැටි ඔක්කොම වීඩියෝ කරලා තියෙන්නෙ. අපේ මෝඩයා රණ්ඩුවලට පැටලෙන්ට කැමති නෑ. ඉඹ නම් මහ උළු ගෙදර අරිනවා. නැතිනම් අතක් පයක් කඩනවා."

"මනුස්සයන් ජීවිතයේ අනන්ත වැරදි කරනවා. ඒවා තේරුම් අරන් හොඳ මිනිස්සු වෙනවා."

"කපු මහත්තයව මේ ගමන එව්වේ කවුද?"

"මහත්තයො මාව මේ ගමන එව්වෙ හිච්චි මහත්තයාම තමයි."

"මෙච්චර විනාශයක් කරපු මිනිහා ගමේශ්ගෙන් පළිගන්ට හදනවද දන්නෙ නෑ. මේක ඒ වගේ කුමන්ත්‍රණයක්."

"මහත්තයෝ යමක් වෙන්ට තියෙනවා නම් අපිට ඒක වළක්වන්න බෑ. අපි පිළිගත්තත් නැතත් දෛවය කියල දෙයක් ලෝකෙ තියෙනවා. ඒකට කාටවත් පිටුපාන්ට බෑ."

"හා.. දැන් ඉතින් මට මොකද කියන්නෙ..?"

"ආයෙත් දවසක ගාල්ලෙ එන්න කියලා ආරාධනා කරන්ටයි ආවෙ."

"ගාල්ලෙ යන්ට. මේක නම් කුමන්ත්‍රණයක්. අපිට කිරිහැර කරන්ටයි ඉන්නෙ. අපින් ගැන්සියක් ගේන්නම්."

"නෑ නෑ බාප්පා තමයි ආරාධනා කරන්නෙ. මහත්තයා අපි මේ ගමන යමු."

ගවේෂ් සිටියේ සතුටින් යුතුවය. වෙනදා නැති උනන්දුවක් සිතේ ඇත.

"කේන්තියෙන් මෝඩ වැඩ කළ බව ඇත්ත. චලනි තරම් වෙන කවුරුවත් මගේ හිතට පිවිසිලා නෑ."

"මොනවද මේ කතා කරන්නෙ... උඹ ද?"

"පොඩ්ඩක් වරදින්න බෑ. අඬනවා. බලපං හිනාවෙ ලස්සන."

"ඔන්න දූනුයි ආදරේ ඇඟට දනිලා තියෙන්නෙ. අර කෙල්ල උඹට පිස්සු වැටිලයි ඉන්නෙ."

"මම මොනවා කරන්නද?"

"උඹට බඩුවක් පෙන්වන්නද?"

ඔහු ලැමිනේටින් ෆයිල් කවරයේ වූ යුගල ඡායාරූපය පෙන්වූයේ ය.

"මම මේක ගාමාගෙ පත්තරේට දෙන්ට හදන කොට අපේ ලොක්කා අපේ එකට ගත්තා. බලපං ඉල්ලලා අඹගන්ට හිතෙනවා නේද?"

"උඹ මේක පත්තරේට දුන්නද?"

"ඔව්. උඹල පෙම් කරනවා වගේම අපිත් ගාණක් හොයා ගන්ට ඕනෑ. කාන්තා පත්‍රයකටත් දුන්නා. ඇයි මචං නියමයිනෙ. උඹල දෙන්න නියම කපල් එක."

"නිකං ෆොටෝ එකක් ගන්නයි කියලා මම හිතුවෙ. ඒත් ඒක පත්තරේකට දෙයි කියලා මම හිතුවෙ නෑ."

"මේවා සෞන්දර්ය විෂයට අයිති ඒවා. පත්‍ර දෙකක යනවා තියන්නේ ලේසි වැඩක් නෙවේ."

● ● ● ● ● ● ● ● ● ● ● ● ●



චලනි එදිනත් රැකියාවට ගියේ නැත. කිසිවක් කිරීමට සිතේ සතුටක් නැත. දෙවියනේ මට මොනවා හරි වෙලා. මගේ ජීවිතය කවුරු හරි උදුරා ගන්න හදනවා. නේවාසිකාගාරයේ උදය කලබලකාරිය. නාන කාමරවල සිට කෑගසන, තුවා හැඳ ඒ මේ අත දුවන, ඇඳුම් අඳින, හැඩ වැඩවන, දුරකථනවලට සවන් දෙන පිරිස අතර චලනි නැත.

ඉසුරි අමනාපයට පත්ව සිටියේ වෙලාවට කෑම පාර්සලය සූදානම් නොකිරීම ගැනය.

"නංගේ.. යන්නෙ නැද්ද?"

ඉසුරි චලනි ළඟට එමින් ඇසුවා ය.

"මොකද මේ උඹට වෙලා තියෙන්නෙ...?"

කඳුළු පිසමින් සිටියා විනා කිසිත් පැවසුවේ නැත.

"දැන් දෙන්නා කතා කරගත්තා නේද? නාඬා හිටපං... නාඬා හිටපං..."

"මම නාඬා ඉන්නෙ කොහොමද?"

"හොස්පිටල් එකේදි කෑමත් කැව්වා කිව්වා නේද?"

"අනේ කෙල්ලෙ මට තේරෙන්නෙ නැති දෙයක් සිද්ධ වෙනවා. මට වෙලා තියෙන්නෙ අඬ අඬා ඉන්නයි."

"මගෙ වෑන් එක ඇවිදින් හෝන් කරනවා. මම යනවා. ඇවිදින් කතා කරමු."

"අනේ කෙල්ලෙ හාෆ්ඩේ එකක් දාලා වරෙන්. නැතිනම් මම කොහේ හරි යනවා."

"මේ පිස්සු නොකර ඉඳින්. අපි ඇවිදින් මොනවා හරි කරන්ට බලමු."

මිතුරිය ගිය පසු වලනි මුහුණ සෝදා ඇඳුම් මාරු කරගත්තා ය. කෑම අයින් කිරීමට පෙර සීලවතී ඇගේ කෑම පංගුව කාමරයට ගෙනාවා ය.

"සීලා මට කන්ට බෑ වාගෙ. ඔයා මේ පිටි එක අරන් ගිහින් මට උණුවෙන් තේ එකක් හදලා දෙනවද?"

"හොඳයි නෝනා. මුකුත් ගේන්න ඕනෑ නම් කියන්න. මම ෆාමසියට යනවා."

නැවත වරක් නිවසේ මහා කලබැගෑනියක් ඇරඹීමට ආසන්න ය. බාප්පා නැවත වරක් මංගල යෝජනාවක් ගෙනෙන්නට යන බව ආරංචි වුණේ අම්මා ගෙනි. මුළු පවුලම විනාශ වූයේ බාප්පා නිසා ය. ඔහු වැඩකට මැදි වුණොත් විනාශයක් ළඟා වනු වළක්වනු බැරි ය.

ගවේෂ් තම හදවතට පිවිස හමාරය. ඔහු නොලැබුණොත් කුමක් වේදැයි පැවසිය නොහැකි තරම් ය. කියන්ට බැරි තරම් මම ගවේෂ්ට ආදරෙයි. මේ කොහේද යන කෙල්ලෙක් ආවානෙ. එයාටවත් දොස් කියන්න බෑ. අතට ලැබුණ සම්පත අත හරින්නෙ කවුද? මා නිකම්ම නිකං ඉස්කෝලෙන් අවුට් වෙච්ච ගමන් නුහුණුවට ආපු කෙල්ලෙක් විතරයි. උපේක්ෂා සෞන්දර්ය විශ්වවිද්‍යාලෙ ඉඳලා ආපු මට වැඩිය දක්ෂ කෙල්ලෙක්.

ඇයට ඇඬෙන්නෙ මේවා සිහිවෙන විට ය. ඇත්තටම ගවේෂ් නොලැබුණොත් මම මැරෙනවා.

පෙරවරුවේ කළේ ඇඳ බදා සිටීම ය.

ඉසුරි වලනි පිළිබඳව බෙහෙවින් දුක්වූවා ය. පාසල් දිවියෙන් පසු කොළඹට පැමිණ සිටින ඈ ජීවිතය පිළිබඳ කිසිම අත්දැකීමක් ලබා තිබුණේ නැත. මේ විවාහ යෝජනාව පිළිබඳව මීට වඩා උපේක්ෂාවෙන් සිතිය යුතුව තිබුණි. ලද අධ්‍යාපනයෙන් රට ජාතියට සේවාවක් කිරීම මෙන්ම යහපත් යුග දිවියකට එළඹීමෙන් මේ ගැහැනු



ජීවිතයේ භාගය පත්‍රයට අයිතිය. ආදරයක් පිළිබඳ කිසිම සටහනක් ඇගේ සිතේ තිබුණේ නැත. හරියටම ඒ දේ සිතට පිවිසුණේ දැන් ය.

දින භාගයක නිවාඩුවක් ගත් ඈ නේවාසිකාගාරය වෙත ගියා ය. සතිපතා මිල දී ගන්නා කාන්තා පත්‍රය අතට ගත් ඇය එය නොබලාම කාමරයට ගෙන ගියා ය.

"ආ... චොකලට් බීම පැකට් එකක් ගෙනාවා, පේස්ට්‍රියකුත් ඇති."

ඇය ප්‍රශ්න ගැන නොවිමසා කීවා ය.

"මට එපා. සීලා තේ එකක් ගෙනැත් දුන්නා. පස්සෙ බොමු."

"ගවේෂ් කතා කළේ නැද්ද?"

එය අඬන්නට සිටින කෙනාගේ ඇහැට ඇඟිල්ලෙන් ඇනීමකට සමාන වැඩකි. ඉසුරි මේසය මත තැබූ පත්‍රයේ පිටකවරය දෙස බැලුවේ නිරුත්සාහයෙනි. දෙවියනේ මේ ඉන්නෙ අර දෙන්නා නේද?

ගවේෂ් හා උපේක්ෂා පිටකවරයේ සිටිනු දැකීමෙන් දරාගත නොහෙන වේදනාවක් සිතට පිවිසුණි.

"ගවේෂ් අර ගර්ල් එක්ක පිටකවරෙට ඉඳලා."

ඇය හැඬුම්මුසුව කීවා ය.

"කාටවත් දොස් කියන්ට එපා. මේවා කවුන්ගෙ වැරදි? මනමාලයා ගෙදර එන දවසෙ ගියා නම් මේවා කිසි දෙයක් වෙන්නෙ නෑනෙ."

ඉසුරි කීවේ දුකින් යුතුව ය.

# 36

විද්‍යාලයේ කලා උළෙල රූගත කිරීමට එන මෙන් ඩේමා ගවේෂ්ට ආරාධනා කර තිබුණි. නංගී අදහස් කරන්නට ඇත්තේ ගිය සැරේත් මහමාලිය කටයුතු දෙකම එකවරම කිරීමට විය හැකිය. මෙවර කටයුතු දෙකම එකවර පෙන්වීමට නොහැකි වූ නිසා කිරීමට සිතුවා විය හැකිය.

පත්‍ර කාර්යාලයේ දී ම අසංකට සෙනෙවිගෙන් ඇමතුම ලැබුණි.

"මචං අසංක මෙහෙට හරිනෙ."

සෙනෙවි ඇසුවේය.

"ඔ... ෂුවර්. උදේ 9 වෙනකොට අපි ඇති."

"මොනවද බයිට් එකට ඕනෑ."

"අද මචං මොනවත් කරන්ට බෑ. හැන්දෑවෙ B.M.I.C.H. එකට යන්න තියෙනවා. වෙනින් දවසක කරමු."



"ඒකට වෙනින් කෙනෙක් අරපං. උඹ අද ඉන්න ඕනෑ කෙල්ලව බලන්නත් යන්නත් ඕනෑ."

"මචං ඒ බවක් කලින් කිව්වෙ නැත්තෙ ඇයි...? මම අනිවාර්යයෙන්ම ඉන්ට ඕනෑ. ඇතුළට යන්ට පුළුවන් පාස් එක තියෙන අයට විතරයි."

"කෝ ගවේෂ්... ඌට කතා කරපං."

"ගවේෂ් ඔෆිස් එකේ වැඩක හිරවෙලා. ඊයෙත් මහ රෑ ආවෙ. මෙට නැවිදින් ඉන්න එකක් නෑ. පොර ආව ගමන් මට කෝල් එකක් දීපං. උඹ වෙරෙත් මචං. ගෙහේ බඩුත් තියෙනවා."

අසංක මැදි වුණේ සැහෙන ප්‍රශ්නයකටය. ඩේමාගේ විදුහලේ කටයුත්තක් නිසා නොකර බැරිය. සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වෙන උත්සවයට තිල අවසර පත් ලැබී ඇත්තේ අසංකට පමණි. මෙම උත්සවය අනිවාර්යයෙන් ආවරණය කළ යුතුය.

A 9 මාර්ගය ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනය ප්‍රශ්නයක්ව තිබුණි. විරෝදාර ත්‍රිවිධ හමුදාවන්ගේ අප්‍රතිහත ධෛර්යය කැප කිරීම නිසා ත්‍රස්තවාදීන්ගේ බලය බිඳී ගියේය. කොළඹ සිට නැව් මඟින් උතුරට භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ දී විශාල මුදලක් වැය වුණි. මේ භාණ්ඩ ප්‍රවාහනය කළේ කුලී නෞකාවලිනි. යුද්ධය අවසන් වූ සැණින් වරායේ කටයුතු මීට වඩා හොඳින් කාර්යක්ෂමව කළ හැකිවනු ඇත.

දූයට කිරුළ ප්‍රදර්ශන කටයුතුන සඳහා වෙහෙසෙමින් සිටි නිසා ඔහුට සම්මන්ත්‍රණ ශාලා භූමියෙන් පිටවීමට ලැබුණේ නැත.

පිටත්වීමට ප්‍රථම ගවේෂ් මිතුරාට ඇමතුමක් ගත්තේය.

"මචං උඹ කෑවද?"

''මම උඹ මේ හාබර් බත් එකක් ගේනකල් බලන් ඉන්නවා. මොකද බං කරන්නෙ...?''

''මේ මහ රෑ හාබර් බත් නෑ. මම උඹට නාසිගුරාම් එකක් ගේන්නම්.''

ගවේෂ් නවාතැනට එන විට හොඳට ප්‍රමාද වී තිබුණි. මුහුණ සෝදා ගත් ගවේෂ් කෑමට ආවේය.

''සොරි මචං''

''උඹ ෆෝන් එක ඕෆ් කරල ද හිටියෙ.''

''ඔව් මචං ඇයි...?''

''උඹ හින්ද කෙල්ලො පිස්සු වැටිලා. චලනි අඬනවා.''

''මම හිතුවා. මම මොනවා කරන්නද?''

''පිට කවරෙ ඉන්නවා දැකලා චලනි අඬනවා. උපේක්ෂා හිනා වෙනවා.''

''ඉතින් මම මොකද කරන්නෙ...?''

''දැන් හෙට උපේක්ෂාට පිස්සු හැදෙයි. මේ මචං මට වැඩි වෙලා ඉන්ට බෑ. ගිහින් පින්තූර ගත්තා මම එනවා. ගවේෂ් ඉඳලා එන්න.''

''මම මේ කියන්ට හිටියෙ. මට හෙට එන්ට වෙන්නෙ නෑ.''

''මොනවා.. ඒක කැත වැඩක්.''

''හැම කාරියකටම වඩා රාජකාරිය ලොකුයි කිව්වලු. අපේ නිවාඩු කැන්සල්. ඇඩ්වර්ටයිසින් බාර වෙලා තියෙන්නෙ මට.''

''ඒ වුණාට හරි නැහෙ. මේ වැඩෙන් දාගෙන තියෙන්නෙ උපේක්ෂලගෙ ගෙදර යන්නත් එක්කයි. සෙනෙවිත් උඹ එනකල් බලන් ඉන්නවා.''



''කාන්ට් හෙල්ප් ඉට්. උඹ ගිහින් පින්තූර ටික අරන් දීලා වරෙන්. මම ඉන්නම බෑ.''

උපේක්ෂා බසයට යද්දී හා බසයෙන් බැස පාසල වෙත පියවර මනිද්දී ඇතැමුන් තමා දෙස අමුතු ලෙස බලන බවක් දැනුණ ද ඒ පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වූයේ නැත. සුපුරුදු උදේ කෑමට ඉඳිආප්ප මුලක් හා උළුඳු වඩයක් ගැනීමට ලක්ෂ්මන්ගේ කඩයට ගිය අවස්ථාවේ ඔවුන් සිනාසුන හැටි ඇගේ සැලකිල්ලට හේතු වුණි.

''මිස් අද පත්තරේ තව ටිකයි තියෙන්නෙ.''

''මොන පත්තරේ ද?''

ඇය මඳ සිනාවෙන් යුතුව ඇසුවාය.

''අර පත්තර කට්ටුවෙ එල්ලලා තියෙන්නෙ.''

පාසලේ ශිෂ්‍යාවන් තමා දෙසට එනු බලා සිටියාය.

''ඇයි තනූජා...?''

''මිස්.. අද පත්තරේ මිස් ඉන්නවා.''

''මොනවා... මම පත්තරේ ඉන්නවා.''

ඇය සිනාමුසු මුහුණින් යුතුව පත්‍රය අතට ගත්තාය.

දෙවියනේ... මගේ ෆොටෝ එක. සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ඉගෙන ගනිද්දී කීපවරක් නැටුම් කණ්ඩායම සමඟ විදේශීය සංචාර කළ අවස්ථාවල දී පුවත්පත් වාර්තා පළවිණි. තනි ඡායාරූපයක් පළ වුණේ කලාතුරකිනි. එහෙත් මෙවැනි ඡායාරූපයක් කිසිදාක පත්‍රයේ පළව තිබුණේ නැත.

දෙවියනේ මේ ෆොටෝ එක ගත්තෙ කවුද? මගේ ඡායාරූපයයි ගවේෂ්ගේ පින්තූරයයි එකට ආවේ කොහොමද?

පින්තූරයක් ගම්මු කිව්වෙ විද්‍යාලයට ආවමයි. එදා ගත්ත පින්තූරය තාක්ෂණිකව සම්බන්ධ කරලා. විද්‍යාලයට ඒමට ප්‍රථම හැන්ඩ්ෆෝනයට ඇමතුම් ගලා ආවේය.

කතා කළේ. නැටුම් කණ්ඩායමේ කැම්පස් එකේ හිටපු ශිල්පාධිපති.

"පත්තරේ දැක්කා නියමයි. කොහොමද ගත්තෙ..?"

"මම කිසි දෙයක් දන්නෙ නෑ ශිල්පා."

"මම ඔයා එක්ක ඉන්න බෝයි දැකලා නෑ. ෆිල්ම්ස්ටාර් කෙනෙක් ද? උඹට ගැලපෙනවා."

නැවත ඇමතුමක් ලැබුණි. හැම ඇමතුමක්ම ඡායාරූපය පිළිබඳවය.

"උපේකා නියම කපල් එක. කන්ග්‍රැචුලේෂන්."

ස්ටාෆ් රූම් එකට ගුරුවරියක් ආවේ ඇයට සුබ පතමිනි.

මෙච්චර ඇගට දැනෙන සතුටක් සිතට දැනී නැත. ඉතුත් ජීවිතයේ දී විශේෂ දක්ෂතා ඇති වෘත්තියට අදාළ පිරිමි හමුණුනා නොවේ. ඒත් මෙච්චර කඩවසම් සිත සසල කළ පිරිමියෙක්. කාටවත් අයිති වෙන්නෙ නැතිව ඉතිරි වුණේ මා නිසාම වෙන්ට ඕනෑ.

• • • • • • • • • • •

කාටවත් අයිති වෙන්ට විදියක් නෑ. ගමේම මගෙයි. වැරදි වෙනවා... නමුත් ඒවා හදාගන්නයි මම හැදුවෙ. ඇය යළිත් පත්‍රයේ ඡායාරූපය දෙස බැලුවාය. දෙනෙතින් කඳුළු වැගිරෙන්ට පටන් ගත්තේ දෙනෙත්වලටත් රහසිනි.

එළිවෙනතෙක් කොට්ටය තෙත් කළා හැරෙන්ට වෙන කිසිවක් කළ හැකි වූයේ නැත.



ඉසුරි මිතුරියගේ දුක හඳින ගත්තාය. ජීවිතයේ කිසිවෙකුට ආදරය දක්වා නැත. මෙම යොවනිය අද ප්‍රථම ප්‍රේමය හඳුනාගෙන ඇත. පෝස්ටර් ගසා විවාහ යෝජනාව නතර කිරීමට උපාකර කළ හැටි මතකය.

උදෙන් නැගිට මුහුණ සෝදාගත් ඈ තේ කෝප්පය රැගෙන චලනිගේ ඇඳ අසලට ගියාය.

"නැගිටලා තේ බොන්ට."

චලනි ඇඳෙන් නැගිට මුහුණ සෝදා තේ කෝප්පය අතට ගත්තාය. ඔවුනතර නිහඬ බවක් ඇති වුණි. චලනි වෙනදා කාර්යාලයට යාමට කලිසම් කමිස අඳින්නේ නැත. අද නිවාඩු දිනයක් ද නොවේ.

"අද ඔෆිස් යන්නෙ නැද්ද?"

"ම්හු... වෙන ගමනක්."

ඇය කලිසමට බැස රෙදි පටියෙන් ඉණ හිර කර ගනිමින් කීවාය.

"නිවාඩු ද?"

"නෑ... මම රස්සාවෙන් අස්වෙලා ගෙදර යනවා."

ඇය හැඬුම්මුසුව කීවාය.

"ලස්සනයි... බොහොම ලස්සනයි. ඒක සැරේකුත් මේ වගේ තකතීරු තීරණයක් ගත්තෙ."

ඇය පහත් කරගත් හිසින් යුතුව නිහඬව සිටියාය.

"මේක හරියට මූණෙ වරදට නාසෙ කපා ගන්නවා වගේ වැඩක්."

ඇය කෝපයෙන් පිටතට බැස්සාය. මොන දේ වුණත් ඇයට උදව් නොකර බැරිය.

ත්‍රීවිලරය ඉදිරියට ඇදෙයි. වලනිගේ සිතේ ආදරය සටහන් වී ඇත්තේ දන්ය. බාත් ඔර්ලෝසුව කණුව තුදුරින් වැටී ඇති මල්වත්ත පාරේ මඳ දුරක් ගිය ඈ ගවේෂ් හමුවීමට ගියාය. එක්වරම ඇයට ගවේෂ් හමුවීමට නොලැබුණි. අපේ මිහරකිට මේ වගේ කෙනෙක් එක්ක දීග යන්න පින නෑ.

කැඳවුම ලැබුණ පසු ඇය ගවේෂ් සේවය කරන වායු සමීකරණය කරනලද කුටියට ගියාය.

"මම ඉසුරි... වලනිගෙ රූම් මේට්."

ඔහු ගෙල බැඳි ටයි පටිය සකස් කර සිනාමුසු මුහුණින් ඉසුරි දෙස බැලුවේය.

"ඔගොල්ලො නේද ලක්ෂ පනහක් ඉල්ලලා තාධු දැම්මෙ...?"

ඇය සිදු වූ සියලුම වැරැද්දිවලට සමාව ඉල්ලා සිටියාය.

"වලනි දුන් මොකද කරන්නෙ...?"

"රස්සාවෙන් අස්වෙලා යන්න හදනවා."



# 37

ගවේෂ් කිසිම පිළිතුරක් නොදී ඉසුරි දෙස බලා සිටියේ ය.

"වලනි රස්සාවෙන් අස්වෙලා ගෙදර නවතින්න හදනවා."

"ගෑනු ඉන්නෙ රස්සාවල් කරන්ට නෙමේ. ගෙදර හිටියට කමක් නෑ."

නොසැලකිලිමත් ලෙස ඔහු දුර්ධ කතාවක් කීවේ ය. වෙනත් පිරිමි නම් මේ කරුණ පිළිබඳව ඉතා හැඟුම්බරව, සංවේදීව කතා කරන හැටි ඇය අසා ඇත. ගෙනෙන ලද තේ කෝප්පය ඔහු තනිව පානය කළේ ආචාරශීලී බවක් නැතිව ය.

"ඔයාගෙ හිතේ අනුකම්පාව කියලා දෙයක් නැද්ද? ඔයා කතා කළ විදිහ හරි කැතයි."

"ගැහැනු රස්සාවක් කරනවට පෞද්ගලිකව මම කැමති නෑ. මම කැමතියි අල්ලන් සිපගන්න දුරින් මලක් වගේ පිපිලා තියෙනවට."

"අනේ ඇත්තට ගවේෂ් ඔයා ගැන අර පෝස්ට්වල තිබුණ කතා ඇත්ත වෙන්න ඕනෑ. ඔයා ඔය ජරා ගතියක් තියෙන තුන්වෙනි පන්තියේ මිනිහෙක්."

''හා හොඳා... ගෑනු ඉන්නෙ මොනවටද?''

''ඔයා හිතන ජාතියේ ගෑනු වික්ටෝරියන් යුගවල හිටියා. ''ඔයා හිතන ජාතියේ ගෑනු වික්ටෝරියන් යුගවල හිටියා.

''ඔයා හිතන ජාතියේ ගෑනු වික්ටෝරියන් යුගවල හිටියා. ඔයා හිතනවට වඩා මහා කාර්යභාරයක් ගැහැනු වෙතින් ඉටුවෙනවා. ගෙවිච්ච කාන්තා දිනයේ දී අපි අපේ අයිතිවාසිකම් ගැන හඬගා කිව්වා. බොහෝ පිරිමි ගැහැනිය අවතක්සේරු කරනවා.''

ඔහු සිනාසුනා විනා කිසිවක් පැවසුවේ නැත.

''ගැහැනිය ගැන කියන්න මාර්තු අට පමණක් ප්‍රමාණවත් නෑ. ගැහැනිය වෙනුවෙන් 365 දවසම වුවමනායි.''

''ඔයා දැඩි මූලධර්මවාදියෙක්.''

ඔහු සම්ප්‍රදායික වෙනත් පිරිමින්ට සමාන නැත.

''අද ගැහැනිය හිංසනයට, ශූරා කෑමට ලක් වෙලා.''

''ඔය වචන සෙට් එක ගෙනාවෙ එන්. ජී. ඕ. කාරයො. ගම්වල ජීවත්වන ගැහැනු කවදත් හොඳින් ඉන්නවා.''

''බොහෝ පිරිමි ගැහැනිය කෙළි බඩුවක් බවට පත්කරගෙන.''

''මොකද්ද ඒකෙ ඇති වරද? මම නම් හිතන්නෙ ලෝකෙ තියෙන සුන්දරතම වස්තුව ගැහැනිය කියලයි. මිනිස්සු හොඳින් හෝ නරකින් හැම උපක්‍රමයක්ම යොදන්නෙ ගැහැනිය අත්පත් කරගන්නයි.''

''පිරිමි තරම් ජරා සිත් තියෙන ජාතියක් ලෝකෙම නෑ. ඔයාගෙ හිතෙත් ඒ පහත් ආසාව තියෙනවා.''

''පිරිමින්ට ඔය විදිහෙ සාහසික චෝදනා කරන්ට එපා. හැම ගැහැනියෙක්ම බලාපොරොත්තු වෙලා ඉන්නෙ ලස්සනට ඇඳුම් ඇඳලා අන්න දවසක් ගැන නෙමේ. හැම ගැහැනියක්ම එහෙම මුහුණම නැතිව ඉන්න කැමතියි.''



''උසස් අධ්‍යාපනය ලබලා තියෙන, උසස් රැකියාවක් කරන බුද්ධිමත් කෙනෙක් මේ වගේ තුන්වෙනි පන්තියේ කතා කියයි කියලා මම හිතුවෙ නෑ.''

''ඉසුරි අම් වගේ පෘථග්ජන මිනිසුන්ගෙන් බොරු උත්තම චරිත බලාපොරොත්තු වෙනට එපා. ඔයාගෙ යාළුවා කිව්ව අරක්කු බොන, ගෑනු පස්සෙ යන, කාමාසක්ත සිතුවිලි හැම පිරිමියෙකුගේම සිත්වල තියෙනවා. පිරිමි ඉන්නෙ ඒවටයි. මාත් බලන් ඉන්නේ ඒ දවස ළඟාවෙන කල් තමයි.''

ඇත්තටම මේ කතා කරන්නේ සැබෑ ගවේෂ් දැයි සිතිය නොහැකි තරම් ය. එක් අතකින් ඔහුගේ කතාව සත්‍යයකි. ගැහැනු ජීවිතයේ වැදගත් අවස්ථා ලෙස සලකන්නේ ලිංගික කටයුතු හා බැඳුණු සිදුවීම ය. ප්‍රථම ආර්තවය මෙන්ම දෙවෙනි ගමනත් කාටවත් වැඩක් නැති පෞද්ගලික සිදුවීම් ය. එය උත්සව පැවැත්වීමට තරම් වැදගත් සිදුවීමක් නොවේ. පැහැදිලිවම ගැහැනිය සුන්දර සුකුමාල සත්ත්ව විශේෂයකි. ආදරයෙන් බැඳීම පිළිබඳව පමණක් නොව ඉන් පරිබාහිරව ද ඇය වෙතින් අනගි සේවයක් සිදු වෙයි. ඒ උදාර වූ මෙහෙය නොවී නම් මෙවන් දැහැමි සමාජයක් ඉතිරි වන්නේ නැත.

විවාහයෙන් පසු පිරිමින්ගේ දුර්වලකම් හඳුනා ඔහුගේ ආත්ම ගෞරවයත් ආරක්ෂා කරමින් පවුල් දිවිය ගෙවීමට ඇය වෙහෙස වෙයි. තමා සාකච්ඡා කිරීමට පැමිණි තැනැත්තා ගැහැනියගේ වටිනාකම තේරුම් ගත් අමනයෙකි. පෙරේතකම ඉහවහා ගොස් ය.

''දැන් ඔය අලවල, ඇහැළඩකන්ද, වේයන්ගොඩ, දිවුලපිටිය තියෙන ඉඩම් නිරවුල් ද?''

දෙවියනේ මේකා සයිලොක් වගේ මිනිහෙක්. ඇය කම්පාවී කියා ගත්තා ය.

"මම කපුවෙක් නෙමෙ. ඒක පීරිස් කපුවාගෙන්ම අහගන්නවා."

"දිවුලපිටියෙ අලවල ඉඩම විකුණලා ඒකෙ අඩුවට දැවැද්දට හම්බ වෙන සල්ලි ටික දමන්නයි මම හිතන් ඉන්නෙ. එදා අහන්ට බැරිව ගියා... දැවැද්දට සල්ලිවලින් කීයක් දෙනවද?"

විස්... මේ වගේ ජරා මිනිහෙක්. අපේ එකී නාහින්න හදන්නෙ මේ පෙරේත කුණාටද?

E.P.F. එකෙන් ලෝන් එකක් දමන්ට පුළුවන්. මොකද තරහෙන් වගේ බලන්නෙ. කොච්චර ගැහැනු කිව්වත් හැම පිරිමියාගෙම හිතේ ගැහැනියගෙන් දැවැද්ද ලබා ගැනීමේ ආශාව තියෙනවා. අපි දැවැද්ද ඉල්ලන්නෙ කෙළින්."

ඉසුරි රවා බැලුවා විනා පිළිතුරු දුන්නේ නැත.

"මම මේ ප්‍රාඩෝ එකක් ගන්න සල්ලි ඉල්ලන්නේ මට විතරක් තනියම යන්ට නෙමෙ. කසාද බැන්දම මට හැමදාම මෙයාව මෝටර් සයිකලේ තියාගෙන යන්ට බෑ. බබා හම්බ වෙන්න වුණාම වාහනයක් ඕනෑමයි."

ඇය නිහඬව සිටියේ කෝපයෙනි.

"දැවැද්ද නැතිනම් මඟුල ඇරුනාවෙ."

ඉසුරි කාර්යාලයෙන් පිටවුණේ කෝපයෙන් යුතුවය.

• • • • • • • • • • • • •

වලනී සිටියේ දරාගත නොහෙන වේදනාවකින් යුතුවය. මේ පිළිබඳව කාටවත් දොස් පැවරිය නොහැක. ඉතා කුඩා සිදුවීමක් මහා පසුබෑමකට හේතු වූ හැටි. තමා මුලදී සිතුවේ ආදරය සම්ප්‍රදායික මෝඩ ක්‍රියාවක් ලෙසය. එය තම හදවතට පිවිසුණේ ඉතා සෙමිනි. අපි රෝහලේ දී හමු වී කොතරම් සුහදව කතා කළා



ද? ජීවිතයට සමීප අනන්ත සිදුවීම් ඇත. ගවේෂ්ගේ හමුවීම තරම් හදවතට සතුට ගෙනා වෙනත් සිදුවීමක් නැත. මේ ආදරය නැතිව ජීවත් වෙන්නේ කොහොමද? මංගල යෝජනා තත්ත්වයෙන් ආවත් ඔහු අයිති තමාට ය. දැන් මේ සියල්ල අතැර ගෙදර යා යුතුය.

පුහුණුව අවසන්ව ගාල්ලේ ප්‍රාදේශීය කාර්යාලයකට මාරුවක් ගැනීමට පුළුවන. එහෙත් ඒ කිසිවක් කිරීමට සිතේ ආශාවක් නැත.

ඉසුරි පහත් කරගත් හිසින් යුතුව කාමරයට පැමිණ වලනීගේ ඇඳේ පසෙක ඉඳගත්තා ය.

"මොකද ගවේෂ් කිව්වෙ...?"

"ඒ වැඩේ හරියන්නෙ නෑ. උඹ වෙන අතක් බලාගනින්."

"දෙවියනේ එහෙම වෙන්නෙ කොහොමද? මට ආදරේ බව මට තේරිලා ඉවරයි."

"මගෙ ජීවිත කාලය තුළ දී මිනිස්සු දැකලා තියෙනවා. ආශ්‍රය කරලා තියෙනවා. ඒත් මෙච්චර ජරා මිනිහෙක් දැකලා නෑ."

ගවේෂ් සමඟ කරන ලද සාකච්ඡාව ඇය සැකෙවින් හෙළි කළා ය.

"නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත් පට්ටියකුයි තවත් ටිකකුයි ඕනැලු. ලොකු දැවැද්දක් ඉල්ලනවා."

"කොහොමටත් අපි දැවැද්දක් දෙනවනෙ."

"අලවල, ඇතාළඩකන්ද, වේයන්ගොඩ, දිවුලපිටිය ඉඩම් විකුණුවත් ප්‍රාඩෝ එකක් ගන්ට බැරිලු."

"ඉතින් අනේ ප්‍රාඩෝ එකක් ගන්න සල්ලි දෙන්නෙ කොහොමද?"

ඇය හැඬුම් මුසුව ඇසුවා ය.

"ඇත්තටම මාත් ගවේෂ් ගැන පැහැදිලයි හිටියෙ. අද මෙ කතාවෙන් මුළු පිරිමි සංහතියම එපා වුණා."

"මගෙ නමට ලියලා තියෙන හැමදේම විකුණන්ට මම කැමතියි."

"එහෙම තීරණ ගන්ට එපා. දරුවන්ගෙ දියුණුවට දෙමව්පියො දැවැදි දෙන බව ඇත්ත. ඒත් ඒවා විකුණලා ප්‍රාඩෝ එකක් ගන්ට සිතීම කොයි තරම් වැරදිද? පස්සෙ ගන්න කල් ඔය තියෙන සයිකලේ යන්ට කියපං."

"කමක් නෑ තියෙන දේවල් ඔක්කොම නැති වුණත් කමක් නෑ. මට ගවේෂ් ඔනෑ."

ඇය හඬමින් මිතුරියගේ ගෙල බදා ගත්තා ය.



# 38

බේමා ගියේ අප්පච්චීගේ පණිවිඩය අනුව ය. අප්පච්චි ප්‍රාදේශීය සභාවේ වැඩට ගියේ දින කිහිපයකට ඉහත ය. අයියාට මංගල යෝජනාවක් යළි පැමිණීම පිළිබඳව හෙතෙම සතුටට පත්ව සිටියේ ය.

"කෝ අප්පච්චි...?"

බේමා කඩිනමින් මව ළඟට එමින් ඇසුවා ය.

"අප්පච්චි ප්‍රාදේශීය සභාවට ගියා. සභාපති තුමා ඇවිදින් එක්කාගෙන ගියා."

"ඔව් ඒක හොඳා. නැතිනම් ගෙදරට වෙලා හිතු හුන කල්පනා කරනවා. ඇයි අම්මා හදිසියෙන් එන්ට කිව්වෙ...? මල්ලි සංගීත ටීචර්ට කැමති වෙලා ද?"

"සංගීත ටීචර් නෙමේ... ආයෙත් ගාල්ලෙ මංගල්ලෙ ඇවිස්සිලා ඇවිදින්. ගාල්ලෙන් එන්න කියලා පණිවිඩයක් ඇවිදින්."

"මොනවා අම්මා... එක සැරයක් බැණලා එලෙව්වා කිව්වා නේද?"

''දෙන්නම බොහොම මිත්‍ර ගුරුවරුනෙ. ඊටත් වඩා අර බාප්පා තමා මේකට මූල්වෙලා තියෙන්නෙ.''

සෙනෙවි මේ සම්බන්ධව කිසිවක් පැවසුවේ නැත. බේමාගේ මිකුරිය ලස්සන දේහයක් ඇති මනා හැඩරුවින් යුතු තරුණියකි. ඇය ප්‍රසිද්ධ චරිතයකි. කිසිවකින් අඩුවක් නැත. ඇගේ අත ගැනීමට සුවිශේෂ පුද්ගලයන් ඉදිරිපත් වුවත් ඇය ගවේෂ්ට කැමති වීම පුදුම සහගතය.

''මනුෂ්‍යයෙකුගේ දෛවය, ලැබීම කියන එක කාටවත් වළක්වන්ට බෑ.''

''අපේ එකා කැමති වුණොත් තමා පුදුමෙ.''

''අනේ දුව මනාලියෙක් බලන්ට යන්ට තියෙනවා කියලා අයියාව එක්කරගෙන එනවද?''

''මනමාලියො බැලිල්ල එපා වෙලයි තියෙන්නෙ. මම නිකං එක්කාගෙන එන්නම්.''

''ඔව් ඒක හොඳා.''

''අම්මා... උපේකා අයියට නහින්න හදනවා.''

''අර කෙලින් එහෙමලු දුව. රස්සාවෙන් අස්වෙලා ගෙදර නවතින්ට හදනවා.''

''කෙල්ලන්ටයි කොල්ලො පොරකන්නෙ. මේක අනිත් පැත්ත.''

බේමා කීවා ය.

බේමාගේ කතාවට සැවොම එකවරම සිනාසුණහ.

''ඔගෙ පුතාට මොනවද අඩු.''



''අභිමාන් එකේ අමිතාබ් වගේ උසයි. මම කියන්නද... අපි දෙන්නා ගිහින් එක්කගෙන එමු.''

''අසංකට කියමු. ගාලු ගිහින් අයන්ති උඩුගම්පලගේ ගෙදරින් දවල්ට කෑමට සෙට් කරන්ට කියමු.''

සෙනෙවි කීවේ ය.

''සෙනෙවි අපිට මනමාලිගෙ ගෙදරින් කෑම. මම කිව්වෙ අසංකව අයියාව රවටගෙන එන්න කියලයි.''

• • • • • • • • • • • • •

කැමරා පෙට්ටිය උරේ එල්වා ගත් අසංක ආවේ සිනාසෙමිනි.

''දාපං අත.''

''ඒ මොටද?''

''උඹටයි උපේකාටයි ටෙලි ඩ්‍රාමා එකකට කතා කළා.''

''මට මේ තියෙන ප්‍රශ්න ඇති. කෝ උඹල හදන්න ගිය ටෙලිනාට්‍යයට සල්ලි හම්බ වුණේ නැතෙ.''

''මේ ෆීල්ඩ් එකේ ගෞරවය ආරක්ෂා කරගෙන ඉන්න අය ටික දෙනෙක් ඉන්නවා. බාගෙට බාගයක් පොලු මස්තර්ලා. වලනිගෙ පින්තූරෙටත් එහෙමයි. කොල්ලො ඇඩ්‍රෙස් එක ඉල්ලලා පොරකනවා. දෙන්නද?''

''මේ... මේ... පිස්සු කරන්ට එපා.''

''සැබෑ තත්ත්වය මේකයි උඹ වලනිට ආදරෙයි.''

ඔහු පිළිතුරක් නොදී සිනාසුණා ය.

''ඇත්ත ඒක තමා ආදරෙයි.''

ඔවුන් කතා කරමින් සිටිය දී කිසිවෙක් එනු ඔවුහු දුටහ.

"උඹල කෑවෙ නෑ නේද?"

සෙනෙවි කාමරයට පිවිසෙමින් ඇසුවේ ය.

"තවම නෑ."

"කෑම තුනක් ගෙනාවා, බෙදාගෙන කමු."

"වැඩිත් එක්ක. කොටයත් තියෙනවා අදිමු."

"බයවෙන්න එපා. ඔක්කොම ගෙනාවා. බඩු හැව."

අයියා හා නංගි දිගු සාකච්ඡාවක යෙදෙනු පෙනේ.

"මම මේ උඹට කතා කරන්ටයි හිටියෙ. උපේක්‍ෂා ගෙවින් එක්ක හිටිය කවර් පේජ් එකට ගෙන තැන. දෙන්න දාලා වෙලියක් කරමු කියලා කියනවා."

"මේ වෙලි ගැහිල්ල ඕනෑ නෑ. දන්න රස්සාව කරගෙන ඉඳපං. අනික ඒ කපල් එකට ඉදිරියට යන්ට බෑ."

"දැන් ප්‍රොපෝසල් එක කන්ෆර්ම් නේද?"

"මලකෙලියයි. ගාල්ලෙ කෙල්ල මැරෙන්ට යනවා මූ නිසා. උපේක්‍ෂත් එහෙමයි."

"මම දැන් එනකොට වලනිගෙ යාළුවා මඟදි හම්බ වෙලා. මෙයා මාර ටෝක් එකක් දාලා."

"මොනවා වුණත් ගෙවින් හරි හොඳයි. කාගෙවත් හිත රිද්දවන්නෙ නෑ. හරියට අප්පච්චි වගේ."

"බමුනුව තමයි. ගෑනියෙක්ව මිනිහෙක් අරගෙන යන්නේ අර වැඩේට විතරයි කිව්වලු. ඕළපං කොච්චර කැත ද?"



"උගෙ කතාවත් ඇත්ත. හොඳ ගති ගුණවලට, ගුණයහපත් කමට ආදරේ කරන්ට තෙමේ. ඒකට තමයි."

තරමක් පදම් වී ගෙන එන නිසා එය හොඳ මාතෘකාවක් වුණි.

"අලවල, ඇකාළඩකන්ද, වෙයන්ගොඩ තියෙන ඉඩම් විකුණලා මොන්ටෙරෝ එකක් ගන්න සල්ලි ඉල්ලවලු."

"බොරු දාන්ට එපා. ගෙවින් ඒ වගේ ඇවැද්ද ඉල්ලන එකෙක් නෙමේ. ඒ කෙල්ල බොරු කියන්ට ඇති."

"නැම් ගෑනියෙක්ම ඇඳුම් ඇඳගෙන ඉන්නවට වඩා කැමති ඇඳුම් නැතිව ඉන්න කියලා කිව්වලු."

"ඔව් ඒ කතාව ඇත්ත. සතුටින් හිටියා කියන්නේ ඕකටනෙ. ගැහැනියෙකුගේ ජීවිතයේ භාගයක් ඉන්ට වෙන්නේ ඔහොමයි."

"යථාර්ථවාදී නවකතාවක් හෝ සම්භාව්‍ය සිනමා කෘතියක් තියන ලේබලය ජීවිතයට අලවන්ට එපා."

"ආව කාරණය මේකයි. අපිට හෙට ගාල්ලෙ කෙල්ලගෙ ගෙදරින් ආරාධනා කරලා තියෙනවා."

"ගෙවින් දන්නවද?"

"ඒක ගැන කතා කරන්ටයි ආවෙ. අසංක අපි ගෙවින්ට මොනවත් නොකියා ගාල්ලට එක්කරගෙන යමු."

ඉසුරි මිතුරිය සමඟ ගාල්ලට යාමට අදහස් කළේ ඇය පසුවන දුර්වල මානසික තත්ත්වය නිසාය. පාසල් ආදරයක අත්දැකීමක් තිබුණා නම් කිසිදාක මෙසේ වන්නේ නැත. රෝස පැහැති උවන තිබුණා රතු ජම්බු ගෙඩියක පැහැය ගෙන තිබුණි. රථය තුළ මන්දස්වරයක ගීත අනුවාදනයක් ඇසේ. එය ප්‍රථම ප්‍රේමය පිළිබඳව වූ මිහිරක වාදනයකි.

''නාඩා හිටපං... සෙනගට ජේනවා.''

හිස වනා යෝජනාව ප්‍රතික්ෂේප කළා විනා කිසිවක් පැවසුවේ නැත.

''මම කොහොමද මේ දුක දරන්නෙ...?''

''ප්‍රථම ආදරය හිතින් අයින් කරන්න බැරි බව මා දන්නවා. ඒ අත්දැකීම මම ලබලා තියෙනවා. මේ වගේ වෙලාවල තමයි බුද්ධිමත් වෙන්න ඕනෑ.''

''ගවේෂ් නොලැබුණොත් මම මැරෙනවා.''

''එහෙම නම් මම ඇවිදින් තියෙන්නේ බොරු ගමනක්. එහෙනම් මම උඹගෙ මළගෙදරට එන්නම්. මම අම්බලන්ගොඩින් බහිනවා.''

ඉසුරි යීනුව නාද කිරීමට සූදානම් වෙත්ම චලනී ඇගේ අතින් අල්වා ගත්තා ය.

''උඹ බැස්සොත් මාත් බහිනවා.''

මඳ වෙලාවක් යනතෙක් ඉසුරි කතා කළේ නැත. බසයේ සිට බලන කල ලතාවකට දිය රළ පෙරළී එන මහ සයුර පෙනෙයි. දහස් සංඛ්‍යාත පිරිසකට ජීවිත අහිමි කළ මහ සයුර අද සෙමින් වෙරළ සිප ගනී. අප ජීවිත ස්වභාවය ද මෙලෙසයි.

''කිසිම කෙනෙකුට තමා දැඩි ලෙස ආදරය කළ රූප කාය සමඟ ජීවිත ගෙවන්ට ලැබෙන්නේ නෑ. එහෙම නූනා කියලා ජීවිත අසාර්ථක වෙලා නෑ. ටික දවසකින් ඔවා හරියයි.''

''ගවේෂ් මට ඕනෑ... ඕනෑ.. ඕනෑමයි.''

''ඇත්තම කියන්නම්... ඒකා දැවැද්ද පෙරේතයෙක්.''



''අලවල, ඇතාලඩකන්ද, වේයන්ගොඩ ඉඩම් ටික විකුණලා කාර් එකක් අරන් දෙමු.''

''ඇයි හරකියේ කාර් එකක් අරන් දෙන්න දෙමව්පියො දූන්ග ඉඩම් විකුණනවද? හා හොඳා... උඹව අතැරලා ගියොත් මොකද කරන්නෙ... මිනිහත් නෑ... ඒවත් නෑ.''

ඇගේ කතාව සත්‍යයකි. ඇසුරු කළ කෙටි කාලය තුළ ඔහුගේ මෘදු සෞම්‍ය ගතිගුණ දැනගත්තා ය. බාප්පා මෙතරම් ලෙහෙසියත් බේරුණේ ගවේෂ්ගේ කටඋත්තරය නිසාය. මනමාලියක් බලන්ට යා යුතුව තිබූ ගමන නතර කර තාත්තාට ලේ දීමට රෝහලට ගියේය. එවැනි උදාර ගතිගුණ ඇති තැනැත්තෙක් දායාදය ඉල්ලාවිද? කොහේ හෝ වරදක් සිදුව ඇත.

''මට උත්තරයක් දැන්නෙ නැතෙ. බැරි වෙලාවත් උඹව අතහැරියොත්...? රස්සාවක් නැතිව ජීවත් වෙන්නේ කොහොමද?''

''මම පාරෙ හිඟා කනවා.''

ඇය කතා කළේ හැඬුම් මුසුව ය.

# 39

මංගල පිරිසට කෑම සැපයීම මෙවරත් භාර ගත්තේ රංජිත් විසිනි. ඉස්සන්, දැල්ලන්, කෙලවල්ලා, බලයා බයිට් එකට බදින්න මාළු ගෙනාවේ වැල්ලෙනි. කිරම සමරජීව මාමා හා උඩවලවල චමින්දට පණිවිඩය යැව්වේ තනිව වැඩ කිරීමට නොහැකි හෙයිනි.

''අයියේ... චලනි දුව එන්නේ කීයටද?''

''මෙලහට එනවා ඇති.''

බාල මහත්තයා කීවේ ය.

''මේ ළමයා රස්සාවෙන් අස්වෙලා ගෙදර නවතිනවලු.''

''මෙච්චර ඉගෙන ගෙන..?''

බාලමහත්තයා ඇසුවේ ය.

''අක්කේ... ගෑණියෙකුට ඕනෑ කරන්නෙ හොඳ ඉලන්දාරියෙක්. මේ වගේ උගත්, බුද්ධිමත් කෙනෙක් අපිට ලැබෙන එකක් නෑ. රස්සාවක් ඕනෑ නෑ. මගේ දේපල දුවට දෙන්නම්.''

''ආ.. අර එනවා ජේන්නෙ... යාළුවෙකුත් එක්ක.''



චලනි මවගේ මුහුණ සිප මිතුරිය සමඟ කාමරයට ගියා ය. කාමරය තුළට වී මඳ වේලාවක් සිට තේ පානය කර දිය නෑමට ගියා ය.

වත්ත කෙළවර වන්නේ කුඹුරු යායකිනි. වෙල මැද වූ කුඩා ඉව්ට තෙක් කඩොලාන වැවී තිබුණි. ඊට ඈතින් කොළඹ ගාල්ල දුම්රිය මාර්ගය වැටී තිබෙනු පෙනේ. මෙය සත්‍යජිත් රායිගේ බඳුර් සංසාර් චිත්‍රපටයේ රූප රාමුවක් වැන්න.

''ගෙදර මොනවත් උත්සවයක් තියෙනවද?''

''මා දැනුවත්ව නම් නැ. බාප්පා ඉන්න දවස්වලට එහෙමයි.''

දිය රෙදි හැඳ දිය නෑවේ කලකට පසුව ය.

රාත්‍රී අහරගෙන නිදන්ට සූදානම් වෙද්දී චලනී කඩන හඬ ඇසී ඉසුරි නැගී සිටියා ය.

''මොකද කෙල්ලේ මේ අඬන එකේ තේරුම..?''

''හෙට මාව බලන්න මනමාලයෙක් එනවලු.''

''මොනවා... උඹ ඒ බවක් දන්නෙ නැද්ද?''

ඇය හිස වනා එය ප්‍රතික්ෂේප කළාය.

''මේක අම්මලාගෙ කුමන්ත්‍රණයක්. මට හිතෙනවා දැන් කොළඹ යන්ට.''

''මේ මහ රෑ. මේ වෙලාවට කෝච්චි, බස් නෑ.''

''ඈත ඉඳලා එන බස් තියෙනවා. ගේට්ටුවෙන් පැනලා යමු.''

''අපි මේ ගැන තව ටිකක් හිතනවා ඕනෑ. මීට කලින් අප්පච්චිට හාට් ඇටෑක් එක හැදුණේ මේ නිසයි. උඹ ගෙදරින් පැනලා ගියොත් අප්පච්චි ආයෙ අසනීප වෙයි.''

''ඔව් නේද? ඒත් මම කොහොමද දන්නෙ නැති මිනිහෙක් එක්ක යන්නෙ...? ගවේෂ් හැරුණාම වෙන කෙනෙකුට මම ආදරේ නෑ. කතාව එච්චරයි.''

''වෙලාවට පෙනී ඉදලා පස්සෙ අකැමැතියි කියපං. විවාහ රෙජිස්ට්‍රාර් වුණත් අකැමැති නම් විවාහය කරන්නෙ නෑ.''

''පුටු අරගෙන ආපු ලොරිය යන්ට හදනවා. වවුමට පැන ගන්ට පුළුවන්.. අපි යමු.''

වලනි යෝජනා කළාය.

නංගී හා මස්සිනා ආවේ උත්සවයට කැඳවාගෙන යාම සඳහාය. අප්පච්චි ගොඩ ආවේ අමාරුවෙනි. ගැහැනියක් හොඳ ලයිට් කණුවක් සමග විවාහ වෙන මෙන් කිවත් එයට තමා දැන් කැමැතියි. සුන්දර සිතුවිලි තමාට දැන් නැත.

''උපේකලගෙ ගෙදර තියෙන්නෙ ගාල්ලෙද?''

''මම දන්න ගාල්ලක් නෑ. උඹ වගෙ තමයි. මට එන්න කිච්චා. මම යනවා.''

''වලනි ගැන වෙලාවකට පව් කියලා හිතෙනවා. කැත නැතිව පාරෙ එක්ක යන්ට පුළුවන් සුදු කෙල්ල.''

''ඉතින් උඹ ට්‍රයි එකක් දීපන්කො.''

''කලින් ඉඳල දක්කන ලොරි භාගයක් මට තියෙනවනෙ. පරණ වාහනේ මට හොඳා.''

ටේමා මනාව සුදානම් වූවා ය.

''අනේ අයියා මොකද්ද ඔය ඇඳල ඉන්න සුදු ඇඳුම. අපි යන්නෙ මනමාලියෙක් බලන්න.''

''ඇඳුමකින් ඉටුවන කාර්ය ඉෂ්ට වෙලා තියෙනවනෙ.''



''ටේමා ඒකා මොනවා ඇන්දත් හැඩයි. නාන්න ඇඳුමකුත් දාගනින්. අයන්තිලගෙ ගෙදරත් ගිහින් උණවටුනෙත් නාලා ජොලියක් දාලා එමු.''

''රෙඩ්ලේබල් එකක් ගත්තා ඇතිනෙ.''

ඔවුහු වෑන් රියට පිවිසුණහ.

වලනිගේ හිතේ අනපේක්ෂිත උද්‍යෝගයක් පැතිර ඇත. වලනි බැලීමට මනමාලයෙක් පැමිණෙන බව දැනගත් මොහොතේ ඇය ජීවිතයේ සතුටට හේතු වූ හැම දෙයක්ම නැතිව ඇතැයි සිතිනි. ප්‍රශ්න තිබුණු බව ඇත්ත. ඉස්පිරිතාලයේ ඔබ හා ගත කළ කෙටි කාලය හදවතට ලැබිය හැකි ලොකුම සතුට ලබා ගන්න හේතු වුණා. වෙන කවුරු ආවත් මම කැමති වෙන්නෙ නෑ. නැඳැයින් හිවසට පැමිණ ඇත.

''අනේ දුව.. දැන් ඒ ළමයි එයි. ඉක්මනට ලෑස්ති වෙන්න.''

''වෙරි සොරි.. මම ලෑස්ති වෙන්නෙ නෑ.''

''බලන්න දරුවෝ මෙයාගෙ තියෙන හිතුවක්කාරකම. මේවා අපේ වරදින් වෙච්ච දේවල් නෙමේ.''

''දුව... මේ කහ පාට සාරිය අඳින්න.''

''මට බෑ කිව්වොත් බෑ. මම කැමති නෑ.''

''මේ නිදහස ගවුම පිටින් මිනිස්සු ඉස්සරහට යන්න බෑනෙ කෙල්ලෙ. ඒ කහපාට සාරිය එපා නම් උඹ කැමති එකක් ඇඳපන්.''

''මේ යන්නේ මගෙ අන්තිම ගමන කියලා හිතාගෙන සුදු සාරිය අඳින්නම්.''

''කමක් නෑ.. කමක් නෑ.. සුදු සාරිය මනමාලියන් අඳිනවනෙ. සුදු ඇඳලා අරලිය මලක් ගහමු. උඹ අපි වගේ නෙමේ... කොහොමත් හිටියත් ලස්සනයි.''

ගවේජ් ඇතුළු පිරිස මනමාලියගේ නිවසට එනවිට දවල් එකොළහ පසු වී තිබුණි.

"මචං උඹ ගාව රෙඩ් ලේබල් එකක් තිබුණා නේද?"

"මදිවෙන එකක් නෑ. වැඩියෙ සෙට් වෙන්න නැහැනෙ. ඇයි මොටද?"

"මචං මනමාලිව බලන්න යන්න ඕනෑ හොඳට මෙන්න මෙතෙන්ට ගහලයි."

"ඒ වගේ තුන්වෙනි පන්තියේ වැඩ කරන්ට හොඳ නෑ. අපි දවල් කෑම කන වෙලාවෙදි ගහමු. මේ ගමන යන්නෙ කැමැත්තෙන් නෙවෙයි නේද?"

ඔහු හිසවනා එය අනුමත කළේ ය.

"බලන්ට යන පළවෙනි ගෑනි කසාද බඳින්න ඕනෑයි කියන කොන්දේසියක්, තීන්දුවක් නෑ. අපි මනමාලි බලලා දෙන දෙයක් කාලා යමු."

"මම මේ ගමන ආවෙ අප්පච්චි සන්තෝස කරන්නයි."

වෑන් රිය මනාලියගේ නිවස ඉදිරිපස නතර කළ පසු සැවොම පිටතට ආහ. ගෙවුයන මලින් බරව තිබුණි. නිවසට හුදුරින් අතු පතර ගැටපිච්ච ගස් හෙල්ලි ගසක් විය. එහි සෙවණේ ප්ලාස්ටික් පුටු රවුමට තබා තිබුණි.

බාල මහත්තයා දොරකඩ ළඟ සිට සැවොම ආචාර කර පිළිගත්තේ ය.

"මචං උඹලා ඇතුළෙ ඉඳපල්ලා. මම අර හෙල්ලි ගහ යට ඉඳගන්නම්."

"අයියා... මනමාලිව බලලා ඇවිදින් එළියෙ ඉඳගම්මු. දැන් ඇතුළට යමු."



"කිසි ප්‍රශ්නයක් නෑ. ඇතුළෙ තියෙන්නෙ රේල් පීල්ලක් වුණත් කමක් නෑ. බඳින එක බඳිනවා. මට එළියෙ ඉන්ට ඕන."

"එහෙම හරි නෑනෙ මචං. මේවයෙ චාරිත්‍ර කියලා දෙයක් තියෙනවනෙ."

"චාරිත්‍ර හදන්නෙ අපියි. මම එළියෙ ගහ යට ඉන්නවා. අපි නැමිදාම සම්ප්‍රදායෙ හිර වෙන්ට ඕනෑ නෑ. මනමාලිට මාව බලන්ට මෙතෙන්ට එන්ට කියපං."

ඔහු පිරිසගෙන් මිදී හෙල්ලි ගස සෙවණේ තිබූ අසුනක ඉඳගත්තේ ය. කොන්ක්‍රීට් වනාන්තරයේ ගත කරන ජීවිතය හා මේ ගැමි දිවිය අතර මහා වෙනසක් ඇතිවාට කිසිම සැකයක් නැත. වත්ත කෙළවරේ වෙල් යායක් ඇතැයි ඔහු අනුමාන කළේ ය.

දැන් කොයි මොහොතේ හෝ මනමාලිය රසකැවිලි ලක් සහිතව තමා වෙතට එනු ඇත. ගැහැනිය මිනිහා අතර පවතින්නේ සොඳුරියාත්මක බැඳීමකි. මේ සුන්දර බන්ධනය ජීවිත කාලය පුරාවට නොනැසී පැවතිය යුතුය. මේ මංගලායයට කැමති වුණේ අප්පච්චිගේ සතුට වෙනුවෙනි. මොන ගැහැනියක් හමු වුණත් වලනි තරම් හදවතට පිවිසි තවත් ගැහැනියක් නැත. ඇයි අපිට මෙහෙම වුණේ. අප්පච්චිට තිබුණේ නැවත එම යෝජනාව ගෙන ඒමයි. නිවස දෙස සිට වතුර වීදුරුවක් අතින් ගත් තැනැත්තියක් තමාට තේ බීමට ආරාධනා කිරීමට එන අයුරු දුටු ඔහු ඉවත බලා ගත්තේ ය.

"මනමාලියෙක් බලන්න ආවද?"

මේ කටහඬ හොඳට හුරු ය. ඔහු සෙමින් හිස එසෙව්වේ ය. දෙවියනේ... මේ කවුද?

## 40

"මාව මේ විදිහට බලාපොරොත්තු වුණේ නැත්ද?"

ඉසුරි අවඥාසහගත සිනාවක් පාමින් ගයේෂ් ඉදිරිපිට ඉඳගනිමින් කීවා ය.

"ඉස්සර දිනවල, රජයේ නිවාඩු දිනවල මනමාලියො බලන්න ගිහින් උන්ගෙ ජීවිතත් එක්ක සෙල්ලම් කරන්ට ඔයේට ලජ්ජා නැද්ද?"

"ඔය ගේ ඇතුළෙ ඉන්න ගෑනි දිව්‍යාංගනාවක් වුණත් මම බඳින්නෙ නෑ. මූණ දිහාවත් බලන්නෙ නෑ. ඒකයි මෙතෙන්ට වෙලා ඉන්නෙ."

"එහෙනම් මිනිස්සුන්ගෙ කාලයයි ධනයයි නාස්ති කරන්ට එන්නෙ මොකද? කාවද බඳින්න හිතන් ඉන්නෙ...?"

"මම බඳින්නෙ වලනිවයි. මම ඒ තීරණය අරන් ඉවරයි."

මේ තමා ආදරයේ හැටි. සිතේ සැඟ වූ දෙයක් කෙළින් නොකීවත් එය අවබෝධ කර ගැනීම ඇයට අපහසු වූයේ නැත.

"වෙරි සොරි. මට එදා කිව්ව ටික වලනිට කිව්වා."



"ඔයා මොනවද කිව්වෙ...?"

"ධනවියක් නැතිව කසාද බඳින්න බැහැයි කියලා වලනිට කිව්වෙ...?"

"ඔයා ඒක කිව්වද?"

"එහෙම නම් එදා මට කියන්ට කිව්වෙ..?"

"මම එදා කිව්වෙ බොරු. මට වලනි වෙනුවෙන් සතේක දෙයක් ඕනෑ නෑ. මට ඕනෑ කෙල්ල විතරයි."

"පුමාද වුණා වැඩියි. අද වලනි බලන්න මනමාලයෙක් එනවා."

"කවුරු කිව්වත් වලනි මට විශ්වාසයි. එයා කවදාවත් බඳින්නෙ නෑ."

"ගයේෂ් මනමාලි බලන්ට යන්නෙ නැද්ද?"

"නෑ. ඕනෑ නම් මාව බලන්ට ආවාවෙ."

සාලයට ගිය ඉසුරි නැවත ආවේ නැත. දැන් කාටත් රහසින් නිවසින් පැන ගත යුතුය. වත්ත කෙළවරේ ලිඳ අසලින් එගොඩ ගොඩට නියර දිගේ යාමට පුළුවන. කොළඹ ගාල්ල බස් පාරට ගියහොත් නැවත කොළඹට යාමට පුළුවන. තමා පිළිබඳව දන්නා ඉසුරි තත්ත්වය තේරුම් ගනු ඇත. සැමදෙනාගේම අවධානය යොමුවී ඇත්තේ නිවසට පැමිණි මංගල පිරිස වෙත ය. නිකමට හෝ මනමාලයා කවුදැයි බැලීමට යා හැකිව තිබුණි. ඔහු නිවස තුළට එන්නේ නැතිව නෙල්ලි ගස යටට ගියේ සිය අහංකාරකම පෙන්වීමට ය. මෙවැනි බොරු ආඩම්බරකාරයින් දැකීමටවත් වලනි සතුටු වූයේ නැත. ඔබයි මායි හමුවෙලා වැඩි කලක් නෑ. දෙන්නගේ අදහස් කොච්චර සමාන ද? රෝහලේ කොරිඩෝරය දිගේ අත් අල්ලාගෙන ගිය හැටි. මම කැව්ව බත් කට නෑ හැටි. මගේ ඇස්

දෙක දෙන්න පොරොන්දු වුණේ කොච්චර ආදරයෙන් ද? එච්චර සුන්දර ආදරයක් මෙතෙක් සටහන්ව නැත. දෙවියනේ ඒ වගේ හැඟීම්බර ගැඹුරු ආදරයක් තියෙද්දී මම කොහොමද රජෙක් ළඟට වුණත් යන්නෙ...?

මේ තමා හොඳම වෙලාව. සිය කාමරයෙන් පිටව වැසිකිළියට යන බව අඟවා ඇය නිවසින් පැන ගත්තා ය. ඇය වත්ත පහළ ළිඳ දෙසට දුව ගියා ය. වත්ත කෙළවර වන්නේ කම්බි වැටකිනි. ළිඳ ළඟින් මහ නියරට පිවිසෙන්ට ඇති එකම මඟවන්නේ කම්බි වැටෙන් රිංගා යාම ය. කලිසමක් හැඳ සිටියා නම් මින් රිංගා යාම ප්‍රශ්නයක් නොවේ. කම්බිය පහත් කරද්දී හැට්ටය පැටලිණි. එය ගලවා ගත්තේ අමාරුවෙනි. යළි රිංගා යාමට ගත් වෑයම අසාර්ථක වූයේ පුළුල් නිතඹ නිසා ය. පසුපසින් සාරිය පැටලී ඇත. මේ කරුමෙ නිසා මේ වගේ තැනකින්වත් යන්ට බෑ. කම්බිය උස්සා වැටෙන් පැනීමට කිසිවෙක් සහාය වන නිසා එදෙස හැරී බැලුවා ය. ඇය සිතුවේ තමා සොයා මෙහි එන්ට ඇත්තේ ඉසුරි කියා ය.

"මනමාලයා ගියා ද?"

වලංනි එහා පැත්තට මාරුවීමට වෙර දරමින් ඇසුවා ය. කම්බියෙන් මාරු නොවී ඇය මිතුරිය හා කතා කිරීමට නැඟී සිටියා ය. දෙවියනේ... මේ කවුද? හදවතට දැනුණ සතුට ඇයට දරාගත නොහැකි වුණි. මගේ හිතට පුදුම දෙයක් වෙලා. සිනා සිටියේ ඔහු ගැනමයි. නැඟී සිටින විට නෙත් අභියස. දෙනෙත් කඳුළෙන් පිරී ගියේ ඇයි දැයි තේරුම් ගැනීමට නොහැක. දෙනෙත් කඳුළෙන් පිරී ගියේ නොදැනුවත්වමය.

"ඇයි මේ අඬන්නෙ...?"

"නෑ මුකුත් නෑ."

ඇය සිනාසීමට වෙර දරමින් කීවා ය.



"නැති වෙන්නෙ කොහොමද?"

ඔහු ඇගේ නිකටින් ඔසවා ඇසුවේ ය.

"ඔයාලගෙ ගෙදර කොහේද තියෙන්නෙ...?"

"ඒක වෙන වෙලාවක කියන්නම්. මාව බලන්න මනමාලයෙක් ඇවිදින්. මම පැන ගත්තයි හදන්නෙ."

"මට ඔයා එක්ක ටිකක් කතා කරන්ට ඕනෑ."

ඔහු මෘදු ලෙස ඇගේ අතින් අල්වා ගත්තේ ය.

"ඔයාට මාව එපා කිව්වා නේද?"

ඇය හැඬුම්බර හඬින් ඇසුවා ය. ඔහු සිනාසුනා විනා කිසිවක් කීවේ නැත.

"තාත්තා කාර් එකක් ගන්ට සල්ලි දෙයි. ඉඩම් ටික විකුණලා ඔයා වාහනයක් ගන්ට."

ඇය ආදරයෙන් කීවා ය.

"මට ඔයා වෙනුවෙන් දෑවැද්ද එපා. මෙච්චර ලස්සන ආදරේ කරන්ට හිතෙන කෙල්ලෙක් මටම හදලා දුන්නට ඇත්තටම ඔබ දෑවැද්ද දෙන්ට ඕනෑ දෙමාපියන්ටයි."

"හානේ... ඔක්කොම මෙහාට එනවා."

ඉසුරි සිනාසෙමින් මවුනතරට ආවා ය.

"දිවුලපිටියෙ ඉඩම් විකුණන්න එපාලු. ඒක දරුවෙකුට දෙන්න තියාගන්නලු. බාප්පා වාහනයක් අරන් දෙයි."

ඉසුරි කීවා ය.

"මට කාගෙවත් වාහන ඕනෑ නෑ. මගේ සයිකලේ මට ඇති."

දිවා ආහාරය ගනිද්දී ඔවුහු මංගල උත්සවය ගැන සාකච්ඡා කළහ.

වලනිට නම් මේ සතුට දරාගත නොහැකි තරම්ය.

"දැන් උඹට අපිව එපා වෙලා නේද?"

"තරහ වෙන්ට එපා. අපිට කොච්චර දේවල් කතා කරන්ට තියෙනවද?"

"ඒකනෙ පණ්ඩිත වැඩ කරන්ට එපා කිව්වෙ. තියෙන ඔක්කොම එකම දවසෙ කතා කරන්ට එපා. අපි යනවා."

මිතුරිය ගිය පසු ඔහු ඇගේ අතින් අල්වා ගත්තේ ය.

"දැන් මම ලක්ෂ පනහක වන්දියක් ගෙවන්ට ඕනැනෙ."

"මට සමාවෙන්න ගවේෂ්. ඒ හැමදෙයක්ම කළේ ආදරේ වැඩිකමට."

"මේ නඩුව ෆ්‍රේම් කරපු හැටි වැදියි. මට ඔයාව බිලියන පනහකටත් වඩා වටිනවා. ඒ කියන්නේ වටිනාකම කියන්ට බෑ."

ඈ සිටියේ තෙත් වූ දෑසිනි.

බේමා කාමරයට ආවේ සිනාමුසු මුහුණින් යුතුවය.

"අයියේ... ගෙදර යන්නෙ නැද්ද?"

"ගෙදර යන්න තව ටිකක් ඉඳලා යමු."

"ගෙදරින් ආවෙ කොහොමද? මුදෙ නාලා අයන්තිලගෙ ගෙදරින් කාලා යමුයි කියලා නේද?"

එකවරම ඉස්තෝප්පුව දෙසින් සර්පිනාවක හඬ ඇසුණි. එය ඩිංගිරි මැණිකා චිත්‍රපටයේ ගීතයකි. ඉන්දියානු ජාතික ඇස්. ඇස්. වේදා හා පී. ඇල්. ඒ. සෝමපාල සංගීත අධ්‍යක්ෂණය කළ

මනාලියක් 245

මෙම චිත්‍රපටියේ ගිරිහෙල් මුදුනේ මාහෙල් නොපිපේ යන ගීතය ගායනා කරනු ලැබුවේ මොහිදීන් බෙග් විසිනි. රංජිත් බාප්පා නොදන්නා සංගීත කරුවෙක් නැත. තන්දියට සංගීත කණ්ඩායම ගෙන්වන්නේ බාප්පා විසිනි. නලින්, සුනිල්, ඉරාජ්, හාතිය, ඉෂාක් බාප්පාගේ මිතුරන්ය.

"ගිහෙල් මුදුනේ සින්දුව උස්සනට කියනවා"

"ඉෂාක් ගෙන්නලද?"

"නෑ... නෑ.. බාප්පාගෙ හඬ. බාප්පට හොඳට සර්පිනාව ප්ලේ කරන්ට පුළුවන්."

මේ කොතරම් සොඳුරු හමුවක් ද? සැදෑ සමයේ ගාල්ලේ සිට ආවේ විවාහය සඳහා දිනයක් නීන්දු කර ගැනීමෙන් පසුවය.

හැම ගැහැනියකගේම සිතෙහි සැඟවුණු සිහිනයක් ඇත. හොඳ මිනිහෙකුගේ ආදරණීය බිරිඳ වී පතිකුලයට පිවිසීම ඇගේ එකම අදහස වෙයි. දුක සැප සමව බෙදාගෙන මරණයෙන් පමණක් කෙළවර වන දිගු ගමනේ ඇය සහකාරිය විය යුතුය.

වලනිගේ මංගල උත්සවය අතිශයින් චාම් එකක් වුණි. වලනි විවාහ ලේකම්වරිය ඉදිරියේ නැගී සිටියා ය.

"වලනි චම්පා උඩුගම්පල වන මම මෙහි සිටින රත්නායක මුදියන්සේලාගේ ගවේෂ් සේනාධීර සමග විවාහ වීමට කිසිම නීත්‍යානුකූල බාධාවක් මා දන්නා තරමින් නොමැති බව ගම්භීරතා පූර්වකව මම ප්‍රකාශ කරමි."

ජයමංගල ගී ගායනා ඇසුණේ ඉන් පසුව ය. මංගල මේසය නිමා වූ පසු ස්තුති කතාව පවත්වනු ලැබුවේ වසර ගණනාවක් බද්ධ වෛරයෙන් පසු වූ මහප්පා ය.

"මනුස්සයෝ විදිහට මිනිසුන් අතින් වැරදි වෙනවා. ගවේෂ්

පුතා අපේ දූවත් එක්ක ඉන්ස්ටිටියුට් එකේ ඉගෙන ගෙන තියෙනවා. පැතිරිලා තිබුණ අනම් මනම් කතා බොරු කියලා දූව කිව්වා. හොඳ අනාගතයක් තියෙන දරුවෙක්. මනමාලිගෙ තාත්තා ඒ කියන්නෙ මගෙ ලොකු මල්ලි දූවට මුදල් සමඟ වෙනත් තෑගි දසක් පිරිනමනවා. බාල මල්ලි එයා ගානෙ දූවට වාහනයක් දෙනවා. මාත් පොඩි දූවට ගාල්ලෙ පන්නර ඒජන්සිය තෑගි විදිහට පිරිනමන්ට කැමතියි.''

ගවේෂ් වලනි අසලට වී උත්සව සභාවේ කතාවට සවන් දුන්නේ ය. ඔහු සෙසු පිරිස පුදුමයට පත්කරවමින් නැගිට්ටේ ය.

''මනාලයා කියන චරිතය මේ වගේ උත්සවවල දී කතා කරන්නෙ නෑ. මම තෑගි බලාගෙන වලනිට කැමති වුණේ නෑ. ඇත්තටම මෙච්චර හොඳ දූවෙක් හදා දුන්නට මමයි තෑගි දෙන්න ඕනෑ.''

හෙතෙම තෑගි ප්‍රතික්ෂේප කරමින් කතා කළේ ය.

නිවසින් පිටවීමට ප්‍රථම වලනි වැඩිහිටියන්ට වැඳ සමුගත්තා ය.

''මේ වගේ උතුම් මිනිහෙකුට ගැහුවා කියලා මම දහස්වර දුක්වෙනවා.''

රංජිත් තෙත් වූ දෑසින් යුතුව කීවේ ය.

''මේ හැම වරදක් කළේ මමයි බාප්පා. හැමදේකටම මම සමාව ගන්නවා.''

ඇය හැඬුම් මුසුව කීවා ය.

''මෙහෙම වරෙන්... අන්තිම මොහොතෙ උඹට අවවාදයක් දෙන්න ඕනෑ. මේවා දෙමව්පියන්වත් දෙන අවවාද නෙමේ.''





ගවේෂ් මිතුරාගේ කරට අත දමා ගත්තේ ය.

''කට ගහගෙන ගියාට හනිමූන් යනවා කියන එක ලේසි නෑ. බයවෙනවා. වාහනේ තියෙන ආයුධ පෙට්ටිය අරන් පලයන්. නියන, කියත, මිටිය.''

''උඹ හිතුවද මම වහලයක් ගහන්න යන බාස් කෙනෙක් කියලා.''

''හොඳන්නා වැරදි සිද්ධ වෙනවා. ඉන්ඇඩවර්ටන්ට් මිස්ටේක්.''

ඔහු කුසුරුදු කතාවක් රහසින් කියා උස් හඬින් සිනාසුණේ ය. මොන දේ කළත් ගවේෂ්ට සිටින්නේ හොඳ මිතුරන් පිරිසකි. ඒ පැවසුවේ පිරිමින්ට ගැළපෙන බාලු කතාවක් බව ඉසුරි දැනගත්තා ය.

කාන්තා නේවාසිකාගාරයේ සමීපතම කීපදෙනෙකුට ආරාධනා කර තිබුණි. ඔවුන් කොල්ලන්ටත් වඩා හපන් දඟකාරියන් ය.

''ගැහැනියෙක් කවදා හරි අනිවාර්යයෙන්ම මේකට මුහුණ දෙනවා. බයවෙන්ට එපා. කඩියෙක් කෑව වගේලු.''

අත්දැකීම් නැති එකියක් රහසින් මුමුණා සිනාසුණා ය.

''කෙහෙල් මල... විෂ නාගයෙක් දෂ්ඨ කළා වගේ සිහිමූර්ජා වෙනවා.''

යළි සියල්ලොම උස් හඬින් සිනාසෙන්නට වූහ.

ඇත්තටම මේ ප්‍රීතිමත් දවස ලැබුණේ ගවේෂ් නිසා ය. මේ උද්වේගකර අවස්ථාවකි. හඬා සිටීමට නොහැකි වුණි. අම්මා තාත්තා පුදු දූවේ කිව්ව හැටි. ඔවුන්ගේ ලෝකයෙන් සමුගෙන

ටවන ලෝකයකට යා යුතුය. තාත්තා හැඬුවේ කුඩා දරුවෙක් මෙනි. තාත්තාට ඇත්තේ අම්මාටත් වඩා ලාමක සිතකි. ගැහැනු දරුවෝ අයිති අපට නෙමේ ඒකට පතාගත් කෙනෙක් ඉන්නවා. බේබි නෑනාගේ දෙකම්මුල් සිප ගත්තා ය.

''මචං... නංගිත් එක්ක රෑ කෑමට හෝටලේට වරෙන්.''

''මේ පිස්සු වැඩ කරන්නෙ නැතිව යන වැඩේ හරියට කරගනින්. ප්‍රශ්නයක් ආවොත් S. M. S. එකක් එවපං.''

''සෙනෙවි අපි යනවා.''

අසංක රථයේ ඉඳගනිමින් කීවේ ය.

මේ විරහව හැම ගැහැනියකටම විඳීමට සිදුවන පොදු අත්දැකීමකි. මගේ අතින් මිදුනා නම්... එච්චර පව් කරලා නෑ. අද මා කොච්චර වාසනාවන්තද? ඈ තෙත් වූ දෑසින් යුතුව ගෙවින්ගේ ළයෙහි හිස තැබුවා ය.

නිමි...

kathapothak.blogspot.com

[illegible]

[illegible]

ඇගේ අතේ ඇඟිලි [illegible]

ප්‍රිය හැකි උපරිම පරිත්‍යාග දෙමින්

[illegible] හරල්ලේ [illegible]

ලොකු සතුටක් ලැබෙති.


ප්‍රේමයේ ප්‍රිය රෝසමලක් ලෙස විකසිත

වෙද්දී මිනිසාගේ සිතේ මහා සතුටක්

ඇතිවෙයි.

kathapothak.blogspot.com

COVER DESIGN - Dammika Mallawaarachchi



මල්ලවආරච්චි ප්‍රකාශකයෝ
200, [illegible]
දුරකථනය : [illegible]

රු. 300/=

ISBN 978-955-8160-35-1